දිනමිණ

The Dinamina | 1909 ඇරැඹි ශ්‍රී ලංකාවේ ජාතික පුවත්පත | தினமின

ශ්‍රී බුද්ධ වර්ෂ 2564ක් වූ අධි වප් අව අමාවක ලත් කිව් දින | කාණ්ඩය 111 | පත්‍රය 259 | පිටු 40 | මිල රු.30 | web: www.dinamina.lk | ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කළ පුවත් පතකි | 2020 ඔක්තෝබර් 16 සිකුරාදා

කොවිඩ් ව්‍යාප්තිය



දේශයේ පාලන මාවත අද පතුය සමග

වනාතවිල්ලුව අවි ගබඩා සිද්ධියට අදාළ
මුස්ලිම් ත්‍රස්තවාදීන් දෙදෙනකු නිදහස් කරන්න අස්සන් කළේ CID නිලධාරීන් ගැන තැබූ විශ්වාසය නිසයි

හිටපු ජනපති මෛත්‍රීපාල පාස්කු කොමිසමට කියයි

සුභාෂිණී සේනානායක

පාස්කු ප්‍රහාරයට පෙර වනාතවිල්ලුව අවි ගබඩා සිද්ධියට අදාළව අත්අඩංගුවට ගත් මුස්ලිම් අන්තවාදීන් සිව් දෙනාගෙන් දෙදෙනකු නිදහස් කිරීමට තම අස්සන යෙදුවේ ඒ සම්බන්ධයෙන් වාර්තාව ඉදිරිපත් කළ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් කෙරෙහි තිබූ විශ්වාසයෙන් බව හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා පෙරේදා (14) පාස්කු කොමිසම හමුවේ කියා සිටියේය පිට 06

දේශීය ආහාරවලින් ස්වයංපෝෂිත වෙමු

ලෝක ආහාර දිනය වෙනුවෙන් නිවේදනයක් නිකුත් කරමින් අගමැති කියයි

කුසගින්න සහ මන්දපෝෂණයෙන් තොර ලොවක් ගොඩනැගීමේදී ජයග්‍රහණය කළ යුතු අභියෝග පිළිබඳ දැනුවත්භාවය වැඩි කිරීමේ අවස්ථාවක් ලෙස ලෝක ආහාර දිනය යොදා ගන්නා බව අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතා අඳට (16) යෙදී ඇති ලෝක ආහාර දිනය වෙනුවෙන් නිවේදනයක් නිකුත් කරමින් ප්‍රකාශ කරයි. පිට 06

පොඩි ලසි දින 90ක් රඳවා ගැනීමට CIDයට අවසර

එස් දියගහගේ - දකුණු පළාත් සංවාරක

දැනට බුස්ස බන්ධනාගාරයේ රඳවා සිටින සංවිධානාත්මක අපරාධ කල්ලි සාමාජිකයකු වන අරුමාහන්දි ජනිත් මධුසංක ද සිල්වා හෙවත් පොඩිලසී නමැති සැකකරු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව යටතේ දින 90ක් රඳවා තබාගෙන වැඩිදුර විමර්ශන කිරීම සඳහා ගාල්ල ප්‍රධාන මහේස්ත්‍රාත් හර්ෂණ කැකුණවෙල මහතා ඊයේ (15) අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට අවසර දුන්නේය. පිට 06

නිරෝධායන නීති ගැසට්ටුව එයි

ජනතාව ගැවසෙන පොදු ස්ථානවල සමාජ දුරස්ථභාවය තබා ගැනීම, මුව ආවරණ පැලැඳීම ඇතුළු ප්‍රධාන සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේදයන් සහිත නව නිරෝධායන නීති ඇතුළත් ගැසට් නිවේදනය ඊයේ (15) මධ්‍යම රාත්‍රියේ නිකුත් කෙරිණි. මෙම ගැසට් නිවේදනයට සෞඛ්‍ය ඇමැති පවිත්‍රා වන්නිආරච්චි මහත්මිය ඊයේ දහවල් අස්සන් තැබූ අතර අදාළ සෞඛ්‍ය නීති කඩ කරන පුද්ගලයන්ට මෙම ගැසට් නිවේදනය අනුව රුපියල් 10000කට නොවැඩි දඩ මුදලක් සහ පිට 06

මහජන ආධාර දෙපාර්තමේන්තුව තාවකාලිකව වසයි

පිට 06

වයිරසය පාලනයට අවශ්‍ය මහජන සහායයි
රට සම්පූර්ණයෙන් වැසීම අනවශ්‍යයි

සෞඛ්‍ය අමාත්‍යාංශයේ මාධ්‍ය ප්‍රකාශක වෛද්‍ය ජයරුවන් බණ්ඩාර

සන්ධ්‍යා කරුණාරත්න

කොවිඩ් - 19 වයිරසයේ ව්‍යාප්තිය හමුවේ ඇතැම් ප්‍රදේශවලට නිරෝධායන ඇඳිරි නීතිය පනවා තිබුණ ද, රට සම්පූර්ණයෙන් වසා දැමීමට මෙතෙක් අවශ්‍යතාවක් නැති බව සෞඛ්‍ය අමාත්‍යාංශය පවසයි. පිට 06

අධිකරණ නියෝග හැල්ලු නොකර බදියුදීන් අත්අඩංගුවට ගන්න

නීතිපති දප්පුල ද ලිවේරා CID ලොක්කාට කියයි

කුමුදු හෙට්ටිආරච්චි

තම උපදෙස් හා අධිකරණ නියෝග හැල්ලුවට ලක් නොකොට රිෂාඩ් බදියුදීන් අත්අඩංගුවට ගන්නා ලෙස නීතිපති දප්පුල ද ලිවේරා මහතා රහස් පොලිසියේ නියෝජ්‍ය පොලිස්පති ප්‍රසාද් රණසිංහ මහතාට ඊයේ (15) වැඩිදුරටත් උපදෙස් දුන් බව නීතිපතිවරයාගේ සම්බන්ධීකරණ නිලධාරිනී රජයේ අධිනීතිඥ නිශාරා ජයරත්න මෙණෙවිය පැවසුවාය. පිට 06

බියගම දෙදෙනකුට කොරෝනා

සුදත් පුබුදු කීර්ති
දෙල්ගොඩ සමූහ

බියගම මාකොළ දකුණ ප්‍රදේශයේ පදිංචි බැංකු නිලධාරිනියක සහ ව්‍යාපාරිකයකු ඊයේ (15) කොවිඩ් 19 වයිරසය ආසාදිතයන් බවට තහවුරු වූ බව බියගම පරිපාලන මහජන සෞඛ්‍ය පරීක්ෂක සමන් පෙරේරා මහතා පැවසීය. පිට 06

පැරිසියට රාත්‍රී ඇඳිරි නීතිය

පිට 06

අත්අඩංගුවට ගැනීම වළක්වන්නැයි බදියුදීන්ගෙන් පෙත්සමක්

නෙල්කා මැදගෙදර

නිකුත් ජනාධිපතිවරණ දිනයේදී ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා අවතැන් ඡන්ද දායකයන් පුත්තලමේ සිට මන්නාරමට ප්‍රවාහනයට ලංකා ගමනාගමන මණ්ඩලයේ බස් රථ යොදා ගැනීම සම්බන්ධයෙන් පිට 06

31 තෙක් සිනමා ශාලා වැසෙයි

අනුර ප්‍රේමලාල්

දිවයිනේ සියලු සිනමා ශාලා මෙම මස 31 වැනිදා තෙක් තාවකාලිකව වසා තබන බව ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාවේ සභාපති ජයන්ත ධර්මදාස මහතා පවසයි. පිට 06

දරාගත නොහැකි මට්ටමට ආසාදිතයන් වැඩි වීමේ අවදානමක්

රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය

සන්ධ්‍යා කරුණාරත්න

මිනුවන්ගොඩ ඇඟලුම් කම්හල ආශ්‍රිතව වාර්තා වන කොවිඩ් -19 පොකුර හේතුවෙන් සෞඛ්‍ය අංශයට දරා ගත හැකි ධාරිතාව ඉක්මවා යෑමේ දැඩි අවදානමක් ඇති බව රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය ප්‍රකාශ කරයි. පිට 06

යාපනය සරසවියේ නවක වධ සිද්ධිය සිව්වන වසරේ 4කගේ පන්ති තහනම්

පිට 06

'ශ්‍රී ලංකා කම්කරු කොංග්‍රසය' නමැති වෘත්තීය සමිතියේ ලක්ෂ 39ක මුදල් පරිහරණය

මහින්දානන්ද කිසිම වරදක් කර නෑ

රහස් පොලීසියේ විශ්‍රාමික පොලිස් පරීක්ෂක පද්මසිරි ඩයස්

පිට 06

පරිසර විනාශ වාර්තා කරන මාධ්‍යවේදීන් රැකීම රජයේ යුතුකමක්

අමෝදා ජයමහ

පරිසර විනාශයන් වාර්තා කරන මාධ්‍යවේදීන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම රජයේ ප්‍රධාන යුතුකමක් හා වගකීමක් ලෙස සලකන බව පරිසර අමාත්‍ය මහින්ද අමරවීර මහතා පැවසුවේය. පිට 06

ආණ්ඩුව පත් වී වසරක් ගියත්
මහජනතාවට වුණු සෙතක් නෑ

ලොකු ලූනු කිලෝවකට රු.100ක සහතික මිලක්

ජයසිරි මුණසිංහ

ලොකු ලූනු කිලෝවක් රුපියල් 100ක සහතික මිලකට මිල දී ගැනීමට රජය තීරණය කොට ඇත. පිට 06

ලේක් හවුස් ආයතනයේ අපි ඔබගේ ආරක්ෂාව වෙනුවෙන් පහත පූර්වෝපායන් අනුගමනය කර ඇත්තෙමු.



කොවිඩ් අවදානමක් තිබුණත් ජාතික ආරක්ෂාවේ කිසිදු අඩුවක් වන්නේ නෑ

යුද හමුදාපති ලුතිතන් ජෙනරල් ශවේන්ද්‍ර සිල්වා

දිලංක ගුණතිලක

කොවිඩ් ආසාදිතයන්ගේ ආශ්‍රිතයන් සෙවීමට බුද්ධි අංශ මාර්ගයෙන් සිදු කිරීමෙන් ජාතික ආරක්ෂාවට කිසිදු අඩුවක් සිදු නොවන බව ආක්ෂක මාණ්ඩලික ප්‍රධානී සහ යුද හමුදාපති ලුතිතන් ජෙනරල් ශවේන්ද්‍ර සිල්වා මහතා පැවසීයය.

වැඩිදුරටත් අදහස් දැක්වූ යුද හමුදාපතිවරයා මෙසේද පැවසීය.

ජාතික ආරක්ෂාව කියන්නේ හමුදාව තුවක්කු අරගෙන ගිහින් කරන වැඩක් විතරක් නොවේ. ජාතික ආරක්ෂාවට කොටස් කීපයක් තියෙනවා. ආහාර සුරක්ෂිතතාව, බලශක්ති සුරක්ෂිතතාව, දේශපාලන ආරක්ෂාව, යුදමය ආරක්ෂාව, පාරිසරික ආරක්ෂාව, සයිබර් ආරක්ෂාව වගේ කොටස් ගොඩක් තියෙනවා. හමුදාවන් සිදු කරන කොටස ආරක්ෂාවේ එක් කොටසක් පමණයි.

ජාතික ආරක්ෂාව යටතේ තමයි සෞඛ්‍ය ආරක්ෂාවත් තියෙන්නේ. මේ කොවිඩ් වයිරසයත් රටේ සෞඛ්‍ය ආරක්ෂාව සම්බන්ධ ප්‍රශ්නයක්. ඉතින් අපිට හැකියාවට තියෙනවා මේ සියලුම ආකාරයේ ආරක්ෂාවන් සපයන ගමන් හමුදාමය ආරක්ෂාව සපයන ගමන්ම ජාතික ආරක්ෂාවේ වැදගත්ම කොටසක් වෙන සෞඛ්‍ය ආරක්ෂාව සම්බන්ධයෙන් ඇතිවෙලා තියෙන තත්ත්වයට මුහුණ දෙන්න සහ ඒ සඳහා අවශ්‍යය දේ කරන්න. අපි මේ කිසිදු දේක හිඩැසක් තියන්න කටයුතු කරන්නේ නැහැ. හේතුව මීට අවුරුද්දකට කලින් ඇති වුණාවගේ තත්ත්වයක් යළි මේ රටේ අපි ඇති කරන්න සූදානම් නෑ. කිසිම වේලාවක අද පවතින ආණ්ඩුව යටතේ අතිගරු ජනාධිපතිතුමා සන්නද්ධ සේනාධිනායකයා වශයෙන් කටයුතු කරනවා. ත්‍රිවිධ හමුදාව සක්‍රියව ඉන්නවා. ඒ නිසා කවුරු හරි හිතනවා නම් මේ කොවිඩ් වයිරසය පැතිරියාමත් එක්ක ඇතිවෙලා තියෙන තත්ත්වයත් එක්ක ජාතික ආරක්ෂාවේ යම් අඩුපාඩු ඇතිවෙයි කියලා, ඒහෙම දෙයක් කිසිසේත්ම වෙන්නේ නෑ කියලා කියන්න පුළුවන්.

ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති දේශබන්දු කියා ඇමතුම් දුන් පුද්ගලයාට වැඩ වරදී

සුභාෂිණී සේනානායක

බස්නාහිර පළාතේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් මහතා බව පවසමින් පොලිස් ස්ථාන ඇතුළු ස්ථාන කිහිපයකට රැකියා ලබා දෙන ලෙස ඉල්ලීම් කළ බව කියන සැකකරුවෙක් ලබන 29 දක්වා රක්ෂිත බන්ධනාගාර ගත කරන ලෙස කොටුව මහේස්ත්‍රාත් ප්‍රියන්ත ලියනගේ මහතා ඊයේ (15) නියෝග කළේය.

මහේස්ත්‍රාත්වරයා මෙම නියෝගය සිදු කළේ කොල්ලුපිටිය පොලිසිය අධිකරණයට ඉදිරිපත් කළ අවුරුදු 65ක් පමණ වයසැති රාගම පදිංචි කරුවෙකි.

පොලිස් අධිකාරිවරුන්ට, වංචා විමර්ශන කොට්ඨාසයට පොලිස් ස්ථාන කිහිපයකට මෙම පුද්ගලයා දුරකතනයෙන් අමතා තමා දේශබන්දු තෙන්නකෝන් බව අඟවමින් උපදෙස් දී ඇත.කොල්ලුපිටිය පොලිස්ථානාධිපතිවරයා වෙතද ඇමතුමක් ලබා දී ඇති බවත් පොලිස්ථානාධිපතිවරයා තෙන්නකෝන් මහතා සමඟ රාජකාරි කර ඇති නිසා මෙම ඇමතුම හඳුනාගත බවත් අධිකරණයට දන්වා සිටියේය.

ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති දේශබන්දු මහතාගේ උපදෙස් මත පුළුල් විමර්ශනයක් ආරම්භ කළ බව පොලිසිය අධිකරණයට දන්වා සිටි අතර සිද්ධිය සම්බන්ධයෙන් විමර්ශන සිදු කර ඉදිරි දින අධිකරණයට දන්වා සිටින ලෙස මහේස්ත්‍රාත්වරයා පොලිසියට නියෝග කළේය.

කොග්ගල ආයෝජන කලාපයේ කොරෝනා ආසාදිතයකු හමුවී නෑ

දකුණු පළාත් සංචාරක

කොග්ගල ආයෝජන ප්‍රවර්ධන කලාපයේ කිසිම කම්හලකින් කොරෝනා ආසාදිතයකු හමුවී නැතැයි හබරාදුව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී වෛද්‍ය පමෝද සිරිවර්ධන මහතා ඊයේ (15) පැවසීය. එහෙත් කොග්ගල බ්‍රැන්ඩික්ස් ඇඟලුම් කම්හලේ සේවක සේවිකාවන් සඳහා ඊයේ (15) පි .සී. ආර්. පරීක්ෂණ පැවැත්වීමට නියමිතව ඇති බව වෛද්‍ය සිරිවර්ධන මහතා සඳහන් කළේය.

මේ අතර මිනුවන්ගොඩ ඇඟලුම් කම්හලේ සේවක සේවිකාවන් 901 දෙනෙකු කොග්ගල සංචාරක හෝටලයක පවත්වා ගෙන යන නිරෝධායන මධ්‍යස්ථානය වෙත යොමු කොට ඇති බවත් එම පිරිසෙන් 251 දෙනෙකුට ඊයේ වන විට කොරෝනා වෛරසය ආසාදනය වී ඇති බව තහවුරු වී ඇතැයි සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිවරයා වැඩි දුරටත් පැවසිය.

එම ආසාදිතයන් වැඩිදුර ප්‍රතිකාර සඳහා රෝහල් වෙත ගෙන ගොස් තිබේ.

මදුරු මර්දන සතිය ඇරැඹේ

අමෝදා ජයමහ

ජාතික මදුරු මර්දන සතිය ඔක්තෝබර් මස 14 සිට 20 දක්වා යෙදී ඇත.

වැසි සමය එළැඹීමත් සමඟ දිවයිනේ ප්‍රදේශ ගණනාවක මදුරු ගහනයේ වැඩිවීමක් පෙන්නුම් කරන බවට වර්තා වී ඇත.

පරිශ්‍ර ගණනාවක මදුරුවන් බෝ වන ස්ථාන බහුලව පවතින බව හඳුනාගෙන ඇති අතර හඳුනාගත් අධි අවදානම් සහිත සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල බල ප්‍රදේශ 147ක් හඳුනාගෙන විශේෂ මදුරු මර්ධන වැඩසටහන් දීප ව්‍යාප්තව ක්‍රියාත්මක වෙමින් පවතී.

කොවිඩ්-19 වසංගත රෝගය හේතුවෙන් කොළඹ, කළුතර, ගම්පහ සහ පුත්තලම යන දිස්ත්‍රික්ක වල මේ වැඩසටහන ක්‍රියාත්මක නොවේ. 1980 දශකයේ සිටම ශ්‍රී ලංකාව තුළ ඩෙංගු රෝගයේ විටින් විට වර්ධනය වන ආකාරය දක්නට ලැබී තිබේ. මේ වන විට 2020-10-12 වන විට ශ්‍රී ලංකාව තුළ ඩෙංගු රෝගීන් 27,986ක් වාර්තා වී තිබේ.නමුත් පසුගිය වසරේ අදාළ කාලයට සාපේක්ෂව මේ තත්ත්ව 50%ක ආසන්න අඩු වීමක් පෙන්නුම් කෙරේ. උතුරු නැඟෙනහිර ප්‍රදේශවල ඩෙංගු රෝගීන් වැඩි වශයෙන් වාර්තා වන අතර ඉදිකිරීම් පරිශ්‍ර තුළ මදුරුවන් බෝ වීමට වැඩි අවදානමක් ඇත.

බොරු තොරතුරු දී හම්බන්තොට මහ රෝහලට ඇතුළු වූ පුද්ගලයාට කොවිඩ්

අම්බලන්තොට සමූහ

තිස්සමහාරාම ප්‍රදේශයේ නිරෝධායනය කර සිටි පුද්ගලයකු රහසිගතව වෙනත් රෝග ලක්ෂණ සඳහන් කරමින් හම්බන්තොට මහ රෝහලට ප්‍රතිකාර සඳහා ඇතුළු වී සිටිය දී එම තැනැත්තා කොවිඩ් ආසාදිතයකු බවට තහවුරු වී තිබේ.

අදාළ පුද්ගලයා තිස්සමහාරාම සේනපුර ප්‍රදේශයේ පදිංචි වයස අවුරුදු 32ක පමණ පුද්ගලයකු වන අතර ඔහු පසුගිය 12 වැනිදා ස්වයං නිරෝධායනයට ලක්කිරීමෙන් පසු 13 වැනිදා PCR පරීක්ෂණය සඳහා යොමු කර ඇත. උදරයේ අමාරුවක් ඇති වී ඇති බව පවසමින් 1990 ගිලන්රථයක් මඟින් 13 වැනි දා රාත්‍රී හම්බන්තොට මහ රෝහලට පැමිණ ඇති අතර එහිදී අදාළ රෝගියා 18 වැනි වාට්ටුවට ඇතුළත් කර තිබේ.

කෙසේ නමුත් 14 වැනි දින අදාළ රෝගී තැනැත්තා කොවිඩ් අසදිතයකු බවට සිදු කර තිබූ PCR පරීක්ෂණ මඟින් ද තහවුරු වීමත් සමඟ ඔහු පිළිබඳ සෙවීමේදී අසත්‍ය තොරතුරු ලබාදෙමින් හම්බන්තොට මහරෝහලට ඇතුළත් වී ඇති බවට කරුණු අනාවරණය වී තිබේ.

එමෙන්ම අදාළ රෝගී පුද්ගලයා යාල ජාතික වනෝද්‍යානය ආසන්නයේ ඇති හෝටලක සංචාරක මග පෙන්වන්නකු ලෙස කටයුතු කර තිබෙන අතර කොළඹ ඇතුළු ප්‍රදේශ කීපයකින් පැමිණි අය සඳහා මොහු විසින් මඟ පෙන්වා තිබේ. එහිදී එම පැමිණි අයෙකුගෙන් මොහුට මෙම රෝගය ආසාදනය විද යන්න සෙවීම සඳහා සෞඛ්‍ය අංශ පරීක්ෂණ මෙහෙයවනු ලබයි.

කෙසේ නමුත් අදාළ ආයතනයේ මොහු සමඟ ආයතනය තුළ සේවකයන් 61 ක් හා පිටත සේවකයින් 61 දෙනෙකු සිටින බවත් ආයතනය ඇතුළත සේවකයන් ඒ තුළම මෙන්ම අනෙකුත් සේවකයින් ඔවුන්ගේ නිවෙස් තුළම නිරෝදායනයට ලක්කර තිබේ. එමෙන්ම හම්බන්තොට මහරෝහලේ ඔහුට ප්‍රතිකාර කළ සෞඛ්‍ය කාර්ය මණ්ඩලයේ 8 දෙනකු පමණ නිරෝධායනයට ලක් කිරීමට රෝහල් බලධාරීන් කටයුතු කර තිබේ.

අදාළ කොරෝනා අසාදිත රෝගියා මේ වනවිට හම්බන්තොට පැරණි රෝහල තුළ ස්ථාපිත කර තිබෙන කොරෝන රෝගී ප්‍රතිකාර ඒකකය වෙත ඇතුලත් කර තිබේ.

මේ සම්බන්ධයෙන් තොරතුරු දැනගැනීම සඳහා හම්බන්තොට දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂිකා වෛද්‍ය ඒ.වී.එම්.ඩී.පටබැදිගේ මහත්මිගෙන් විමසීමකදී එතුමිය කියා සිටියේ ඒ සම්බන්ධයෙන් තොරතුරු සෞඛ්‍ය ලේකම්වරයාගෙන් ලබා ගන්නා ලෙසයි.

බලපත්‍ර නැතිව පවත්වාගෙන ගිය බීඩි නිෂ්පාදනාගාරය වටලා සැකකාරියක් අත්අඩංගුවට

නිමල් රාජපක්ෂ

කනන්විල හොරගස්හන්දිය ප්‍රදේශයේ දී බලපත්‍ර නොමැතිව පවත්වාගෙන ගිය බීඩි නිෂ්පාදනාගාරයක් වටලා රුපියල් ලක්ෂ අටක් වටිනා බීඩි තොගයක් සමගින් එක් සැකකාරියක් පෙරේදා හොරණ සුරාබදු නිලධාරීන් අත්අඩංගුවට ගෙන ඇත.

අත්අඩංගුවට ගත් බීඩි නිෂ්පාදනාගාරයේ තිබි නීති විරෝධී ලෙස නිෂ්පාදනය කළ බීඩි 150,000 ක තොගයක් සොයා ගත් බව සුරාබදු මාධ්‍ය ප්‍රකාශක ,සුරාබදු කොමසාරිස් නීති ක්‍රියාත්මක කිරීමේ කපිල කුමාරසිංහ මහතා පවසයි.

අත්අඩංගුවට පත්වූ මෙම බීඩි තොගයේ තනි බීඩි, බීඩි මිටි සහ බීඩි පැකට් වශයෙන් තිබුණු අතර එම බීඩි සියල්ල පෙරේදා (14) සහකාර සුරාබදු කොමසාරිස් (බ.ප II) බී.ඒ දයාරත්න, යටතේ කළුතර සුරාබදු අධිකාරි ගාමිණීරත්න ප්‍රනාන්දු යන මහත්වරුන්ගේ අධීක්ෂණය යටතේ විනාශ කැර ඇත. අත්අඩංගුවට ගත් 50 හැවිරිදි සැකකාරිය බස්නාහිර පළාත භාර සහකාර සුරාබදු කොමසාරිස් (II) බී.ඒ දයාරත්න මහතා වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව රුපියල් 25,000/= ක දඩ මුදලක් ගෙවන ලෙස නියම කර ඇත.

සුරාබදු කොමසාරිස් ජනරාල් ඒ. බෝදරගම මහතාගේ උපදෙස් පරිදි සුරාබදු කොමසාරිස් කපිල කුමාරසිංහ ,බස්නාහිර පළාත භාර සහකාර සුරාබදු කොමසාරිස් (II) බී.ඒ දයාරත්න,කළුතර සුරාබදු අධිකාරි ගාමිණීරත්න ප්‍රනාන්දු යන මහත්වරුන්ගේ මෙහෙයවීමෙන්,හොරණ සුරාබදු ස්ථානයේ සුරාබදු පරීක්ෂක කහටපිටිය , සුරාබදු සැරයන්වරුන් වන 631 පෙරේරා, 824 රසික නයනකුමාර, සුරාබදු නියාමකවරුන් වන 951 ජයවර්ධන, 1128 ලක්මාල්, 1164 දමිත රියැදුරු කසුන් යන නිලධාරීහු මෙම වැටලීම සිදු කළහ.

SINCE 1978 42nd OBSERVER MOBITEL SCHOOL CRICKETER OF THE YEAR 2020
Recognizing talent, inspiring greatness.
Sri Lanka Telecom Mobitel

42 වන ඔබ්සවර් - මොබිටෙල් වඩාත් ජනප්‍රියතම පාසල් ක්‍රිකට් ක්‍රීඩකයා / ක්‍රීඩිකාව - 2020

ඔබේ ජනප්‍රියතම පාසල් ක්‍රිකට් ක්‍රීඩකයාට / ක්‍රීඩිකාවට මනාපය පළ කර ඔහුව / ඇයව වසරේ ඔබ්සවර් - මොබිටෙල් වඩාත් ජනප්‍රියතම පාසල් ක්‍රිකට් ක්‍රීඩකයා / ක්‍රීඩිකාව කිරුළ දක්වා රැගෙන යන්න.

☐ **වඩාත්ම ජනප්‍රියතම පාසල් ක්‍රිකට් ක්‍රීඩකයා 2020**

ශ්‍රී ලංකා පාසල් ක්‍රිකට් සංගමය මගින් පවත්වනු ලබන 2019/2020 වයස අවු. 19 න් පහළ "පළමු, දෙවන සහ තෙවන කාණ්ඩ" අන්තර් පාඨශාලයීය තරඟාවලීන්හි දී තරඟ වදින ක්‍රිකට් ක්‍රීඩකයින්, මනාප ලැබීමට සුදුසු වේ.

☐ **වඩාත් ජනප්‍රියතම පාසල් ක්‍රිකට් ක්‍රීඩිකාව 2020**

ශ්‍රී ලංකා පාසල් ක්‍රිකට් සංගමය මගින් පවත්වනු ලබන 2019/20 වයස අවු. 19 න් පහළ "සමස්ත ලංකා අංශයේ" අන්තර් පාඨශාලයීය තරඟාවලීන්හි දී තරඟ වදින ක්‍රිකට් ක්‍රීඩිකාවන් මනාප ලැබීමට සුදුසු වේ.

ඔබේ ක්‍රීඩකයා : .....

අංශය: පළමු කාණ්ඩය ☐ දෙවන කාණ්ඩය ☐ තෙවන කාණ්ඩය ☐

සමස්ත ලංකා ක්‍රීඩිකාව: .....

(එක් කූපනයක් එක් ක්‍රීඩකයෙකුට / ක්‍රීඩිකාවකට පමණක් වලංගු වේ)

පාසල : .....

ඔබේ නම : .....

ලිපිනය : .....

ජංගම දුරකථන අංකය : .....

SUNDAY OBSERVER

vote.schoolcricketer.lk වෙත පිවිසීමෙන්ද ඔබගේ මනාපය ප්‍රකාශ කළ හැක.

කූපන්පත් එවා සතිපතා ත්‍යාග දිනාගන්න.

ප්‍රථම ත්‍යාගය : Mobitel 4G Wi-Fi router **දෙවන ත්‍යාගය** : රු. 2,500/-
තෙවන ත්‍යාගය : රු. 1,500/- **හතරවන ත්‍යාගය** : රු. 1,000/-

42 වන ජනප්‍රියතම පාසල් ක්‍රිකට් ක්‍රීඩකයා / ක්‍රීඩිකාව නම් කිරීමේ තරඟාවලිය දැන් ආරම්භ කර ඇත. සම්පූර්ණ කරනලද ඉහත කූපනය ක්‍රීඩා සංස්කාරක, සන්ඩේ ඔබ්සවර්, ලේක්හවුස්, කොළඹ 10 වෙත තැපැල් කරන්න.

කොන්දේසි :

1) එක් කූපනයක් එක් ක්‍රීඩකයෙකුට / ක්‍රීඩිකාවකට පමණක් වලංගු වේ.
2) ලේක්හවුස් හෝ මොබිටෙල් ආයතනයේ සේවක / සේවිකාවන්ගේ දූ දරුවන්ට තරගයට සහභාගි විය නොහැක.
3) ජයග්‍රහණය කරනු ලබන අයට මුදල් / කුසලාන හා සහතිකපත් හිමි වේ. සෑම කූපනයකම එක් ක්‍රීඩකයෙකු පමණක් නම් කළ හැකි අතර, එය එක් තරඟ වාරයක් සඳහා පමණක් වලංගු වේ. තරඟාවලියේ අවසාන තීරණය සන්ඩේ ඔබ්සවර් ක්‍රීඩා සංස්කාරක සතු වේ.

දිනය 2020-10-17 **අංකය** 32

UNLIMITED YouTube HD quality up to 25GB*
මාසෙටම රු.249+බදු
#170# අමතන්න
4G LTE
Sri Lanka Telecom Mobitel

නීති විරෝධීව ධීවර කර්මාන්තයේ යෙදුණු පුද්ගලයෝ 28ක් නාවික හමුදා භාරයට

මහින්ද අලුත්ගෙදර

නීති විරෝධී ලෙස ධීවර කර්මාන්තයේ යෙදුණ පුද්ගලයින් 28 ක් නාවික හමුදා භාරයට ගෙන තිබේ.

ඒ අනුව පසුගිය සති දෙකක කාලය තුළ නාවික හමුදාව න් උතුරු මැද, නැඟෙනහිර, උතුර සහ බටහිර නාවික විධානයන්හි සිදුකල සෝදිසි මෙහෙයුම්වල දී නීති විරෝධී ලෙස ධීවර කර්මාන්තයේ නියැලුනු පුද්ගලයින් 28ක් තම භාරයට ගත් බව නාවික හමුදා මාධ්‍ය අංශය පවසයි.

උතුරුමැද නාවික විධානය තෙවම්පිඩිඩි සහ අච්චානකුලම් ප්‍රදේශයට ඔබ්බෙන් වූ මුහුදු ප්‍රදේශයේ සිදුකල මෙහෙයුම් දෙකක දී තහනම් දැල් භාවිතාකර ධීවර කර්මාන්තයේ යෙදුනු පුද්ගලයින් 7ක්, ධීවර යාත්‍රා දෙකක් සහ තහනම් ධීවර දැල් දෙකක් ඇතුළු තවත් ධීවර ආම්පන්න කිහිපයක් නාවික හමුදා භාරයට ගෙන තිබෙන අතර, තලෛමන්නාරම ඌරුමලේ ප්‍රදේශයේ දී මුහුදු කුඩැල්ලන් කිලෝග්‍රෑම් 18කට අධික ප්‍රමාණයක් බලපත්‍ර නොමැතිව ප්‍රවාහනය කරමින් සිටි තවත් පුද්ගලයෙක් නාවික හමුදා භාරයට ගෙන තිබේ.

නැඟෙනහිර නාවික විධානය විසින් සල්පෙආරු හා ත්‍රිකුණාමලයට ඔබ්බෙන් වූ මුහුදු ප්‍රදේශයේ සහ මඩකළපුව කොටුවමඩ ප්‍රදේශයේ සිදුකළ මෙහෙයුම් මඟින් තහනම් ධීවර දැල් භාවිතා කරමින් ධීවර කර්මාන්තයේ යෙදුනු පුද්ගලයින් 12ක්, ඩිංගි යාත්‍රා 03ක් සහ තහනම් දැල් දහයක් නාවික හමුදා භාරයට ගෙන ඇත.

උතුරු නාවික විධානය විසින් මණ්ඩතිව් ගුරුනගර් ජැටියට ඔබ්බෙන් වූ මුහුදු ප්‍රදේශයේ දී වලංගු ධීවර බලපත්‍ර නොමැතිව මුහුදු කුඩැල්ලන් අල්ලමින් සිටි පුද්ගලයින් සිව්දෙනෙක්, ඩිංගි යාත්‍රාවක්, ඔවුන් විසින් අල්ලන ලද මුහුදු කුඩැල්ලන් සහ අනෙකුත් ධීවර ආම්පන්න නාවික හමුදා භාරයට ගෙන ඇති අතර, කරෙයිනගර් සෙයිනෝර් ජැටිය අසළ මුහුදු ප්‍රදේශයේ දී බලපත්‍ර නොමැතිව ධීවර කටයුතු සිදුකළ තවත් පුද්ගලයින් දෙදෙනෙක්, ඔරුවක් සහ තහනම් දැලක් නාවික හමුදා භාරයට ගන්නා ලදි.

බටහිර නාවික විධානය දියවන්නා ඔයේ තහනම් දැලක් භාවිතා කරමින් මසුන් අල්ලමින් සිටි පුද්ගලයින් දෙදෙනෙක්, ඔරුවක්, අල්ලන ලද මසුන් කිලෝග්‍රෑම් 12ක් සහ තහනම් දැලක් නාවික හමුදා භාරයට ගැනීමට පියවර ගෙන ඇත.

මෙලෙස නාවික හමුදා භාරයට ගත් පුද්ගලයින් වයස අවුරුදු 19ත් 57ත් අතර වයසේ පසුවන සිලාවතුර,මුලන්කාවිල්, මන්නාරම, එරක්කන්ඩි, නිලාවෙලි, කින්නියා, ගුරුනගර්, කයිට්ස් සහ රාජගිරිය යන ප්‍රදේශවල පදිංචිකරුවන් බවට හඳුනාගත් අතර, අදාල සැකකරුවන්, ධීවර යාත්‍රා, තහනම් දැල් සහ අනෙකුත් ධීවර ආම්පන්න ඉදිරි පරීක්ෂණ කටයුතු සඳහා මන්නාරම, ත්‍රිකුණාමලය සහ මඩකළපුව සහකාර ධීවර අධ්‍යක්ෂක කාර්යාල වෙතත් කුච්චවේලි, ගුරුනගර් සහ කයිට්ස් ධීවර පරීක්ෂක කාර්යාලය වෙතත් සහ බත්තරමුල්ල ජාතික ජලජීවී වගා සංවර්ධණ අධිකාරි කාර්යාලය වෙතත් භාරදීමට පියවර ගෙන තිබේ.



අපනයන සංඛ්‍යාවෝල මිල ගණන්

2020.10.13 දිනෙන් අවසන්වූ සතිය තුළ සැරවති සංඛ්‍යාත මිල (මිලියන් ශ්‍රැණියට රුපියල්)

වෙරළය	ප්‍රභේදය	මිනිකුරා	මිනිකුරා	ලුණුවැලිය	කොහුමල	රන්කලා	රිදීමල	ලුණුකණකලු	කොටලමල	කන්නිමල	කුක්කිරිමල	කන්මල	මිනිකටු	කණිකරන්කොට	කණිකරන්කොට
සුරබදු	Alba					3,033	-	-	-	-	2,865	3,050	2,838	-	-
	C-5 Sp					2,616	-	-	2,400	-	2,490	2,480	2,538	-	-
	C-5					2,516	-	-	2,300	-	2,383	2,335	2,340	2,300	-
	C-4					2,133	-	-	2,130	-	2,167	2,240	2,264	2,236	-
	N-5					1,850	-	-	-	-	1,565	-	2,225	-	-
	N-4					1,850	-	-	-	-	1,860	-	2,190	-	-
	H-1					1,700	-	-	2,100	-	1,663	2,140	2,171	2,176	-
සම්මිශ්‍රවන්	1 ශ්‍රේණිය	566	557	555	583	535	564	583	551	-	586	555	549	566	568
	2 ශ්‍රේණිය	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-
සරාමු 1 ශ්‍රේණිය		816	819	802	782	862	898	856	962	-	570	825	888	867	900
කොටි 1 ශ්‍රේණිය		739	750	775	800	725	790	758	732	-	765	725	693	731	630
කොකෝවා 1 ශ්‍රේණිය		370	403	-	325	-	325	330	-	-	-	-	-	-	380
කරදමුණු ගුණා ගිනි		13,000	14,800	-	-	-	-	12,006	-	-	-	-	-	-	-
කාදිස්සා 1 ශ්‍රේණිය		663	667	575	600	-	-	615	-	-	-	500	-	-	-
එලතාවනි 1 ශ්‍රේණිය		3,413	3,333	2,700	3,250	-	-	3,450	-	-	-	4,200	-	-	-
ගුලුනෑ පොලු 1000යි		-	-	-	-	-	-	2,006	-	-	-	-	-	-	-
පුවක් කරන්නා සි.ගු.1යි		616	791	700	716	575	616	832	613	-	633	650	641	656	580

විශේෂාංශය	බ' පොට	ර' පුර	කහුණු	මිනිසා
සුරාබදු පොලු පොල් (සි.ගු./රු.)	-	-	4,150	4,000
සාමාන්‍ය පොල් (සි.ගු./රු.)	2,867	0	-	2,500

වැඩි විස්තර සඳහා අපනයන වෙළඳ අවේදියට පිවිසෙන්න - www.dcs.gov.lk

තක්ෂිලේදුන ආංශය, අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, 1096, කුවර පාර, පේරාදෙණිය
අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව - ආනයිට සරු පොට දිනකට

☎ 081 2388651

බන්ධනාගාර රැඳවුවන්ට පොදු දුරකතන සේවයක්

බුද්ධිකා ඉඹුලාන

දැනට පවතින කොවිඩ්-19 තත්ත්වය හේතුවෙන් බන්ධනාගාරගත රැඳවුවන් හමුවීමට ,ඔවුන්ගේ පවුල්වල ඥාතීන්ට අවස්ථාව අහිමි වී ඇති බැවින් එම ඥාතීන් සමඟ කතා බහ කිරීමට බන්ධනාගාරවල සවිකර ඇති පොදු දුරකතන මාර්ග ඔස්සේ රැඳවුවන්ට අවස්ථාව උදා කර දෙන ලෙස බන්ධනාගාර ප්‍රතිසංස්කරණ හා සිරකරුවන් පුනරුත්ථාපන රාජ්‍ය ඇමැතිනී විශේෂඥ වෛද්‍ය සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය බන්ධනාගාර දෙපාර්තමේන්තුවට උපදෙස් ලබා දී තිබේ. එම දුරකතන ඇමතුම් මාසයක කාලයක් පුරා නොමිලේ ලබාදීමට අවශ්‍ය පහසුකම් සලසන ලෙස ඇමැතිනිය ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගමෙන් ද ඉල්ලීමක් කර ඇත. ඒ අනුව අද (16) දින සිට රැඳවුවන්ට සිය නිවෙස් වෙත නොමිලේ ඇමතුම් ලබා ගැනීමට අවස්ථාව හිමිවනු ඇත.

දිවයින පුරා වැව් ගැන පරිගණකගත දත්ත පද්ධතියක්

ප්‍රතිසංස්කරණය කළ යුතු වැව් 5,000ක් තේරීමටත් සැලසුම්

චන්දිමා කරුණාරත්න

සමස්ත වැව් පද්ධතිය වෙනුවෙන් පරිගණකගත දත්ත පද්ධතියක් සකස් කිරීමට සැලසුම් කෙරේ.

වැව් පද්ධතිය වෙනුවෙන් දත්ත පද්ධතියක් සකස් කිරීම හරහා වැව්වල සංවර්ධන කටයුතු මනා සම්බන්ධීකරණයකින් යුතුව සිදු කිරීමට හැකි වන බවත් විද්‍යාත්මක ප්‍රමිතීන් මූලික කර ගනිමින් තාක්ෂණික කරුණුවලට අමතරව පාරිසරික හා සමාජයීය කාරණාවලට ද අවධානය යොමු කරමින් වැව් හා ජලාශවල ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කරන බවත් ග්‍රාමීය කුඹුරු හා ආශ්‍රිත වැව්, ජලාශ හා වාරිමාර්ග සංවර්ධන රාජ්‍ය අමාත්‍ය අනුරාධ ජයරත්න මහතා පැවැසීය.

මෙම වැව් ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියේ දී වැවේ තාක්ෂණික කාරණා, ජල ධාරිතාව වැඩි කර ගන්නේ කෙසේද වැවේ ආරක්ෂාව, වැවේ පැවැත්ම ආදී සියලු කරුණු ගැන අවධානය යොමු කළ යුතු බවත් හෙතෙම අවධාරණය කළේය. සමස්ත වැව් පද්ධතියම අධ්‍යයනය කර මුලින්ම ප්‍රතිසංස්කරණය කළ යුතු වැව් 5,000ක් තෝරා ගැනීම සිදු කළ යුතු බව පැවැසූ රාජ්‍ය අමාත්‍යවරයා ප්‍රාදේශීය කෘෂිකර්ම කමිටුවේ යෝජනා ගැනීම මෙහිදී සිදු කළ යුතු බවත් ඒ හරහා දෛනිකව ගොවිජනතාව මුහුණ දෙන ගැටලු හඳුනාගෙන ඒ අනුව අවශ්‍ය වැඩපිළිවෙළ සකස් කළ යුතු බවත් පෙන්වා දුන්නේය.

වාරි සෞභාග්‍ය වැඩසටහනට සමගාමීව හඳුනාගත් වැව් 5,000ක් ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා කාර්ය සාධන බළකායක් සකස් කර තිබෙන බවත් එය ප්‍රධාන වශයෙන් ගොවිජන සේවා, වන ජීව්, වන සංරක්ෂණ, භූ විද්‍යා, හමුදා ඉංජිනේරු අංශය, ඉඩම් සංවර්ධන සංස්ථාව ආදී ආයතන සම්බන්ධ කර ගනිමින් සකස් කර තිබෙන බවත් පැවැසූ රාජ්‍ය අමාත්‍යවරයා, එම කටයුතු සම්බන්ධව ආයතන වශයෙන් මුණගැසෙමින් සාකච්ඡා සිදු කරන බවත් මේ සියලු කටයුතු වෙනුවෙන් ආයතනවල ප්‍රධානීන්ගේ උපදෙස් හා දැනුම ලබා ගැනීමට අවශ්‍ය බවත් කියා සිටියේය.

ස්වයංපෝෂිත ආර්ථිකයක් ගොඩනැඟීම සඳහා වැව් පද්ධතිය හා ඇළ මාර්ග සංවර්ධනය කිරීමට අවශ්‍ය කටයුතු මේ වන විට දියත් කර තිබේ. උපදේශන මට්ටමින් මේ පිළිබඳ දැනුම තිබෙන පිරිස එකතු කර ගනිමින් නිවැරදි වැඩපිළිවෙළක් දියත් කිරීමට මෙහිදී බලාපොරොත්තු වේ. ඇතැම් දිස්ත්‍රික්කවල වැව් සම්පූර්ණයෙන්ම ප්‍රයෝජනයට ගත නොහැකි තත්ත්වයට පත් වී තිබෙන බව පැවැසූ ජයරත්න මහතා, මේ සංවර්ධන කටයුතු නිවැරදිව කළ යුතු බවත් දිස්ත්‍රික් මට්ටමින් සංවර්ධනය කළ යුතු දේ පිළිබඳව අවධානය යොමු කිරීමට ප්‍රමුඛතා ලැයිස්තුවක් සකස් කර තිබෙන බවත් ප්‍රකාශ කළේය.

සමස්ත වැව් පද්ධතිය වෙනුවෙන් පරිගණකගත දත්ත පද්ධතියක් මෙම අමාත්‍යාංශය මඟින් සකස් කිරීමට බලාපොරොත්තු වන බවත් එය ක්‍රියාත්මක කිරීමේ හැකියාව ගොවිජන සේවා, වාරිමාර්ග ආදී දෙපාර්තමේන්තුවට ලබා දීමේ හැකියාව පවතින බවත් පැවැසූ ඒ මහතා, සමස්ත වැව් පද්ධතිය වෙනුවෙන්ම දත්ත පද්ධතිය සකස් කිරීම හරහා වැව් අයත් වන්නේ ගොවිජන සේවා දෙපාර්තමේන්තුවට ද වාරිමාර්ග දෙපාර්තමේන්තුවට ද මහවැලි අධිකාරියට ද යන්න පිළිබඳව ගැටලු ඇති නොවන බවත් පැහැදිලි කර සිටියේය.

ඉන්දු - ශ්‍රී ලංකා බලශක්ති ගැටලු ගැන සාකච්ඡා

උපාලි කරුණාරත්න

බලශක්ති ක්ෂේත්‍රයේ ඉන්දු - ශ්‍රී ලංකා ද්විපාර්ශික ගැටලු පිළිබඳ සාකච්ඡාවක් බලශක්ති ඇමැති නීතිඥ උදය ගම්මන්පිල සහ ශ්‍රී ලංකාවේ ඉන්දියානු මහ කොමසාරිස් ගෝපාල් බාග්ලේ මහත්වරුන් අතර ඊයේ (15) කොළඹ ඉන්දීය මහ කොමසාරිස් කාර්යාලයේ දී පැවැත්විණි.

බලශක්ති අමාත්‍යාංශයේ ලේකම් කේ. ඩී. ආර්. ඔල්ගා, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සභාපති සුමිත් විජේසිංහ, ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ සභාපති මොහොමඩ් උවයිස් මහත්ම මහත්මීන් ඇතුළු නිලධාරීහු පිරිසක් මේ සඳහා එක්ව සිටියහ.

කොරෝනා තොරතුරු සොයන්න ගිය
පොලිස් නිලධාරීන්ට බාධා කළ බීමත් තරුණයාට වැඩ වරදී

මල්වාන සමූහ

කොරෝනා සම්බන්ධව තොරතුරු සොයා බැලීමට ගිය පොලිස් නිලධාරීන්ගේ රාජකාරි කටයුතුවලට බාධා වන අන්දමින් බීමත්ව හැසිරුණු තරුණයකු බියගම පොලිසිය මඟින් පසුගිය දා (12) බියගම, පේරගස්හන්දිය ප්‍රදේශයේ දී අත්අඩංගුවට ගෙන ඇත.

එම තරුණයා එම ප්‍රදේශයේම පදිංචි අවුරුදු 25 ක් වයසැති තරුණකු වන අතර ඔහු මහර මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමට දැන් කටයුතු කර ගෙන යයි. බියගම පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක ඊ.ඒ.සී.එල්. අමරසේකර මහතා ගේ උපදෙස් අනුව ප්‍රජා පොලිස් ඒකකයේ ස්ථානාධිපති පොලිස් පරීක්ෂක ආර්. එස්. ජයන්ත,පො කො. පනාවල (61817) හා මධුශංක (34270) යන නිලධාරීහු මොහු අත්අඩංගුවට ගත්හ.

ජීව අත්බෝම්බයක් සමඟ සැකකරුවෙක් සහ සැකකාරියක් අත්අඩංගුවට

රක්ෂණ ශ්‍රියන්ත

ජීව අත්බෝම්බයක් සමඟ සැකකරුවෙක් සහ සැකකාරියක් පෙරේදා (14) අවිස්සාවේල්ල පොලිස් වසමේ මානියම්ගම ප්‍රදේශයේ දී අවිස්සාවේල්ල පොලිස් ස්ථානයේ නිලධාරීන් අත්අඩංගුවට ගෙන තිබේ.

අවිස්සාවේල්ල පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් සැක කටයුතු යතුරු පැදියක් නවතා පරීක්ෂාකර ජීව අත්බෝම්බය සමඟ මෙම සැකකරු සහ සැකකාරිය අත්අඩංගුවට ගත් බව පොලිසිය පවසයි.

අත්අඩංගුවට ගත් සැකකරු සහ සැකකාරිය වයස අවුරුදු 30 සහ 28 වයස්වල පසුවන පල්ලෙවෙල සහ අවිස්සාවේල්ල ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ. සැකකරු සහ සැකකාරිය ඊයේ (15) අවිස්සාවේල්ල මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කිරීමට නියමිතව තිබුණි. අවිස්සාවේල්ල පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරයි.

විභාග වංචා සොයා බැලීමට පුළුල් පරීක්ෂණයක් ඕනෑ

ගම්පහ හා කොළඹ සිද්ධි ගැන දැඩි නීති ක්‍රියාමාර්ග ගත යුතුයි

ලංකා ගුරු සංගමය

සිතාරා සේනානි

උසස් පෙළ විභාගය ආරම්භයේදීම විභාග වංචා සිදු වීම සම්බන්ධයෙන් වහාම පුළුල් පරීක්ෂණයක් පවත්වා ඉදිරි දිනවල දී විභාග වංචා සිදුවීම වැළැක්වීමට කටයුතු කළ යුතු බව ලංකා ගුරු සංගමය අවධාරණය කළේය.

ලංකා ගුරු සංගමයේ ප්‍රධාන ලේකම් ජෝසප් ස්ටාලින් මහතා සඳහන් කර සිටියේ, අපොස උසස් පෙළ විභාගයේ ගම්පහ ප්‍රාදේශයේ විභාග මධ්‍යස්ථානයක සහ කොළඹ ප්‍රදේශයේ විභාග මධ්‍යස්ථානයක විභාග වංචා සිදුව ඇති බව මේ වන විට අනාවරණය වී ඇති බවයි. ගම්පහ ප්‍රදේශයේ විභාග මධ්‍යස්ථානයේ දී විභාගයට පෙනී සිටි අපේක්ෂකයා නවීන ඉලෙක්ට්‍රොනික උපකරණයක් විභාග මධ්‍යස්ථානයේ භාවිත කර ඇති බවත් කොළඹ විභාග මධ්‍යස්ථානයේ දී අපේක්ෂකයා ස්මාට් ජංගම දුරකතනයක් භාවිත කරමින් ප්‍රශ්න පත්‍රයක් බාහිර පුද්ගයකු වෙත යවා ඇති අතර, විභාග නිරීක්ෂකයන් එම දුරකතනය ගෙන පරීක්ෂා කිරීමේ දී බාහිර පුද්ගලයකු එම ප්‍රශ්න පත්‍රයට අදාළ පිළිතුරු ජංගම දුරකතනයට දිගින් දිගටම එවා ඇති බවත් අනාවරණය වී ඇති බවත් ඒ මහතා පැවසීය. මෙමඟින් ප්‍රශ්න පත්‍ර පිටවීමක් සිදු වී දැයි වහා සොයා බැලිය යුතු බව ද හෙතෙම කියා සිටියේය.

ස්ටාලින් මහතා වැඩිදුරටත් කියා සිටියේ, මෙය කිසියම් පුද්ගලයකු විභාගයට පෙනී සිටින අපේක්ෂකයකු යොදවා කළ කූට ක්‍රියාවක් ද යන්න පිළිබඳවත් එම පුද්ගලයා තවත් අපේක්ෂකයන්ට මේ ආකාරයෙන් පිළිතුරු යවා තිබේද යන්නත් වහාම සොයා බැලිය යුතු බවයි. මෙවැනි කූටක්‍රි යා සඳහා සිසුන් යොමු කරවන පුද්ගලයන් සම්බන්ධයෙන් දැඩි නීත්‍යනුකූල පියවර ගත යුතු බව ද ලංකා ගුරු සංගමයේ ප්‍රධාන ලේකම්වරයා අවධාරණය කළේය.

පිළියන්දල සිළුමිණි පිරිවෙනේ නිරෝධායනය වන හිමිවරුන්ට දානය දීමේ වැඩසටහනක්

නිරෝධායනය වෙමින් සිටින පිළියන්දල සිළුමිණි පිරිවෙනේ ස්වාමීන් වහන්සේ 69 දෙනාට එම කාලසීමාව සඳහා අවශ්‍ය හීල් දානය, දහවල් දානය, ගිලන්පස සඳහා ඖෂධීය පානයක් මෙන්ම වියළි ආහාර ද්‍රව්‍ය ලබා දීම සහ එම පිරිවෙන් භූමියේ ගොඩනැඟිල්ලක් ඉදිකරමින් සිටි සේවකයන්ට අවශ්‍ය ආහාර හා වියළි ආහාර ද්‍රව්‍ය ලබා දීමේ වැඩසටහනක් දහම් පාසල්, පිරිවෙන් හා භික්ෂු අධ්‍යාපන රාජ්‍ය ඇමැති විජිත බේරුගොඩ මහතාගේ උපදෙස් මත ඊයේ (15) ආරම්භ කෙරෙනි.

සිළුමිණි පිරිවෙනේ නිරෝධයනය වී සිටින ස්වාමීන් වහන්සේලාගේ සුවදුක් විමසීම සඳහා එහි ගිය රාජ්‍ය ඇමැති විජිත බේරුගොඩ මහතා එම පිරිවෙන් විහාරාධිපති පඤ්ඤාලෝක ස්වාමීන් වහන්සේ පෙන්වා දුන් ගැටලුවලට කඩිනම් විසඳුම් ලබා දීමට රාජ්‍ය ඇමැතිවරයා පියවර ගත්තේය. දැනට රට පුරා පිරිවෙන් 820ක් තිබෙන අතර, එම පිරිවෙන්හි වැඩ වසන ස්වාමීන් වහන්සේගේ ආරක්ෂාව උදෙසා සෞඛ්‍යාරක්ෂිත වැඩපිළිවෙළක් ද රාජ්‍ය අමාත්‍යාංශයේ මැදිහත් වීමෙන් ක්‍රියාත්මක කිරීමට මෙහිදී තීරණය වී තිබේ.

Cargills food city

කාගිල්ස් ෆුඩ්සිටි ශාඛාවල මිල අඩු කළා

රු. 100.00 ලොකු ලූනු 1kg*

රු. 85.00 සුදු සීනි 1kg*

රු. 200.00 ටින් කළ මාළු 425g*

අසමසම සති අග දීමනා 50%

දීමනාව වලංගු වන්නේ 2020 ඔක්තෝබර් 16 සිට 18 දක්වා පමණයි.

වටවල තේ 200g

හෝ

මරීනා පිරිසිදු පොල්තෙල් 675ml

රු. 2500 කට වඩා වැඩි බිල්පත් සඳහා*

(*ඉහත භාණ්ඩවල වට්නාකම නොමැතිව) කොන්දේසි සහිතයි. මෙම දීමනාව වලංගු වන්නේ උපරිම ඒකක 1ක් දක්වා පමණයි. එක් පාරිභෝගිකයෙක්ට සිදුකළ හැකි වන්නේ එක ගනුදෙනුවක් පමණි. තොග අවසන් වන තුරු පමණයි.

රු. 8.00 ලීක්ස් 100g

රු. 5.00 පිපිඤ්ඤා 100g

රු. 10.00 තක්කාලි 100g

රු. 5.00 වට්ටක්කා 100g

රු. 5.00 ගස්ලබු 100g

රු. 84.00 කෙලවල්ලා පෙති 100g

මෙම දීමනා Cargills Online සඳහා ද අදාළ වේ

මෙම සේවාව ක්‍රියාත්මක වන්නේ තෝරාගත් ප්‍රදේශවල පමණි

Google play | App Store

QR Code එක scan කර ඩවුන්ලෝඩ් කරන්න හෝ www.cargillsonline.com වෙත පිවිසෙන්න

ඉතිරිය රු. 8.00 රු. 52.00 ප්‍රීමා කොත්තු මී චිකන් රසැති 78g

ඉතිරිය රු. 6.00 රු. 49.00 රයිගම් ඉසි ඉසින පිසින ලුණු 400g

ඉතිරිය රු. 9.00 රු. 51.00 මයිලෝ RTD ටෙට්‍රා පැක් 180ml

ඉතිරිය රු. 10.00 රු. 55.00 ලංකාසෝයි කරි රසැති සෝයා 90g

ඉතිරිය රු. 74.00 රු. 416.00 වටවල තේ 400g

ඉතිරිය රු. 17.00 රු. 153.00 සන්ලයිට් ලෙමන් ඇන්ඩ් රෝස් ඩිටර්ජන්ට් 1kg

ඉතිරිය රු. 18.00 රු. 127.00 සිග්නල් ටූත් පේස්ට් ස්ට්‍රෝං ටීත් 160g

*කොන්දේසි සහිතයි. පාරිභෝගිකයින් අතර සාධාරණ බෙදාහැරීමක් සඳහා මිලදී ගත හැකි උපරිම ප්‍රමාණය කිලෝ 2ක් හෝ ඒකක 2ක් වන අතර තොග ලෙසින් මිලදී ගත නොහැකියි. හැවුම් එළවළු, පලතුරු සහ මාලු සඳහා වට්ටම් 2020 ඔක්තෝබර් 18 දක්වා ද, අනෙකුත් භාණ්ඩ සඳහා වට්ටම් 2020 ඔක්තෝබර් 22 දක්වා ද වලංගු වේ. තොග අවසන් වන තුරු පමණයි.

Cargills food city හෙළ සත ගමන්

Cargills SINCE 1844

දිනමිණ
The Dinamina
1909 ඇරැඹි ශ්‍රී ලංකාවේ ජාතික පුවත්පත

35, ඩී. ආර්. විජයවර්ධන මාවත,
ලේක්හවුස්, කොළඹ.
දුරකතන - 2429429, 2331181, 2421181
ෆැක්ස් - 2429240
(කර්තෘ මණ්ඩලයට පමණයි)
2449069 (පොදු)
ඊ මේල් - editor.dinamina@lakehouse.lk
දැන්වීම් කළමනාකරු - 2429341

2020 ඔක්තෝබර් 16 සිකුරාදා

වෙළෙඳ විප්ජා කපා හැරීම

රටක ආර්ථිකය හැසිරවීම අතිශය දුෂ්කර හා සංකීර්ණ ක්‍රියාවලියකි. පාරිභෝගිකයාට සහන ලැබෙන විට ගොවියා අඬන්න පටන් ගනී. ගොවියාට සහන සලසන විට පාරිභෝගිකයා අඬන්න පටන් ගනී. මේ අතර සමාගම්වල ක්‍රියාකාරිත්වය වෙනම පවතී. අතරමැදියන්ගේ ක්‍රියාකාරිත්වය ද වෙනම පවතී. මේ සියල්ලම තෘප්තිමත් කරන ආර්ථික වැඩපිළිවෙළක් කිසිවකුට නිර්මාණය කළ නොහැකිය. අවම ලෙස පාරිභෝගිකයා හා ගොවියා යම් පමණකින් හෝ තෘප්තිමත් වන ආර්ථික ක්‍රියාවලියක් සැකසිය හැකි නම් අවුලකින් තොරව ආර්ථිකය ගලා යනු ඇත. නැත හොත් ක්‍රියාත්මක වනු ඇත. නිදහස් වෙළෙඳපොළක් පවතින රාජ්‍යයක එවැන්නක් සිදු කිරීම ද ඉතා අපහසුය. එහෙත් එය කළ යුතුය.

ජීවන වියදම් කමිටුවේ රැස්වීමකදී ජනාධිපතිවරයා පෙන්වා දී ඇත්තේ ගොවියා හා පාරිභෝගිකයා තෘප්තිමත් වන ආර්ථික ක්‍රියාවලියක් කෙසේ හෝ ආරම්භ කළ යුතු බවය. ඒ සඳහා ආදර්ශයක් පෙන්වා දුන් ජනාධිපතිවරයා ගොවියා ගසා කන අතරමැදියන්ගේ ක්‍රියාවලිය නවතා දැමීම වැදගත් බව කියා සිටියේය. එය කළ හැක්කේ කෙසේ ද මාර්ග දෙකක් ඇත. පළමු මාර්ගය වන්නේ රජය මැදිහත් වී ගොවියාගේ අස්වැන්න මිලට ගැනීමය. දෙවන මාර්ගය වන්නේ ගොවියාට කෙළින්ම වෙළෙඳපොළ හා සම්බන්ධ විය හැකි අවස්ථාවක් ඇති කිරීමය. දෙවන මාර්ගය වඩාත් ප්‍රායෝගික බව පෙනී යයි. ඊට ගොවි ජනතාව ද එකඟ වනු ඇත.

අතරමැදියන්ගේ ගසා කෑම අපේ වෙළෙඳපොළ තුළ ජයටම සිදු වෙයි. ගොවි බිමට එන අතරමැදියා ඉතා අඩු මිලකට අස්වැන්න කොල්ල කා ගනී. ගොවියා එම මොහොතේ පහසුව තකා අතරමැදියාට හසුවන ආකාරය දැක ගත හැකිය. ඒ හැරත් දුප්පත් ගොවියාට ප්‍රවාහන පහසුකම් නැත. වෙළෙඳපොළ සම්බන්ධතා නැත. මෙහි වාසිය අතරමැදියාට ලැබෙයි. ගොවි බිමට යන අතරමැදියා වටිටක්කා කිලෝව රුපියලකට දෙකකට මිලට ගනී. එය වෙළෙඳපොළ වෙත එන්නේ ගත් මිලට වඩා දහ ගුණයකින්වත් මිල වැඩි කිරීමෙන් පසුවය. මේ ක්‍රමය නිසා එක අතකින් ගොවියා සූරාකෑමට ලක් වෙයි. තව අතකින් පාරිභෝගිකයා සූරාකෑමට ලක් වෙයි.

මේ දිනවල කහ හිඟයක් පවතී. කහ කුඩු ග්‍රෑම් සියයක් රුපියල් හයසියයට අලෙවි කළ අවස්ථා ද වාර්තා වී තිබිණි. කහ හිඟය ඇති වූයේ කහ ආනයනය නවතා දැමීම නිසාය. රටට අවශ්‍ය තරම් කහ කුඩු සැපයිය හැකි යැයි ගොවියා කියනමුත් එය ඉටු වී නැත. කහ ඇතුළු තවත් පාරිභෝගික භාණ්ඩ රැසක් ආනයනය කිරීම නවතා ඇත්තේ දේශීය ගොවීන්ගේ ඉල්ලීම මතය. එහෙත් ඉන් පාරිභෝගිකයා අමාරුවේ වැටී ඇත. මේ නිසා කළු කඩයක් ද බිහි වී ඇත. පොල් සම්බන්ධයෙන් ඇත්තේ තවත් ගැටලුවකි. වාර්ෂික පරිභෝජනයට අවශ්‍ය පොල් ප්‍රමාණය ඇතත් එය වෙළෙඳපොළට එන්නේ නැත.

පොල් ගැටලුව සම්බන්ධයෙන් ක්‍රියාත්මක වන රජය අලුතින් හෙක්ටයාර් ගණනාවක පොල් වගා කිරීමට යයි. එය පොල් ගැටලුවට හොඳ උත්තරයකි. පොල් සංවර්ධන අධිකාරිය හා පොල් වගාකරුවන්ගේ සංගමය ඒකාබද්ධ වී වෙළෙඳපොළ වෙත පොල් ලබා දීමේ අලුත් වැඩසටහනක් ආරම්භ කර ඇත. එයත් හොඳ උත්තරයක් ලෙස සැලකිය හැකිය. පොල් මිල ඉහළ නංවා ඇත්තේ කෘත්‍රිම ලෙස යැයි සිතන්නට කරුණු තිබේ. එය තනිකරම ව්‍යාපාරික උප්පරවැට්ටියකි. මේවා සම්බන්ධයෙන් දැඩි නීති - රීති අනුගමනය කළත් ඊට මහජන විරෝධයක් එල්ල වන්නේ නැත. මේ වන විට පොල් ගැටලුව යම් පමණකට විසඳී ඇති බව පෙනෙයි. කහ පිළිබඳ ගැටලුවට ද එබඳු විසඳුමක් ක්‍රියාත්මක විය යුතුය.

කොවිඩ් අර්බුදය ද සැලැකිල්ලට ගත් රජය අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය හතරක ආනයන බදු කපාහැරීමට පියවර ගත්තේය. එය රටේ සමස්ත ජනතාවට ලබා දුන් සහනයකි. ඒ අනුව ටින් මාළු, පරිප්පු, ලොකු ලූනු හා සීනි අඩු මිලට ගත හැකි විය යුතුය. පාරිභෝගික ජනතාව බදු කපා හැරීම ගැන ප්‍රසාදය පළ කරන අතර, ව්‍යාපාරිකයා පසු වන්නේ වෙනත් මතයකය. රජය කියන පිළිවෙළට ව්‍යාපාර ගෙන යා නොහැකි බවට ඔවුහු තර්කයක් ඉදිරිපත් කරති. බදු කපාහරින්නේ නම් අඩු මිලට භාණ්ඩ අලෙවි කරන්නට බැරිකමක් තිබෙන්නට බැරිය. බදු මුදල අහෝසි වූ පසු ව්‍යාපාරිකයාට අඩු මුදලකට භාණ්ඩ ගැනීමට හැකි වෙයි. එහි වාසිය පාරිභෝගිකයා වෙත ද කාන්දු විය යුතුය.

නිදහස් ආර්ථිකයක් තුළ වෙළෙඳපොළ හැසිරවීම සම්බන්ධයෙන් ආණ්ඩුවකට කළ හැක්කේ සොච්චම් ක්‍රියා මාර්ගයකි. අපි ඊයේ ද මේ තීරුව ඔස්සේ ඒ කරුණ පැහැදිලි කළෙමු. එහෙත් සොච්චම් බලපෑම උපායශීලි ලෙස යොදා ගත හොත් වෙළෙඳපොළ හැසිරීම පිළිබඳ යම් බලයක් රජය වෙත ලබා ගත හැකිය. ජනාධිපතිවරයා පෙන්වා දෙන අන්දමට එම බලපෑම මගින් ගොවියාට හා පාරිභෝගිකයාට යන දෙදෙනාටම සහන ලබා දිය හැකිය. ගොවිතැන ශ්‍රී ලංකාවේ ප්‍රධාන ජීවනෝපායකි. ඒ හැරත් රටේ මුළු ජනගහනයෙන් වැඩි පිරිස කුමන හෝ අංශයකින් කෘෂිකර්මයට දායකත්වයක් සපයති. ඒ අනුව ආර්ථිකයේ ප්‍රධාන තැනක් ගොවියාට හිමි විය යුතුය. ඉන් අර්ථවත් වන්නේ ගොවියාගේ ද අත මිට සරු විය යුතු බවය.

අපට ජාතික ආර්ථික ප්‍රතිපත්තියක් නැතිකමේ පාඩුව මෙබඳු අවස්ථාවලදී හොඳින් පෙනී යයි. ජාතික ප්‍රතිපත්තියක් ඔස්සේ ආර්ථික ක්‍රියාවලියේ නිත්‍යතාවක් ඇති කිරීම වැදගත්ය. එබඳු පසුබිමකදී ආර්ථික වැඩසටහන් වරින්වර වෙනස් කිරීමට අවශ්‍ය වන්නේ නැත. මේ ආපදා අවස්ථාවේ ගොවියා හා පාරිභෝගිකයා යන දෙදෙනාටම සහන අවශ්‍ය වෙයි.

දිල්රුගෙ සිවුර

රට රස්සා අවතැන් වී විදේශ විනිමයත්	අඩුය
සංචාරක කර්මාන්තෙ වයිරසයෙන් කුඩේ	කුඩුය
ඇඟලුම් කර්මාන්තෙටත් වයිරස් කඩු කිනිසි	තුඩුය
අසරණයන් පිට වැටෙන්නෙ දෙයියොත් නොබලනා	නඩුය



19න කණපිට පෙරැළුණු ජනපති බලතල

වෛද්‍ය, නීතිඥ
පාලිත බණ්ඩාර සුබසිංහ

වත්මන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ මේ වන විට විධායක ජනපතිවරුන් හත්දෙනකු රටේ පාලනයට පැමිණ තිබේ. දහනව වැනි ව්‍යවස්ථා සංශෝධනය පැමිණෙන තෙක්ම ජනපතිවරයාගේ බලතල සම්බන්ධයෙන් ප්‍රශ්නයක් මතු වූයේ නම්, ඒ ජනපති බලතල වැඩි වීම සම්බන්ධයෙනි. එහෙත් 19 වැනි ව්‍යවස්ථා සංශෝධනයත් සමඟ එම මතය යම් ආකාරයකට කණපිට පෙරළීමක් සිදු විය. එතැන් සිට මේ දක්වාම වැඩි කතාබහට ලක්වන කාරණය වන්නේ ජනපති බලතල කප්පාදු වීම නිසා අවශ්‍ය මොහොතේ අවශ්‍ය තීරණ ගැනීමට ජනපතිවරයාට අවකාශ නොමැති වීමෙන් රට අර්බුදයකට පත්ව තිබෙන බවය. 20 වැනි ව්‍යවස්ථා සංශෝධනය කරළියට පැමිණ තිබෙන්නේ මෙවැනි පසුබිමකය. මේ වන විට ඒ හා සම්බන්ධ ශ්‍රේෂ්ඨාධිකරණ මතය ජනපතිවරයාට හා කථානායකවරයාට දැනුම් දී ඇත.ජේ.ආර්. ජයවර්ධන මහතා 1978 ගෙනා නව ව්‍යවස්ථාවේ නිරූපිත ජනපති බලතල ඒ ආකාරයෙන්ම ජනපතිවරයාට ලබා දිය යුතු බව පිරිසක් ප්‍රකාශ කරද්දී තවත් පිරිසක් පවසන්නේ 19 වැනි ව්‍යවස්ථා සංශෝධනය මගින් පාර්ලිමේන්තුව සතු කළ ජනපති බලතල යළි ජනපති වෙත පවරා නොදී පාර්ලිමේන්තුව සතුවම පැවැතිය යුතු බවය. මෙම අදහස් දෙකෙන් වඩා හොඳ කුමක් ද සම්බන්ධව සාමාන්‍ය ජනතාවට ඇත්තේ ප්‍රශ්නයකි. විධායක ජනපතිවරයා 19 වැනි ව්‍යවස්ථා සංශෝධනයට පෙර ක්‍රියාත්මක වූ ආකාරයත් ඉන් අනතුරුව ක්‍රියාත්මක වූ ආකාරයත් සම්බන්ධව කිසියම් විශ්ලේෂණයක් සිදු කර ඒ සම්බන්ධව යම් අවබෝධයක් ලබා ගැනීම කාලෝචිත අවශ්‍යතාවක් වී තිබෙන්නේ මෙම පසුබිම තුළය.

■ ත්‍රස්තවාදය පරාජය කිරීම

මෙරට ජනතාව තිස් වසරක් පුරා බැට කෑ ත්‍රස්තවාදය සහමුලින් පරාජය කර රටට සාමය ගෙන ඒමට මහින්ද රාජපක්ෂ මහතාට ශක්තියක් වූයේ විධායක ජනපති ධුරය බව කවුරුත් පිළිගන්නා සත්‍යයකි. ඒ අවස්ථාවේ 19 වැනි ව්‍යවස්ථා සංශෝධනය මගින් නිර්මාණය වූ ආකාරයේ විධායක ජනපති ධුරයක් ක්‍රියාත්මක වී තිබුණේ නම් ත්‍රස්තවාදය පරාජය කිරීම පිණිස සෘජු තීරණ කිසිවක් මහින්ද රාජපක්ෂ මහතාට ගත නොහැකි වනු ඇත. රටේ වාසනාවට එම අවස්ථාවේ මහින්ද රාජපක්ෂ මහතා සේනාධිනායක ලෙස ආරක්ෂක අමාත්‍යාංශය ද තමන් යටතේ තබාගෙන ත්‍රස්තවාදය පරාජය කිරීමේ සටනට නායකත්වය දුන්නේය. ඉන් දස වසරකට පසු පාස්කු ප්‍රහාරයට රට ගොදුරු විය. හිටපු විධායක ජනපතිවරයාගේත් අගමැතිවරයාගේත් කඹ ඇදිල්ල මෙම ප්‍රහාරයට හේතු වූ බව ඒ සම්බන්ධයෙන් ජනපති පත් කළ කොමිසමේදී අනාවරණය වන තොරතුරුවලින් පැහැදිලිය. රටේම ජනතාවගේ බහුතර කැමැත්ත තුළින් විධායක ජනපති ධුරයට පත් විය නොහැකි බව දැන සිටි එජාප නායක රනිල් වික්‍රමසිංහ මහතා 19 වැනි ව්‍යවස්ථා සංශෝධනය ඔස්සේ උත්සාහ කළේ තමන්ට කිසිදා ජනතාව ලබා නොදෙන බලයක් ජනපති මුළා කර ඛැහැ ගැනීමටය. පොදු අපේක්ෂක ලෙස ජනපතිවරණයට ඉදිරිපත් වීමට අවස්ථාවත් ඒ සඳහා එජාපයේ පූර්ණ සහයත් ලබා දෙමින් රනිල් වික්‍රමසිංහ මහතා දැක් වූ සහයෝගයට කෘතගුණ දක්වමින් තම බලතල කප්පාදු කර ගැනීමට මෛත්‍රීපාල සිරිසේන මහතා ද දෙවරක් නොසිතා අවකාශ සලසා දුන්නේය. එහෙත් එවැනි වෙනසක් සඳහා ජනතාව යහපාලන ආණ්ඩුවට තුනෙන් දෙකක බලයක් ලබා නොදුන්නේය.

රට ඒකාධිපතිත්වයක් කරා ගෙන යන විධායක ජනපති ධුරය කප්පාදු කර පාර්ලිමේන්තු බලය තවත් ශක්තිමත් කිරීම මගින් ප්‍රජාතන්ත්‍රවාදය වඩාත් තහවුරු වන බවත්, ස්වාධීන කොමිෂන් සභා මගින් එතෙක් රාජ්‍ය සේවයේ තිබූ දේශපාලන පක්ෂග්‍රාහි බවට තිත තැබෙනු ඇති බවත් මතවාදී ලෙස සමාජගත කරන්නට ජනපතිවරයාගේ හා අගමැතිවරයාගේ අනුග්‍රහය මත ආණ්ඩු පක්ෂය කටයුතු කිරීම තුළින් 19 වැනි ව්‍යවස්ථා සංශෝධනයක අවශ්‍යතාව සමාජය මත බලහත්කාරයෙන් පටවනු ලැබුවේ යැයි පැවසීම එක්තරා අන්දමකින් නිවැරදිය. එලෙස සම්මත වූ 19 වැනි ව්‍යවස්ථා සංශෝධනය වෙනස් කළ යුතු යැයි කියන පිරිස අතර, හිටපු ජනපති මෛත්‍රීපාල සිරිසේන මහතා ද සිටින්නේය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යනු රටේ මූලික නීතියයි. එයට සංශෝධන ගෙන ඒම ආවාට ගියාට කරන්නට යෑමෙන් සිදු වන ව්‍යසනයට හොඳම උදාහරණය පාස්කු ප්‍රහාරයයි. අදටත් එම ප්‍රහාරයේ වගකීම බාර ගැනීමට කෙනකු නොමැත. කොමිසම හමුවේ සාක්කි දෙමින් එකල ප්‍රධාන තනතුරු දැරූ සැවොම කරන්නේ එකිනෙකාට චෝදනා කර ගැනීමය. සහරාන් පිළිබඳ තොරුතුරු කල් තියා දැන සිටියත් ඒ සම්බන්ධයෙන් ක්‍රියාත්මක වීමට නොහැකි වූ කරුණු අතර ප්‍රමුඛ වූයේ යහපාලන ආණ්ඩුවට පාර්ලිමේන්තුවේ බහුතරය ලබා දීමට මුස්ලිම් පක්ෂවල සහය ලබා දී තිබීමය. නැගෙනහිර මුස්ලිම් අන්තවාදයට එරෙහිව ක්‍රියාත්මක වුව හොත් මුස්ලිම් මන්ත්‍රීවරු ආණ්ඩුවෙන් ඉවත්වීම ඔස්සේ ආණ්ඩුව අස්ථාවර වේ යැයි අගමැති රනිල් සිතුවේය. ආණ්ඩු පක්ෂය තම තීරණවලට එරෙහිව කටයුතු කරද්දී අඩුම තරමේ පාර්ලිමේන්තුව විසුරුවා හැරීමේ හෝ හැකියාවක් ජනපතිවරයාට නොතිබිණි.

> **අතීතයේ මෙරට ක්‍රියාත්මක වූ රාජාණ්ඩු ක්‍රමය තුළ විධායකය, ව්‍යවස්ථාදායකය හා අධිකරණය යන තුනම නිරූපණය වූයේ රජතුමාගෙනි. එදා රාජාණ්ඩු සමයේ රට දියුණු තත්ත්වයක පැවතිණි.**

■ පාර්ලිමේන්තුවේ නියෝජනය

පාර්ලිමේන්තුවේ බලය රැක ගැනීමට අගමැතිවරයා ප්‍රමුඛ ආණ්ඩු පක්ෂය ඕනෑම පවාදීමක් කරන්නට සූදානම් වන්නේ නම් එය වැළැක්වීමේ බලයක් ජනපතිවරයාට තිබිය යුතුය. ජනපතිවරයා පත්වන්නේ රටේම බහුතර කැමැත්තෙනි. පාර්ලිමේන්තුව නියෝජනය කරන කිසිදු මන්ත්‍රීවරයකුට එවැනි ජනවරමක් හිමි වන්නේ නැත. අගමැතිවරයා ලෙස පත්වන්නේ එක් එක් දිස්ත්‍රික්කවලින් තමන්ගේ නියෝජිතයන් ලෙස පාර්ලිමේන්තුවට ජනතාව පත් කර එවන මන්ත්‍රීවරුන්ගේ බහුතර කැමැත්ත දිනා ගන්නා පුද්ගලයාය. අගමැතිවරයා ද පාර්ලිමේන්තුවට තේරී පත් වන්නේ දිස්ත්‍රික්කයකට තරග කිරීමෙන් පසුවය. ආණ්ඩුව පිහිටුවන්නට අගමැතිවරයාට සහාය දෙන පක්ෂ හා කණ්ඩායම් එම සහාය ලබා දෙන්නේ නොයෙක් කේවල් කිරීම්වලට යටත්වය. රට ගැන නොසිතා තමන්ගේ බලය ගැන පමණක් සිතා අගමැතිවරයා තීන්දු තීරණ ගන්නේ නම් ඒවා නිවැරදි කිරීමේ බලයක් ජනපති සතු විය යුතුය. අතීතයේ මෙරට ක්‍රියාත්මක වූ රාජාණ්ඩු ක්‍රමය තුළ විධායකය, ව්‍යවස්ථාදායකය හා අධිකරණය යන තුනම නිරූපණය වූයේ රජතුමාගෙනි. එදා රාජාණ්ඩු සමයේ රට දියුණු තත්ත්වයක පැවතිණි. තනි පුද්ගලයකු වෙත බලය කේන්ද්‍රගත වීමෙන් ඇති විය හැකි අවදානම දුරලීම පිණිස අදාළ බලතල අයුතු ලෙස පාවිච්චි කරන අවස්ථාවක එය මැඩපැවැත්වීමට ව්‍යවස්ථාව මඟින්ම ක්‍රියාමාර්ග යෙදීමට පුළුවන.

එසේ නොමැතිව බලය අයුතු ලෙස පාවිච්චි කරනු ඇතැයි අනුමාන කර විධායක ජනපතිවරයාගේ දැත් ගැට ගැසීම රටට හිතකර නොවන බව අප තේරුම් ගත යුතුව තිබේ.

වෙනත් රටවල ආකෘති මේ රටට ගැළපීමට යෑම නුවණ ඇති ක්‍රියාවක් නොවන්නේය. අවාසනාවකට අපේ නායකයන් බොහොමයක් දෙනා ගනු ලබන්නේ එවැනි තීරණය. ඉන්දියාවේ විවිධ ජාතීන්, විවිධ ආගම්කයන් ජීවත් වේ. අපේ රටේත් එසේමය. එසේ වුවත් ඉන්දියාවේ ජීවත් වන සියලු ජාතීන් තමන් ඉන්දියයකු යැයි සිතයි. එහෙත් එවැනි තත්ත්වයක් අපේ රටේ නැත. අපේ ඇතැම් මුස්ලිම් ජාතිකයන් මේ රටේ ජීවත් වුවත් මනස ඇත්තේ පාකිස්තානයේය. එලෙසින්ම ඇතැම් දෙමළ ජාතිකයින්ගේ ශරීරය මෙහි වුවත් මනස පවතින්නේ ඉන්දියාවේය. එක රටක් එක ජාතියක් ලෙස සිතන රටකට විධායක ජනපති ධුරයක් බලයක් සහිතව ක්‍රියාත්මක වීම අවශ්‍ය නොවනු ඇත. එසේ වුවත් රටින් කොටසක් වෙන් කර වෙනත් රාජ්‍යයක් හැදීමට සිහින දකින පිරිස් ක්‍රියාකාරී දේශපාලනයේ සිටින රටකට බලතල සහිත විධායක ජනපතිවරයෙක් අවශ්‍යය ය.

මෙවැනි අදහස් ඇති අය පාර්ලිමේන්තුවට පැමිණ ආණ්ඩුවක් පිහිටුවීම සඳහා ප්‍රධාන පක්ෂයකට සහාය දී තමන්ගේ පටු අරමුණු ඉටු කර ගැනීමට අගමැතිවරයා ප්‍රමුඛ අණ්ඩුවට බලපෑම් කරන අවස්ථාවක එය වැළැක්වීම සඳහා ක්‍රියා කළ හැකි බලයක් සහිත ජනපතිවරයෙක් සිටිය යුතුය. පාර්ලිමේන්තුව විසුරුවා හැරීමේ බලය වසර 4 1/2 ක් යන තුරු ජනපතිවරයාට අහිමි කිරීමෙන් මතුවන අර්බුදකාරී වාතාවරණය යහපාලන ආණ්ඩු සමයේ මෙරට ජනතාව හොඳින් අත්විත්දේය.

■ ස්ථාවර ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

පවතින ව්‍යවස්ථාව අණ්ඩ දැමූ කලිසමකට සමානය. එක් අණ්ඩයක් දමන විට තවත් තැනකින් කලිසම ඉරෙයි. නැතහොත් දැමූ අණ්ඩයක් ලිහී යයි. ජේ.ආර්. ජයවර්ධන මහතා 1978 දී මෙරටට හඳුන්වා දුන්නේ ස්ථාවර ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවකි. එහි පැහැදිලි ලෙස විධායක ජනපති සතු බලතලත් පාර්ලිමේන්තුව සතු බලතලත් දක්වා තිබිණි. විටින් විට පාලනයට පැමිණි පුද්ගලයන්ගේ හා ආණ්ඩුවල අවශ්‍යතා සඳහා එයට සංශෝධන ගෙනාවේය. ඒවා බොහොමයක් රටේ යහපත පිණිස නොව පුද්ගල හෝ පක්ෂවල යහපත පිණිස ගත් තීන්දුය. රටේ යහපත ගැන නොසිතා ඒ ආකාරයෙන් ගන්නා තීන්දු තීරණවලින් සිදු වන්නේ අර්බුද නිර්මාණය වීමය. ඒ අර්බුද රාශියක් මතුවන්නේ ඒ මොහොතේ නොව පසු කාලීනවය. දැන් 19 ඔස්සේ මතුව තිබෙන්නේ ද එවැන්නකි. නව ව්‍යවස්ථාවක් හඳුන්වා දීම හිතන තරම් පහසු කාර්යයක් නොවන්නේය. ඒ සඳහා කාලයක් ගතවනු ඇත. එතෙක් රට සිර කර තැබීම සුදුසු නැත. ජනපති ගෝඨාභය රාජපක්ෂ මහතාට ජනතාව බලය දුන්නේ බොහෝ බලාපොරොත්තු සමඟය. ඒවා ඉටු කිරීමට ඔහුට ශක්තියක් තිබිය යුතුය. නව සැලසුම් ක්‍රියාත්මක කිරීමට ඒ මහතාට ව්‍යවස්ථාවෙන් ඇති වන බාධා ඉවත් කර දීම ඉක්මනින් කළ යුතුය.

■ ආත්මාර්ථය

දේශපාලනඥයන් සිටිය යුත්තේ තම මතය නොව ජනතාවගේ මතය නියෝජනය කිරීමටය. නමුත් අපේ රටේ වැඩිපුර සිදු වන්නේ තම ආත්මාර්ථය උදෙසා ඔවුන් ක්‍රියාත්මක වීමේ ස්වභාවයකි. පාර්ලිමේන්තුව සෑම විටම නිවැරදි තීන්දු ගන්නේ යැයි යන මතයේ සිට අප ක්‍රියා නොකළ යුතුය. රට අර්බුදයකට ගෙන ගිය 19 වැනි ව්‍යවස්ථා සංශෝධනය තුනෙන් දෙකක බහුතරයකින් සම්මත කිරීමට සහය දැක් වූ මන්ත්‍රීවරුන් අතරින් බහුතරය අද එය වෙනස් කළ යුතු යැයි කියන පාර්ලිමේන්තු මන්ත්‍රී කණ්ඩායම නියෝජනය කරති. විසි වන ව්‍යවස්ථා සංශෝධනය 19 සමඟින්ම ගෙන එනු ඇතැයි විශ්වාසයෙන් තමන් ඊට පක්ෂව ඡන්දය දුන් බව මන්ත්‍රීවරු පවසන්නේ 19 මඟින් රටේ ඇතිව තිබෙන අර්බුදයට තමන්ගේ දායකත්වයේ තරම හීන කිරීමේ අදහසින් වන්නට පුළුවන. දහනව වැනි ව්‍යවස්ථා සංශෝධනය සම්මත වූයේ පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක බහුතරයකිනි. එය අහෝසි කිරීමේ අරමුණින් ගෙන එන 20 වැනි ව්‍යවස්ථා සංශෝධනය ද තුනෙන් දෙකක බහුතරයකින් සම්මත කිරීමට හැකියාව තිබිය යුතුය. 19 සම්මත කිරීමට ජනමත විචාරණයකට නොගිය බැවින්ය. 20ට ඇයි ජනමතවිචාරණයක්, යන්න දැන් සාකච්ඡා වෙමින් තිබෙන ප්‍රශ්නයකි. මේ සියලු කාරණා මැද අදාළ ව්‍යවස්ථා සංශෝධනය පසුපස්සට තල්ලු වීම රටට යහපත් නොවන්නේය. කොවිඩ් දෙවන රැල්ල දැන් ක්‍රියාත්මක වෙමින් තිබේ. එය මර්දනය කිරීම එක් පැත්තකින් සිදු වෙද්දී අනෙක් පසින් ව්‍යවස්ථා සංශෝධන ක්‍රියාවලිය අඛණ්ඩව ඉදිරියට යා යුතුය.

ස්වාධීන කොමිෂන් සභා සුදු පිරුවටයක දවටා වන්දනාමාන කළ යුතු ඒවා බවට විපක්ෂය මතයක් ගොඩනඟමින් තිබේ. 19 ආරක්ෂා කිරීමට විපක්ෂය සතුව ඇති එකම තුරුම්පුව එය බව පෙනෙන්නට ඇත. පොලිස් කොමිසම මඟින් උදේ ලබා දෙන මාරුව හවස් වන විට අවලංගු කර ගැනීමට සමත් පොලිස් නිලධාරීන් අපි දැක ඇත්තෙමු. පොලිස් කොමිසමේ ස්වාධීන බව ප්‍රශ්න කරන්නට එයම සෑහෙන්නේය. පාස්කු ඉරුදින ප්‍රහාරය වළක්වා ගැනීමට අසමත් වූ බවට චෝදනා ලද පොලිස්පතිවරයා ඉවත් කිරීමේ හැකියාවක් විධායක ජනපතිවරයාට නැත. මැතිවරණ කොමිසමේ සාමාජිකයකු දේශපාලන පක්ෂයකට එරෙහිව මත ප්‍රකාශ කිරීමෙන් එහි ස්වාධීන බව සම්බන්ධව ද ප්‍රශ්න ඇති විය. මෙතරම් අර්බුද තිබියදී 19 අහෝසි නොකර සිටීම රටට වැදගත් වන්නේ කෙසේද යන්න සම්බන්ධව විපක්ෂය අවංකව රටට ප්‍රකාශ කළ යුතුව තිබේ.

අසේල කුරුළුවංශ

ප්‍රශ්නය

අපට කළ නොහැක්කේ මොනවා ද?

සමාලෝචන

කළ නොහැක්කක් නොමැත

ආර්ථිකය පණගන්වන ධනවාදී ප්‍රවේශයක්

ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා විසින් වසර 27කට පසු අපනයන සංවර්ධන සභාව රැස් කරනු ලැබූ බවත් අපනයනය ඉලක්ක කොට ගත් නිෂ්පාදන ක්‍රියාවලියක් රටේ ක්‍රියාත්මක කිරීමට තීරණය කළ බවත් මාධ්‍ය මගින් ප්‍රචාරය කෙරිණි. ඇත්තෙන්ම රටේ අනාගතයට බලපාන මෙවැනි පුවතක් විද්‍යුත් සහ මුද්‍රිත මාධ්‍ය මගින් ප්‍රචාරණය වූවා ප්‍රමාණවත් නොවේ.

ජනාධිපතිතුමාගේ වැඩපිළිවෙළේ අපනයනය ප්‍රමුඛ කරගත් ජාතික ආර්ථිකය දීර්ඝ කාලීන සිහිනයක්ව පැවතිණි. මෙහිදී විවිධ අපනයන කලාප ඇති කරනු වෙනුවට මුළු රටම අපනයන කලාපයක් බවට පත් කළ යුතුය. නිෂ්පාදන භාණ්ඩ අපනයනය රටක ආර්ථිකයේ කොඳු නාරටිය විය යුතුය. පසුගිය දශක ගණනාවක්ම අපේ රටේ රජයන් කරගත් ලොකුම වැරැද්ද නිෂ්පාදන භාණ්ඩ අපනයනය දෙවැනි කොට සේවා අපනයනය ගැන විශ්වාස කිරීමය. කොවිඩ් වැනි අනපේක්ෂිත ලෝක ව්‍යසනයක් හමුවේ මෙම සේවා ආර්ථිකය කඩා වැටුණේ පෙන බුබුළු විනාශ වී යන්නා සේය. නැතිනම් බැලූම් පුපුරන්නා සේය. ජනාධිපතිතුමාගේ ඉතා නිවැරැදි මගපෙන්වීම යටතේ සේවා ආර්ථිකයෙන් නිෂ්පාදන අපනයන ආර්ථිකයකට අප මාරු විය යුතුය. අපනයන නිෂ්පාදනය ප්‍රධාන වශයෙන් කොටස් කිහිපයකට වෙන් කිරීමට හැකිය. කෘෂිකාර්මික හා ආශ්‍රිත නිෂ්පාදනවල අත්කම් සහ පාරම්පරික භාණ්ඩ නිෂ්පාදනය සහ සුළු මධ්‍යම සහ මහා පරිමාණ කාර්මික නිෂ්පාදනය වශයෙනි.

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය
රෝහණ ජී. මහලියනාරච්චි.
සබරගමු විශ්වවිද්‍යාලයේ හිටපු උපකුලපති, දියතලාව යුදෙ හමුදා ඇකඩමියේ හිටපු අධ්‍යයන උපදේශක

අප, අපනයනය කේන්ද්‍ර කොටගත් ජාතික ආර්ථිකයක් ගොඩනංවන්නේ නම් අදාළ භාණ්ඩවලින් දේශීය වෙළෙඳපොළ සංතෘප්ත කරන අතරම අතිරික්තයක් නිෂ්පාදනය කර අපනයනයට යොමු විය යුතුය. බොහොමයක් කෘෂි සහ කාර්මික නිෂ්පාදන සඳහා මෙම න්‍යාය අදාළ කරගත හැකිය. මා මෙසේ කියන්නේ ඇයි? අනපේක්ෂිත බාහිර උවදුරක් නිසා අපනයන වෙළෙඳපොළට යම් හානියක් සිදු වුව හොත් දේශීය වෙළෙඳපොළෙහි ඇති ඉල්ලුම නිසා කාලීනව අදාළ නිෂ්පාදන ක්ෂේත්‍රය නොවැටී තබා ගත හැකි වනු ඇත.

කෘෂිකාර්මික සහ ආශ්‍රිත නිෂ්පාදන අපනයනයේ දී නැවුම් එළවළු සහ පලතුරු අපනයනය, අගය එකතු කළ කෘෂි නිෂ්පාදන අපනයනය, ධීවර සහ ආශ්‍රිත නිෂ්පාදන අපනයනය අදාළ වේ. නැවුම් එළවළු සහ පලතුරු සඳහා මැද පෙරදිග රාජ්‍යයන් හොඳම වෙළෙඳපොළ වේ. කාබනික නිෂ්පාදන මෙන්ම කාබනික නොවන නිෂ්පාදන ද මේ සඳහා යොදා ගත හැකිය. වසරකට අරාබි රටවල් ඩොලර් බිලියන 55ක පමණ එළවළු සහ පලතුරු අපනයනය කරයි. අප උත්සාහ කළ යුත්තේ ඉදිරි වසර පහ තුළ ඉන් 10%ක් එනම් ඩොලර් බිලියන 5 තවත් නැවුම් එළවළු සහ පලතුරු මැද පෙරදිගට අපනයනය කිරීමට යි. ඒ සඳහා ඉතා ඉහළ තත්ත්වයේ නිෂ්පාදන මෙන්ම පසු අස්වනු තාක්ෂණයක් සහ කළමනාකරණයක් අත්‍යවශ්‍ය වේ.

අපේ ඉලක්කය විය යුත්තේ ඉදිරි වසර 5 තුළ සමස්ත නිෂ්පාදන අපනයනය ඩොලර් බිලියන 200ක් දක්වා වැඩි කර ගැනීමටය. මෙසේ ඉතා ඉහළ ඉලක්ක මත කටයුතු කිරීම තුළින් සියලු නිෂ්පාදන සහ අලෙවි අංශ අභිප්‍රේරණය කළ යුතුය.

අගය එකතු කරන ලද කෘෂි නිෂ්පාදන සහ ධීවර නිෂ්පාදන අපනයනය කිරීමට අවශ්‍ය තාක්ෂණය අප සතුව දැනටමත් ඇත. අවශ්‍ය වැඩි දියුණු කිරීම් කළ හැකිය.

කෘෂිකාර්මික නිෂ්පාදන අපනයනයේ දී අපේ රටේ ඇති නිෂ්පාදනවලින් අපනයනය කළ නොහැක්කේ මොනවා ද? බොහෝ දේ එසේ අපනයනය කළ හැකිය. ඉන් ප්‍රධාන වන්නේ රටේ ඉතා සුලබව ඇති ගස් යට ඉදී විනාශ වී යන කොස්ය. ඊට අමතරව මුරුංගා, ලාවුළු, අනෝදා වැනි වර්ගවලට ලෝක වෙළෙඳපොළේ විශාල ඉල්ලුමක් ඇත. මෙහි දී පෞද්ගලික ව්‍යවසායකයන් ඒකරාශි කොට ඔවුන්ට තාක්ෂණය දීම, වෙළෙඳපොළ සොයා දීම, අන්තර්ජාතික වෙළෙඳපොළට අවශ්‍ය තත්ත්ව පාලනය ආදිය රාජ්‍ය අනුග්‍රහයෙන් දිය යුතුය. කුඩා පරිමාණ ව්‍යවසායකයාට ඇති ලොකුම ප්‍රශ්නයක් නම් අන්තර්ජාතික වෙළෙඳපොළට ඇතුළු වීමට තරම් නිෂ්පාදනයන් හෝ තත්ත්ව පාලනයන් ඔවුන් සතුව නොතිබීමයි. ඒ සඳහා මා යෝජනා කරන්නේ අන්තර්ජාතික ප්‍රමිතියේ තත්ත්ව පාලනයක් යටතේ නිෂ්පාදනය ස්වාධීනව කිරීමට කුඩා සහ මධ්‍යම පරිමාණ ව්‍යවසායකයන්ට පහසුකම් රාජ්‍ය අනුග්‍රහයෙන් දී අපනයනය සඳහා රාජ්‍ය සහ පෞද්ගලික දෙඅංශයේම මැදිහත් වීමෙන් අපනයන සමාගම් ඇති කිරීමය. එවිට කුඩා සහ මධ්‍යම පරිමාණ ව්‍යවසායකයාට ඇති බරපතළම ප්‍රශ්නය වන වෙළෙඳපොළ සොයා ගැනීමේ අභියෝගයෙන් ඔවුන් මුදාලනු හැකි වේ. කෙසේ වෙතත් කලක් යන තුරු මේ කුඩා සහ මධ්‍යම පරිමාණ නිෂ්පාදකයාට සමීප අධීක්ෂණයකින් ඔවුනට සහාය වීම රජයේ වගකීමකි. මාපියන් කුඩා දරුවන් වැඩෙන තුරු බලා කියා ගන්නා මෙන් මේ කුඩා සහ මධ්‍යම පරිමාණ නිෂ්පාදකයන් පරිණතභාවයට පත් වන තුරු රජය මාපියන්ගෙන් ඔවුන්ව රැක බලාගෙන ගුරුකම් දිය යුතුය. වසර පහක් මෙසේ ඉතා විධිමත් අපනයනය ඉලක්ක කර ගත් නිෂ්පාදන ක්‍රියාවලියක් සැලසුම් කළ හැකි වන්නේ නම් ඉන් පසු ඔවුන් තම තමන්ම ස්වාධීන වනු ඇත.

අත්කම් භාණ්ඩ අලෙවියේ දී පාරම්පරික අත්කම් භාණ්ඩ නිෂ්පාදකයන්ට ලෝක වෙළෙඳපොළේ ඇත්තේ ඉහළ වටිනාකමකි. ලංකාවේ බොහෝ පාරම්පරික අත්කම් භාණ්ඩ ගුරුකුල තිබේ. අවශ්‍ය වන්නේ ඔවුන්ගේ පැටිකිරිය සමඟ එම අත්කම් භාණ්ඩ ලෝක වෙළෙඳපොළට යොමු කිරීමය. වෙළෙඳපොළේ දී එම පැටිකිරියට විශේෂ වෙළෙඳ වටිනාකමක් හිමි වේ. ඒ සඳහා නව තාක්ෂණය යොදා ගත හැකිය. අන්තර්ජාලය හරහා විද්‍යුත් අලෙවිකරණ සමාගමක් ආරම්භ කළ හැකිය. ලංකාව පුරා වෙසෙන පාරම්පරික අත්කම් භාණ්ඩ නිෂ්පාදකයින්ගේ පැටිකිරිය සමඟින් එම අත්කම් භාණ්ඩ ලෝක වෙළෙඳපොළට යොමු කිරීම අන්තර්ජාල විද්‍යුත් අලෙවිකරණ සමාගම මගින් කළ හැකිය. ඒ සඳහා වන සැලසුම් ද මේ ලියුම්කරු සතුව ඇත. මේ තුළින් විශාල විදේශ විනිමයක් රටට ගෙන ආ හැකි අතර අදාළ පාරම්පරික අත්කම් භාණ්ඩ නිමවුම්කරුවන්ට ඉතා ඉහළ ආදායමක් දිය හැකිය.

තවද ඉන්දියාව වැනි රටවල කෙසෙල් සහ උණ ශාකයේ කෙඳිවලින් ගන්නා නූල්වලින් වියන රෙදිවලින් සාදා ඇති අත්යන්ත්‍ර සාරී, කමිස, සල්වාර් ආදී නිෂ්පාදන ඉතා ඉහළ මිල ගණන්වලට විකිණේ. එම ඉන්දීය තාක්ෂණය අපේ රටට ගෙන අවශ්‍ය නම් වැඩි දියුණු කර එවැනි අත් යන්ත්‍ර සාරි, කමිස ආදිය නිෂ්පාදනය කර දේශීය සහ ලෝක වෙළෙඳපොළට අපනයනය කළ හැකිය.

අපනයනයේ දී තත්ත්ව පාලනය මගින් ඉතා ඉහළ තත්ත්වයක් තම නිෂ්පාදනවලට දීමත් එම තත්ත්වය හැමදාම හොඳින් රැක ගනිමින් තව තවත් උසස් තත්ත්වයකට පත් කිරීමත් ඉතා වැදගත් බව අපනයන නිෂ්පාදකයින්ව දැනුවත් කිරීම ඉතාම අවශ්‍යය.

ලංකාව ප්‍රමාණයෙන් සහ ධනවත් බව අතිනුත් කුඩා බව සැබෑය. එසේම කිසි දිනෙක එම පුංචිකම ලෝකයට අපනයනය ජය ගැනීමේදී බාධාවක් නොව ආශිර්වාදයක් කර ගත යුතුමය. මම එක් අවස්ථාවක දී ලංකාව වර්තමාන නැව් නිෂ්පාදන කර්මාන්තයට අත පෙවිවේ 1974 තරම් ඈත අතීතයේදී බව පවසා අපට පසු එයට අත ගැසූ දකුණු කොරියාව සහ චීනය වැනි රටවල් බොහෝ දුර ගොස් ඇති බව කීවෙමි. එහි සිටි ඉංජිනේරුවරු කීවේ අපට නම් නැව් හදන්න අමාරුයි. බෝට්ටු හදමු කියලයි. ලංකාව නැව් සාදා අපනයනය කළේ දසවන සියවස එනම් ඈත අතීතයේ දී බව මේ මහත්තුරු අසා නොතිබෙන්නට ඇත. මෙවැනි හීන ආකල්ප තුළ නම් අපනයනයෙන් මේ රට ඉහළට ගෙන ආ නොහැකිය. ඊශ්‍රායලය දකුණු කොරියාව කුඩා රටවල්ය. එහෙත් බොහෝ ක්ෂේත්‍රවලින් ලෝකයම ජය ගෙන විශාල ආර්ථික සංවර්ධනයක් ළඟා කරගෙන ඇත.

මැතිවරණ කාලයේ දී ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමා කැඳවූ විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ගේ සමුළුවක දී වචනයක් දෙකක් කථා කිරීමට මට ද අවස්ථාව ලැබුණි. මා එතුමාට කීවේ මෙපමණකි. අපි මේ රට සිංගප්පූරුවක් නොව ඊශ්‍රායලය තත්ත්වයකට ගෙන එමු. ඊශ්‍රායලය අපටත් වඩා කුඩා රටකි. රට වටේම සතුරෝය. එහෙත් තාක්ෂණයෙන් සහ රටේ ජනතාවගේ කැපවීමෙන් ලෝකයම ජය ගෙන ඇත.

මට ඇසීමට ඇත්තේ එක ප්‍රශ්නයකි. අපට කළ නොහැක්කේ මොනවා ද? පිළිතුර කළ නොහැක්කක් නොමැත. අවශ්‍ය කැපවීම සහ උත්සාහයයි. මේ සියල්ල සිදු කිරීමට නම් සමස්ත ජාතියම එකවර මහා ජවයකින් අවදි කර ගත යුතුය. ඒ සඳහා දේශය පුරාම පිබිදෙන ජාතිය අවදි කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කළ යුතුය. ඒ සඳහා ගීත, වේදිකා නාට්‍ය, ටෙලි නාට්‍ය පමණක් නොව චිත්‍රපට පවා යොදා ගත හැකිය. එය කලාකරුවාගේ මේ මොහොතේ ජාතික වගකීමක් වේ.

රජය මෙන්ම පෞද්ගලික රූපවාහිනී, ගුවන් විදුලි නාලිකා මෙන්ම පුවත්පත් ද සියල්ල පසෙකලා සමස්ත ජාතියම පුබුදුවාලන ආර්ථික සමාජ ප්‍රගමන වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කළ යුතුය. එය නිෂ්පාදනය සහ අපනයනය ඉලක්ක කරගත් එකක් විය යුතුය.

හැත්තෑවේ දශකයේ මුල භාගයේ ගීතය සහ වේදිකාවත් නවකථාවත් රටේ සංවර්ධනයට සැපයූ දායකත්වය අති මහත්ය. එම උදාහරණ අප දැන් ප්‍රයෝජනයට ගත යුතුය.

කෘෂිකාර්මික සහ ආශ්‍රිත නිෂ්පාදන අපනයනයේදී නැවුම් එළවළු සහ පලතුරු අපනයනය, අගය එකතු කළ කෘෂි නිෂ්පාදන අපනයනය, ධීවර සහ ආශ්‍රිත නිෂ්පාදන අපනයනය අදාළ වේ. නැවුම් එළවළු සහ පලතුරු සඳහා මැද පෙරදිග රාජ්‍යයන් හොඳම වෙළෙඳපොළ වේ. කාබනික නිෂ්පාදන මෙන්ම කාබනික නොවන නිෂ්පාදන ද මේ සඳහා යොදා ගත හැකිය.

කොරෝනා මැඩීමට ස්වයං විනය

කොරෝනා ගැන බිය සැක සංකා යළි මතුවෙමින් පවතී. සතුන් මෙන්ම මිනිස්සු ද ජීවිතය පිළිබඳ බියක් දැනුණු, හැඟුණු කල ආරක්ෂා වීමට කළ හැකි සියල්ලම කරති. එහෙත් මිනිසුන් සහ සතුන් අතර වෙනසක් දුටිමි. තිරිසන් සතුන් ජීවිත අවදානම කල් ඇතිවම දැන ගත් කල ආරක්ෂා වීමට වැර දරන මුත් මිනිසුන් එසේ නැත. බොහෝ දෙනෙක් අවදානමට පෙර සූදානමක් නැත. කොරෝනා පසු විපරම සහ අලුතින් පැන නැඟී ඇති තත්ත්වය බලන කල මුළු ලොව පුරා අවදානමේ බරපතළකම ඉදිකටු තුඩක තරමින්වත් පහව ගොස් නොමැති තැන අපේ රටේ ඇත්තෝ බොහොම නිදහසේ කටයුතු කර ඇති බව කිව යුතුව ඇත. කොරෝනා මැඩීමට ඇති එකම බෙහෙත ස්වයං විනයයි. ස්වයං විනය වනාහි නීති රීති පනවා කළ යුතු කාර්යයක් නොවේ. අවදානමක් මතුව ඇති බව දැන තම තමන් ආරක්ෂා වීමට කටයුතු කිරීමෙන් තමන් මෙන්ම මුළු රටම රෝග ව්‍යසනයකට ඇදී යා හැකි මඟ අහුරනු ලබයි.

තම තමන්ගේ ආරක්ෂාව ගැන එතරම් නොතකන මුත් "ඇයි මෙතරම් අවදානමක් තිබෙද්දි රට ලොක්ඩවුන් කරන්නේ නැත්තේ ඇයි ?" දැයි විමසන කටවල් කෝටියකි. එමෙන්ම රටට ම ඇඳිරිනීතිය දමා තත්ත්වය පාලනය කිරීමට ආණ්ඩුව කටයුතු නොකරන්නේ මන්දැයි තවත් පිරිසක් විමසති. මෙසේ විමසන ඇත්තන් අඩුම තරමින් මුඛ ආවරණයක්වත් පැලඳගෙන එළි බසින්නේ නැත. මේ කතා වපුරන්නේ ද මීටරයේ දුර තුට්ටුවට දමා රංචු ගැසී එකට ඇලී ගැලී කන බොන තැන්වලය. මෙවැන්නෝ ස්වයං විනයක් නොමැතිව කල් මරන්නෝ වෙති.

මේ මොහොතේ රටේ වත්මන් තත්ත්වය සැහැල්ලුවෙන් තකන බවට චෝදනා කරන තවත් පිරිසක් කඩ මණ්ඩියේ රාජකාරි ස්ථානයේ කිසිදු සෞඛ්‍ය ආරක්ෂාවක් නොතකා සුපුරුදු පරිදි හැසිරෙති. මුඛ ආවරණ පැලඳ ආරක්ෂා වීමට වැර දරන්නන්ට උසුළු විසුළු ද කරති. කෙරෝනා ව්‍යාප්තියත් සමඟ ස්වයං විනය යනු මිනිසුන්ගේ බුද්ධි මට්ටම මනින මිම්මක් බවට පත් ඇත. චීනය කොවිඩ් 19 ජය ගත්තේ මේ විනය නිසා ය. තවත් රටවල් ද මේ අභියෝගය එලෙස ජය ගන්නා ලදි. එහෙත් අමෙරිකාවට සහ ඉන්දියාවට මේ තරගයේ දී දරුණු පරාජයක් අත් විය. ඉන්දියාවට යම් සමාවක් දිය හැක්කේ එරට ජනතාවගේ අධ්‍යාපන මට්ටම සහ ජීවන රටාව අනුව එය නීතිරීතිවලින් පවා පාලනය කිරීමට අභියෝගයක් නිසාය. එහෙත් අමෙරිකාවේ ජනපති ට්‍රම්ප්ගේ පටන් වගකිව යුත්තෝ බොහෝ දෙනකු ස්වයං විනයක් නොමැතිව කටයුතු කිරීමෙන්ම මුළු රටටම කොරෝනා හමුවේ දණ නැමීමට සිදු විය. අපේ රටේ සියලු අංශ මනා සැලසුමකින් යුතුව මේ අභියෝගය ජය ගැනීමට ගත් වෑයම නිසා කොරෝනා පළමු රැල්ල සාර්ථකව ජය ගත හැකි විය. ඒ සඳහා රට සුළු කාලයකට හෝ වසා දැමීමට සිදු විය. රට ලොක් ඩවුන් කිරීම යනු කියන තරම් පහසුවෙන් කළ හැකි කාර්යයක් නොවේ. ඇඳිරි නීතිය ද එසේමය. මින් රටේ ආර්ථිකයට, දෛනික ජන ජීවිතයට සිදු වන බලපෑම ස්වල්ප නොවේ. මේ නිසා අඩුම තරමින් මුඛ ආවරණයක් පැලඳගෙන හෝ අප සියලු දෙනා සාමූහිකව එක්ව මේ ව්‍යසනයෙන් රට බේරා ගැනීමට කටයුතු කළ යුතු නොවේ ද? මේ වගකීම පැහැර හරින්නේ හරිහැටි අධ්‍යාපනයක් නැති අයට වඩා දැන උගත් ඇත්තන් බව අපට පෙනෙන්ට තිබේ. උගතුන් වැඩ කරන තැන්වල ස්වභාවය විපරම් කරන්නකු මේ කතාවේ ඇති තතු දැසින් දැක බලා ගැනීමට පුළුවන. උගතා සහ බුද්ධිමතා අතර වෙනස මෙයයි. ඇතැමුන් දැන් දැන් සිටම රටට ඇඳිරිය වැටේ යැයි සිතා නිවෙස බඩු මුට්ටුවලින් පුරවා ගැනීමට ලහි ලහියේ දඟලති. ඒ අතරින් වැඩි පිරිසක් කාසි පනම් ඇත්තන් ය .නමුත් එසේ බඩු මුට්ටු ගෙන ඒමට යෑමෙන් කොරෝනා ද සමඟ ගෙට ගොඩවීමට සිදු වේ යැයි බෝහෝ දෙනෙක්ගේ ඔළු ගොඩවලට නොවැටහෙති. මේ අතරේ තවත් පිරිසක් මොන යම් හෝ දෙයකින් බඩගින්න නිවාගෙන ජීවිතය බේරා ගැනීමට වැර දරති. ඔවුහු ස්වයං විනය ඇත්තෝය. මේ මොහොතේ කිව යුතු යමක් ඇත. රජය ජනතාව වෙනුවෙන් ගත යුතු හොඳම තීරණය සුදුසු මොහොතේ ගනු ඇත. ඒ සහතිකය රජය දැනටමත් ලබා ගෙන ඇත. කොරෝනා මැඩලූ රටවල් අතරින් ශ්‍රී ලංකාව දෙවැනි තැනට පත් කර ලබා ගත් කීර්ති සහතිකය රජය සතුය. එහෙත් ඒ ගමන ආපස්සට හැරවීමට ඔබට මට පුළුවන. ඒ තම තමා සතු ඒ සවයං විනය මතය. රටක් ලොක් ඩවුන් කිරීමට අවැසි වන්නේ ස්වයං විනය පිරිහුණු තැනය. මේ නිසා සෞඛ්‍ය නීතිරීතිවලට අවනතව කටයුතු කිරීම ඔබේ මගේ දැනුම උගත්කම නොව බුද්ධි මට්ටම මනින අලුත්ම මිම්ම බවට පත්ව ඇති බව අමතක නොකරමු.

අඹන්පොළ විශේෂ
සකුන්තලා ජයසිංහ

ගොවිසෙත	සුපිරි වාසනා	ලග්න වාසනාව	කෝටිපති කප්රුක	සංවර්ධන වාසනාව	ජයෝදා	ශනිදා වාසනාව	සුපර් බෝල්	ජාතික සම්පත	අද කෝටිපති	වාසනා සම්පත	දරු දිරි සම්පත
2020 - 10 - 13	2020 - 09 - 21	2020 - 09 - 08	2020 - 09 - 27	2020 - 07 - 31	2020 - 09- 09	2020 - 09 - 09	2020 - 09- 27	2020 - 09-30	2020 - 09 - 09	2020 - 09 - 28	2020 - 07 - 30
දිනුම් වාරය - 2569	දිනුම් වාරය - 1537	දිනුම් වාරය - 2916	දිනුම් වාරය - 630	දිනුම් වාරය - 354	දිනුම් වාරය - 1688	දිනුම් වාරය - 3366	දිනුම් වාරය - 1228	දිනුම් වාරය - 1059	දිනුම් වාරය - 1036	දිනුම් වාරය - 1617	දිනුම් වාරය - 013
13 21 44 54	01 33 37 57	21 37 45 59	11 21 45 64	22 23 40	07 31 35 43	31 34 60 64	11 27 35 42	0 0 2 7 9 6	07 12 39 48	37 46 48 58	04 12 33 63
අක්ෂරය G	සුපිරි අංකය -01	ලග්නය-මිතුන විශේෂිත අංක	ඉංග්‍රීසි අක්ෂරය- E	දෛව අංකය - 02 අක්ෂරය- L	අක්ෂරය-A	අක්ෂරය - D	අක්ෂරය - Q විශේෂ අංකය -5767	අක්ෂරය -H	අක්ෂරය - K	අක්ෂරය - G	අක්ෂරය - U
		රු 500 තෑග සඳහා-9609							රු 500 තෑග සඳහා-2169		

ශ්‍රී ලංකා කම්කරු කොංග්‍රසය යන වෘත්තීය සමිතියේ ලක්ෂ 39ක මුදල් පරිහරණය

මහින්දානන්ද කිසිම වරදක් නෑ

රහස් පොලිසියේ විශ්‍රාමික පොලිස් පරීක්ෂක පද්මසිරි ඩයස්

කුමුදු හෙට්ටිආරච්චි

ශ්‍රී ලංකා කම්කරු කොංග්‍රසය යන වෘත්තීය සමිතියට අයත් රුපියල් ලක්ෂ 39 ක මුදලක් සාවද්‍ය ලෙස පරිහරණය කළ බවට අමාත්‍ය මහින්දානන්ද අලුත්ගමගේ මහතාට එරෙහිව පවරා ඇති නඩුවේ විමර්ශන සිදු කිරීමේදී එම ගනුදෙනුව විධිමත් ක්‍රමවේදයන් මත සිදුකර ඇති බව හා එහිදී කිසිදු වරදක් මහින්දානන්ද අලුත්ගමගේ මහතා විසින් සිදු කර නැති බව තමාට පෙනීගිය බවත් රහස් පොලිසියේ විශ්‍රාමික පොලිස් පරීක්ෂක පද්මසිරි ඩයස් මහතා කොළඹ මහාධිකරණය හමුවේ ඊයේ (15) පැවසීය.

මහින්දානන්ද අලුත්ගමගේ මහතාට සිය දෙමාපියන්ගෙන් උරුම වූ කුරුණෑගල පොල් ඉඩම් අක්කර 17ක්, රත්නපුර ඉඩම් අක්කර 92ක් ,කොත්මලේ අක්කර 70වක ඉඩමක්, එනසාල් වගා කළ අක්කර 20 ක ඉඩමක්, හා කොත්මලේ පිහිටි අක්කර 05 ක ඉඩමක් ඇතුළු නාවලපිටියේ තේ කර්මාන්තශාලාවක් තිබෙව බවට විමර්ශනවලදී හෙළි වූයේ නැතිදැයි ජනාධිපති නීතිඥ නළීන් ලද්දුවහෙට්ටි මහතා විසින් විමසා සිටියේය.

විත්තිකාර මහින්දානන්ද අලුත්ගමගේ මහතාට සිය පරම්පරාවෙන් උරුම වූ තේ හා පොල් වගා කළ ඉඩම් අක්කර 197කට ආසන්න ප්‍රමාණයක් හා තේ කම්හලක් ඇති බව විමර්ශනවලදී අනාවරණය වූ බවට මතකයක් ඇති බව ඊට පිළිතුරු දෙමින් සිද්ධිය සම්බන්ධයෙන් විමර්ශන සිදුකළ විශ්‍රාමික පොලිස් පරීක්ෂක පද්මසිරි ඩයස් මහතා වඩිදුරටත් පැවසීය

මහින්දානන්ද අලුත්ගමගේ මහතා වෙනුවෙන් ජනාධිපති නීතිඥ නළීන් ලද්දුවහෙට්ටි මහතා අසන ලද හරස් ප්‍රශ්නයකට පිළිතුරු දෙමින් සාක්කිකරු පවසා සිටියේ මහින්දානන්ද අලුත්ගමගේ මහතාට විශාල දේපලක් හිමි බවට දැනසිටියත් ඉන් ලැබෙන ආදායම් සම්බන්ධයෙන් විමර්ශන සිදු නොකළ බවයි.කොළඹ මහාධිකරණ විනිසුරු ආදිත්‍ය පටබැදිගේ මහතා හමුවේ මෙම නඩුව විභාගයට ගැනේ.

මෙම ගනුදෙනුවේදී එම වෘත්තීය සමිතියේ විධායක කමිටුවේ අනුමැතිය ඇතිව විධිමත් ලෙස සිදු කළ ගනුදෙනුවක් නොවේදැයි ජනාධිපති නීතිඥ නළීන් ලද්දුවහෙට්ටි මහතා අසන ලද හරස් ප්‍රශ්නයට සාක්කිකරු පිළිතුරු දීමෙන් වැළකී සිටියදී ජනාධිපති නීතිඥ මහතා ඇසූ පූශ්නය විනිසුරු ආදිත්‍ය පටබැදිගේ මහතා විසින් නැවත වරක් සාක්කිකරුගෙන් අසන ලදී .

එහිදී පිළිතුරු දෙමින් සාක්කිකරු පැවසුවේ එකී ගනුදෙනුවේ කිසිදු වරදක් තමා නොදකින බවයි.

අදාළ සමිතියේ මුදල් අවභාවිතයක් සිදුව ඇති බව එම වෘත්තීය සමිතියේ නිළධාරීන් හෝ සාමාජිකයන් විසින් පැමිණිල්ලක් ඉදිරිපත් කර නැති බව විත්තිය වෙනුවෙන් ජනාධිපති නීතිඥමහතා ඇසූ හරස් ප්‍රශ්නයකට පිළිතුරු දෙමින් සාක්කිකරු පැවසීය.

මහින්දානන්ද අලුත්ගමගේ මහතා වෙනුවෙන් නීතිඥ බුද්ධික චන්දසේකර ,ශාලික ගුණවර්ධන ,ජනක රණතුංග හා ජ්‍යෙෂ්ඨ නීතිඥ කාංචන රත්වත්ත මහතා සමග ජනාධිපති නීතිඥ නළීන් ලද්දුවහෙට්ටි මහතා ඇතුළු නීතිඥවරු මඩුල්ලක් පෙනී සිටියහ.

මහජන ආධාර දෙපාර්තමේන්තුව තාවකාලිකව වසයි

සන්ධ්‍යා කරුණාරත්න

කොළඹ මහ නගර සභාවට අනුබද්ධ මරදාන මහජන ආධාර දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු ලිපිකාර නිලධාරිණියකට කොවිඩ් - 19 ආසාදිත වීමත් සමඟ එම කාර්යාල පරිශ්‍රය තාවකාලිකව වසා දැමීමට සෞඛ්‍ය අංශ පියවර ගෙන තිබේ.

පී.සී.ආර්. පරීක්ෂණයකින් පසුව ඇයට වයිරසය ආසාදිත බවට ඊයේ (15) හඳුනාගෙන ඇති බවත් ඇය කඩුවෙල පදිංචිකාරියක් බවත් වාර්තා වේ.

කළුතර මහ රෝහලේ සේවය කළ හෙද නිලධාරිනියකට ද කොරෝනා වෛරසය ආසාදනය වී ඇති බවට තහවුරු වී ඇත.

මෙම හෙද නිලධාරිනිය පොදු ප්‍රවාහන සේවාවන් භාවිතා කර ඇතැයි ද වාර්තා වේ.

වයිරසය ආසාදිතයන් වාර්තා වීමෙන් පසුව ඔවුන්ගේ ආශ්‍රිතයන් සොයා වයිරසයේ ව්‍යාප්තිය පාලනය කිරීමට සෞඛ්‍ය අංශ කටයුතු කරන බව ද සෞඛ්‍ය අමාත්‍යාංශය ප්‍රකාශ කරයි.

යාපනය විශ්වවිද්‍යාලයේ නවක වධ සිද්ධිය සිව්වන වසරේ 4කගේ පන්ති තහනම්

උතුරු පළාත් විශේෂ රසුල දිල්හාර ගමගේ

යාපනය විශ්වවිද්‍යාලයේ අමානුෂික හා ලිංගික ක්‍රියාකාරකම් ඔස්සේ නවක වධය ලබාදීමේ සිද්ධියට සම්බන්ධ හතරවන වසරේ සිසුන් ගෙන් සිසුන් හතර දෙනකුට එක් වසරක කාලයක් විශ්වවිද්‍යාල ශිෂ්‍යභාවය අහෝසි කිරීමටත් එම කාලය තුළදී ඔවුන්ට යාපනය විශ්වවිද්‍යාල භූමිය තහනම් භූමියක් ලෙස දැණුම් දීමටත් මේ සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වන කමිටුව 14 දා නිර්දේශ කොට තිබේ.

මෙම නවක වදය ලබාදීමේ සිද්ධියට සම්බන්ධ තවත් සිසුන් දෙදෙනෙකුට මෙතෙක් දඬුවම් නියම කිරීමක් සිදු වී නොමැත. නවක වදය ලබාදීමේ සිද්ධිය සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වන ලද කමිටුව සිය වාර්තාව යාපනය විශ්ව විද්‍යාලයේ විනය කමිටුවට ඉදිරිපත් කිරීමෙන් පසුව අදාල නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා යාපනය විශ්ව විද්‍යාලයේ උපකුලපතිවරයා වෙත බාර දී තිබේ.

1 පිටුවෙන් ..

බියගම දෙදෙනකුට...

කොළඹ මරදාන ප්‍රදේශයේ වානිජ බැංකුවක නිලධාරිනියක් වන වයස අවුරුදු 33 ක කාන්තාවක් සහ මාකොල ප්‍රදේශයේ ව්‍යාපාරිකයෙකු වන අවුරුදු 49 ක පුද්ගලයෙකුට මෙසේ කොවිඩ් 19 වෛරසය ආසාදනය වී ඇත.

මෙම පිරිමි පුද්ගලයා තම නඩු කටයුත්තක් සඳහා පසු ගිය දිනක මිනුවන්ගොඩ ප්‍රදේශයේ නීතිඥවරයකු මුණ ගැසී ඇත. පසුව එම නීතිඥ වරයාට කොවිඩ් 19 වෛරසය ආසාදනය වූ බවට වාර්තා වීමෙන් අනතුරුව මෙම පුද්ගලයා සවයං නිරෝධායනයට ලක් කර පසුව කළ පී. සී. ආර්. පරීක්ෂණයෙන් ඔහු කොවිඩ් ආසාදිතයකු බවට තහවුරු වී ඇත. මෙම දෙපළගේ ආශ්‍රිතයින් 15 දෙනකු සවයං නිරෝධායනයට යොමු කර ඇත.

වයිරසය පාලනයට ...

මෙ වයිරසයේ ව්‍යාප්තිය වළක්වා ගැනීමට ජනතාව සහාය ලබා දෙන්නේ නම් එය තවදුරටත් ව්‍යාප්ත වීම පාලනය කිරීම අපහසු නොවන බව සෞඛ්‍ය අමාත්‍යාංශයේ මාධ්‍ය ප්‍රකාශක වෛද්‍ය ජයරුවන් බණ්ඩාර මහතා 'දිනමිණ'ට ඊයේ (15) ප්‍රකාශ කළේය.

මිනුවන්ගොඩ කොරෝනා ආසාදිත පොකුර තවදුරටත් ව්‍යාප්තවීම වළක්වා ගත හැක්කේ ජනතාවගේම සහායෙන් බව ද ඔහු කීය.

මෙම වයිරසයෙන් ආරක්ෂා වීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය හඳුන්වාදී ඇති සෞඛ්‍ය ආරක්ෂිත ක්‍රම නිසි ලෙස අනුගමනය කිරීමෙන් රෝගයෙන් වැළකී සිටිය හැකි බවත් මුඛ ආවරණ, දෑත් සේදීම, සමාජ දුරස්ථභාවය යනාදි සෞඛ්‍ය උපදෙස් පිළිපැදීම අනිවාර්ය බවත් ඒ මහතා පැවැසුවේය.

පොඩිලසී ...

අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මෝසමක් මගින් අධිකරණයට කරන ලද කරුණු සළකා බැලූ මහේස්ත්‍රාත්වරයා පොඩිලසී නමැති සැකකරු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව යටතට බාර දෙන ලෙස බූස්ස බන්ධනාගාර අධිකාරිවරයාට නියෝගයක් ද නිකුත් කළේය.

අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ සහකාර පොලිස් අධිකාර මෙරිල් රන්ජන් ළමාහේවා මහතා අධිකරණයට කරුණු දක්වමින් කියා සිටියේ මත්ද්‍රව්‍ය නාශක කාර්යංශයේ නිලධාරි කණ්ඩායමක් හා මත්ද්‍රව්‍ය ජාවාරමුන් සමඟ සම්බන්ධවී අවි ආයුධ රැස් කරමින් මනුෂ්‍ය ඝාතන සිදු කරමින් බිහිසුණු ක්‍රියාකාරකම් සිදු කිරීම මහජන සාමයට බාධාවන අයුරින් කටයුතු කිරීම සම්බන්ධයෙන් සැකකරුවන් 26 දෙනකුට එරෙහිව මේ වනවිට කොළඹ මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු කටයුත්තක් පවතින අතර එම සැකකරුවන්ගෙන් 13ක් රිමාන්ඩ් බන්ධනාගාර ගත කර ඇති බවත් සැකකරුවන් 14ක් රැඳවුම් නියෝග මත අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව බාරයේ සිටින බවය.

හෙරොයින් කිලෝ ග්‍රෑම් 11යි ග්‍රෑම් 800 සහ ගිනි අවි දහයක් සන්තකයේ තබා ගැනීම මනුෂ්‍ය ඝාතන ඇතුළු අපරාධ රැසක් සිදු කිරීම සම්බන්ධයෙන් පොඩිලසි නමැති සැකකරු පිළිබඳ තව දුරටත් විමර්ශන කිරීමට අවශ්‍ය බවත් එනිසා 1979 අංක 15දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතේ 124වැනි වගන්තිය යටතේ ආරක්ෂක අමාත්‍යංශය විසින් නිකුත්කර ඇති නියෝගය පරිදි සැකකරු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට බාරදෙන ලෙස නියෝගයක් නිකුත් කරන ලෙසත් සහකාර පොලිස් අධිකාරිවරයා ඉල්ලා සිටියේය.

ඒ අනුව කරුණු සළකා බැලූ මහේස්ත්‍රාත්වරයා පොඩිලසි නමැති සැකකරු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව බාරයට පත් කරන ලෙස බූස්ස බන්ධනාගාර අධිකාරිවරයාට නියෝගයක් නිකුත් කළේය.

ජනාධිපතිවරයාට ආරක්ෂක ලේකම්වරයාට සහ බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ උසස් නිලධාරීන්ට මරණීය තර්ජන එල්ල කිරීම සම්බන්ධ නඩුවේ 2වන සැකකරු ලෙස පොඩිලසි නම්කර ඇති අතර ඔහු මේ වනවිට බූස්ස බන්ධනාගාරයේ රඳවා සිටී. ඒ පිළිබඳ නඩුව අද(16)ගාල්ල මහේස්ත්‍රාත් අධිකරණයේ විභාගයට ගැනීමට නියමිතය.

ලොකු ලූනු කිලෝවකට ...

ඒ අනුව දිස්ත්‍රික් ලේකම්වරුන් මාර්ගයෙන් ලොකු ලූනු මිල දී ගැනීමට පියවර ගන්නා බව සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා, ව්‍යාපාර සංවර්ධන හා ඌන උපයෝජන රාජ්‍ය සම්පත් සංවර්ධන රාජ්‍ය ඇමැති ෂෙහාන් සේමසිංහ මහතා ප්‍රකාශ කළේය.

මේ දිනවල ලූනු අස්වැන්න තොග වැඩි වශයෙන් ගබඩා කරගෙන වෙළෙඳපොළට නිකුත් කිරීමට ගොවීහු බලාපොරොත්තුවෙන් සිටියහ. පිටරටින් ගෙන්වන ලූනු සඳහා අය කළ ආනයනික විශේෂ බද්ද ඉවත් කිරීම නිසා දේශීය ගොවියාට සිදුවූ එම පීඩාවන් අවම කිරීමේ අරමුණින් මෙම තීරණය ගත් බවද රාජ්‍ය ඇමැතිවරයා සඳහන් කළේය.

දිනෙන් දින ඉහළ යන ජීවන වියදම සමනය කිරීමේ අරමුණින් රජය විින් මාළු, ලොකු ලූනු, පරිප්පු සඳහා අය කළ විශේෂ බද්ද ඉවත් කිරීමට තීරණය කරන ලදි. එම තීරණයත් සමඟ ලොකු ලූනු ගොවිතැනෙහි නියැළී සිටි ගොවි ජනතාවට සිදුවූ අපහසුතාවය වළකාලීමේ අරමුණින් රජය මේ අන්දමින් සහතික මිලක් යටතේ එම අස්වනු මිලදී ගැනීමට කටයුතු කරන බව ද රාජ්‍ය ඇමැතිවරයා සඳහන් කළේය.

දරාගත නොහැකි...

මේ සම්බන්ධයෙන් සෞඛ්‍ය ඇමැතිවරිය සමඟ සාකච්ඡාවක් පැවැත්වූ බවත් සෞඛ්‍ය ධාරිතාව පාලනය කර ගැනීම සඳහා කරුණු 10 කින් යුක්ත යෝජනාවලියක් ඉදිරිපත් කර ඇති බවත් සංගමයේ ලේකම් වෛද්‍ය සෙනාල් ප්‍රනාන්දු මහතා පැවැසුවේය.

කොරෝනා රෝගීන් හඳුනා ගැනීමේ ක්‍රමවේදය හා පරීක්ෂණ ප්‍රතිපත්තිය වහාම යාවත්කාලීන කිරීම, පී.සී.ආර්. පරීක්ෂණ සංඛ්‍යාව ඉහළ නැංවීම සහ ප්‍රමිතිකරණයට ලක්කිරීම, වසංගත රෝග නිවාරණ ඒකකයේ හා පී.සී.ආර්. පරීක්ෂණාගාර මානව සම්පත වැඩි කිරීම, රෝගීන්ගේ රෝග ලක්ෂණ තීව්‍රතාව අනුව අත්‍යවශ්‍ය රෝගී සත්කාරයට බාධා නොවන ලෙස කොවිඩ් - 19 ප්‍රතිකාර සේවා සඳහා රෝහල් අනුයුක්ත කිරීම හා ධාරිතාව වැඩි කිරීම, කොරෝනා රෝගීන් හඳුනා ගැනීමේ නිර්වචනය, ප්‍රතිකාර හා රෝහල් කළමනාකරණය පිළිබඳ මාර්ගෝපදේශ යාවත්කාලීන කිරීම යනාදි යෝජනා 10 ක් සංගමය ඉදිරිපත් කර තිබේ.

අධිකරණ නියෝග ...

2019 වසරේ ජනාධිපතිවරණය සඳහා පුත්තලමේ සිට මන්නාරම දක්වා ලංකා ගමනා ගමන මණ්ඩලයට අයත් බස් රථ 222 කින් ඡන්දය දැමීම සඳහා අවතැන්වූ පුද්ගලයන් ප්‍රවාහනය කරමින් රජයේ මුදල් රුපියල් මිලියන 9.5ක් සාවද්‍ය ලෙස පරිහරණය හා මැතිවරණ නීති උල්ලංඝනය කිරීමේ චෝදනා මත නීතිපතිවරයාගේ උපදෙස් මත පාර්ලිමේන්තු මන්ත්‍රී රිෂාඩ් බදියුදීන් මහතා මෙතෙක් අත්අඩංගුවට නොගැනීම සම්බන්ධයෙන් කරුණු විමසීම සඳහා රහස් පොලිසියේ නියෝජ්‍ය පොලිස්පතිවරයා නීතිපතිවරයා විසින් ඊයේ පෙරවරුවේ කැඳවූ අවස්ථාවේ මෙම උපදෙස් ලබා දී ඇත.

නීතියේ ආදිපත්‍ය රැකගනිමින් කටයුතු කරන ලෙසටත් පොලිස් දෙපාර්තමේන්තුව කෙරෙහි මහජන විශ්වාසය නැතිවන අයුරින් නොව එම විශ්වාසය ඇති වන අයුරින් කටයුතු කරන ලෙසත් නීතිපතිවරයා රහස් පොලියේ නියෝජ්‍ය පොලිස්පති ප්‍රසාද් රණසිංහ මහතාට වැඩිදුරටත් උපදෙස් ලබාදෙමින් පවසා සිටි බව රජයේ අධිනීතිඥ නිශාරා ජයරත්න මෙනෙවිය පැවසුවාය.

31 තෙක් සිනමා ශාලා ...

රටේ පවතින කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් සෞඛ්‍ය අමාත්‍යංශය මගින් ලබා දී ඇති සෞඛ්‍ය උපදෙස් අනුව මෙම තීරණය ගෙන තිබේ.

පරිසර විනාශයන් ...

ඔවුන්ගේ වෘත්තීයට බාධා කරන ධනවතෙක් වුව ද බළවතෙක් වුව ද ඕනෑම තරාතිරකම පුද්ගලයෙක්වේද ඒ අයට විරුද්ධව නීතිය ක්‍රියාත්මක කිරීමට කිසි විටෙකත් පසුබට නො වන බව ද ඇමැතිවරයා කීවේ ය. පසුගිය දිනවල පරිසර හානීන් වර්ථාකරණයට ගොස් සිටි මාධ්‍යවේදීන්ට විවිධ බලපෑම්, පහරදීම් සිදු වී තිබෙන බවත්, උතුරේ මුලතිව් හා මොණරාගල දිස්ත්‍රික්කවල ඇතැම් පිරිස් විසින් පරිසරයට සිදු කරන්නා වූ හානි වර්ථාකරණයට ගිය මාධ්‍යවේදීන් පිරිසක් මෙසේ හිරිහැරයට ලක්ව ඇති බවට තමා දැනුවත් වූ බවත් ඒ මහතා ප්‍රකාශ කළේ ය.

එම සිද්ධිය පිළිබඳ පරිසර අමාත්‍යවරයා ලෙස පොලිස්පතිවරයා දැනුවත් කළ බව ද පරිසර අමාත්‍යංශයේ ඊයේ (15) පැවති මාධ්‍ය හමුවකට සහභාගී වෙමින් අමාත්‍යවරයා කී ය.

වනාතවිල්ලුව අවි ගබඩා ...

ඔවුන් සම්බන්ධයෙන් විමර්ශන කරන්නේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව. ඔවුන් එවන වාර්තා ගැන විශ්වාසයක් මත තමා අත්සන් කට බව කියා සිටි හිටපු ජනාධිපති වරයා කිසි දිනෙක ඔවුන් ත්‍රස්තවාදීන් බව දැන සිටියේ නම් තම අත්සන නොතබන බවද කියා සිටියේය. මට අත්සනට එවන්නේ අපරාධ පරීක්ෂණ මෙම සිද්ධියට අදාළව විමර්ශන කරන නිලධාරීන්. ඔවුන් විමර්ශන කර අත්සන යොදා මගේ අත්සනට එව්වම ඔවුන් කෙරෙහි ඇති විශ්වාසයෙන් මම අත්සන් කරනවා. එවැනි ලිපි මිටි ගණන් මගේ අත්සනට ගේනවා. ජනාධිපති ලෙස මට විශාල ලිපි ගොනු දිනකට අත්සන් කරන්න වෙනවා. හැම ලිපි ගොනුවක් ම පරීක්ෂා කරන්න මට වෙලාවක් ලැබෙන්නේ නෑ යැයිද හිටපු ජනාධිපති වරයා කොමිසමට කියා සිටියේය. කොමිසමේ සභාපති විනිසුරු වරයා සිදු කළ විමසීමකදී ඒ මහතා මේ බව කියා සිටියේය

කොමිසමේ සභාපති විනිසුරු වරයා

ත්‍රස්ත පනත යටතේ ඇතැම් සැකකරුවන් වසර පහකට වැඩි කාලයක් රඳවා සිටින බවට කොමිසමට සාක්ෂි ඉදිරිපත් වී තිබෙනවා.ඉස්ලාම් අන්තවාදීන් පුපුරණ ද්‍රව්‍ය සමග අත්අඩංගුවට ගත්තාම සාක්ෂි නෑ කියලා මාස තුනක් යාමට පෙර නිදහස් කරනවා. ඒකට හේතුව මොකක්ද හිටපු ජනාධිපති තුමා.

හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා

ත්‍රස්තවාදීන් නිදහස් කළා නම් ඒකට අත්සන් කට අය වගකියන්න ඕන. මගේ ධූර කාලයේ ඉස්ලාම් අන්තවාදීන් නෙමෙයි කිසිම සැකකරුවෙක් නිදහස් කරන්න කියලා කිසිම කෙනෙක් මගේ ලගට එන්නේ නැහැ. ඒ ත්‍රස්තවාදීන් හතර දෙනාගෙන් දෙන්නෙක් නිදහස් කරන්න අත්සන් යොදලා තිබුනේ හිටපු ජනාධිපති වරයා ලෙස ඔබතුමා යැයි කොමිසමේ සභාපති විනිසුරු වරයා විමසා සිටි අවස්ථාවේ හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා මෙම කරුණු කියා සිටියේය.

ආණ්ඩුව පත්වී වසරක් ගියත් මහජනතාවට වුණු සෙතක් නෑ

● හිටපු ඇමැති වජිර අබේවර්ධන

ශිරෝමි අබයසිංහ

වත්මන් ආණ්ඩුව බලයට පත්ව වසරකට ආසන්න කාලයක් ගතවී ඇතත් මහජනතාවට කිසිදු සෙතක් ඉටුනොවූ පාලන තන්ත්‍රයක් බවට පත්වී ඇති බව හිටපු අමාත්‍ය වජිර අබේවර්ධන මහතා පැවැසීය. එවැනි තත්ත්වයක් තුළ රටේ ඉරණම ඉතාමත් අවාසනාවන්ත තැනකට යොමුවෙමින් තිබෙන බවත් මෙහි අනිටු ප්‍රතිඵල ඉදිරියේ දී මහජනතාව බුක්ති විඳිමට සිදු වන බවත් ඒ මහතා පැවැසීය.

රටේ ආර්ථිකය බරපතල බේදවාචකයකට මුහුණ දෙමින් තිබෙන බවත් එම තත්ත්වයෙන් ගොඩ ඒම සඳහා ලෝකය ගෙන ඇති ක්‍රියාමාර්ග, ශ්‍රී ලංකාව තුළ මේ මොහොත දක්වාම වර්තමාන රජය ලබාගෙන නැති බවත් ඒ මහතා පැවසීය. ඒ මහතා මේ බව සඳහන් කළේ මාධ්‍ය වෙත අදහස් දක්වමිනි.

මාධ්‍ය වෙත අදහස් දක්වමින් වජිර අබේවර්ධන මහතා මෙසේද පැවැසීය

කොරෝනා රෝග තත්ත්වය 2022, 2023 වන තුරු ශ්‍රී ලංකාවෙත්, ලෝකයෙත් ක්‍රියාත්මක වෙයි කියා මත පළවී තිබෙනවා. . ඉතිහාසයේ මේ වගේ තත්ත්වයන් ඇති වූ අවස්ථාවල වසර දෙකක් - තුනක් මේ තත්ත්වයන්ට මුළු ලෝකෙම මුහුණ දිලා තියෙනවා. දැන් මෙවැනි අවස්ථාවක තමයි ශ්‍රී ලාංකික ජනතාවත් මේ ප්‍රශ්නයට මුහුණ දෙමින් සිටින්නේ. මෙවැනි තත්ත්වයක්පා යටතේ ලකයන්ගේ යුතුකම් ඉටු කර තිබේද? මම දන්න තරමට නම් නෑ.

ඒ නිසා පාලකයන් විසින් කළ යුතු කාරණා කිහිපයක් තියෙනවා. එකක් මේ බෝ විමේ ක්‍රමවේදය පුළුවන් තරම් අවම කිරීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කළ යුතුව තිබෙනවා. අපට පේනවා කිසිසේත්ම ඒ සඳහා අවශ්‍ය පියවර රජය අරගෙන නැහැ. ඊළඟට මෙයින් පසු රට යන්නෙ කොතනටද?

“ අප මතක තබා ගත යුතු කරුණක් තමයි කොරෝනා මතුවෙච්ච අවස්ථාවෙදී එක්කෙනෙක් දෙන්නෙක් තුන්දෙනෙක් වාර්තා වෙනකොට මුළු රටේම ඇඳිරිනීතිය දාලා, මුළු රටම වහලා ජයග්‍රහණයක් ලැබුවා සේ පෙන්නුම් කිරීමක් සිදු කළා. ඇත්ත වශයෙන් එය දක්ෂතාවයක් නෙමේ. ගෙවල් ඇතුළේ මිනිස්සු තියලා රටේම ආර්ථිකය කඩාගෙන වැටිලා මාස කිහිපයක් ඒ විදියට ඇඳිරිනීතිය පනවමින් රටේ මේ තත්ත්වය පාලනය කළා.

පැරිසියට රාත්‍රී ඇඳිරි නීතිය

බුද්ධි කරුණාරත්න

ප්‍රංසයේ නැගී එන කොරෝනා තර්ජනයට මුහුණ දීම සඳහා පැරිසිය ඇතුළු එරට ප්‍රධාන නගර 9කට රාත්‍රී ඇඳිරි නීතිය පැනවීමට ජනාධිපති එමානුවෙල් මැක්‍රොන් නියම කර ඇත. පසුගිය සෙනසුරාදා (17දා) සිට ඉදිරි සති හතරක කාලයකට රාත්‍රී 9.00 සිට උදෑසන 6.00 දක්වා මෙසේ ඇඳිරි නීතිය පනවා තිබෙන බව රූපවාහිනී සම්මුඛ සාකච්ඡාවකට එක්වෙමින් ඔහු කියා ඇත. පැරිසියට සහ මාර්සෙලි, ලියොන්, ලිලී, සෙන්ට් එටියෙන්, රොවෙන්, ටොවිලොවිස්, ග්‍රෙනෝබල් සහ මොන්ට්පෙලියර් යන ප්‍රදේශවලට මේ වසා දැමීම බලපායි.

හදිසි මහජන සෞඛ්‍ය තත්ත්වයක් ද ප්‍රකාශයට පත් කර තිබේ. මේ අතර ජර්මනියේ අධි අවදානම් කලාපවල සුරාසැල් සහ අවන්හල් කළින් වසා දැමිය යුතු බව එරට බලධාරීහු නියම කර තිබේ. අප්‍රේල් මාසයෙන් පසු ජර්මනියේ නව ආසාදිතයින් 5,000කට වඩා වාර්තා වීම නිසා එරට චාන්සලර් ඇන්ජෙලා මර්කල් බදාදා (14දා) සිට දැඩි කොන්දේසි පනවා තිබේ. බ්‍රහස්පතින්දා (15දා) එම තත්ත්වය තවත් වර්ධනය වී රෝගීන් 6,638ක් වාර්තා වී තිබේ. මෙය කොවිඩ් වසංගත කාලය අතරතුර මෙතෙක් එරටින් වාර්තා වූ වැඩිම රෝගීන් සංඛ්‍යාවයි.

යුරෝපය පුරා මේ වන විට ආරම්භ වී ඇති දෙවැනි කොවිඩ් රැල්ලට මුහුණ දීම සඳහා එම රටවල්වල ආණ්ඩු විවිධ ක්‍රියාමාර්ග ගනිමින් සිටියි. නෙදර්ලන්තයේ පාර්ශ්වික වසා දැමීම් පනවා ඇති අතර බොජුන්හල් සහ අවන්හල් වසා දමමින් පවතියි. මීට කළින් ස්පාඤ්ඤයේ ඊසාන දිග කැටලෝනියා කලාපයේ බ්‍රහස්පතින්දා සිට දින 15ක කාලයකට සුරාසැල් සහ අවන්හල් වසා දැමීමට නියම කර තිබේ.

1 පිටුවෙන් ..

දේශීය ආහාරවලින් ...

එම නිවේදනයේ කරුණු වැඩිදුරටත් මෙසේ දැක්වේ. 1945 වසරේ දී එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් ආහාර සහ කෘෂිකර්ම සංවිධානය හඳුන්වාදීම අනුස්මරණය කිරීමට සෑම වසරකම ඔක්තෝබර් 16 වැනිදා ලෝක ආහාර දිනය වශයෙන් නම් කරන ලදී.

මෙවර ලෝක ආහාර දිනය (World Food Day) අද දිනයට යෙදී තිබේ. මෙවර එහි තේමාව වන්නේ “සැවොම එක්ව, වැඩෙන්න, පෝෂණය කරන්න, පවත්වා ගන්න, අපගේ ක්‍රියාවන් අපගේ අනාගතයයි” යන්නයි.

ලෝකයේ සෞඛ්‍ය සම්පන්න ජනතාවක පැවැත්ම ආහාර සුරක්ෂිතභාවය, පෝෂණයට අවශ්‍ය තිරසාර ආහාර රටාව හා සෞඛ්‍ය සම්පන්න ආහාර පද්ධති මත රඳා පවතියි. අතීතයේ පටන් දේශීය ආහාර රටාවකට උරුමකම් කියන ජාතියක් ලෙස අපි දේශීය ආහාර රටාවකට උරුමකම් කියන ආහාරවලින් ස්වයංපෝෂිත ජාතියකි.

කොවිඩ් - 19 වසංගත තත්ත්වය හමුවේ ලෝක ජනගහනය දැඩි අර්බුදකාරී තත්වයකට මුහුණ දී තිබේ. ඒ නිසා අද ජනතාවගේ ආහාර අවශ්‍යතාව සපුරා ගැනීම පිළිබඳ ලෝක මට්ටමෙන් අවධානය යොමුවනු ඇත. එසේ වුවද රටක් ලෙස කොවිඩ්-19 තත්ත්වයට මුහුණදෙමින් එය පාලනය කර ගැනීමේදී අන් සියලු රටවලට වඩා අපගේ ආහාර රටාව ද වැදගත් සාධකයක් විය.

ඉවතලන දණ්ඩක් වුවද ලියලන අපගේ මේ මහ පොළොව ආහාර බෝග නිෂ්පාදනාගාරයකි. ඈත අතීතයේ පටන් අපගේ හෙළ දරුවන් හා මුතුන් මිත්තන් විසින් හඳුන්වාදුන් ආහාර රටාවන් තුළින් රෝගාබාධයන් මේ පොළවෙන් තුරන් විය. එවන් ආහාර රටාවකට හිමිකම් කියන අප සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශනය තුළින් ද දේශීය ගොවියා හා දේශීය ආහාර නිෂ්පාදන නඟා සිටුවීමට කටයුතු කරන්නෙමු.

මෙරට නිෂ්පාදනය කළ හැකි ආහාර බෝග විදෙස් රටවලින් ආනයනය කිරීම හමුවේ මෙරටට අහිමිවන විදේශ විනිමය ප්‍රමාණය ඉහළ යාම රටට අහිතකර මෙන්ම රටේ ආර්ථිකයට ප්‍රබල අභියෝගයකි. එවන් පසුබිමක් තුළ අප රජය යටතේ දේශීයත්වය අගයමින් දේශීය සෞඛ්‍ය සම්පන්න ආහාර රටාවකට ජනතාව හුරු කරවීම ආරම්භ කර ඇති බව නොරහසකි.

ආහාර යනු මානව පැවැත්ම සහ යහ ජීවනය සඳහා වන මූලික අවශ්‍ය

ශ්‍රී ලාංකේය පුස්තකාල විද්‍යාවේ අමර තරුව

ශ්‍රී ලාංකේය පුස්තකාල විද්‍යා ක්ෂේත්‍රයෙහි උන්නතිය උදෙසා සුවිසල් මෙහෙවරක් සිදු කොට නිධනප්‍රාප්ත ප්‍රවීණ පුස්තකාලයාධිපති ජයතුංග අමරවීරයන්ගේ පස් වස් පූර්ණ ගුණානුස්මරණය මෙම මස 27 වැනි දිනට යෙදී තිබේ. මේ සටහන ඒ නිමිත්තෙනි. තවද කැලණිය විශ්වවිද්‍යාලයේ පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යයන අංශයෙහි මූලිකත්වයෙන් එතුමාගේ ගුණානුස්මරණ වැඩසටහනක් සූදානම් කර ඇති අතර එහිදී එතුමාට දක්වන ගෞරව උපහාරයක් වශයෙන් 'අමරවීර ගුණානුස්මරණ ශාස්ත්‍රීය සඟරාවක්' එළිදැක්වීමට නියමිතය.

පන්නිපිටිය පොල්වත්තේගම පදිංචිව සිටි ලියනෝරාගේ සහ ගෝමස්ගේ ජීවිත කතාවේ අලුත් පරිච්ඡේදයක් 1994 ජූලි මස 15 වැනි දින ආරම්භ විය. එනම් ඔවුන් දෙදෙනාගේ කුලුඳුල් පුතණුවන් මෙලොව එළිය දැකීමයි. මෙම කුළුඳුල් පුත්රුවන නමින් ජයතුංග ආරච්චිගේ අමරවීර නම් විය. නුගේගොඩ ඝාන්ත ජෝන්ස් විද්‍යාලයෙන් අකුරු කිරීම ආරම්භ කළ අමරවීර දරුවා පහ වසර දක්වාම එහි අධ්‍යාපනය ලැබුවේය. කුඩා අමරවීරගේ පදිංචිය කොළොන්නාව ප්‍රදේශයට වෙනස් කිරීමට සිදු වීම නිසා නුගේගොඩ ශාන්ත ජෝන්ස් විදුහලට සමුදුන් ඔහු කොළොන්නාව ටෙරන්ස් ද සිල්වා කනිෂ්ඨ විදුහලට ඇතුළත් විය. ඉතා දක්ෂ අයුරින් පාසලේ අධ්‍යාපන කටයුතුවල නිරත වූ අමරවීර සිසුවා එවකට පැවති 8 වසරේ ශිෂ්‍යත්ව විභාගයෙන් ඉහළින්ම සමත් විය. "ඒ සමත් වීම මගේ ජීවිතයේ හැරවුම් ලක්ෂ්‍යය වුණා කිව්වොත් නිවැරදියි. මුළු පාසලෙන්ම මේ විභාගය සමත් වුණේ තිදෙනායි. ඒ අතර මමත් හිටියා. ඒ බව මගේ අම්මාටයි, තාත්තටයි කියූ විගස ඔවුන්ගේ ඇස්වල පිරුණු සතුටු කඳුළු දැනුත් මට පේනවා." අමරවීරයන් සිය ශිෂ්‍යත්ව විභාගය සමත් වීම පසු කලෙක ආවර්ජනය කළේ එලෙසිනි. වැඩිදුර අධ්‍යාපනය සඳහා කොළඹ තර්ස්ටන් විද්‍යාලයට ඇතුළත් වන අමරවීර සිසුවා 1963 වර්ෂයේදී විද්‍යෝදය විශ්වවිද්‍යාලයට ප්‍රවේශ වීමේ වරම් හිමි කර ගති. එවක විද්‍යෝදය විශ්වවිද්‍යාලයෙන්, වර්තමාන ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් විද්‍යාවේදී උපාධිය ගෞරව පන්ති සාමර්ථ්‍යය සහිතව සමත් වන අමරවීර සිය ජීවන වෘත්තිය ලෙස තෝරාගන්නේ ගුරු වෘත්තියයි. මීරිගම මහා විද්‍යාලයේ ගුරුවරයකු වශයෙන් කටයුතු කරන ඔහුට එම පාසලෙහිම පුස්තකාලයේ කටයුතු සඳහා සහාය වීමට ලැබීම ඔහුගේ ජීවන ගමනේදී තවත් හැරවුම් ලක්ෂ්‍යයක් විය.

අමරවීරයන් ශ්‍රී ලාංකේය පුස්තකාල හා විඥාපන විද්‍යාව විෂය ක්ෂේත්‍රයට ප්‍රවේශ වීමේ පෙරනිමිති එසේ පහළ විය. එතුමන්ගේ ජීවන ගමනේ සහකාරිය වූ සමන්ලතා විජේවර්ධන මෙනවිය මුණ ගැසුණේ මීරිගමදීය. මීරිගම මහා විද්‍යාලයෙන් කෝට්ටේ ආනන්ද ශාස්ත්‍රාලයට ගුරු මාරුවකින් පැමිණෙන මෙතුමා වැඩි කලක් එහි සේවය නොකළ අතර 1972 වර්ෂයේදී ශ්‍රී ලංකා රබර් පර්යේෂණ ආයතනයේ පුස්තකාලයාධිපති හා ප්‍රකාශන නිලධාරී වශයෙන් සේවයට බැඳුණි. අමරවීර මහතාගේ පුස්තකාල විද්‍යා ක්ෂේත්‍ර සම්ප්‍රාප්තිය එසේ සනිටුහන් විය. රබර් පර්යේෂණ ආයතනයේ පුස්තකාලයාධිපතිවරයා හා ප්‍රකාශන නිලධාරිවරයා වශයෙන් එතුමා එම ආයතනයට හා පර්යේෂණ ක්ෂේත්‍රයට අදාළ පුස්තකාල සඳහා කරන ලද සුවිශේෂී සේවාව සදා අනුස්මරණීය වේ. අමරවීරයන්ගේ පුස්තකාල විද්‍යා ජීවිතය ආලෝකමත් වන්නේ මහාචාර්ය ජයසිරි ලංකාගේ මහතාගේ ඇසුර ලැබීමත් සමඟය. කැලණිය විශ්වවිද්‍යාලයේ පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යයන අංශයේ පුස්තකාල හා විඥාපන විද්‍යා විෂය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීම් තුළින් එතුමා ගත් දැනුම එතුමාට පුස්තකාල විද්‍යා ක්ෂේත්‍රය තුළ දිගු ගමනක් යෑමට සැබැවින්ම ශක්තිමත් අත්වැලක් විය. කැනේඩියන් ජාතික ආචාර්යවරයකු වූ පීටර් චෝර්ඩ් බෙන්ද්ගේ මුණගැසීම අමරවීරයන්ගේ ජීවිතයේ තවත් නව පිටුවක් පෙරළීය. එම හමුවේ ප්‍රතිඵලයක් ලෙස පිලිපීනයේ කෘෂිකර්ම විශ්වවිද්‍යාලයේ පැවැති පළමු වැඩමුළුවට සහභාගි වීමට අමරවීර මහතාට අවස්ථාවක් හිමි විය. 1978 වසරේ ලංකා ඛනිජ තෙල් සංස්ථාවේ පුස්තකාලයෙහි පුස්තකාලයාධිපති තනතුරට පත් වන මෙතුමා එහි සේවය කරනු ලබන්නේ මාස තුනක් වැනි කෙටි කාලයකි. නැවත 1979 දී ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සහකාර පුස්තකාලයාධිපති තනතුරට පත්වන අතර එහිදී විශ්වවිද්‍යාල පුස්තකාල පරිගණකගත කිරීමේ වැඩසටහන සඳහා සිය දායකත්වය දුන්නේය. 1998 වසරේදී බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ පළමු පුස්තකාලයාධිපති තනතුර සඳහා තේරී පත්වන අමරවීරයන් 2009 වසරේ විශ්‍රාම යන තෙක්ම එහි සේවය කළේය. ඒ අතරතුර කැලණිය විශ්වවිද්‍යාලයේ පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යයනාංශයේ බාහිර කථිකාචාර්යවරයකු වශයෙන්ද සුවිසල් මෙහෙවරක් කළේය. කැලණිය විශ්වවිද්‍යාලයේ පුස්තකාල හා විඥාපන අධ්‍යයන අංශය වූ කලී ශ්‍රී ලාංකේය පුස්තකාල විද්‍යා ක්ෂේත්‍රයට අවශ්‍ය පුහුණුව හා කුසලතා පූර්ණ මානව සම්පත් බිහි කරන එකම ජාතික විශ්වවිද්‍යාල පද්ධතිය නියෝජනය කරනු ලබන අධ්‍යාපන ආයතනයයි. මෙම අධ්‍යයන අංශයට හා සම්බන්ධව ශාස්ත්‍රවේදී උපාධි අපේක්ෂකයන්ට මෙන්ම ඩිප්ලෝමා පාඨමාලාවන් හදාරන සිසුන්ටද අවශ්‍ය දැනුම බෙදා දීමට එතුමා ඉතා උනන්දුවෙන් කැප වීමෙන් සහ ඉතා කැමැත්තෙන් සම්බන්ධ විය. තවද ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මධ්‍යස්ථානය, ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සංගමය, ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය, ජාතික අධ්‍යාපන ආයතනය ආදි ශ්‍රී ලංකාවේ පුස්තකාල විද්‍යා ක්ෂේත්‍රය හා සම්බන්ධ සියලු ආයතන සඳහා එතුමා ස්වකීය සේවය දීම විශේෂයෙන්ම සිහිපත් කළ යුතුය. එතුමා ශ්‍රී ලංකා පුස්තකාල සංගමය, ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල පුස්තකාලයාධිපතිවරුන්ගේ සංගමය ආදී විද්වත් වෘත්තික සංවිධානයන්හි ක්‍රියාකාරී සාමාජිකයකු වශයෙන් දශක ගණනාවක් පුරාවට විවිධ තනතුරු හොබවමින් කරන ලද සේවාව සැබැවින්ම ප්‍රශංසනීයය. මාලදිවයින, ඉන්දියාව වැනි රටවල් පමණක් නොව යුරෝපීය රටවල් සමඟද ජාතික හා අන්තර්ජාතික සම්බන්ධතා ඇතිකර ගනිමින් ශ්‍රී ලාංකික පුස්තකාල ක්ෂේත්‍රයේ උන්නතිය වෙනුවෙන් එතුමා විසින් කරන ලද සේවාව සදා අනුස්මරණීයය. ශ්‍රී ලංකාවේ පුස්තකාල ක්ෂේත්‍රයට අමිල සේවාවක් කළ ජයතුංග අමරවීර මහතා අවුරුදු හැත්තෑ එකක් ආයු වින්දනය කර 2015 ඔක්තෝබර් මස 27 වැනිදා පුස්තකාල ලෝකයෙන් සමු ගත්තේය. වෘත්තිකයන් අතර යහපත් වෘත්තිකයකු වශයෙන්ද මිනිසකු වශයෙන්ද තමන්ට පැවරුණු සමාජ හා ශාස්ත්‍රීය මෙහෙවර මනාව ඉටු කළ ජයතුංග අමරවීර නම් වූ ප්‍රවීණ පුස්තකාලයාධිපතිවරයාට උතුම් නිවන් සුව ලැබේවා!

ත්‍රිපිටක විශාරද, රාජකීය පණ්ඩිත,
බෝපැත්තේ සෝමානන්ද හිමි
සහකාර කථිකාචාර්ය
පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

කොරෝනා නිසා කෑගල්ලේ වාහන ආදායම් බලපත්‍ර නිකුත් කිරීම තාවකාලිකව අත්හිටුවයි

කෑගල්ල දිස්ත්‍රික් සමූහ
දයාරත්න බණ්ඩාර

කොවිඩ් 19 වසංගතය යළි හිස එසවීම හේතුවෙන් පවතින අනාරක්ෂිත තත්ත්වය හමුවේ කෑගල්ල දිස්ත්‍රික්කයේ වාහන ආදායම් බලපත්‍ර නිකුත් කිරීම තාවකාලිකව අත්හිටුවීමට පියවර ගැනීමට දිස්ත්‍රික් කොවිඩ් 19 මෙහෙයුම් කමිටුවේදී තීරණය කෙරිණි.

ඒ අනුව සති දෙකක කාලයක් සඳහා මෙම තීරණය ගත් බව සබරගමු පළාත් ආණ්ඩුකාර ටිකිරි කොබ්බෑකඩුව මහතා මෙහිදී සඳහන් කළේය.

කෑගල්ල දිස්ත්‍රික් ලේකම් මහින්ද එස්. වීරසූරිය මහතාගේ කැඳවීමෙන් සබරගමු පළාත් ආණ්ඩුකාර ටිකිරි කොබ්බෑකඩුව මහතාගේ ප්‍රධානත්වයෙන් සහ දිස්ත්‍රික් දේශපාලන අධිකාරියේ සහභාගීත්වයෙන් දිස්ත්‍රික් කොවිඩ් මෙහෙයුම් කමිටුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය ශ්‍රවණාගාරයේදී රැස් විය.

සියලුම ක්ෂේත්‍ර අතර මනා සම්බන්ධීකරණයක් පවත්වා කොවිඩ් පාලනය කටයුතු කිරීම මඟින් දිස්ත්‍රික්කයේ තත්ත්වය ආරක්ෂා කර ගත හැකි වනු ඇතැයි කෑගල්ල දිස්ත්‍රික් ලේකම් මහින්ද එස්. වීරසූරිය මහතා මෙහිදී සඳහන් කළේය.

කෑගල්ල දිස්ත්‍රික්කය තුළ මේ වන විට කොවිඩ් රෝගීන් 13ක් වාර්තා වන බවත් දිස්ත්‍රික්කය තුළ 532ක පිරිසක් නිවෙස්වල නිරෝධායන කටයුතු කෙරෙන බවත් දිස්ත්‍රික්කයේ තත්ත්වය පිළිබඳ අදහස් දක්වමින් දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක වෛද්‍ය කුමාර් වික්‍රමසිංහ මහතා ප්‍රකාශ කළේය.

දිස්ත්‍රික්කය තුළ උසස් පෙළ විභාගය පැවැත්වීම විධිමත්, ආරක්ෂාකාරී තත්ත්වයක් යටතේ සහ සෞඛ්‍ය අංශයේ අඛණ්ඩ නිරීක්ෂණය යටතේ කෙරෙන බවත් කොවිඩ් මර්දන කටයුතු සඳහා ආරක්ෂක අංශ සහ පළාත් පාලන ආයතන මැදිහත් වී කටයුතු කරන බවත් මෙහිදී සඳහන් විය.

එමෙන්ම රාජ්‍ය ආයතනවල සේවකයන් සේවා අවශ්‍යතා අනුව කාර්යාලයට ගෙන්වීම කෙරෙහිද කමිටු රැස්වීමේදී අවධානය යොමු කෙරිණි.

මේ අවස්ථාව සඳහා සමාගම් වතු ප්‍රතිසංස්කරණ, තේ වතු ආශ්‍රිත බෝග, කර්මාන්ත නවීකරණ තේ හා රබර් අපනයන ප්‍රවර්ධන සහ රාජ්‍ය අමාත්‍ය කනක හේරත්, කලාපීය සහයෝගිතා අමාත්‍ය තාරක බාලසූරිය, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ සම සභාපතිනි රාජිකා වික්‍රමසිංහ, පාර්ලිමේන්තු මන්ත්‍රී උදයකාන්ත ගුණතිලක යන මහත්ම මහත්මීන් සහ ප්‍රාදේශීය සභා සභාපතිවරුන් ඇතුළු දිස්ත්‍රික් දේශපාලන අධිකාරිය, අතිරේක දිස්ත්‍රික් ලේකම් (පාලන) නාලිකා පියසේන, අතිරේක දිස්ත්‍රික් ලේකම් (ඉඩම්) දිනීෂා එස් රත්නායක, සහකාර දිස්ත්‍රික් ලේකම් විජයානි රත්නසේකර යන මහත්මීන් ඇතුළු ප්‍රාදේශීය ලේකම්වරුන් සහ දිස්ත්‍රික්කයේ රාජ්‍ය ආයතන ප්‍රධානීන්, සබරගමු පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක කපිල කන්නන්ගර මහතා ඇතුළු සෞඛ්‍ය අංශ ප්‍රධානීන්, කෑගල්ල දිස්ත්‍රික් නියෝජ්‍ය පොලිස්පති ඇතුළු දිස්ත්‍රික්කයේ ආරක්ෂක අංශවල නිලධාරීහු පිරිසක් සහභාගී වූහ.

යාපනයේ කොරෝනා පැතිර යා හැකි සෑම මඟක්ම වැසුවා

❱ යාපනය දිසාපති

උතුරු පළාත් විශේෂ
රසුල දිල්හාර ගමගේ

යාපනය දිස්ත්‍රික්කය තුළ අලුතින් කොරෝනා රෝගය පැතිර යාමට ඇති ඉඩකඩ සියල්ල මේ වන විට පාලනය කොට ඇතැයි යාපනය දිසාපති කනපතිපිල්ලේ මහේසන් මහතා පෙරේදා (14) පැවසීය.

මේ වන විට යාපනයෙන් හමු වූ කොරෝනා රෝගීන් 28 දෙනා ප්‍රතිකාරවලින් පසුව රෝගීන් 18 දක්වා අඩු වී ඇතැයිද දිසාපතිවරයා සඳහන් කළේය.

යාපනය දිස්ත්‍රික්කය තුළ පවුල් 501කට අයත් පුද්ගලයන් 1098ක් ස්වයං නිරෝධායනයට ලක් වී ඇති බවත් 14 වැනිදා දිනය තුළ යාපනයෙන් අලුතින් හමු වී ඇත්තේ එක් ආසාදිතයකු පමණක් බවත් යාපනය දිසාපතිවරයා කීවේය.

කොරෝනා දෙවන රැල්ල මතුවීමෙන් පසුව යාපනයේ පීසීආර් පරීක්ෂණ 2000කට වඩා සිදු කොට ඇතැයිද එම පරීක්ෂණ සංඛ්‍යාව 5000ක් දක්වා ඉහළ දැමීමට කටයුතු සූදානම් කොට ඇතැයිද කී දිසාපතිවරයා මේ කාර්යයේදී යාපනයේ සෞඛ්‍ය අංශ ආරක්ෂක අංශ හා ස්වේච්ඡා සංවිධාන විශාල සහායක් දක්වන බවද කියා සිටියේය.

දඹුල්ලේ ආර්ථිකයේ කොරෝනා නෑ

සීගිරිය විශේෂ

දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානයේ අහඹු ලෙස කරන ලද පීසීආර් පරීක්ෂණවලින් කිසිදු රෝගියකු වාර්තා නොවූ බව දඹුල්ල නගරාධිපති ජාලිය ඕපාත මහතා රැයේ (15) පැවසීය.

පසුගියදා දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානය තුළට කෝවිඩ් 19 වයිරසය ශරීරගත වූ පුද්ගලයන් දෙදෙනකු පැමිණ වෙළඳසල් 80කට පමණ ගමන් කළ බවට ලද තොරතුර සමඟ මාතලේ වසංගත රෝග ඒකකය සමග එක්ව දඹුල්ල මහ නගර සභාවේ මැදිහත්වීමෙන් පුද්ගලයන් 100 දෙනකුගේ පීසීආර් පරීක්ෂණ කළ බවද ඒ මහතා ප්‍රකාශ කළේය.

ඒ අනුව මහනුවර මහා රෝහලේදී කරන ලද පීසීආර් පරීක්ෂණ වාර්තාව 14 වැනිදා රාත්‍රියේ තමා වෙත ලැබී ඇතැයිද එහි කිසිදු අයකුට කොරෝනා වයිරසය ආසාදනය වී නැති බවට වාර්තා වී ඇතැයිද නගරාධිපති ජාලිය ඕපාත මහතා වැඩිදුරටත් දන්වා සිටියේය.

දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානයේ වෙළෙඳසල් බොහෝමයක සේවය කරන පිරිස් පීසීආර් පරීක්ෂණ වාර්තා ලැබෙන තුරු තම නිවෙස්වලට පවා නොගොස් ආර්ථික මධ්‍යස්ථානයේම රැඳී සිටීමේ විශේෂත්වයක් දක්නට ලැබිණ. කෙසේ වෙතත් පරීක්ෂණ වාර්තා ප්‍රමාද වීම නිසා ආර්ථික මධ්‍යස්ථානය දැඩි කලබලකාරී තත්ත්වයක පැවතිණි.

කරන ලද පරීක්ෂණ සියයේ රෝගීන් වාර්තා නොවුණද දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානය තුළ කිසිදු අයකුට ආරක්ෂිත මුඛ ආවරණ නොමැතිව සේවය කිරීමට හෝ ඇතුළත රැඳී සිටීමට ඉඩ නොදෙන බවත් වෙළෙඳ සල්වල එසේ සිටින්නේ නම් එම වෙළෙඳසැල් හිමිකරුවන්ට විරුද්ධව නීතිමය පියවර ගන්නා බවත් නගරාධිපතිවරයා වැඩිදුරටත් සඳහන් කළේය.

කෑගල්ලේ තවත් 6කට කොරෝනා

කෑගල්ල දිස්ත්‍රික් සමූහ - දයාරත්න බණ්ඩාර

කෑගල්ල මහ රෝහලේ බාහිර රෝග අංශයේ සේවය කළ වෛද්‍යවරියන් තිදෙනාට අමතරව තවත් එහි රෝගීන් හය දෙනකුට කොරෝනා වයිරසය ආසාදනය වී ඇතැයි කෑගල්ල මහා රෝහලේ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කුමාර් රූපසිංහ මහතා පැවසීය.







පාස්කු ප්‍රහාරයේ වගකීම බාර ගත්තොත් තානාපතිකමක් දෙන බව පූජිත් ජයසුන්දරට කිසිම විටක පැවැසුවේ නෑ

හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන

සුභාෂිණී සේනානායක

අපේ රටේ තිබූ දේශපාලන බෙදීම්, ගැටුම් අන්තවාදී සංවිධාන විසින් ප්‍රයෝජනයට ගෙන තිබෙන බවත් එම අවස්ථා ප්‍රයෝජනයට ගනිමින් ISIS වගේ සංවිධාන අපේ රටට රිංගූ බවත් හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා පාස්කු කොමිසම හමුවේ පෙරේදා (14) කියා සිටියේය.

තම පාලන කාලයේ මේවා පාලනය කරන්න අවශ්‍ය පියවර ගන්න කටයුතු කළ බව කියා සිටි හිටපු ජනාධිපතිවරයා ජේ. ආර්. ජයවර්ධන ජනාධිපතිතුමාගේ කාලේ බෙදුම්වාදී යුද්ධය බරපතළ ලෙස තිබූ බවත්. එය වළක්වන්න එතුමාට බැරි වූ බවත් කියා සිටි අතර පාස්කු ප්‍රහාරයෙන් ඇති වූ තත්ත්වයන් පාලනය කරගන්න තමන් සහ රනිල් වික්‍රමසිංහ මහතා මොන ගැටුම් තිබුණත් හමුවී සාකච්ඡා කළ බවත් කියා සිටියේය.

එමෙන්ම පාස්කු ප්‍රහාරය වළක්වා නොගැනීමේ වගකීම භාර ගෙන පොලිස්පති තනතුරෙන් ඉල්ලා අස්වුවහොත් තානාපති ධුරයක් ලබාදෙන බවට තමන් පූජිත් ජයසුන්දර මහතාට කිසිසේත් නොපැවසූ බව ද හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා කොමිසමට කියා සිටියේය.

පාස්කු ප්‍රහාරය එල්ලවන අවස්ථාවේ මෙරට ආරක්ෂක අමාත්‍ය ධූරය දැරූ හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා ඊයේ පස්වරුවේ තුන්වැනි දිනටත් ජනාධිපති කොමිසම හමුවේ සාක්ෂි ලබා දීමට පැමිණියේය.

රජයේ අතිරේක සොලිසිටර් ජනරාල්වරිය - විරුද්ධ පක්ෂ මන්ත්‍රීවරුන් ආරක්ෂක කවුන්සිලයට කැඳෙව්වේ කුමන පදනමකින්ද?

හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා - විරුද්ධ පක්ෂයේ වුණාට මට විශ්වාස මාත් සමඟ, අපේ බෙදීම්, ගැටුම් ඒ අන්තවාදී සංවිධාන ප්‍රෙයෝජනයට ගත්තා. මගේ කාලේ මේවා පාලනය කරන්න පියවර ගත්තා. ජේ. ආර්. ජයවර්ධන ජනාධිපතිතුමාගේ කාලේ යුද්ධය බරපතළ ලෙස තිබුණා. එය වළක්වන්න බැරි වුණා. බරපතළ ජාත්‍යන්තර ඇඟිලි ගැසීම් තිබුණා. මේවා වළක්වන්න රනිල් වික්‍රමසිංහ මහත්තයාත්, මමත් මොන ගැටුම් තිබුණත් සාකච්ඡා කළා. උතුරු නැඟෙනහිර ජනාධිපති කාර්ය සාධක බළකාය හැදුවේ මේ විෂමතා ඉවත් කරන්න. අපි රණකාමී, සටන්කාමී ජාතියක්. අපේ ඉතිහාසය එහෙමයි. අපේ ලේවල තිබෙන්නේ ශ්‍රේෂ්ඨත්වය. සුළු ජාතික ප්‍රශ්නවලට සෑම ආණ්ඩුවක්ම මුහුණ දුන්නා. බැට කාලා තිබෙනවා. අද කොරෝනා එක්ක අපි සටන් කරනවා. කිසිම රාජ්‍ය නායකයෙක් සතුටින් රට කළ බව කියන්න බැහැ. ඩී. එස්. සේනානායක මහත්තයාගේ ඉඳලා සෑම රාජ්‍ය නායකයෙක්ම අසීරුතාවලට මුහුණ දී තිබෙනවා. මම රටේ, ජනතාවට ආදරය කළ කෙනෙක්. මොන රාජ්‍ය නායකයාද කැමැති රටේ ත්‍රස්තවාදය, අන්තවාදය ඇතිවෙනවාට. 2015 සිට ප්‍රහාරය තෙක් ආරක්ෂක මණ්ඩලය මේවා කතා කරලා උපදෙස් දී තිබෙනවා.

රජයේ අතිරේක සොලිසිටර් ජනරාල්වරිය - ප්‍රහාරයෙන් පසුව සෝදිසිවලදී මුස්ලිම් පල්ලිවල තියුණු ආයුධ, කඩු තිබුණා නේද?

මෛත්‍රීපාල සිරිසේන මහතා - ඔව්.

රජයේ අතිරේක සොලිසිටර් ජනරාල්වරිය - ඔබ කාතාන්කුඩියට ගොස් තිබෙනවාද? අනෙක් පළාත්වලට වඩා වෙනසක් දුටුවාද?

මෛත්‍රීපාල සිරිසේන මහතා - එහෙම මතකයක් නැහැ.

රජයේ අතිරේක සොලිසිටර් ජනරාල්වරිය - කාතාන්කුඩියේ පුවරුවල ඉංග්‍රීසි භාෂාවෙන් වගේම ආරාබි භාෂාවෙන් සටහන් කර තිබෙනවා නේද?

ජේ. ආර්. ජයවර්ධන ජනාධිපතිතුමාගේ කාලේ බෙදුම්වාදී යුද්ධය නවත්වන්න බැරි වුණා

සිටින අය තමයි ගෙන්වූයේ. ජාතික ආරක්ෂාව සම්බන්ධයෙන් ඒ අවස්ථාවේ රටේ තත්ත්වය, ආරක්ෂක කවුන්සිලය වැඩ කරන්නේ කොහොමද කියලා අවබෝධයක් දෙන්න මට අවශ්‍ය වුණා. ඒ නිසා මන්ත්‍රීවරුන් හතරදෙනෙකුට එන්න කිව්වා. ඒ අයට අවබෝධයක් දුන්නා, ජාතික ආරක්ෂක කවුන්සිලය කියන්නේ මේකයි කියලා. පාර්ලිමේන්තුවේ ප්‍රශ්නයක් ආවොත් පිළිතුරු දීමේ පදනම මතයි ඒ අය ගෙන්වූයේ.

රජයේ අතිරේක සොලිසිටර් ජනරාල්වරිය - ආරක්ෂක මණ්ඩල රැස්වීම්වල උනන්දුවක් දැක්වූයේ මොන වගේ කරුණු ගැන කතා කරන්නද?

හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා - එක් එක් වකවානුවල එක් එක් තත්ත්වයන් ඇතිවී තිබෙනවා. මගේ නිල කාලයේ විවිධ ක්ෂේත්‍ර කරා කරුණු ගලා ගියා. කොළොන්නාව කුණු කන්ද සිද්ධියෙන් මරණ ගණනාවක් ඇතිවුණා. කෑගල්ල නාය යෑම, මහනුවර ගැටුම බරපතළ තත්ත්වයන් ඇතිකළා. 2016 - 2017 කාලය තුළ ස්වභාවික විපත් ඇතිවුණා. රත්නපුර, ගාල්ල ගංවතුරෙන් විශාල හානි සිදුවුණා. ඒවාට මුහුණ දෙන්න, අපරාධ මර්දනය කිරීම, මත්කුඩු, අන්තවාදය, පාතාලය, එල්. ටී. ටී. ඊ. නැගීසිටීම වැනි කරුණු ඉදිරිපත් වුණාම තීන්දු තීරණ ගත්තා. මඩකළපු පොලිසියේ දෙදෙනෙකු ඝාතනය වුණාම යුද හමුදා බුද්ධි අංශ වාර්තා කළේ එල්. ටී. ටී. ඊ. සිද්ධියක් කියලා. මාසයක්, එකහමාරක් ගියාම පාස්කු මෙහෙයුමේදී පොලිසියේ රාළහාමිලාගේ පිස්තෝල මේ අය ළග තිබී අහුවුණා. මේ කරුණු දීර්ඝව කතා කළා. නියෝග උපදෙස් දුන්නා.

රජයේ අතිරේක සොලිසිටර් ජනරාල්වරිය - අසාද් සාලි මහතා කාන්තන්කුඩියේ සහරාන් ගැන අවස්ථා කිහිපයකදී පැමිණිලි කළාද?

මෛත්‍රීපාල සිරිසේන මහතා - පැමිණිලි කළා. මුස්ලිම් ජාතීන් අතර විවිධ සංවිධාන තිබෙනවා. දේශපාලන පක්ෂ තිබෙනවා. සිංහලත්, දෙමළත් එහෙමයි. ඔය හැම අයෙකුගේම අභ්‍යන්තර ගැටීම් තිබෙනවා. සහරාන් හොඳ නැති බව කීවා. ඒ කරුණු ආරක්ෂක මණ්ඩලයේදී සැලකිල්ලට ගත්තා.

රජයේ අතිරේක සොලිසිටර් ජනරාල්වරිය - සහරාන්ගේ සංවිධානය විනාශ කළාද?

මෛත්‍රීපාල සිරිසේන මහතා - ප්‍රහාරයෙන් පසු සති 4 ක් යාමට පෙර සහරාන්ගේ සංවිධානය සම්පූර්ණයෙන් විනාශ කළා. කෙටි කලකින් හැමෝම අත්අඩංගුවට ගන්න හැකිවුණා. පුහුණු කඳවුරු හදුනාගත්තා. ලංකාවේ පිපිරීම්වල වගකීම ISIS බාරගන්නවා කිව්වා. ජාත්‍යන්තරව සහරාන්ලාට සම්බන්ධයක් තිබිය යුතුයි කියන විශ්වාසය තිබෙනවා.

රජයේ අතිරේක සොලිසිටර් ජනරාල්වරිය - ආචාර්ය විජයදාස රාජපක්ෂ මහතා 2016-11-18 සිරියාවට ගොස් ISIS පුහුණුව ලබන මුස්ලිම්වරුන් ගැන පාර්ලිමේන්තුවේදී කතා කළා නේද?

මෛත්‍රීපාල සිරිසේන මහතා - විජයදාස මහතා ආරක්ෂක මණ්ඩලයට කළ චෝදනාව මා ප්‍රතික්ෂේප කරනවා. ඔවුන්ගේ තොරතුරු ගුවන් තොටුපළට දීලා පියවර ගන්න කියලා උපදෙස් දී තිබුණා.

රජයේ අතිරේක සොලිසිටර් ජනරාල්වරිය - 2017-06-13 සිංහල හා මුස්ලිම් නොසන්සුන්තාවක් ගැන බුද්ධි අංශ කියලා තිබුණා නේද? සාමය නැත්නම් රජයකට කටයුතු කරන්න අමාරුයි නේද?

මෛත්‍රීපාල සිරිසේන මහතා - . මේ රටේ දේශපාලනඥයින් දෙන දායකත්වය නිසා ඇතිවන අසමගිකම් නිසා විවිධ සංවිධාන ඇතිවෙනවා. ජාතීන් තුළ බෙදීම් ඇතිවෙනවා. මේ සියල්ල එකට එකතු වූ සංකීර්ණ සමාජයක් රටේ තිබෙන්නේ. මේ කතාවට ISIS වගේ සංවිධාන අපේ රටට රිංගුවා.

මෛත්‍රීපාල සිරිසේන මහතා - ඔව්.

රජයේ අතිරේක සොලිසිටර් ජනරාල්වරිය - නගර මධ්‍යයේ තිබෙන්නේ රටඉඳි ගස් නේද? ඔබතුමා රටඉඳි ගස් දැක තිබෙන්නේ කොහේද?

මෛත්‍රීපාල සිරිසේන මහතා - සිනාසෙයි... පිටරටවල දැක තිබෙනවා.

රජයේ අතිරේක සොලිසිටර් ජෙනරාල්වරිය - 2018 ඔක්තෝබර් මාසයේ ඇතිවූ ව්‍යවස්ථා අර්බුදයෙන් පසු නැවත අගමැති ධූරයට පත්වූ රනිල් වික්‍රමසිංහ මහතාව ආරක්ෂක කවුන්සිලයේ රැස්වීම් සඳහා කැඳවූවාද?

හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා - මට ඒ පිළිබඳ මතකයක් නැහැ.

රජයේ අතිරේක සොලිසිටර් ජෙනරාල්වරිය - මෙම කොමිසමට සාක්ෂි ඉදිරිපත් වුණා ඔබතුමා රනිල් වික්‍රමසිංහ මහතාව කැඳවූවේ නැහැ කියලා.

හිටපු ජනාධිපති - මෛත්‍රීපාල සිරිසේන මහතා- ස්වාමීනි ගැසට් එක අනුව අගමැතිව ඊට කැඳවන්න ඕනෙ නැහැ. ජනාධිපතිට අවශ්‍යනම් පමණයි කැඳවන්නේ. ඒ නිසා මම කැඳවන්නේ නැතිව ඇති. මට හරියට මතකයක් නෑ ආවද කියලා එතුමා.

රජයේ අතිරේක සොලිසිටර් ජෙනරාල්වරිය හිටපු ආරක්ෂක ලේකම් හේමසිරි ප්‍රනාන්දු මහතා ඔබෙන් ඇහුවලු අග්‍රාමාත්‍යවරයා කැඳවනවාද කියලා. එතකොට ඔබතුමා කිව්වලු 'ඔයාට පිස්සුද?' කියලා.. ඇත්තද එක ?

හිටපු ජනාධිපති - මෛත්‍රීපාල සිරිසේන - එහෙම පිස්සුද කියලනම් වචනයක් භාවිත කරලනම් නැතුව ඇති.

රජයේ අතිරේක සොලිසිටර් ජෙනරාල්වරිය ඔය රැස්වීම්වල මුස්ලිම් අන්තවාදය ගැන සාකච්ඡා කළාද ?

හිටපු ජනාධිපති - මෛත්‍රීපාල සිරිසේන - 2016 ඉදලා අපි මුස්ලිම් අන්තවාදය ගැන සාකච්ඡා කළා

රජයේ අතිරේක සොලිසිටර් ජෙනරාල්වරිය - ශබතුමාලට තොරතුරු ලැබුණද සහරාන්ලව ජාත්‍යන්තර වශයෙන් කවුරු හෝ මෙහෙයවූවා කියලා?

හිටපු ජනාධිපති - මෛත්‍රීපාල සිරිසේන - සහරාන්ලා බෝම්බ ගැහුවට පස්සේ IS නායකයා සහ තව ප්‍රකාශකයෙක් ලංකාවෙ සිදුවුණ ප්‍රහාරයේ වගකීම බාර ගන්නවා කියලා නිවේදනය කරලා තිබුණා. ඒ නිසා සහරාන්ලට ජාත්‍යන්තර සහායක් තිබුණා කියන්න පුළුවන්. සහරාන්ලගේ සංවිධානය අපි විනාශ කළත් ලෝකෙ තවමත් IS ක්‍රියා වාර්තාවෙන නිසා මේ සිද්ධිය මෙතනින් ඉවරයි කියලා හිතන්න බැහැ.

රජයේ අතිරේක සොලිසිටර් ජෙනරාල්වරිය - ඔබතුමා දැනගෙනද හිටියේ සහරාන්ලාගේ ජාතික තව්හිද් ජමාත් එකට බාහිරින් IS මතවාදය දරණ තවත් කණ්ඩායම් ක්‍රියාත්මක වුණා කියලා ?

හිටපු ජනාධිපති - මෛත්‍රීපාල සිරිසේන - ඔව් මම දැන සිටියා. මට බුද්ධි අංශ ඒ ගැන වාර්තා ඉදිරිපත් කළා.

මෙහිදී මේ වනවිටත් කොමිසමට ඉදිරිපත්ව ඇති තාක්ෂණික සාක්ෂියක් සහාවේ අවධානයට රජයේ අතිරේක සොලිසිටර් ජෙනරාල්වරිය විසින් යොමු කළා.

එහි සඳහන් වූයේ Akhi, did anyone start fighting before us ? ලෙස පාස්කු ප්‍රහාරයට පසු වෙනත් අන්තවාදී දෙපිරිසක් අතර හුවමාරු වූ කෙටි පණිවිඩයක්.

එම පණිවිඩය පෙන්වමින් මෛත්‍රීපාල සිරිසේන මහතාගෙන් විමසුවේ සහරාන් හෂීම්ට පෙර එම අන්තවාදී මතයම අනුව යමින් තවත් පිරිස් ක්‍රියාත්මක වී ඇති බව මෙයින් පෙනී යන්නේද බවයි.

එහිදී එහෙමයි ස්වාමීනි යනුවෙන් අතිරේක සොලිසිටර් ජෙනරාල්වරියගේ විමසීමට මෛත්‍රීපාල සිරිසේන මහතා ප්‍රතිචාර දැක්වූවා.

හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන -

මේ කාරණය මම ජනාධිපති වුණාට පස්සෙ ඇති වුණ තත්ත්වයක් නෙවෙයි ස්වාමිනි. මේක අවුරුදු 70ක විතර ඉදන් එන සිංහල, මුස්ලිම්, දෙමළ ජනතාව අතර ඇති ගැටුමක්. අපි වගේ පුංචි රටක මේ වගේ ඇතිවෙන ගැටුම්වලදී දේශපාලකයන් දෙන නායකත්වය නිසා බෙදීම් ඇතිවෙනවා. ඒක බොහොම හොඳින් පේනවා මේ සංවිධාන දිහා බැලුවම. අන්තර්ජාතික වශයෙන් IS සංවිධානයත් ඔය අතරේ අපේ රටට රිංගුවා මට පේන විදියට. ඒ අය අපේ රටේ බෙදීම්වලින් ප්‍රයෝජන ගත්තා. ජාතික ආරක්ෂක කවුන්සලයේ, ඇමති මණ්ඩලයේ රනිල් වික්‍රමසිංහ මහත්තයලා අපි අතර මොන තරම් ගැටලු තිබුණත් මේ කටයුතුවලදි අපි එකට කටයුතු කරලා පියවර ගත්තා. මං උතුරු නැගෙනහිර වෙනුවෙන් වෙනම ජනාධිපති කාර්ය සාධක බළකායක් දාලා හිටං මේවට පිළියම් හෙව්වා. J.R. මහත්තයා වුණත් යුද්ධෙදි ගන්න පුළුවන් පියවර ගත්තට නවත්තගන්න බැරි වුණානේ. දැන් මේ සහරාන්ගෙ සිද්ධිය ගත්තම වරෙන්තු නිකුත් වුණෙත් ඒ අයගේ සංවිධාන අතරම ඇතිවුණ ගැටුම් නිසා. ආරක්ෂක අමාත්‍යාංශය විදියට අපි මොන තරම් මේ වගේ ප්‍රශ්නවලට මුහුණ දෙනවාද? ඩී. එස්. සේනානායක මහත්තයගෙ ඉඳලා සතුටින් ආණ්ඩු කරපු එක රජයක්වත් නැහැ. මාත් මගේ ධූර කාලය තුළ බරපතළ ප්‍රශ්න රැසකට මුහුණ දුන්නා. මම මේ රටට ආදරේ කරන මිනිහෙක්. මං මේ ඇඟ බේරගන්න හදනවා නෙවෙයි. 2015 ඉදන් 2019 අප්‍රේල් වෙනකල් මේ හැමදෙයක්ම ආරක්ෂක කවුන්සිලයේ කතා කළා. ඒ අවශ්‍ය උපදෙස් දුන්නත් ඉහළ ඉදන් පහළට සහ පහළ ඉදන් ඉහළට මේ දේවල් හරිහැටි ක්‍රියාත්මක වුණානම් මෙහෙම වෙන්නෙ නැහැ. මට පුළුවන් උපරිමයෙන් කටයුතු කළා.

පූජිත් ජයසුන්දරව ඉවත් කරන්නත් අපි සූදානම් වුණා

ජනාධිපති කොමිසමේ විග්‍රාමික අභියාචනාධිකරණ විනිසුරු -

ඔය විදියට උපදෙස් දීලා ඒවා නොවුණ එකට කවුද වගකියන්න ඕනෑ?

හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන -

මගේ මතය අනුව තොරතුරු ලැබුණු සියලු දෙනා වගකීම් ඉටුනොකිරීම ගැන වගකියන්න ඕනෙ

ජනාධිපති කොමිසමේ සභාපති විනිසුරු -

වනාතවිල්ලුවේ පුපුරන ද්‍රව්‍ය සොයා ගැනීමේ දී ඊට සම්බන්ධ 4 දෙනෙක් අත්අඩංගුවට ගත්තා. නමුත් ඔවුන් ඒ සිද්ධියෙන් මාස තුනක් යන්නත් කලින් නිදහස් වුණා. ඒ වගේම ත්‍රස්ත පනත යටතේ අත්අඩංගුවට ගත්ත කෙනෙක් මේ වෙද්දිත් බන්ධනාගාරයේ ඉන්නවා. මොකක්ද මේ ඉස්ලාම් අන්තවාදයට අනුව ගත් අයව නිදහස් වෙන්නත් අනිත් කෙනා තාමත් බන්ධනාගාරයේ රඳවා ගන්නත් වෙනස් හේතු..?

පාස්කු දා ප්‍රහාරය පිළිබඳ සොයා බලන ජනපති කොමිසම

හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන -

එහෙම දෙයක් වුණානම් ස්වාමීනි ඒ නිදහස් කරන්න නිර්දේශ කරපු කෙනා තමයි වගකියන්න ඕනේ.

ජනාධිපති කොමිසමේ සභාපති විනිසුරු -

ඒ වනාතවිල්ලුවේ සිවුදෙනාගෙන් තිදෙනෙක් කොන්දේසි මත නිදහස් කරන්න අත්සන යොදලා තියෙන්නේ ඔබතුමා

හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන -

කඩදාසි හදන් ආවම අත්සන් කරනවා. CID එක ඔය වගේ ලිපි ගොඩවල් ගණනාවක් අරන් එනවා. නමුත් ඒ නිලධාරින් ගැන තිබෙන විශ්වාසයට අත්සන් යොදනවා එච්චර ලිපි ගොඩක් බල බල ඉන්න බැරි නිසා ස්වාමීනි

CID එක අරන් එන ලිපි ගොඩවල්වලට නිලධාරීන් ගැන විශ්වාසය තබා අස්සන් කරනවා

ජනාධිපති කොමිසමේ අභියාචනාධිකරණ විනිසුරු -

මීට පෙර දිනයේ රනිල් වික්‍රමසිංහ හිටපු අග්‍රාමාත්‍යවරයා කිව්වා මේ ප්‍රහාරය වළක්වා නොගැනීමේ වගකීම සාමූහිකව භාරගන්න ඕනේ කියලා. ඒ ප්‍රකාශය ගැන ඔබේ මතය මොකක්ද

හිටපු ජනාධිපති - මෛත්‍රීපාල සිරිසේන -

මේක වළක්වාගන්න තිබුණ ප්‍රහාරයක්. ඒ වගකීම එක්කෙනෙක් දෙන්නෙක් නෙවෙයි විශාල පිරිසක් අතරේ බෙදී යනවා. ඒ අයයි ඒ වගකීම භාර ගන්න ඕනෑ

රජයේ අතිරේක සොලිසිටර් ජෙනරාල්වරිය -

නමුත් 2019.04.21 ස්ථාන 8ක බෝම්බ පිපිරිලා, පල්ලි ගිය බැතිමතුන් සිය ගාණක් ජීවිතක්ෂයට පත්වෙලා, හෝටල්වල පාතරසය විදිමින් සිටි සිය ගාණකට ජීවිත නැති වුණා. බෝම්බ ගහනකල් නීතිය හා සාමය මෙන්ම ආරක්ෂක අමාත්‍යවරයා වුණේ ඔබතුමා. ජනාධිපති විදියට ඔබ උපදෙස් දීලා තිබුණා නම් කොහොමද මැතිතුමනි ඉස්ලාම් අන්තවාදය හිසඔසවලා මේවට කිසිම දායකත්වයක් නොදක්වපු අර අහිංසක මිනිස්සු මේකට බිලිවුණේ

හිටපු ජනාධිපති - මෛත්‍රීපාල සිරිසේන -

එහෙනම් ඉතින් ස්වාමීනි රටේ ජනාධිපති විතරයි ඉන්න ඕනේ. පොලිස්පති, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරුන්, නියෝජ්‍ය පොලිස්පතිලා, ප්‍රාදේශීය පොලිස් නිලධාරින් කවුරුත්ම ඕනේ නැහැ. මේ තොරතුරු ගැන පරීක්ෂණ කරන්න ඉහළින් උපදෙස් දෙනකල් ඉන්න ඔනේ නැහැ... නිලධාරින් ඒවා හොයල බලල කරන්න ඕනෙ ඒක එයාලගෙ වගකීම. අපි ආරක්ෂක කවුන්සිලයේදී උපදෙස් ඕන තරම් දීලා තියෙනවා

රජයේ අතිරේක සොලිසිටර් ජෙනරාල්වරිය -

ඔබතුමා යම් අවස්ථාවක පොලිස්පතිව ජාතික ආරක්ෂක කවුන්සිලයට නොකැඳවන්න තීරණය කළාද

හිටපු ජනාධිපති - මෛත්‍රීපාල සිරිසේන -

ඔව් සමහර අවස්ථාවල. එක වෙලාවක CID නිශාන්ත සිල්වා මාරුකරන්න කියපු අවස්ථාවේ මේක ආරක්ෂක කවුන්සිලයේ සාකච්ඡා කළ පිපිරිදි කියලා පොලිස් කොමිසමට ලියලා තිබුණා. ඒක වැරැද්දක් එහෙම යොදපු එක. ඊළඟට ආරක්ෂක කවුන්සිලයට ආවට කිසි දෙයක් අහන් ඉන්නේ නෑ, සටහන් දාගන්නෙ නැහැ. ඒ නිසා එන්න එපා කියලා ඔහු වෙනුවට CID එකේ රවි සෙනෙවිරත්න ගෙන්නුවා. පූජිත් තනතුරට නොගැළපෙන වැඩ කළේ එකපාරක් දෙපාරක් නෙවෙයි නිසා රංජිත් මද්දුමබණ්ඩාර ඇමතිතුමාගේ කාලේ විනය පරීක්ෂණත් කළා. 2018 අගභාගය වෙද්දි රනිල් වික්‍රමසිංහ මහතා සහ කරු ජයසූරිය මහත්මයා සමග සාකච්ඡා කරලා පූජිත් ජයසුන්දරව ඉවත් කරන්නත් අපි සූදානම් වුණා. නමුත් ඉතින් මට පූජිත් එක්ක පෞද්ගලික තරහක්නම් තිබුණේ නැහැ. එතුමා මාව හම්බෙන්න සතියට දෙපාරක්වත් ඇවිත් යනවා කෝල් ගන්නවා.

රජයේ අතිරේක සොලිසිටර් ජෙනරාල්වරිය -

ඔබ කිව්වා නිශාන්ත සිල්වා මාරුකිරීම ගැන. ඔබ එහෙම නිශාන්ත සිල්වා මාරු කරන්න කියලා පසු අවස්ථාවක යළිත් කිව්වද කාගෙන් අහලද මාරු කළේ කියලා ?

හිටපු ජනාධිපති - මෛත්‍රීපාල සිරිසේන -

දැන් ඔය නිශාන්ත සිල්වා අදටත් ලංකාවෙ නැහැනෙ පැනලා ගිහින් ඉන්නෙ. එයා තමයි ඔය යුද හමුදා නිලධාරින් අත්අඩංගුවට ගත්ත කෙනා. ඒ ගැන ආපු පැමිණිලි නිසා තමයි නිශාන්ත සිල්වාව මීගමුවට මාරු කෙරුණේ. නමුත් ඒකට රනිල් වික්‍රමසිංහ මහතා ඇතුළු ආණ්ඩුවේ ගොඩක් අය විරුද්ධ වුණා ඉතා දැඩිව. NGO පවා අධිකරණයට යන්න හැදුවා. පස්සෙ තමයි මම කිව්වේ ඔයගොල්ලෝ කැමති දෙයක් කරගන්න කියලා. ඊටපස්සෙ තමයි නිශාන්ත සිල්වාව ආයෙත් CID එකට මාරුකළේ. ජාත්‍යන්තර NGO තමයි ඔය නිශාන්ත සිල්වා පසුපස හිටියේ. අපි LTTE එක පරාජය කළාට ජාත්‍යන්තරයේ තාම තියෙනවා. ඒ අයගේ NGO තමයි මේ නිශාන්තලව පාලනය කළේ.

අතිරේක සොලිසිටර් ජෙනරාල්වරිය -

ඔබ තව අවස්ථාවක ප්‍රහාරය සිදුවුණාට පස්සෙ පොලිස්පති පූජිත් ජයසුන්දර මහත්තයා ගෙන්නලා කිව්වද මේකෙ වගකීම භාර අරන් ඉවත් වුණොත් කැමති රටක තානාපති කමක් දෙන්නම් කියලා ?

හිටපු ජනාධිපති - මෛත්‍රීපාල සිරිසේන -

ඒක සම්පූර්ණයෙන් බොරුවක්. තානාපති කමක් දෙන්නම් කිව්වා පූජිත් අර නුවර පෙරහැරේ නටපු වෙලාවෙ. එතකොට මම කිව්වා ඉවත් වෙලා යන්න මම වෙන පොලිස්පති කෙනෙක් පත්කරගන්නම් කියලා.

ජනාධිපති කොමිසමේ අභියාචනාධිකරණ විනිසුරු -

අප්‍රේල් 4 වෙනිදා සිට ඔබ විදෙස් ගත වූ 16 දක්වා ඔබේ පැජිටි පාරෙ දුරකතනයට නිලන්ත ජයවර්ධන මහතා අවස්ථා ගණනාවක සම්බන්ධ වෙලා ඔබතුමා එක්ක කතා කරලා තිබුණා. ඒ එක අවස්ථාවක හරි ඔබට මෙම ප්‍රහාරය ගැන දැනුම්දුන්නද ?

හිටපු ජනාධිපති - මෛත්‍රීපාල සිරිසේන -

නෑ කිසිම අවස්ථාවක කිව්වේ නැහැ. ඒක විශාල අතපසු වීමක්.

රජයේ අතිරේක සොලිසිටර් ජනරාල්වරිය - ඔබට නිලන්ත ජයවර්ධන අප්‍රේල් 21 පෙරවරු 8.01 ට සහ 8.11 ට දුරකථන ඇමතුම් 2 ක් දීලා තිබෙනවා. ප්‍රහාරයට අදාළ තොරතුරු ඔබට කිව්වාද?

මෛත්‍රීපාල සිරිසේන මහතා - ප්‍රහාරයේ සිදුවූ ජීවිත හානිය, දේපළ හානිය ගැන කිව්වා. පොලිස්පතිතුමාට, ආරක්ෂක ලේකම්ට, අනෙකුත් අයට ප්‍රහාරයක් විය හැකි බවට දැනුම් දුන් බවත් කිව්වා.

රජයේ අතිරේක සොලිසිටර් ජනරාල්වරිය - ඔබට ඒ දුරකථන ඇමතුම් දී තිබුණේ ප්‍රහාරයට කලින්.

මෛත්‍රීපාල සිරිසේන මහතා - එහෙම ඇමතුමක් ගත්තේ නැහැ.

රජයේ අතිරේක සොලිසිටර් ජෙනරාල්වරිය -

ප්‍රහාරයෙන් පසු ඔබ ඇහුවෙ නැත්ද නිලන්ත ජයවර්ධන මහත්මයාගෙන් ඇයි මට මේක කලින් නොකිව්වේ කියලා ?

හිටපු ජනාධිපති - මෛත්‍රීපාල සිරිසේන -

මම අප්‍රේල් 22 ආරක්ෂක කවුන්සිලය ඉවර වෙලා යන ගමන් ඇහුවා. එතකොට කිව්වා මේ ගැන සිසිර මෙන්ඩිස් ඇතුළු අනිත් අයට කිව්වා කියලා. ඔවුන් මට කියයි කියලා නිලන්ත හිතන් ඉඳලා තියෙන්නෙ.

රජයේ අතිරේක සොලිසිටර් ජෙනරාල්වරිය -

මේ ප්‍රහාරය ගැන දැනගෙනයි ඔබ රටින් පිටවුණේ කියලා මේ කොමිසමට සාක්ෂි ඉදිරිපත් වී ඇත්නම් ඔබතුමා එය පිළිගන්නවාද ?

හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන -

මම ප්‍රතික්ෂේප කරනවා. කිසිසේත්ම නැහැ ස්වාමීනි ඒක අසත්‍යයක්. ඒ තොරතුර ලැබුණ නම් රට අතහැරලා යන පහත් මට්ටමක මම හිටියේ නැහැ. මේක කවුරුන් හෝ ගොතපු කතාවක් මම රටට, ජනතාවට ආදරය කළ කෙනෙක්. රටේ සියලුදෙනාගේ ජීවිත ආරක්ෂා කරගන්න මම බැඳී සිටිනවා. තොරතුරු ලැබුණා නම් මම ගත යුතු සියලු පියවර ගන්නවා. කවුරුන් හෝ කිව්වා නම් එය නිර්මාණය කරලා ගොතන ලද එකක්. හදිසි නීතිය, ඇඳිරි නීතිය අවශ්‍ය පරිදි යොදා රට ආරක්ෂා කර ගන්න මම පියවර ගන්නවා ස්වාමීනි.

කොමිසම - 2019-04-12 ඔබ මඩකළපුවේ සංචාරයක් කළා. එම ප්‍රදේශයට යාමට ආරක්ෂාව තිබේද කියා නිලන්ත ජයවර්ධන මහතාගෙන් විමසා බැලුවාද?

මෛත්‍රීපාල සිරිසේන මහතා - මතකයේ හැටියට අහන්න ඇති.

කොමිසම - නිලන්ත ජයවර්ධන ඒ අවස්ථාවේ දැනුම් දුන්නේ මොකක්ද?

මෛත්‍රීපාල සිරිසේන මහතා - ආරක්ෂාව හොඳින් තිබෙන බව දැනුම් දුන්නා.

රජයේ අතිරේක සොලිසිටර් ජෙනරාල්වරිය - ඔහු අප්‍රේල් 04 ලැබුණු බුද්ධි තොරතුර ගැන දැනුම් දුන්නාද? එම තොරතුරට අදාළ සියලුදෙනා නැගෙනහිර පළාතෙ අය බව කිව්වාද?

මෛත්‍රීපාල සිරිසේන මහතා - නැහැ.

කොමිසම - විදේශගතවන විට ආරක්ෂක ඇමැතිවරයෙක් පත් කළේ නැහැ නේද?

මෛත්‍රීපාල සිරිසේන මහතා - ජේ. ආර්. ජයවර්ධන ජනාධිපතිතුමා පත්කරලම නැහැ. 2010 - 2015 ජනාධිපතිතුමාත් ඇතැම් වෙලාවට තමයි පත්කර තිබෙන්නේ. රටේ ප්‍රශ්නයක් නැහැ කියලා තේරෙනවා නම් පත්කරන්නේ නැහැ. මටත් නරක තත්ත්වයක් වාර්තා වී තිබුණේ නැහැ. ඒ නිසා මමත් එහෙම කළේ නැහැ. මේ වගේ සිද්ධියක් වුණාම තනතුරු

ආරක්ෂක කවුන්සිලයට කැඳෙව්වේ විරුද්ධ පක්ෂයේ වුවත් මට විශ්වාස මන්ත්‍රීවරුන්

විජයදාස මහතා ආරක්ෂක මණ්ඩලයට කළ චෝදනාව මා ප්‍රතික්ෂේප කරනවා

වට මාරු කෙරුණේ. නමුත් ඒකට රනිල් වික්‍රමසිංහ මහතා ඇතුළු ආණ්ඩුවේ ගොඩක් අය විරුද්ධ වුණා ඉතා දැඩිව. NGO පවා අධිකරණයට යන්න හැදුවා. පස්සෙ තමයි මම කිව්වේ ඔයගොල්ලෝ කැමති දෙයක් කරගන්න කියලා. ඊටපස්සෙ තමයි නිශාන්ත සිල්වාව ආයෙත් CID එකට මාරුකළේ. ජාත්‍යන්තර NGO තමයි ඔය නිශාන්ත සිල්වා පසුපස හිටියේ. අපි LTTE එක පරාජය කළාට ජාත්‍යන්තරයේ තාම තියෙනවා. ඒ අයගේ NGO තමයි මේ නිශාන්තලව පාලනය කළේ.

අතිරේක සොලිසිටර් ජෙනරාල්වරිය -

ඔබ තව අවස්ථාවක ප්‍රහාරය සිදුවුණාට පස්සෙ පොලිස්පති පූජිත් ජයසුන්දර මහත්තයා ගෙන්නලා කිව්වද මේකෙ වගකී

හින්දු කෝවිල් හතළිහකට අගමැති අතින් මූල්‍යාධාර

තෝරා ගත් හින්දු කෝවිල් හතළිහකට නව රාත්‍රී පූජා උත්සවයට සමගාමී ව රුපියල් පනස්දහස බැගින් මූල්‍යාධාර පිරිනැමීම අරලියගහ මන්දිරයේ දී අගමැති මහින්ද රාජපක්ෂ මහතාගේ ප්‍රධානත්වයෙන් ඊයේ (15) සිදු කෙරිණි.

මුදල් ආධාර ප්‍රදානය සංකේතවත් කරමින් කෝවිල් භාරකාර මණ්ඩලවල සභාපතිවරුන් වෙත මෙහිදී අගමැතිවරයා අතින් මූල්‍යාධාර චෙක්පත් ප්‍රදානය කෙරිණි.

කොවිඩ්-19 වසංගතය හේතුවෙන් මුළු ලෝකයම විශාල තර්ජන හා අර්බුදවලට මුහුණ පා ඇති අවස්ථාවක වුවත්, ආණ්ඩුවක් ලෙස හින්දු ආගමික සාරධර්ම ආරක්ෂා කිරීම සැමගේ වගකීමක් බව අගමැති මහින්ද රාජපක්ෂ මහතා එහිදී ප්‍රකාශ කෙළේය.

මෙවැනි දුෂ්කර අවස්ථාවක හින්දු කෝවිල් සඳහා රුපියල් 50000ක අධාර මුදලක් ලබා දීමෙන් ආගමික සාරධර්ම ආරක්ෂා කිරීමට සහ රටට සෙතක් වේවායි කියලා ප්‍රාර්ථනා කරන්නට මෙය අවස්ථාවක් කර ගන්නවා.

ආගමික කටයුතු භාර ඇමැතිවරයා වශයෙන් හින්දු ධර්මය හා හින්දු ආගමේ සාරධර්ම ආරක්ෂා කිරීම අපගේ වගකීමක්. මෙම ආගමික සාරධර්ම ප්‍රවර්ධනය කිරීම සඳහා ද රුපියල් 50000ක දායක මුදලක් ලබා දෙන්න අපි බලාපොරොත්තු වෙනවා.

ආරම්භ කරන සෑම දෙයක්ම සාර්ථකව අවසන් වේ යැයි බලාපොරොත්තුවෙන්, යහපත් ක්‍රියාවන් ආරම්භ කරන මෙම නවරාත්‍රී උත්සව කාලයේ අප මෙම පුණ්‍ය කටයුත්ත ආරම්භ කිරීම ද ඉතා වැදගත් වෙනවා. කෝවිඩ් - 19 ආසාදන තර්ජනය මධ්‍යයේ කෝවිල්වල පවත්වනු ලබන උත්සවවල දී සෞඛ්‍ය අමාත්‍යාංශයේ සෞඛ්‍ය මාර්ගෝපදේශ අනුගමනය කිරීමට කටයුතු කරයි කියලා අපි විශේෂයෙන් බලාපොරොත්තු වෙනවා යැයි කීවේය.

ඇමැතිවරුන් වන ඩග්ලස් දේවානන්දා, නාමල් රාජපක්ෂ, රාජ්‍ය ඇමැති ජීවන් තොන්ඩමන්, පාර්ලිමේන්තු මන්ත්‍රී එම්. රාමේශ්වරන්, අගමැති ලේකම් ගාමිණී සෙනරත්, අගමැති අතිරේක ලේකම් චමින්ද කුලරත්න, බදුල්ල දිස්ත්‍රික් අගමැති සම්බන්ධීකරණ ලේකම් සෙන්දිල් තොන්ඩමන් මහත්වරුන් ඇතුළු පිරිසක් මෙම අවස්ථාවට එක්ව සිටියහ.

Waterfront Integrated Resort
පළමු මහලේ වැඩ අවසන්

ජෝන් කීල්ස් සමූහ ව්‍යාපාරය කොළඹ 12, ජස්ටිස් අක්බාර් වීදියේ ඉදි කරන ලද Waterfront Integrated Resort නිවාස සංකීර්ණයේ පළමු මහලේ මූලික වැඩ කටයුතු අවසන් කිරීම නිමිත්තෙන් මහා සංඝරත්නයේ ආශිර්වාදය ලබා ගැනීම සඳහා සංවිධාන කළ පිරිත් දේශනාවට අගමැති මහින්ද රාජපක්ෂ මහතා ද ඊයේ (15) එක් විය.

ගොඩනැගිලි 6කින් සමන්විත මෙම නිවාස සංකීර්ණයේ මූලික කටයුතු අවසන් කළ ගොඩනැගිල්ල මහල් 33කින් සමන්විතය. මහල් 47කින් යුත් නිවාස සංකීර්ණ දෙකක්, සිනමාහල්, සාප්පු සංකීර්ණ හා ආපන ශාලාවලින් සමන්විත මෙම නිවාස සංකීර්ණය සුඛෝපභෝගී ජීවන රටාවකට අවශ්‍ය සියලු පහසුකම්වලින් සැදුම්ලත්ය.

ඇලන් මැතිනියාරාමාධිපති උඩුවේ ධම්මාලෝක ස්වාමීන් වහන්සේ ප්‍රමුඛ මහා සංඝරත්නය මෙම පිරිත් සජ්ඣායනාව සඳහා වැඩම කළහ.

මෙම අවස්ථාව සඳහා ජෝන් කීල්ස් සමූහ ව්‍යාපාරයේ සභාපති හා ප්‍රධාන විධායක නිලධාරී ක්‍රිෂාන් බාලේන්ද්‍ර, Waterfront Integrated Resort නිවාස සංකීර්ණයේ වාස්තු විද්‍යාඥ කිම් තේ හී මහත්වරුන් ඇතුළු ජෝන් කීල්ස් සමූහ ව්‍යාපරයේ නියෝජිත පිරිසක් එක්ව සිටියහ.

කොළඹ ජාතික රෝහලේ සේවා ඉදිරියට ගෙන යන්න
වට්ස් ඇප්

කොළඹ ජාතික රෝහලේ රෝගී සත්කාර සේවා යථා පරිදි පවත්වාගෙන යෑමට අන්තර්ජාල හා වට්ස් ඇප් (Whats App) පහසුකම් ලබාදීමට ශ්‍රී ලංකා ටෙලිකොම්, මොබිටෙල් ආයතන ඉදිරිපත් වූ අතර අදාළ පහසුකම් සහිත සිම් කාඩ්පත්, ජනාධිපති පෞද්ගලික ලේකම් සුගීශ්වර බණ්ඩාර මහතා පෙරේදා (14) රෝහල වෙත භාර දුන්නේය. ජාතික රෝහලේ නියෝජ්‍ය අධ්‍යක්ෂ වෛද්‍ය චන්දන ගජනායක සහ මොබිටෙල් වරලත් නියෝජිත කොස්මෝස් පෞද්ගලික ආයතනයේ අධ්‍යක්ෂ සුමේධ ගෝමස් යන මහත්වරු මේ අවස්ථාවට එක්ව සිටියහ.

මාර්ග සංවර්ධන අධිකාරිය - මධ්‍යම අධිවේගී මාර්ගය
ව්‍යාපෘති කළමනාකරණ ඒකකය කෝප් කමිටුවට කැඳවයි

ස්වර්ණා විජේකෝන්

මධ්‍යම අධිවේගී මාර්ගයේ ශක්‍යතා සහ ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ සිදු කර ඇති විශේෂ විගණන වාර්තාව සම්බන්ධයෙන් අවධානය යොමු කිරීම සඳහා මාර්ග සංවර්ධන අධිකාරිය සහ මධ්‍යම අධිවේගී මාර්ගයේ ව්‍යාපෘති කළමනාකරණ ඒකකය ලබන 20 වැනිදා (අඟහරුවාදා) පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව(කෝප්) වෙත කැඳවා තිබේ. එමෙන්ම 21 වැනිදා කැලණි ගඟේ ජලය අපවිත්‍ර වීම සම්බනයෙන් සිදු කළ පාරිසරික විගණන වාර්තාව පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා ජල සම්පාදන මණ්ඩලය ,ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය ,මධ්‍යම පරිසර අධිකාරිය සහ අදාළ පළාත් පාලන ආයතන ද කෝප් කමිටුව වෙත කැඳවා තිබේ.

පාර්ලිමේන්තු රැස්වීම් පැවැත්වෙන 20 වැනිදා සිට 23 වැනිදා තෙක් වූ දින හතරම පොදු ව්‍යාපාර කාරක සභාව හෙවත් කෝප් කමිටුව රැස්වීමට එම කාරක සභාවේ සභාපති පාර්ලිමේන්තු මන්ත්‍රී මහාචාර්ය චරිත හේරත් මහතා තීරණය කර ඇත.

ඒ අනුව 22 වැනිදා මෙරට තුළ ඛනිජ තෙල් ගබඩා කිරීම සහ බෙදා හැරීම පිළිබඳ සිදු කළ විශේෂ ව්‍යාපෘතියේ වාර්තාව සාකච්ඡාවට ලක් කිරීම සඳහා ලක් කිරීම සඳහා ලංකා ඛනිජ තෙල් සංස්ථාව කෝප් කමිටුව හමුවට කැඳවා ඇත. 23 වැනිදා පොල් සංවර්ධන අධිකාරිය, පොල් වගා කිරීමේ මණ්ඩලය සහ පොල් පර්යේෂණ ආයතනය යන ආයතන කෝප් කමිටුව හමුවට කැඳවා ඇත.

'යටලීයෙන් මතු වූ සිත්තම්' කෘතියෙන්
මිනිසුන් විඳින දුක් වේදනා මනාව හෙළි වෙනවා
මහාචාර්ය එච්.එම්.ඩී.ආර්. හේරත් කියයි

උපාලි කරුණාරත්න

ජාතිය පුබුදුවාලන පරිපාලන නිලධාරීන්ගේ සේවය රටට ඉතා වැදගැයි බව මහාචාර්ය එච්. එම්. ඩී.ආර්. හේරත් මහතා පැවසීය.

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ සමාජ විද්‍යා අධ්‍යයන අංශයේ මහාචාර්ය එච්.එම්.ඩී.ආර්. හේරත් මහතා එසේ ප්‍රකාශ කළේ පෙරේදා (14) බුද්ධ ශාසන ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ අතිරේක ලේකම් විජිත නන්ද කුමාර් මහතා සම්පාදනය කළ 'යටලීයෙන් මතු වූ සිත්තම් ' කෘතිය එළි දැක්වීම සඳහා පැවති උත්සවයේදීය.

කොළඹ-07 පුස්තකාල ප්‍රලේඛණ මණ්ඩල ශ්‍රවණාගාරයේ දී සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් මෙම උත්සවය පැවැත් විණි.

මෙම අවස්ථාව සඳහා තන්ත්‍රිරිමලේ රාජමහා විහාරාධිපති උතුරු නැගෙනහිර දෙපළාතේ උප ප්‍රධාන සංඝනායක තන්ත්‍රිරිමලේ චන්දරතන නාහිමි, නායක හිමිවරුන් සමඟ මහා සංඝරත්නය, ජාතික උරුම, ප්‍රාසාංග කලා හා ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය ඇමැති විදුර වික්‍රමනායක මහතා ඇතුළු නිලධාරීන් රැසක් සහභාගි වූහ.

එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ මහාචාර්යවරයා මෙසේ ද පැවසීය. මෙම කෘතියේ වසර 34ක පරිපාලන සේවයේ යෙදී සිටියදී කළ කී දෑ පිළිබඳ විස්තර සඳහන්

බුද්ධ ශාසන ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ අතිරේක ලේකම් විජිත නන්ද කුමාර් මහතා 'යටලීයෙන් මතු වූ සිත්තම්' කෘතිය ජාතික උරුම, ප්‍රාසාංගික කලා හා ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය ඇමැති විදුර වික්‍රමනායක මහතාට පිරිනමන අයුරු.

වෙනවා. මෙහි ලේඛකයා නිදහස් අධ්‍යාපනයෙන් පන්නරය ලැබූ පුද්ගලයෙක්. වර්තමානයේ පරිපාලන නිලධාරීන් මෙවැනි දේ කරනවා අඩුයි. අතීතයේ සිටි බොහෝ පරිපාලන නිලධාරීන් විවිධ දේ ලියා තැබුවා. ඔවුන්ගේ අත්දැකීම් ඉතා වැදගත්. ඒ නිසා විජිත නන්ද කුමාර් මහතාගේ මෙම කෘතිය ඉතා වැදගත් ග්‍රන්ථයක් වශයෙන් හැඳින්විය හැකියි. ගැමි සුවඳ එහි තිබෙනවා. වර්තමානයේ ලියන්න පුළුවන් දක්ෂයින් අඩු බවක් පෙනෙනවා.

ජාතිය පුබුදුවාලන කිර්තිමත් පරිපාලන නිලධාරීන්ගේ සේවය රටට අවශ්‍යයි. කෙනකුට තවත් කෙනෙක් හිතන විදිහ හිතන්න පුළුවන් නම් ඒක ඉතා වැදගත්. මෙම අවස්ථාවේ ග්‍රන්ථයේ කතුවරයා සම්බන්ධයෙන් ප්‍රදර්ශනය කළ කෙටි වීඩියෝ දර්ශනයෙන් රටේ විවිධ ප්‍රදේශවල මිනිසුන්ගේ ගැටලු, ජීව ශක්තිය අප දුටුවා. භූමිය පිළිබඳ ගැටලුව ප්‍රාදේශීය ලේකම්වරයකු විසඳා ගත යුතු අන්දම මෙම ලේඛකයා දකිනවා. ඔහු රට පුරා කටුක ජීවිත ගෙවන මිනිසුන්ගේ දුක වේදනාව දකිනවා. තමාට රාජකාරියෙන් පැවරී ඇති වගකීම් ඔහු නිසි ලෙස ඉටු කරනවා. යුද්ධය කාලයේ එයට ප්‍රදේශීය ලේකම් සම්බන්ධ වූ අකාරය මේ කෘතියේ දැක්වෙනවා. එය ඉතා විශිෂ්ඨයි.

තමන් ප්‍රාදේශීය ලේකම්වරයා ලෙස කටයුතු කළ කාලය තමන්ගේ හොඳම කාලය බව බොහෝ රාජ්‍ය නිලධාරීන් විවිධ අවස්ථාවල ප්‍රකාශ කර තිබෙනවා. මෙම ග්‍රන්ථයේ කතා 62ක් තුළ තිබෙන්නෙ සුරංගනා ලෝකවල කරන රඟ දැක්වීම් නොවේ. ලංකාවේ සපත්තු නැති මිනිසුන් ඇතැමුන්ට සපත්තු අරන් දෙන්න හදනවා. ගෙවල් නැති මිනිස්සු ගෙවල් නැති අයට ගෙවල් හදා දෙන්න උත්සාහ කරනවා. එවන් අවංක මිනිසුන් සමඟ මේ ලේඛකයා කටයුතු කර තිබෙනවා. මොහු ගැමියන්ට ශක්තිය දෙන්න කටයුතු කළ නිලධාරියෙක්.

බුද්ධ ශාසන ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ අතිරේක ලේකම් විජිත නන්ද කුමාර් මහතා-

මෙය මගේ ප්‍රථම කෘතියයි. මේ සඳහා පදනම වූයේ මාගේ අවුරුදු 34ක රාජකාරි කාල සීමාවයි. මෙම කෘතිය තුළින් රාජ්‍ය සේවයට යම් පණිවිඩයක් ලබාදීමට මා බලාපොරොත්තු වෙනවා. කෘතිය කියවා බලන්නන් ඒ සම්බන්ධයෙන් කරන විවේචන අනුව මගේ කෘතියේ සාර්ථක භාවය රඳා පවතිනවා. ඉදිරියේදී තවත් ග්‍රන්ථ කීපයක් එළි දැක්වීමට මා බලාපොරොත්තු වනවා.

ඡායාරූපය- හිරන්ත ගුණතිලක

ශ්‍රී ලංකාව සහ මාලදිවයින අතර
මාධ්‍ය අධ්‍යයන හුවමාරු වැඩසටහනකට සාකච්ඡා

ශ්‍රී ලංකාව සහ මාලදිවයින අතර මාධ්‍ය අධ්‍යයන හුවමාරු වැඩසටහක් ක්‍රියාත්මක කිරීමට සහයෝගය ලබා දෙන්නැයි ශ්‍රී ලංකාවේ මාලදිවයිනේ මහ කොමසාරිස් ඔමාර් අබ්දුල් රසාක් ජනමාධ්‍ය ඇමැති ආචාර්ය කෙහෙලිය රඹුක්වැල්ල මහතාගෙන් පෙරේදා (14) ඉල්ලීමක් කළේය.

ඇමැතිවරයා සහ මහ කොමසාරිස්වරයා අතර ජනමාධ්‍ය අමාත්‍යංශයේ පෙරේදා (14) පැවැති හමුවකදී මහ කොමසාරිස්වරයා මේ ඉල්ලීම කළේය.

මාලදිවයිනේ මාධ්‍යවේදීන්ට මෙරට මාධ්‍ය ක්ෂේත්‍රයේ අත්දැකීම් ලබා ගත හැකි බවත් ඒ සඳහා මෙම අධ්‍යයන හුවමාරු වැඩසටහන ක්‍රියාත්මක වීම ඉතා වැදගත් බවත් මහ කොමසාරිස්වරයා මෙහිදී ප්‍රකාශ කළේය.

මාධ්‍ය ආචාර ධර්ම මෙන්ම ගවේෂණාත්මක මාධ්‍යකරණය පිළිබඳ ව දෙරට අතර අත්දැකීම් හුවමාරු කර ගැනීමට හැකියාව ලැබෙන බව ද ඒ සඳහා අවශ්‍ය වැඩපිළිවෙළ දෙරට එක්ව සකස් කිරීමට පියවර ගත හැකි බවද මහ කොමසාරිස්වරයා කීවේය.

ශ්‍රී ලංකාව හා මාලදිවයින අතර පවතින සමීප රාජ්‍ය සම්බන්ධතා වදගත් තැනක් ගන්නා බවත් හෙතෙම පැවැසීය. මහ කොමසාරිස්වරයාගේ ඉල්ලීම කාලෝචිත අගනා අදහසක් බැවින් එය ක්‍රියාවට නැංවීම සඳහා අවශ්‍ය පියවර ගන්නා බව මෙහි දී අදහස් දක්වමින් ඇමැති කෙහෙලිය රඹුක්වැල්ල මහතා ප්‍රකාශ කළේය.

මෙයට අමතරව දෙරට අතර ආර්ථික, වෙළෙඳ, සංචාරක ඇතුළු ක්ෂේත්‍ර ගණනාවක් පිළිබඳ ව මෙහිදී සාකච්ඡා කෙරිණි. මාලදිවයනේ නියෝජ්‍ය මහකොමසාරිස් අස්ලාම් ශකීර්, ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම් ජගත් පී. විජේවීර, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් නාලක කළුවැව, ඇමැතිවරයාගේ පෞද්ගලික ලේකම් රමිත රඹුක්වැල්ල, සම්බන්ධීකරණ ලේකම් බ්‍රිගේඩියර් ජේ.පී.ඒ.ජයවර්ධන මහත්වරු මේ අවස්ථාවට එක් වූහ.

රාජ්‍ය අංශයට අවශ්‍ය සැපයීම් ටෙන්ඩර්
දේශීය ව්‍යාපාරිකයන්ට

මහින්ද අලුත්ගෙදර

තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ රාජ්‍ය අංශයට අවශ්‍ය සැපයීම් ටෙන්ඩර් වැඩි අවස්ථා දේශීය ව්‍යාපාරිකයන්ට ලබාදීමට ආණ්ඩුව තීරණය කරයි.

ඒ සඳහා ඇමැති මණ්ඩලයේ අනුමැතිය ලැබී තිබෙන අතර මේ පිළිබඳව වූ චක්‍රලේඛය මුදල් අමාත්‍යාංශය විසින් නිකුත්කර තිබෙන බව ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය පවසයි. පරිගණක මෘදුකාංග හා දෘඩාංග, ඉදිකිරීම් කර්මාන්තය හා ගෘහ භාණ්ඩ හා ආශ්‍රිත නිපැයුම් මිට ඇතුලත් වන අතර තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ රුපියල් මිලියන දෙකට අඩු සියලු කර්මාන්ත සැපයීම් ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයේ (ICTA) http://startupsl.lk වෙබ් අඩවියේ ලියාපදිංචි දේශීය Startup ව්‍යාපාරිකයන්ට ලබාදිය යුතුවේ.

ශ්‍රී ලංකාවේ තාක්ෂණ ක්ෂේත්‍රයේ නව ව්‍යවසායකත්ව (Startup) වර්ධනය සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය මෙම වැඩසටහන අරඹා තිබෙන අතර මෙම නව ප්‍රතිපත්තිය තුළින් නව ව්‍යවසායකයන් startup ඔවුන්ගේ ව්‍යාපාරික අත්දැකීම වර්ධනයකර ගැනීමටත් නව ආර්ථික අවස්ථා උදාකර ගැනීමටත් දිරියක් වනු ඇතැයි තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයේ සභාපති ජයන්ත ද සිල්වා මහතා පවසයි.

මාධ්‍යවේදී අසේල කුරුළුවංශගේ 'දිවිදොස්ගල උරුමක්කාරයෝ' කෘතිය දොරට වැඩුම හෙට

මාධ්‍යවේදී අසේල කුරුළුවංශ විසින් රචිත 'දිවිදොස්ගල උරුමක්කාරයෝ' ග්‍රන්ථය එළි දැක්වීම මහනුවර ශ්‍රී දළදා මාලිගාවේදී දියවඩන නිලමේ ප්‍රදීප් නිලංග දැල මහතාගේ ප්‍රධානත්වයෙන් හෙට (17) පස්වරු 2.30ට සිදු කෙරෙයි.

උඩරට පාරම්පරික නර්තන කාලව මේ දක්වා රැක ගැනීමට අමිල සේවයක් කළ කලාකරුවන් 24 දෙනකු පිළිබඳ තොරතුරු මෙම ග්‍රන්ථයේ ඇතුළත්ය.

නිත්තවෙල ගුණයා, අමුණුගම සුරඹා, නිත්තපජ්ජල සුරඹා, ශ්‍රී ජයනා, හීන්බබා ධර්මසිරි, ඥානදාස රාජපක්ෂ, හපුගොඩ ධර්මසිරි, පීටර් සූරසේන, වෛද්‍යවතී රාජපක්ෂ, මාමුඩාවෙල ඩයස්, ලැහැඹේ සිරිපාල, නිත්තපජ්ජල සුමනවීර, මන්තොස බණ්ඩාර තෙන්නකෝන්, ආරියදාස ඉහළවෙල, උපනන්ද තල්ගහගොඩ, රත්තොට සිරිසේන, ඉලන්කාලි ගෙදර සිරිසෝම, අජිත් ප්‍රේමදාස, නිත්තපජ්ජල ප්‍රේමචන්ද්‍ර, තිලකරත්න ජෝතිරත්න, ඕතැන්නේ කරුණාදාස, මොළගොඩ ජේම්ස්, පීල්දෙණියේ ගෙදර විමලසිරි යන පාරම්පරික උඩරට නාර්තන හා වාදන ශිල්පීන්ගේ තොරතුරු හා ඡායාරූප මෙහි අන්තර්ගය. ග්‍රන්ථය පිළිබඳ විශේෂ දේශනයක් පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ සමාජ විද්‍යා අධ්‍යන අංශයේ හිටපු මහචාර්ය එච්.එම්.ඩී.ආර් හේරත් මහතා විසින් පැවැත්වීමට නියමිතය.

ලෝක බැංකු කෘෂි ව්‍යාපෘති කඩිනම් වෙයි

නදී මාණික්කගේ

කෘෂිකර්ම අමාත්‍යාංශයට අදාළ ලෝක බැංකු වත්මන් ව්‍යාපෘතියෙහි තත්ත්වය ශක්තිමත් කිරීමට සහ දැනට ක්‍රියාත්මක ව්‍යාපෘතිවල වැඩ කටයුතු කඩිනම් කිරීමට පියවර ගැනීමට තීරණය කර ඇත.

ශ්‍රී ලංකාව, නේපාලය සහ මාලදිවයින ලෝක බැංකු අධ්‍යක්ෂ ෆාරිස් හඩාඩ් - සර්වෝස්ගේ නායකත්වයෙන් ලෝක බැංකුවේ ඉහළ පෙළේ දූත පිරිසක් කෘෂිකර්ම ඇමැති මහින්දානන්ද අලුත්ගමගේ මහතා සමඟ පසුගියදා කෘෂිකර්ම අමාත්‍යංශයේදී කරන ලද සාකච්ඡාවකදී මෙම තීරණය ගෙන තිබේ.

මෙහිදී මෙම තීරණයට අමතරව කෘෂිකර්ම අමාත්‍යාංශයට අදාළ ලෝක බැංකු වත්මන් ව්‍යාපෘති පිළිබඳ සහ එහි මෙහෙයුම් පිළිබඳව වැඩිදුරටත් සාකච්ඡා කර ඇති අතර එම වැඩ කටයුතු තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා අමාත්‍යාංශය සමඟ සමීපව කටයුතු කිරීමටත් පියවර ගන්නා බව දෙපාර්ශවයම අවධාරණය කර තිබේ.

මේ සාකච්ඡාව සඳහා සහභාගි වූ ලෝක බැංකු කණ්ඩායමේ සෙසු සාමාජිකයන් වූයේ ලෝක බැංකු ශ්‍රී ලංකා කළමනාකාර වියෝ කන්ඩා, ප්‍රධාන කෘෂිකර්ම විශේෂඥ ඇන්ඩෘ ගුඩ්ලන්ඩ් සහ ජ්‍යෙෂ්ඨ ග්‍රාම සංවර්ධන විශේෂඥ සීනිතම්බි මනෝහරන් යන මහත්ම මහත්මීන්ය.

අධිකරණයට හෝ නීතිපති බලයට අත පොවන්නේ නැහැ

ජනපති කොමිසම

රෝෂන් තුෂාර

දේශපාලන පළි ගැනීම් ජනාධිපති විමර්ශන කොමිසම මෙරට අධිකරණ ක්‍රියාවලියට හෝ නීතිපතිවරයාගේ අභිමතානුසාරී බලයට කිසිදු බලපෑමක් හෝ අත පෙවීමක් නොකරන බව එම කොමිසමේ සභාපති හිටපු ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු උපාලි අබේරත්න මහතා ඊයේ (15) පැවසීය.

අඩුම තරමේ කොමිසම ඉදිරියේ වගඋත්තරකරුවකු ලෙස පෙනී සිටින පුද්ගලයෙකුට හෝ සාක්ෂිකරුවකුටවත් බලපෑම් නොකරන බව හෙතෙම පෙන්වා දුන්නේය.

දේශපාලන අධිකාරියකින් හා නීත්‍යානුකූල නොවන වටපිටාවක් තුළ පිහිටුවූ දූෂණ විරෝධී කමිටු කාර්යාලයේ පැමිණිලි මත පොලිස් මූල්‍ය අපරාධ කොට්ඨාසය මඟින් මෙරට තිස් වසරක යුද්ධයට මුහුණදුන් රණවිරුවන්ට ආචාර සමාචාර කරනවා වෙනුවට දේශපාලන පළිගැනීම් කර ඇති බවට පැමිණිලි ලැබී ඇති හෙයින් කොමිසමේ බලතල ප්‍රකාරව එම කටයුතුවල නීති අනීතික බව සොයා බැලීම කරන බවත්, කොමිසමේ එම තීන්දුව ජනාධිපතිවරයාට යොමු කිරීමෙන් පසුව ජනාධිපතිවරයා විසින් පාර්ලිමේන්තුවේ අනුමැතිය සහිතව සුදුසු කාර්යයක් කිරීමට නීතිපතිවරයාට යොමු කරන බවත් පැවසීය.

දූෂණ විරෝධී කමිටුවෙන් හා අනීතික යැයි බොහෝ පාර්ශව පවසන හා දැනට ඒ පිළිබඳ සාක්ෂි අනාවරණය වන පොලිස් මූල්‍ය අපරාධ කොට්ඨාසය යුද හමුදා හා නාවික හමුදා බුද්ධි නිලධාරීන් දැඩි පීඩනයට ලක් කර ඇති බවට සාක්ෂි අනාවරණය වන බවත් සභාපතිවරයා අවධාරණය කළේය.

වගඋත්තරකාර පාඨලි චම්පික රණවක මහතා වෙනුවෙන් ඉදිරිපත් කළ ප්‍රශ්නයකට පිළිතුරු දෙමින් කොමිසමේ සභාපතිවරයා එසේ පැවසීය.

නීතිපතිවරයා විසින් අධිචෝදනා ගොනු කළ පුද්ගලයින් ජනාධිපති කොමිසම ඉදිරියේ පැමිණිලිකරුවන් බවට පත්ව ඇති බවත්, මහාධිකරණයේ අධිචෝදනා ලද එම පැමිණිලිකරුවන් වෙනුවෙන් කොමිසම ඉදිරියේ නීතිපතිවරයා නැවත පෙනී සිටීම 'නීතියේ ළබැඳියාවන් පිළිබඳ පරස්පරතා මතු කරන බවට" නීතිඥ ශිරාල් ලක්තිලක මහතා මතු කළ ප්‍රශ්නයකට පිළිතුරු දෙමින් සභාපතිවරයා එසේ පැවසීය.

නීතිඥ ශිරාල් ලක්තිලක මහතා - ස්වාමිනී, ඔබතුමා මගේ සේවාදායකයා වගඋත්තරකරුවකු කරලා.

සභාපති විනිසුරුවරයා - කොමිසම සාක්ෂිකාරයින්ට බලපෑම් කරන්නේ නැහැ. සාක්ෂි දීම හෝ නොදීම ඔහු සතු අයිතියක්. මේ කොමිසමේ සාක්ෂි ලබාදෙනවනෙ ස්වෙච්ඡාවෙන්.

නීතිඥවරයා - නමුත් ඔබතුමාට බලය තිබෙනවා අභියාචනාධිකරණයට දැනුම් දීලා ඉදිරි පියවර ගන්න.

කොමිසම - කොමිසන් සභා ඉතිහාසය තුළ එහෙම කරලා තිබෙනවාද? එහෙම කරන්නේ නැහැ. අපි අපේ බලතලවල ඉන්නවා මිසක් ඉන් ඔබ්බට යන්නේ නැහැ. ඔබ පවසන පරිදි නීතිපතිවරයාගේ ළබැඳියාවන්වල පරස්පරතාවයක් තිබෙනවනම් නීතිපතිවරයාට ලියලා ඒ ගැන අහගන්න පුළුවන්. එයට අවසරය ඔබට තිබෙනවා. මේ අවස්ථාවේ නීතිපති නියෝජනයක් මෙතැන තිබෙනවා . ඒ නිසා පැහැදිලි කර ගන්නට පුළුවන්.

නීතිඥවරයා - ඒ ගැන තමයි ස්වාමිනී මම කියන්නේ.

කොමිසම - ඔබ කියන දේ මට තේරෙනවා. ඒ නිසා තමයි අපි පැමිණිලිකරුවන් වෙනුවෙන් ඔහුට නීතිඥවරයෙක් ඉදිරිපත් කරන්න ඉඩ දීලා තියෙන්නේ. නීතිපතිවරයා මෙතැන ඉන්නේ පනතින් ලැබී තිබෙන බලතල අනුව, ඔහු පැමිණිලිකරුවන්ට පෙනී ඉන්නේ නැහැ.

අතිරේක සොලිසිටර් ජනරාල් රොහාන්ත අබේසූරිය මහතා - ළබැඳියාවන්වල පරස්පරතා තිබෙනවා කියලා මම පිළිගන්නේ නැහැ. මහාධිකරණයේ යම් අධිකරණ කටයුත්තක් තිබෙනවා නම් ඒ අදාළ සාක්ෂි ප්‍රකාරව නීතිපතිවරයා අධිකරණයට කරුණු ඉදිරිපත් කරනවා. තීන්දුව විනිසුරුවරයා ලබා දෙනවා. හැබැයි මේ කොමිසමේ කරුණු අනුව සාක්ෂි අනුව යම් යම් අනාවරණය වූ කාරණා සම්බන්ධයෙන් නීතිපතිවරයා නුදුරේදීම තීරණයක් ලබා දීමට නියමිතයි.

වේහැල්ලේ පියතිලක අභාවප්‍රාප්ත වෙයි

අනුර ප්‍රේමලාල්

ප්‍රවීන මාධ්‍යවේදියකු, සාහිත්‍යධරයකු මෙන්ම කලා ශිල්පියෙකු වූ වේහැල්ල පියතිලක මහතා (90) ඊයේ (15) අභාවප්‍රාප්තවිය.

කොළඹ මුහන්දිරම් පීරිස්, ගිමාරාහාමි හේවා කොළඹගේ දෙපළට දාව වසර 1930 මැයි මස 03 වන දින මාතර වේහැල්ලේ දී පවුලේ දෙවැනි දරුවා ලෙද උප්පත්තිය ලද වේහැල්ල පියතිලක මහතා ඌරුගමුව මෙතෝදිස්ත , මාතර, දික්වැල්ල බටහිර පාසල, දික්වැල්ල විජිත මධ්‍ය මහා විද්‍යාලයෙන් සහ මාතර රාහුල විද්‍යාලයෙන් අධ්‍යාපනය හදාරා තිබේ.

කලක් රෝගාතුරව සිට මෙසේ මිය ගොස් ඇති ඒ මහතා හැත්තෑව දශකයේදී 'අපට පුතේ මගක් ඇතේ', කඩදහි කොටි, උරවත්‍රමාලේ ඇතුළු වේදිකා නාට්‍ය ගණනාවක්ම නිර්මාණය කරමින් කලා ලොවට නවකයින් රැසක් හඳුන්වාදීමට පුරෝගාමිවිය. සරත් දසනායක නිෂ්පාදනය කළ දයා විමලවීර අධ්‍යක්ෂණය කළ මිහිදුම් සිහින චිත්‍රපයේ කලා අධ්‍යක්ෂණය කරමින් රංගනයට එක්විය. එමෙන්ම ඒ මහතා කලා අධ්‍යක්ෂවරයෙක් ලෙසත් රංගන ශිල්පියෙක් ලෙස විශ්මය අතුළු චිත්‍රපට ගණනාවක කටයුතු කර තිබේ. පසුව ගීපද රචනයට එක්ව සිටි අතර ජේ.ඒ. මිල්ටන් පෙරේරා ගායනා කළ 'සමානවී ඉපිදී' ගීතයද ලියා ඇත. සාහිත්‍යධරයකු ලෙස නවකතා,කෙටිකතා හා කවි රචනා කර තිබෙන අතර ඇත්ත පුවත් පතෙන් මධ්‍ය ක්ෂේත්‍රයට එක්වූ වේහැල්ලේ මහතා කිණිහිර, රසවාහිනී හා පසුව දිනමිණ පුවත්පතේදි සේවය කළේය. කලා ක්ෂේත්‍ර ගණනාවකම දස්කම් පෑ වේහැල්ලේ මහතා දැව සංස්ථාවේ ක්‍රියාකාරි අධ්‍යක්ෂ ලෙසද ක්‍රියා කළේය. විජය කුමාරතුංගයන් සමග එක්ව දේශපාලන කටයුතුවලට එක්වූ ඒ මහතා 1977දී ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් අනුරාධපුර දිස්ත්‍රික්කයේ හොරොව්පතාන ආසනයට මහා මැතිවරණයට ඉදිරිපත්වී ඉතා සුළු ඡන්ද සංඛ්‍යාවකින් පරාජයට පත් විය.

නන්දා වේහැල්ල මහත්මියගේ ආදරණීය ස්වාමි පුරුෂයා වූ වේහැල්ල මහතා ස්වාධීන රූපවාහිනී සේවයේ වැඩසටහන් අධ්‍යක්ෂවරයකු ලෙස සේවය කරන ජනජීව වේහැල්ල, නාගරික සංවර්ධන අධිකාරියේ සේවයේ නියුතු දිමුතු ජනදර්ශනී වේහැල්ල යන දරුවන්ගේ පියාද වේ.

'සමගි නිවස' කහටගස්දිගිලිය යන නිවසේ දේහය තැන්පත් කර ඇති අතර අවසන් කටයුතු හෙට (17) සවස 3.30ට කහටගස්දිගිලිය, පොදු සුසාන භූමියේදී සිදු කෙරේ.

කොවිඩ් - 19 ආසාදිතයන් ගමන් ගත් බස් 6කේ හඳුනා ගත්තා

කොවිඩ් - 19 ආසාදිතයන් බවට තහවුරු වූ පුද්ගලයන් ගමන් ගත් බස් රථ හයක් මේ වන විට හඳුනාගෙන ඇති බව ප්‍රවාහන ඇමැති ගාමිණී ලොකුගේ මහතා පැවැසුවේය.

කොළඹ - මැදගම ND 4890, මාකුඹුර - ගාල්ල ND 2350, අම්බලන්ගොඩ - කඩවත ND 549, කොළඹ - යාපනය 6503, ඇල්පිටිය - කොළඹ ND 9788, ගාල්ල - කඩවත NF 7515 ධාවනය කළ බස් රථයන්හි ගමන් කළ කොරෝනා ආසාදිත පුද්ගලයන් හඳුනා ගත් බව ද ඇමැතිවරාය ප්‍රකාශ කළේය.

කොවිඩ් - 19 වැළැක්වීමේ සෞඛ්‍ය නීතිරීති කඩ කරමින් ධාවනය කරන බස්රථ හිමියන්ට එරෙහිව දැඩි ලෙස නීතිය ක්‍රියාත්මක කරන බවත්, සෞඛ්‍ය නීති කඩ කරමින් ගමන් කරන බස්රථ සම්බන්ධයෙන් 1955 දුරකථන අංකයට දැනුම් දිය හැකි බවත් ඇමැතිවරයා පැවැසීය.

වායුසමනය කළ බස් රථවලට මගීන් නංවා ගන්නා විට ඔවුන්ගේ උෂ්ණත්වය පරීක්ෂා කර බැලිය යුතු බවත් කිසියම් මගියකුට සෞඛ්‍ය ගැටලුවක් පැවැතියහොත් ඒ සම්බන්ධයෙන් වෛද්‍ය අධිකාරිවරයෙකුට හෝ 1955 දුරකථන අංකයට දැනුම් දිය හැකි බවත් ඇමැතිවරයා ප්‍රකාශ කළේය.

කොරෝනා ව්‍යාප්තියත් සමග බස්රථයන්හි ගමන් ගන්නා මගීන්ගේ සංඛ්‍යාව අඩු වී ඇති බවත් බස්රථවල ගමන් ගන්න මගීන් ගැන බස්රථ සේවකයින් අවධානයෙන් සිටිය යුතු බවත් ඇමැතිවරයා කීය.

කොරෝනා වයිරසය මේ අවස්ථාවේදී ව්‍යාප්ත වීමට පෙර දිනකට බස් රථ 1600 ධාවනය වූ අතර අද වන විට එය 666 ක් දක්වා සීමා වී ඇත්තේ යැයි ද, 25000 ක් පමණ බස්රථවලින් ගමන් ගත් මගීන්ගේ සංඛ්‍යාව 5700 ක් පමණ දක්වා අඩු වී ඇතැයි ද ඇමැතිවරයා පැවැසුවේය.

පාස්කු දින ප්‍රහාරයේ වගකීම සාමූහිකව බෙදී යා යුතුයි

හිටපු ජනපති මෛත්‍රීපාල

සුභාෂිණී සේනානායක

පාස්කු දින එල්ල වූ ප්‍රහාරය වළක්වා නොගැනීම සම්බන්ධයෙන් වගකිව යුතු විශාල පිරිසක් සිටින බවත් එහි වගකීම ඒ සියලු දෙනා අතර බෙදී යා යුතු බවත් හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා පාස්කු ප්‍රහාරය සම්බන්ධයෙන් සොයා බලන ජනාධිපති කොමිසම හමුවේ පෙරේදා (14) පැවැසීය.

පාස්කු ප්‍රහාරයෙන් වගකීම සාමූහිකව බාර ගන්නා බවට හිටපු අගමැති රනිල් වික්‍රමසිංහ මහතා කොමිසම හමුවේ කළ ප්‍රකාශයක් සම්බන්ධයෙන් කොමිසමේ විනිසුරුවරයකු විසින් සිදු කළ විමසීමක දී හිටපු ජනාධිපතිවරයා මේ බව කියා සිටියේය. මෙම ප්‍රහාරය වළක්වා ගැනීමට හැකියාව තිබූ එකක්. එය වළක්වා නොගැනීමයි මෙහි තිබෙන ප්‍රශ්නය. එම ප්‍රහාරය වළක්වා නොගැනීමට කටයුතු කළ විශාල පිරිසක් සිටිනවා. ඔවුන් සියලු දෙනා අතර මෙහි වගකීම බෙදී යනවා. ඒ පිරිස මෙම අවාසනාවන්ත ප්‍රහාරය වළක්වා නොගැනීමේ වගකීම භාර ගත යුතු බවද ඒ මහතා පැවැසීය.

හිටපු ජනාධිපතිවරයාට හිටපු රාජ්‍ය බුද්ධි අධ්‍යක්ෂ නිලන්ත ජයවර්ධන මහතා පාස්කු ප්‍රහාරය එල්ල වූ දින පෙරවරු 8.01 ට තප්පර 49ක දුරකතන ඇමතුමක් ලබා දී ඇති බව කොමිසම හමුවේ මෙදින (14) අනාවරණය විය.

මිනුවන්ගොඩ ගම්මාන තුනක් හුදෙකලා කරයි

කොවිඩ් -19 ආසාදිතයන් හමුවීම හේතුවෙන් මිනුවන්ගොඩ පොලිස් බලප්‍රදේශයට අයත් ගැනිහිමුල්ල, පේරලන්දවත්ත, සහ හැලකන්දන යන ගම්මාන තුන ඊයේ (15) උදෑසන සිට එම හුදකලා කර ඇත.

මිනුවන්ගොඩ ඇඟලුම් කම්හලේ සේවක සේවිකාවන් කොවිඩ් ආසාදිතයන් බවට හඳුනාගැනීමත් සමග එම ප්‍රදේශවලින් ඔවුන්ගේ ආශ්‍රිතයන් වැඩිවශයෙන් වාර්තා වීම නිසා මෙලෙස හුදකලා කර තිබේ.

ඒ හේතුවෙන් සෞඛ්‍ය බලධාරීන් මෙම තීරණය ගෙන ඇති අතර, ආසාදිතයන්ගේ ආශ්‍රිතයින් 500කගේ පීසීආර් පරීක්ෂණ ඊයේ දෙවොලපොළ සතිපොළේ දී සිදුකර කරනු ලැබිණි.

ලියාපදිංචිය ඉල්ලූ පක්ෂ 154න් 6කට අනුමැතිය

අනුර ප්‍රේමලාල්

මෙම වසරේදී දේශපාලන පක්ෂ 154ක් ලියාපදිංචිය සඳහා ඇයැදුම් කර ඇතත් ඉන් පක්ෂ හයකට පමණක් ලියාපදිංචිය සඳහා අවස්ථාව දීමට මැතිවරණ කොමිෂන් සභාව තීරණය කර තිබේ.

ඒ අනුව අරුණලු ජනතා පෙරමුණ, ජනතා සේවක පක්ෂය, නව ප්‍රජාතන්ත්‍රවාදී මාක්ස් ලෙනින්වාදී පක්ෂය සහ සමත්තුව කච්චි යන පක්ෂ ලියාපදිංචි කිරීමට තීරණය කර ඇත.

ඊට අමතරව පිවිතුරු හෙළ උරුමය සහ සිංහල රාවය ද ලියාපදිංචි කිරීමට තීරණය කර ඇති අතර සිංහල රාවය පක්ෂයේ නම අපේ ජනතා රාවය ලෙස සංශෝධනය කිරීමට යෝජිත බවද මැතිවරණ කොමිෂන් සභාව පවසයි.

මෙවර ලියාපදිංචිය සඳහා ජනවාරි මාසයේ දේශපාලන පක්ෂවලින් ඉල්ලුම්පත් කැඳවා තිබූ අතර එහිදී ඉල්ලුම්පත් 154ක් ලැබී තිබේ. ඉන් ඉල්ලුම් පත්‍ර 121ක් සඳහා සම්මුඛ පරීක්ෂණ පවත්වා ඇති අතර පක්ෂ 06ක් පමණක් ලියාපදිංචි කිරීමට තීරණය කර තිබේ. මීට පෙර දේශපාලන පක්ෂ 70ක් පිළිගත් දේශපාලන පක්ෂ ලෙස ලියාපදිංචි වී තිබුණි.

හිටපු ජනපති මෛත්‍රී, රනිල්, පූජිත්, හිටපු මැති ඇමැතිවරුන් ඇතුළු 21ක් 19 දින ජනාධිපති කොමිසම හමුවට

රෝෂන් තුෂාර

හිටපු ජනපති මෛත්‍රීපාල සිරිසේන, හිටපු අගමැති රනිල් වික්‍රමසිංහ, හිටපු පොලිස්පති පූජිත් ජයසුන්දර හා යහපාලන ආණ්ඩුවේ මැති ඇමැතිවරුන් ඇතුළු 21 දෙනෙකුට ලබන 19 දින පෙනී සිටින්නැයි නියෝග කරමින් දේශපාලන පළිගැනීම් විමර්ශන ජනාධිපති කොමිසම ඊයේ (15) සිතාසි නිකුත් කළේය.

රුසියාවේ හිටපු තානාපති උදයංග වීරතුංග මහතා දේශපාලන පළිගැනීම් කොමිසම හමුවේ පැවරූ පැමිණිල්ලක් සලකා බැලීමෙන් අනතුරුව මෙම සිතාසි නිකුත් කළේය.

2006 මිග් යානා ගනුදෙනුව පිළිබඳව බොරු සාක්ෂි ගොතමින් නඩු පවරා දේශපාලන පළිගැනීමක් කළ බවට සඳහන් කරමින් උදයංග වීරතුංග මහතා මෙම පැමිණිල්ල ගොනු කර තිබිණි.

හිටපු ජනාධිපතිවරයා හා හිටපු අගමැතිවරයා සාක්ෂිකරුවන් ලෙස කැඳවන අතර, හිටපු මැති අමැතිවරුන් හා සෙසු පිරිස වගඋත්තරකරුවන් ලෙස කැඳවා ඇත. හිටපු ඇමැති මංගල සමරවීර , හිටපු ඇමැති රවී කරුණානායක, පාර්ලිමේන්තු මන්ත්‍රී අනුර කුමාර දිසානායක, හිටපු පොලිස්පති පූජිත් ජයසුන්දර , පොලිස් මූල්‍ය අපරාධ කොට්ඨාසයේ ප්‍රධානී , රවී වෛද්‍යාලංකාර , හිටපු ගුවන් හමුදාපති රොෂාන් ගුණතිලක, හිටපු තානාපති සුවරැල්ලා අහමඩ්, පොලන්ත හිටපු තානාපති සමන්ත පතිරණ, මහ බැංකු මූල්‍ය බුද්ධි ප්‍රධානී පී. එම්. අමරතුංග, ඇතුළු පිරිසකට මෙසේ සිතාසි නිකුත් කළේය.

නීත්‍යානුකූලව හා නිවැරැදිව විනිවිදභාවයකින් සිදු වූ මිග් යානා මිල දී ගැනීමේ ගිවිසුම පිළිබඳව බොරු සාක්ෂි මත නඩු පවරා දේශපාලන පළිගැනීමක් කළ බවට පැය තුනකට අධික වේලාවක් සාක්ෂි ලබාදීමෙන් අනතුරුව මෙම සිතාසි නිකුත් කළේය.

මිග් යානා මිල දී ගැනීමේ ගනු දෙනුව පිළිබඳ සැබෑ සාක්ෂි වසන් කිරීම දේශපාලන පළි ගැනීමක්

● රුසියාවේ හිටපු තානාපති උදයංග වීරතුංග

රෝෂන් තුෂාර

ද්විපාර්ශ්වීය ගිවිසුමක් මත විනිවිදභාවයකින් සිදු කළ මිග් යානා මිල දී ගැනීමේ ගනුදෙනුව පිළිබඳව සැබෑ සාක්ෂි වසන් කිරීම දේශපාලන පළිගැනීමක් බව රුසියාවේ හිටපු තානාපති උදයංග වීරතුංග මහතා දේශපාලන පළිගැනීම් විමර්ශන ජනපති කොමිසම හමුවේ සාක්ෂි දෙමින් ඊයේ (15) පැවසීය.

මෙම ගනුදෙනුව පිළිබඳව ජනපති ගෝඨාභය රාජපක්ෂ මහතාට ද මඩ ප්‍රචාර එල්ල කළ බවත්, ජනාධිපතිවරයා ඊට එරෙහිව අදාළ පුවත්පත් ආයතනයට එරෙහිව වන්දි නඩුවක් පවරා බොරුව පරාජය කළ බව ද හෙතෙම පෙන්වා දුන්නේය.

එවන් පසුබිමක් තුළ දේශපාලන පළිගැනීමේ අරමුණින් 2015 වසරේදී යළි නඩු පැවරීමට පිඹුරුපත් සැකසීම ද්වේශසහගත පළිගැනීමක් බව ද එම පළිගැනීමට සාධාරණය ඉටු කරන ලෙස ද ඉල්ලා සිටියේය.

කොමිසමේ සභාපති හිටපු ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු උපාලි අබේරත්න මහතා ප්‍රමුඛ විනිසුරු මඬුල්ල ඉදිරියේ සාක්ෂි විමසීය.

උදයංග වීරතුංග මහතා මෙසේ ද පැවසීය.

අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය පරිදි ගුවන් හමුදාවේ පිරිසක් යුක්‍රේනයට ගියා. මිග් ගුවන් යානා අලුත්වැඩියා කරන කර්මාන්ත ශාලාවකට ගියා. එම නිරීක්ෂණයෙන් පසුව ගුවන් හමුදාපති ඩොනල් පෙරේරා මහතා විසින් අදාළ ගුවන් සමාගමට මිග් යානා මිල දී ගන්නවා කියලා සහතිකයක් දෙනවා. 2006 ජූලි 26 දින මෙම ගිවිසුම අත්සන් කරන්න තිබුණා. මිග් යානා අලුත්වැඩියා කරන්න කියලා ගුවන් හමුදාපතිවරයා එම සමාගමට කිව්වා. 2000 වසරේ මිග් ගුවන් යානා මිල දී ගන්න විට අලුත්වැඩියා කිරීම ගැන අවබෝධයක් ගන්න ශ්‍රී ලංකා රජයට අවස්ථාව තිබුණේ නැහැ. නමුත් 2006 ගුවන් යානා මිල දී ගැනීමේදී අලුත්වැඩියා කරන අයුරු බලන්න අපේ හමුදාවට හැකි වුණා. අපේ ගුවන් ඉංජිනේරුවන් ඉතා හොඳ තත්ත්වයේ ගුවන් යානා මිලදී ගත්තා කියලා මේ තුළින් අපට සහතික වෙන්න පුළුවන්. මාධ්‍ය මොන අවලාද කළත් 2006 ගුවන් යානා මිල දී ගැනීම විනිවිද ආකාරයෙන් සිදු වුණා. යහපාලන රජය අපේ වීර සෙබළුන්ට නින්දිත ආකාරයට පහර ගැසුවත් ගුවන් ඉංජිනේරුවන් මහත් කැපවීමෙන් ඒවා ඉටු කළා කියලා මට සහතිකයි.

මිග් ගුවන් යානා මිල දී ගැනීම යුක්‍රේන් රජය සමඟ ඇති කර ගත් ගිවිසුමක් අනුව මිල දී ගෙන තිබෙනවා. විලිවිසා කියන ආයතනය සමඟ ඇති කර ගත් ගිවිසුමක් තිබෙනවා. ද්විපාර්ශවීය ගිවිසුමක් වූ විට රාජ්‍යයන් දෙකෙහිම අය අත්සන් කරනවා. එම අත්සන් මෙම ගිවිසුම්වල තිබෙනවා. පසුගිය රජය දිගින් දිගටම කරනු ලැබූ චෝදනාවක් තමයි මෙම මිල දී ගැනීම් යුක්‍රේන් රජය දන්නේ නැහැ කියන එක. එයට හොඳම සාක්ෂිය තමයි මේ ගිවිසුම්. එවගේම මිග් ගුවන් යානා හතර මිල දී ගැනීමේ ගිවිසුම් මා විසින් සකස් කළා කියලා පොලීසිය චෝදනා කළා. නමුත් මේ ගිවිසුම් සියල්ල ගුවන් හමුදාව විසින් සකස් කළා කියලා මේ ගිවිසුම්වල අත්සන් කර ඇති නිලධාරීන් ගැන බැලුවම පේනවා. ගුවන් හමුදාපති රෝෂාන් ගුණතිලක හා එරට රාජ්‍ය නිලධාරීන්, තානාපති නිලධාරීන්, ඉංජිනේරුවන්, ගුවන් හමුදා නිලධාරීන් දෙදෙනෙක් අත්සන් කර තිබෙනවා.

යුක්‍රේන් ආයතනයේ අත්සන් ගැන විශාල වශයෙන් මට චෝදනා එල්ල වුණා. නමුත් මේ අත්සන පවර් ඔෆ් ඇටර්නි බලපත්‍රයන් මත අත්සන් කර තිබෙනවා. එම ඇටර්නි බලපත්‍රය පොලීසිය විසින් අධිකරණයට ඉදිරිපත් කළේ නැහැ.

කොමිසම - නමුත් ඔය ඇටර්නි බලපත්‍රය ගිවිසුමට අත්සන් කරලා නැහැ නේද ?

සාක්ෂිකරු - ඇටර්නි බලපත්‍රය අරගෙන තමයි යුක්‍රේන් සමාගම ලංකාවට පැමිණියේ නියෝජ්‍ය අධ්‍යක්ෂවරයාගේ ඇටර්නි බලපත්‍රය ශ්‍රී ලංකා ගුවන් හමුදාවට ලබා දී තිබෙනවා. නමුත් කැබිනට් අනුමැතිය නොතිබූ නිසා ශ්‍රී ලංකාවේදී මේ ගිවිසුම අත්සන් කරන්න වෙන්නේ නැහැ.

කවුරු හරි කියනවා නම් මේ ගුවන්යානා යුක්‍රේන් රාජ්‍යය ලංකාවට විකිණුවේ නැහැ කියලා ඒකට දෙන්න පුළුවන් හොඳම උත්තරය තමයි මේ ගුවන් යානා යුක්‍රේන් රාජ්‍යයේ සිට සෘජුව ගුවන් මඟින් කොටස් වශයෙන් ලංකාවට ගේනවා. එතකොට රේගුවේ අනිවාර්යයෙන් සටහන් වෙනවා.

මේ ගනුදෙනුව වෙන්නේ කොහොමද කියලා මේ ගෙන ඒම ලෝකයේ තිබෙන ලොකුම දෙවැනි ගුවන් යානයකින් මෙරටට ගේනවා. එම යානා බාර ගැනීමට රෝෂාන් ගුණතිලක මහතා යනවා.

යුක්‍රේන් කර්මාන්ත ශාලාව පරීක්ෂා කිරීමට මෙරට ගුවන් හමුදා නිලධාරීන් යුක්‍රේනයට ගියා. එම ඡායාරූප මා මෙම කොමිසමට ඉදිරිපත් කරනවා. ඒ වගේම ගුවන් යානා බාර ගන්න රෝෂාන් ගුණතිලක මහතා යුක්‍රේනයට යනවා. එහි ගිය අවස්ථාවේ රෝෂාන් ගුණතිලක මහතා එරට අරක්ෂක කවුන්සිලයට ද යනවා. එහිදී ලෝකයේ ලොකුම ගුවන් යානාව ද ගුණතිලක මහතාගේ නිරීක්ෂණයට ලක් වෙනවා. මෙම මිලදී ගැනීමේ මුදල් අවුරුදු දෙකකින් ගෙවන්න තිබුණත් අපි 2010 වෙනකම් ඒ මුදල් ගෙවුවා.

පසුගිය අවුරුදු 05 තුළ මට එල්ල වූ චෝදනාව තමයි යුක්‍රේනය නොදැන මේ ගුවන් යානා මිල දී ගත්තා කියන එකනේද මා ඉදිරිපත් කරන මේ ඡායාරූප මඟින් පේනවා,

මේ සියලු චෝදනා දේශපාලන දඩයමට හා මට එරෙහිව පළිගැනීමට කරපු දේවල් කියලා.

2006 ජූලි මාසයේ සිට 2006 ඔක්තෝම්බර් කාලය තුළ මා ලංකාවේ සිටියේ නැහැ. ඒ බව ඔප්පු කිරීමට මම මගේ පාස්පෝට් එක ඉදිරිපත් කරනවා. මොකද පොලීසිය මට එල්ල කළ චෝදනාව තමයි මේ ගිවිසුම මම මෙරටට ඇවිල්ලා අත්සන් කරලා ආපසු රැගෙන ගියා කියන එක. මේ පාස්පෝට් එකෙන් පැහැදිලි වෙනවා මම ගිවිසුම අත්සන් කරන අවස්ථාවේ ලංකාවේ සිටියේ නැහැ කියන එක. ඒ වගේම මේ ගවිසුම් අත්සන් කළ අදාළ නිලධාරීන් මෙරටට පැමිණි බවට සනාථ කරන ලේඛන මා මේ කොමිසමට ඉදිරිපත් කරනවා.

යුක්‍රේන ආයතනයේ නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා කොටුව මහේස්ත්‍රාත් අධිකරණයට මේ ගනුදෙනුව පිළිබඳ දිවුරුම් ප්‍රකාශයක් ද ලබා දී තිබෙනවා.

2000 ගත්ත ගුවන් යානාවලට වඩා වැඩි මුදලක් 2006 මිල දී ගත් ගුවන් යානාවලට ගෙවුවා කියලා මට චෝදනාවක් එල්ල කළා. නමුත් රෝෂාන් ගුණතිලක ඔප්පු කරලා තිබෙනවා 2000 ගත්ත ගුවන් යානා හතෙන් එකක් නඩත්තු කිරීමට වසරකට රුපියල් හයලක්ෂ හතළිස් තුන්දහක් යනවා කියලා සඳහන් කළා. නමුත් 2006 මිල දී ගත් ගුවන් යානාවක් නඩත්තු කිරීමට වසරකට රුපියල් තුන්ලක්ෂ විසිදෙදහස් එකසිය විසිපහක් පමණක් යන බව සඳහන් කර තිබෙනවා.

මෙම මිග් ගනුදෙනුව ගැන පළවූ පුවත්පත් ලිපියකට එරෙහිව ගෝඨාභය රාජපක්ෂ මහතා වන්දි නඩුවක් පමණ රුපියල් මිලියන සීයයක වන්දියක් අයකරගෙන තිබෙනවා. නමුත් එතුමා එම මුදල් ගතතේ නැහැ. එතුමාගේ කීර්තිය රැක ගැනීමට පමණක් මේ නඩුව අදාළ පුවත්පතට එරෙහිව පවරා තිබුණා.

යුක්‍රේන් ගිවිසුමක් නැහැ. යුක්‍රේන් නියෝජ්‍ය අධ්‍යක්ෂ හොරෙක්. උදයංග වීරතුංග හොරෙක් කියන යහපාලන රජය 2016 දී යුක්‍රේන් ආයතනයට පැසසුම් ලිපියක් යවනවා. එය යවන්නේ එවකට වැඩ බලන ලේකම් එස්. හෙට්ටිආරච්චි මහතා විසින් එම පැසසුම් ලිපිය අනුව යුක්‍රේන් ආයතනයේ ඉණ වර්නා කර තිබෙනවා. මුදල් අමාත්‍ය මංගල සමරවීර මහතා ද මේ සම්බන්ධයෙන් කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කර තිබෙනවා. එම කැබිනට් තීරණ අනුව යුක්‍රේන් ආයතනය සමඟ ගනුදෙනු කළා කියලා පැහැදිලි වෙනවා.

යහපාලන රජයේ අවසාන කාලයේදී ගුවන් යානා තුනක් යළි යුක්‍රේන් ආයතනයට බාර දෙනවා. ගිවිසුමක් තිබුණේ නැත්නම් කොහොමද ආපසු ගුවන් යානා බාර දුන්නේ . මොකක්ද මට තිබෙන සාධාරණය.

මිග් යානා ගනුදෙනුව පිළිබඳව පසුගිය රජය විශාල විමර්ශන සිදු කළා . එහිදී රවී වෛද්‍යාලංකාර මහතා ඇතුළු විශාල පොලිස් නිලධාරීන් පිරිසක් යුක්‍රේනයට ගොස් තිබෙනවා. නමුත් මේ විමර්ශන කණ්ඩායම් යුක්‍රේනයට යන්න ගිය මුදල් ගැන පාර්ලිමේන්තුවේ සටහනක් නැහැ. මම හිතන්නේ මේ විමර්ශනයට ගිය මුදලින් තවත් මිග් යානාවක් ගන්න තිබුණා. මේකත් යහපාලන රජයේ මුදල් අවභාවිතයක් කියලා මම කියනවා. යහපාලන රජය මට එරෙහිව ජාත්‍යන්තර රතු නිවේදනයක් ගත්තා. නමුත් මට එරෙහිව අධිචෝදනාවක් ගොනු කර තිබුණේ නැහැ. මෙය ජාත්‍යන්තර පොලිස් නීති රේගුලාසීවලට පටහැනියි. යහපාලන පොලීසිය මඟින් මට පාස්පෝට් දෙකක් තිබෙනවා කියලා චෝදනා කළා. නමුත් එම කරුණු අධිකරණය පවා ප්‍රතික්ෂේප කළා. මොකද එක් අයකුට පාස්පෝට් දෙකක් තිබෙන්න බැහැ කියලා ඕන අයෙක් දන්නවා.

මෙම රතු නිවේදන හා වරෙන්තු සම්බන්ධයෙන් මා හා මගේ දරුවන් වින්ද පීඩාව මට කියලා නිම කරන්න බැහැ. මගේ දරුවන්ට ක්ලාස් එකකට යන්න බැහැ. තාත්තට රතු නිවේදන, ඔවුන් මට නම වෙනස් කරන්න පවා යෝජනා කළා. (සාක්ෂිකරු සංවේදී වෙයි.) මිනිසුන්ගෙන් දේශපාලන පළිගැනීම් කළ යහපාලන රජය වැනි ආණ්ඩු මෙරට තවත් බිහි නොවේවායි කියලා මම ප්‍රාර්ථනා කරනවා. ඊට වඩා දෙයක් මට කියන්න බැහැ ස්වාමිනී.

මෙම මිග් යානා ගනුදෙනුව මෙරට විනිවිද ආකාරයෙන් සිදු වූ ඉතිහාසයේ හොඳම ගනුදෙනුව කියලා ආරක්ෂක ලේකම්ව සිටි වත්මන් ජනාධිපතිවරයා පවා ප්‍රකාශ කර තිබෙනවා.

එසේ තිබියදී සී. අයි. ඩී ය මඟින් වැරැදි තොරතුරු ජාත්‍යන්තර පොලීසියට යවා විශාල අගතියක් මට කර තිබෙනවා. එම වැරැදි තොරතුරු ලිපි පිළිබඳ පරිශීලනය ඉතා වැදගත් ස්වාමිනී.

කොවිඩ් එන්නතේ විශ්වීය ප්‍රවේශයට ලෝක සෞඛ්‍ය සංවිධානය කැප විය යුතුයි



විදෙස් ඇමැති දිනේෂ් ගුණවර්ධන

මහින්ද අලුත්ගෙදර

ඩිජිටල් ගනුදෙනු සඳහා අන්තර්ජාතික ප්‍රමිතීන් අනුගමනය කළ දකුණු ආසියාවේ පළමු රට ශ්‍රී ලංකාව බව විදේශ ඇමැති දිනේෂ් ගුණවර්ධන මහතා පොදුරාජ්‍ය මණ්ඩල විදේශ අමාත්‍යවරුන්ගේ වීඩියෝ (අතථ්‍ය) රැස්වීම අමතමින් සඳහන් කළේය.

පොදුරාජ්‍ය මණ්ඩලයීය කටයුතු පිළිබඳ රාජ්‍ය ලේකම් සහ එක්සත් රාජධානියේ පළමු රාජ්‍ය ලේකම් පාර්ලිමේන්තු මන්ත්‍රී ඩොමිනික් රාබ් මහතාගේ ප්‍රධානත්වයෙන් මෙම රැස්වීම පැවැති අතර, ඊට එක් වෙමින් විදේශ ඇමැතිවරයා මේ බව පැවසීය.

පෙර නොවූ විරූ අභියෝගයක් වන කොවිඩ් - 19 වසංගතය විසින් ගෝලීය හා ජාතික ආර්ථිකයන් කඩාකප්පල් කරවීම මඟින් විවිධ අහිතකර බලපෑම් ඇති කර තිබෙන අතර, ජාතික සීමාවන් ඉක්මවා යන ආකාරයේ ගෝලීය අර්බුදයන් සඳහා පුළුල් බහුපාර්ශ්වික ප්‍රවේශයකින් සහ නොමසුරු ජාත්‍යන්තර සහයෝගීතාවකින් යුත් විශ්වීය හා නව්‍ය විසඳුම් අවශ්‍ය බව ද හෙතෙම එහිදී පෙන්වා දී තිබේ. මුහුණ දීමට ඇති අභියෝග සහ ඒවාට බහුපාර්ශ්වික විසඳුම් පැහැදිලිව හඳුනා ගැනීම උදෙසා පොදුරාජ්‍ය මණ්ඩලය ඉදිරිපත් කර ඇති කොවිඩ් - 19 ප්‍රකාශය ශ්‍රී ලංකාව සාදරයෙන් පිළිගන්නා බව ද ඇමැතිවරයා එහිදී සඳහන් කළේය.

වසංගතයට ගෝලීය ප්‍රතිචාර දැක්වීමේ දී ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් ඉටු කරන ලද තීරණාත්මක කාර්යභාරය තම නියෝජිත කණ්ඩායම අගය කරන අතර, මේ සම්බන්ධයෙන් ඔවුන් දරන පුළුල් උත්සාහයන් සඳහා සහාය දක්වන බව ද හෙතෙම කියා සිටියේය. කොවිඩ් - 19 එන්නත සඳහා විශ්වීය ප්‍රවේශය වෙනුවෙන් පහසුකම් සැලසීමට ලෝක සෞඛ්‍ය සංවිධානය උත්සාහ දැරිය යුතු වන අතර, එවැනි එන්නතක් නිපදවීමෙන් පසුව එය මූලික පොදු යහපතක් ලෙස නම් කළ යුතු වන බව ද සඳහන් කර තිබෙන ඇමැතිවරයා, සියල්ලන්ටම දැරිය හැකි මිලකට එම එන්නත ලබා ගත හැකි විය යුතු බව ද පැවසීය. හෙතෙම වැඩිදුරටත් කියා සිටියේ, ශ්‍රී ලංකාව ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශ සමඟ සම්පව කටයුතු කරන අතර, එහි අත්දැකීම් සහ විශිෂ්ට පරිචයන් සාමාජික රටවල් සමඟ බෙදා හදා ගන්නා බවයි.

දිනේෂ් ගුණවර්ධන මහතා එහිදී වැඩිදුරටත් මෙසේ ද කීය.

"කොවිඩ් - 19 හා සම්බන්ධ අඛණ්ඩ පර්යේෂණවල දී සහාය වීම සඳහා පොදුරාජ්‍ය මණ්ඩලයීය රටවල දැනට පවතින විද්‍යාත්මක හා තාක්ෂණික විශේෂඥතාව සහ දැනුම එක්රැස් කළ යුතු යැයි අපි යෝජනා කරනවා. මේ සම්බන්ධයෙන්, ශ්‍රී ලංකාවේ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ඔක්ස්ෆර්ඩ් විශ්ව විද්‍යාලය සමඟ එක්ව, කොවිඩ් - 19 ආසාදනවලට ප්‍රතිශක්තිකරණ ප්‍රතිචාර අවබෝධ කර ගැනීමට ඩෙංගු ආසාදන සඳහා පුද්ගලයන්ගේ ප්‍රතිශක්තිකරණ ප්‍රතිචාරයන් තුළින් ලබා ගත් විශේෂඥ දැනුම හා දැනුම බෙදා හදා ගැනීම සඳහා පියවර ගන්නවා. ඉන්දියානු සහ අනෙකුත් දකුණු ආසියානු විශ්වවිද්‍යාලවල ද මෙවැනිම පර්යේෂණ කටයුතු අඛණ්ඩව සිදු වනවා.

"මෙම වසංගතය හේතුවෙන් සංවර්ධනය වෙමින් පවතින හා කුඩා රාජ්‍යයන් මුහුණ දී සිටින පෙර නොවූ විරූ ආර්ථික හා ණය අර්බුද පිළිබඳව ශ්‍රී ලංකාව දැඩි අවධානයෙන් සිටින අතර, මේ හේතුවෙන් ඇති වන අහිතකර ආර්ථික හා සමාජයීය බලපෑම ලිහිල් කිරීම පිණිස ණය සහන, ණය ආපසු ගෙවීම විලම්බනය කිරීම සහ මූල්‍ය උත්තේජනය සඳහා වන හදිසි අවශ්‍යතාවන් සඳහා සහාය දක්වනවා. අප කෙටිකාලීන හදිසි ක්‍රියාමාර්ග සහ තවදුරටත් මධ්‍යකාලීන ස්ථාවරකරණ පියවරයන් ඉල්ලා සිටින අතර, සාමාන්‍ය ආර්ථික ක්‍රියාකාරකම් නැවත ආරම්භ කළ හැකි වන තෙක් අවශ්‍ය සහන ලබා දෙන ලෙස ජාත්‍යන්තර මූල්‍ය ආයතන සහ පරිත්‍යාගශීලීන්ගෙන් ඉල්ලා සිටින ගෝලීය ඉල්ලීම් හා සම්බන්ධ වනවා.

"නොවැළැක්විය හැකි ලෙස, ඊ - වාණිජ්‍යය සහ ඊ - පාලනය පශ්චාත් කොවිඩ් - 19 ලෝකයේ රටවල තරගකාරීත්වය නිර්වචනය කරනු ඇති අතර, විවේකය හා සංචාරක කටයුතු ආශ්‍රිත කර්මාන්ත ද එවැනි වේදිකා මඟින් මෙහෙයවනු ලබනවා. දැනටමත් ඩිජිටල් ගනුදෙනු සඳහා ජාත්‍යන්තර ප්‍රමිතීන් අනුගමනය කළ දකුණු ආසියාවේ පළමු රට වන්නේ ශ්‍රී ලංකාවයි. රට මඟින් මෙහෙයවනු ලබන පොකුරුවලින් සිදු කෙරෙන කාර්යයන් සඳහා යළි ප්‍රමුඛතාවය දීම පොදුරාජ්‍ය මණ්ඩලයීය සම්බන්ධතා න්‍යායපත්‍රය යටතේ කාලෝචිත පියවර ගැනීම අප සාදරයෙන් පිළිගන්නවා. විශේෂයෙන් වෙළෙඳාම සහ ආයෝජන ඉහළ නැංවීම සඳහා ඩිජිටල් ආර්ථික මෙවලම් භාවිතා කිරීම සම්බන්ධයෙන් එම පොකුරු මඟින් මෙහෙයවනු ලබන වැඩ කටයුතු පිළිබඳව අපේක්ෂා සහගතව සිටිනවා."

දැරිය හැකි මිලකට එන්නත දෙන්නත් ඕනෑ

ලොව පුරා කොවිඩ් ආසාදිත ගණන ලක්ෂ 387ක් තෙක් ඉහළට

මහින්ද අලුත්ගෙදර

ලොව පුරා කොවිඩ් - 19 ආසාදනය වූවන් සංඛ්‍යාව ලක්ෂ 387 දක්වා ඉහළ ගොස් තිබේ.

නවතම දත්තවලට අනුව වාර්තා වන මුළු ආසාදිතයන් සංඛ්‍යාව 38,744,473කි. ඒ අතරින් 29,123,761 දෙනකු සුවය ලබා ඇත. වැඩිම ආසාදිතයන් පිරිස ඇමෙරිකාවෙන් වාර්තා වන අතර, එම සංඛ්‍යාව 8,150,043කි. එරට මරණ සංඛ්‍යාව 200,000 ඉක්මවා යෑම විශේෂත්වයකි. ඒ අනුව එරට මියගිය සංඛ්‍යාව 221,843ක් වෙයි. මේ අතර, ඉන්දියාවේ ආසාදිතයන් 7,305,070ක් සහ බ්‍රසීලයේ ආසාදිතයන් සංඛ්‍යාව 5,141,498ක් ලෙස වාර්තා වේ. රුසියාව ද ආසාදිතයන් ලක්ෂ 10 ඉක්මවා ගොස් ඇත. පේරු, කොලොම්බියාව, මෙක්සිකෝව, දකුණු අප්‍රිකාව, ස්පාඤ්ඤය, ආජන්ටිනාව, ප්‍රංශය, එක්සත් රාජධානිය, ඉරානය යන රටවල ආසාදිතයන් ප්‍රමාණය 500,000 ඉක්මවා ගොස් ඇත.

මේ වන විට කොවිඩ් ආසාදනය වීම හේතුවෙන් ලොව පුරා මියගිය සංඛ්‍යාව දෙලක්ෂයකට වැඩි පිරිසක් ඇමෙරිකා එක්සත් ජනපදයෙන් වාර්තා වන අතර, ඉන්දියාවෙන් හා බ්‍රසීලයෙන් ලක්ෂයකට වැඩි මරණ සංඛ්‍යාවක් වාර්තා වී තිබේ. ඒ අනුව බ්‍රසීලයේ මරණ සංඛ්‍යාව 151,779ක් වන අතර, ඉන්දියාවේ මරණ සංඛ්‍යාව 111,311කි. ඇමෙරිකා එක්සත් ජනපදයේ ජෝන්ස් හොප්කින්ස් විශ්ව විද්‍යාලයේ සංඛ්‍යා ලේඛන අනුව කොවිඩ් - 19 වයිරසය හේතුවෙන් ස්පාඤ්ඤයේ 33,413ක්, ඉතාලියේ 36,289ක්, ප්‍රංශයේ 33,037ක්, බ්‍රිතාන්‍යයේ 43,155ක්, බ්‍රසීලයේ 151,779ක්, රුසියාවේ 23,205ක්, බෙල්ජියමේ 10,278ක්, ඉරානයේ 29,349ක්, නෙදර්ලන්තයේ 6,663ක්, මෙක්සිකෝවේ 84,898ක්, කැනඩාවේ 9,664ක් සහ ජර්මනියේ 9,771ක් ලෙස මරණ වාර්තා වී තිබේ. ඊට අමතරව අසල්වැසි ඉන්දියාවේ ආසාදිතයන් 7,305,070ක් වාර්තා වන අතර, මියගොස් තිබෙන සංඛ්‍යාව 111,311කි.

ලොව වැඩිම ආසාදිතයන් සංඛ්‍යාවක් වාර්තා වන රටවල් ලැයිස්තුවේ තවදුරටත් පෙරමුණේ පසුවන්නේ ඇමෙරිකාව වන අතර, ඉන්දියාව දෙවැනි ස්ථානයේත් බ්‍රසීලය තෙවැනි ස්ථානයේත් රුසියාව සිව් වැනි ස්ථානයේ හා ස්පාඤ්ඤය පස් වැනි ස්ථානයේත් පසුවෙයි.

ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය මහ කොමසාරිස් සාරා හල්ටන් මහත්මිය පෙරේදා (14) ජනමාධ්‍ය ඇමැති ආචාර්ය කෙහෙලිය රඹුක්වැල්ල මහතා හමු වී සාකච්ඡා කළ අයුරු.

ශ්‍රම බළකා රික්තයක් ඇති වීම වැළැක්වීමට

පෞද්ගලික අංශයේ විශ්‍රාමික වයස 60 දක්වා ඉහළ දැමීමේ තීරණයක්

අනුර ප්‍රේමලාල්

ලෝකයේ අනෙක් රටවල පවතින විශ්‍රාම ගැන්වීමේ වයස ඉහළ දැමීම ද සලකා බලා අනාගතයේ දී සේවා ප්‍රවීණයන්ගෙන් තවදුරටත් රටට සේවය ලබා ගැනීමේ අරමුණින් මෙරට පෞද්ගලික අංශයේ විශ්‍රාම ගැන්වීමේ වයස හැට (60) දක්වා ඉහළ දැමීමට සලකා බලන බව කම්කරු අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා මහතා ප්‍රකාශ කළේය.

ඒ මහතා සඳහන් කළේ, මෙරට වැඩිහිටි ජනගහණය ශීඝ්‍රයෙන් ඉහළ යමින්, තරුණ ප්‍රතිශතය පහළ යන බැවින් අනාගත ශ්‍රම බළකායේ විශාල රික්තයක් ඇති විය හැකි බවයි.

කම්කරු දෙපාර්තමේන්තුවේ පෙරේදා (14) පැවැති කම්කරු උපදේශක සභාවේ ඉදිරිපත් වූ මෙම යෝජනාවට සේව්‍ය සම්මේලනයේ සහ වෘත්තීය සමිතිවල පූර්ණ එකඟතාවය පළ කිරීම පිළිබඳව ඇමැතිවරයා එහිදී සිය ප්‍රණාමය පළ කළේය. එහිදී අදහස් දැක්වූ සේව්‍ය සම්මේලනයේ අධ්‍යක්ෂ ජනරාල් කණිෂ්ක වීරසිංහ මහතා කියා සිටියේ, මෙම තීරණය ඉතාමත් ඵලදායී එකක් බවයි.

කෙසේ වෙතත් මේ පිළිබඳ අවසන් තීරණය මීළඟ කම්කරු උපදේශක සභාවේ දී ප්‍රකාශයට පත් කරන බවත් ඉන් පසු ඊට අදාළ නෛතික ප්‍රතිපාදන සකස් කරන බවත් අමාත්‍යවරයා ප්‍රකාශ කළේය.

මහා පරිමාණ හෙරොයින් ජාවාරමුන් වූ

'කොණ්ඩා චමින්ද' ඇතුළු 3ක් දිවි ඇති තෙක් හිරේට

කුමුදු හෙට්ටිආරච්චි

හෙරොයින් ජාවාරම් කිරීම හා සන්තකයේ තබා ගැනීමේ චෝදනාවන්ට වරදකරුවන් වූ උපුල් චමින්ද හෙවත් 'කොණ්ඩා චමින්ද' ඇතුළු විත්තිකරුවන් තිදෙනකුට කොළඹ මහාධිකරණය විසින් පෙරේදා (14) ජීවිතාන්තය දක්වා සිර දඬුවම් නියම කරන ලදි.

පූර්වගාමී කොළඹ මහාධිකරණ විනිසුරු විකුම් කළුආරච්චි මහතා විත්තිකරුවන් හට මෙම සිරදඬුවම් නියම කළේය. විත්තිකරුවන්ට එරෙහිව පැවැති දීර්ඝ නඩු විභාගයන්ගෙන් අනතුරුව පැමිණිල්ල විසින් විත්තිකරුවන්ට එරෙහිව නඟන ලද චෝදනා සාධාරණ සැකයෙන් තොරව ඔප්පු කර ඇති බව තීන්දු කළ විනිසුරුවරයා මෙම තීන්දුව ලබා දී තිබේ. හෙරොයින් ග්‍රෑම් 6.68ක් සන්තකයේ තබා ගැනීම හා ජාවාරම් කිරීම සම්බන්ධයෙන් මත්ද්‍රව්‍ය නාශක කාර්යාංශය විසින් 2013 වසරේ බොරැල්ල ප්‍රදේශයේ දී අත්අඩංගුවට ගෙන තිබූ ඒ.ඩබ්ලිව්. මනෝජ් හා හෙරොයින් ග්‍රෑම් 2.37ක් සමඟ සුරාබදු නිලධාරීන් විසින් අත්අඩංගුවට ගනු ලැබූ ටී.ආර්.එච්. කරුණාරත්න හා 2013 අගෝස්තු 27 වැනිදා මාළිගාවත්ත ප්‍රදේශයේ දී කොළඹ අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් විසින් අත්අඩංගුවට ගන්නා ලද උපුල් චමින්ද හෙවත් 'කොණ්ඩා චමින්ද' යන විත්තිකරුවන් එසේ ජීවිතාන්තය දක්වා වූ සිර දඬුවම් නියම කෙරිණි. විත්තිකරුවන්ට එරෙහිව නීතිපතිවරයා මත්ද්‍රව්‍ය ජාවාරම් කිරීම හා සන්තකයේ තබා ගැනීම යන අධි චෝදනා මත මෙම නඩු පවරා තිබිණි.

කොරෝනාවෙන් බේරෙන්න සෞඛ්‍ය උපදෙස් චක්‍රලේඛ 56ක්

වැඩි විස්තර www.health.gov.lk වෙතින්

සන්ධ්‍යා කරුණාරත්න

කොවිඩ් - 19 වයිරසයෙන් ආරක්ෂා වීම සඳහා පවතින සෞඛ්‍ය උපදෙස් චක්‍රලේඛ 56ක් ඒ ඒ ආයතනවලට ගැළපෙන පරිදි සකස් කිරීමට සෞඛ්‍ය අමාත්‍යාංශය පියවර ගෙන තිබේ.

ඒ ඒ ක්ෂේත්‍රයන්ට අදාළව වයිරසය පාලනයට උපදෙස් ලබා දීම මෙම චක්‍රලේඛවලින් සිදු කර ඇති අතර, එම චක්‍රලේඛයන්ට අනුගතව කටයුතු නොකරන ආයතනවලට එරෙහිව ඉදිරියේ දී නීතිය ක්‍රියාවට නංවන බව සෞඛ්‍ය අමාත්‍යාංශයේ මාධ්‍ය ප්‍රකාශක, වෛද්‍ය පර්යේෂණ ආයතනයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ, විශේෂඥ වෛද්‍ය ජයරුවන් බණ්ඩාර මහතා පැවැසුවේය. සෞඛ්‍ය අමාත්‍යාංශයේ www.health.gov.lk වෙබ් අඩවියට පිවිසීමෙන් මෙම චක්‍රලේඛ සම්බන්ධයෙන් කරුණු දැනුවත් විය හැකිය.

කොවිඩ් - 19 වයිරසය වළක්වා ගත හැකි සෞඛ්‍ය නිර්දේශ අනුගමනය කිරීම වසර දෙක තුනක් තිස්සේ වුවත් ජනතාවට පිළිපැදීමට සිදු වනු ඇති බවත් තමතමන් ප්‍රවේශම් වීම මෙම වයිරසයෙන් වැළකී සිටීමට හැකි එකම මඟ බවත් ඒ මහතා කීය. ඔහු වැඩිදුරටත් කියා සිටියේ, ඇමෙරිකාව වැනි දියුණු රටවල ජනතාව අතර පැතිර යන කොවිඩ් පාලනය සම්බන්ධයෙන් වගකීම මහජනතාව වෙත පවරා තිබුණ ද, ශ්‍රී ලංකාවේ එවැනි තත්ත්වයක් නොපැවතීම සම්බන්ධයෙන් සතුටු විය යුතු බවයි.

මතුගමිනුත් කොවිඩ් ආසාදිතයෝ 4ක්

අධිවේගී බස් රථයේ ගිය අය අවධානයෙන්

කොරෝනා ආසාදිතයන් සිව් දෙනකු පෙරේදා (14) මතුගම ප්‍රදේශයෙන් හඳුනාගෙන ඇති බව සෞඛ්‍ය අංශ සඳහන් කළේය.

අධිවේගී මාර්ගයේ කොළඹ - මතුගම සුඛෝපභෝගී බස් රථයක හිමිකරුවකු, එහි රියැදුරු හා කොන්දොස්තරවරයා එම සිව් දෙනාගෙන් තිදෙනකු බවත් අනෙක් ආසාදිතයා කොළඹ ජාතික රෝහලේ හෙදියක බවත් සෞඛ්‍ය අංශ පැවසීය. බස් රථ කොන්දොස්තරවරයාගේ බිරිය සේවය කරන මතුගම නගරයේ පෞද්ගලික බැංකුවක් ද විෂබීජහරණයට ලක් කර ඇති අතර, කාර්ය මණ්ඩලයේ සියලු දෙනා නිරෝධායනයට ලක් කර ඇත. නිරෝධායනයට ලක් කර ඇති පිරිසගේ පී.සී.ආර්. පරීක්ෂාව ඊයේ (15) ඔව්විගල ශ්‍රී සුනන්දාරාම විහාරස්ථානයේ දී සිදු කිරීමට නියමිතව තිබිණි.

මේ අතර, පැලවත්ත නගරයේ සතිපොළ සහ වෙළෙඳ සල් කිහිපයක් ද වසා දැමීමට කටයුතු කර තිබේ.

ආසාදිතයකු පැමිණීමෙන්

සිළුමිණසෑය පිරිවෙනේ ස්වාමීන් වහන්සේ 75 නමක් නිරෝධායනයට

සන්ධ්‍යා කරුණාරත්න

පිළියන්දල, කහපොළ ප්‍රදේශයේ පිහිටි සිළුමිණසෑය පිරිවෙනේ ස්වාමීන් වහන්සේ 75 නමක් ඇතුළු 90ක් එම පිරිවෙන තුළම ඊයේ (14) නිරෝධායනය ලක් කළ බව කොවිඩ් - 19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථානය සඳහන් කළේය.

එහි වැඩවසන හිමි නමකගේ මවක් පසුගිය දිනක එම හිමි නම බැලීම සඳහා පැමිණ පිටව යෑමෙන් අනතුරුව ඇයට කොවිඩ් වයිරසය ශරීරගත වී ඇති බවට වාර්තා වී තිබේ. මෙසේ ඇය ආසාදිතයකු ලෙස වාර්තා වීමත් සමඟ මේ පිරිස නිරෝධායනයට ලක් කිරීමට සෞඛ්‍ය අංශ ඇතුළු නිලධාරීන් පියවර ගෙන ඇත. වයිරසය ආසාදනය වූ එම හිමි නමගේ මව මිනුවන්ගොඩ ඇඟළුම් කර්මාන්ත ශාලාවට සම්බන්ධ කොවිඩ් ආසාදිතයකුගේ ආශ්‍රිතයකු බවට මේ වන විට හඳුනාගෙන තිබේ.

කොළඹ ජාතික රෝහලට රෝගීන් පැමිණීම සීමා කරයි

සායනවලට පැමිණෙන්නන් මේ අංක අමතන්න

දැනට පවතින කොවිඩ් - 19 වසංගත තත්ත්වය හේතුවෙන් කොළඹ ජාතික රෝහලට පැමිණෙන රෝගී ජනතාව සීමා කිරීමට තීරණය කර තිබේ.

ඒ අනුව කොළඹ ජාතික රෝහලේ සායනවලින් ඖෂධ ලබා ගන්නා රෝගීන් පහත සඳහන් දුරකතන අංක අමතා අදාළ සායන හා සම්බන්ධ වී සේවාවන් ලබා ගන්නා ලෙස රෝහල් අධ්‍යක්ෂවරයා ඉල්ලා සිටියේය.

හෘදය රෝග සායනය 0113618727, 0113618728, 0113618736, 0113618730, 0113618735

ස්නායු ශල්‍ය සායනය 0113618754

වේදනා සමනක සායනය 0113618762

රක්තවේද සායනය (සාමාන්‍ය) 0113618538

රක්තවේද සායනය (විශේෂ) 0113618770

ශල්‍ය සහ උරස් ශල්‍ය සායනය (කාමර අංක 17) 0113618718

ශල්‍ය හා වාහිනීක සායනය (කාමර අංක 19) 0113618719

චර්ම රෝග සායනය (කාමර අංක 25) 0113618746

උගර කන නාසා සායනය (කාමර අංක 21) 0113618748

වෛද්‍ය, ශල්‍ය හා මෞත්‍ර ලිංගික සායනය (කාමර අංක 18 හා 24) 0113618724

වෛද්‍ය සායනය (කාමර අංක 26,27,36) 0113618742, 0113618743

වකුගඩු රෝග සායනය (කාමර අංක 09) 0113618715

දිවුලපිටියේ පාසල් 9ක සිසුන් 16කට කොවිඩ්

ළඟම ආශ්‍රිතයන් 150ක් නිරෝධායනයට

සන්ධ්‍යා කරුණාරත්න

ගම්පහ, දිවුලපිටිය ප්‍රදේශයේ පාසල් 9ක දරුවන් 16 දෙනකුට කොවිඩ් - 19 වයිරසය ආසාදනය වී ඇති බව ශ්‍රී ලංකා මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගේ සංගමයේ උප සභාපති යූ.ටී. කුලතිලක මහතා පෙරේදා (14) 'දිනමිණ' ට පැවැසුවේය.

ඒ අනුව දිවුලපිටිය ඥානෝදය විද්‍යාලයෙන් සිසුන් 3ක් ද ඥානාවාස විද්‍යාලයෙන් 3ක් ද කොටදෙනියාව කරුණාරත්න විද්‍යාලයෙන් 2ක් ද දොරොව්ව විද්‍යාලයෙන් 2ක් ද දූනගහ රණසිංහ විද්‍යාලයෙන් 2ක් ද අස්වැන්නවත්ත, කොස්ඇටදෙනිය, හල්පෙ හා හුණුමුල්ල විද්‍යාලවලින් දරුවන් එක්කෙනා බැගින් 4ක් ද ලෙස ආසාදිත සිසුන් 16ක් වාර්තා වී තිබේ.

මෙම දරුවන්ගේ පවුල්වල පුද්ගලයන් සහ ළඟම ආශ්‍රිතයන් 150ක් පමණ මේ හේතුවෙන් නිරෝධායනයට ලක් කරන බව ද ඒ මහතා පැවැසුවේය.

මිනුවන්ගොඩ ඇඟළුම් කම්හලෙන් පළමුවෙන්ම කොවිඩ් ආසාදිත බවට හඳුනා ගත් කාන්තාවගේ දියණියට වයිරසය ආසාදනය වීමෙන් පසුව ඇය ඉගෙන ගත් දිවුලපිටිය ඥානෝදය විද්‍යාලයේ දරුවන්ට සහ කාර්ය මණ්ඩලයට පී.සී.ආර්. පරීක්ෂණ සිදු කිරීමේ දී එම පාසලේ දරුවන් තිදෙනකුට වයිරසය ආසාදිත බවට හඳුනාගත් බව ද ඔහු කීය.

ඒ අනුව දිවුලපිටියෙන් පමණක් පෙරේදා (14) ආසාදිතයන් 37ක් වාර්තා වීමත් සමඟ දිවුලපිටියේ සමස්ත ආසාදිතයන් ගණන 239ක් දක්වා ඉහළ ගොස් තිබේ.

කඩිනම් අධිකරණ ක්‍රියාවලියකට

ජ්‍යෙෂ්ඨ නීතිඥවරුන්ගෙන් යුත් කමිටු 5ක්

රෝෂන් තුෂාර

කාර්යක්ෂම හා කඩිනම් අධිකරණ ක්‍රියාවලියක් රට තුළ ස්ථාපිත කිරීමේ රජයේ වැඩපිළිවෙළ සාර්ථක කර ගැනීම උදෙසා වන ව්‍යාපෘති කළමනාකරණ කාර්යාලය සඳහා ජ්‍යෙෂ්ඨ නීතිඥවරුන්ගෙන් සමන්විත කමිටු පහක් පත් කෙරේ.

අදාළ කමිටුවල නිලධාරීන් සඳහා පත්වීම ලිපි ලබා දීම අධිකරණ ඇමැති ජනාධිපති නීතිඥ එම්.යූ.එම්. අලි සබ්රි මහතා විසින් අධිකරණ අමාත්‍යාංශයේ දී පසුගියදා සිදු කෙරිණි. අධිකරණ ක්ෂේත්‍රයේ පවතින අඩුපාඩු සොයා බලා ඒවාට ලබා දෙන විසඳුම් මොනවාද යන්න පිළිබඳව රජයට වාර්තාවක් ඉදිරිපත් කිරීම මෙම කමිටුවල කාර්යබාරය ලෙස අධිකරණ ඇමැතිවරයා පෙන්වා දුන්නේය.

යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලියේ පවතින අඩුපාඩු සොයා බලා වසර තුනක් ඇතුළත කඩිනම් හා කාර්යක්ෂම සේවාවක් බවට අධිකරණ ක්ෂේත්‍ර සේවාව පත් කිරීම සඳහා ජාතික වැඩපිළිවෙළක් සැකසිය යුතු බවට අධිකරණ ඇමැතිවරයා කැබිනට් මණ්ඩලයට කළ යෝජනාවට අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබීමෙන් අනතුරුව මෙම කළමනාකරණ කාර්යාලය හා ඊට අදාළ කමිටු පත් කිරීම සිදු කළේය. අධිකරණ, යටිතල පහසුකම් සංවර්ධන, අපරාධ නීති ප්‍රතිසංස්කරණ, අධිකරණ ඩිජිටල්කරණ හා ස්වයංක්‍රීය වාණිජ නීති ප්‍රතිසංස්කරණ හා සිවිල් නීති ප්‍රතිසංස්කරණ කමිටු ලෙස කමිටු පහක් පත් කිරීම මෙහිදි සිදු කළේය.

එම කමිටු සභාපතිවරුන් ලෙස පිළිවෙළින් ජනාධිපති නීතිඥවරුන් වන යූ.ආර්. ද සිල්වා, ශවේන්ද්‍ර ප්‍රනාන්දු, නවින් මාරපන යන මහත්වරුන් පත් කළ අතර, වාණිජ හා සිවිල් නීති ප්‍රතිසංස්කරණ කමිටු දෙකෙහි සභාපතිවරුන් ලෙස නීතිඥ කෞශල්‍ය නවරත්න මහතා හා ලසිත් කණුවනආරච්චි මහත්වරුන් පත් කර තිබේ. කමිටු උපදේශකවරුන් ලෙස නීතිඥ සංජීව දසනායක, නීතිඥ ෂෙහාන් ගුණවර්ධන, නීතිඥ ශමිත් ප්‍රනාන්දු, නීතිඥ රුවන්ත කුරේ, නීතිඥ නිශාන් පේමතිරත්න හා නීතිඥ සංජිත් සේනානායක යන මහත්වරු පත් කර ඇත. අදාළ කමිටුවල විශේෂඥයන් ලෙස නීතිඥ ෂෙහානී ද අල්විස් මහත්මිය පත් කෙරිණි. කමිටුවල පර්යේෂණ නිලධාරී ලෙස නීතිඥ රම්සි බාචා මහතා පකටයුතු කරනු ඇත. කමිටු නිලතල පත්වීම් ප්‍රදානය කිරීමෙන් අනතුරුව අමාත්‍යවරයා විසින් කමිටු කාර්යබාරය පැහැදිලි කරන ලද අතර, මෙම අවස්ථාවට අමාත්‍යාංශ ලේකම්වරයා ද සහභාගී විය.

යොවුන් කාන්තා ලෝක කුසලානයත් කල් යන ලකුණු

වසර 2021 ජනවාරියේ බංග්ලාදේශයේ සත්කාරකත්වයෙන් පළමුවරට පැවැත්වෙන අවුරුදු 19න් පහළ කාන්තා ලෝක කුසලාන තරගාවලිය පිළිබඳ ලබන මාසයේදී අවසන් තීරණයකට එළැඹීමට අයිසීසීය බලාපොරොත්තු වෙයි.

2020 විස්සයි20 ලෝක කුසලාන තරගාවලිය සහ 2021 කාන්තා එක්දින ලෝක කුසලාන තරගාවලිය වසර 2022 දක්වා කල් දමනු ලැබුවද යොවුන් කාන්තා ලෝක කුසලාන තරගාවලිය පිළිබඳ මෙතෙක් අයිසීසීය නිල නිවේදනයක් නිකුත් කර නැත.

නමුත් බංග්ලාදේශය ඇතුළු බොහෝ රටවල කොරෝනා වසංගය නැවත හිස එසැවීමත් සමඟ යොවුන් කාන්තා ලෝක කුසලාන තරගාවලිය පැවැත්වීමේ අවදානමක් මතු වී තිබේ.

අවුරුදු 19න් පහළ කාන්තා ලෝක කුසලාන තරගාවලියක් ආරම්භ කිරීමට අයිසීසීයේ අවධානය යොමු වී ඇතැයි ප්‍රකාශයට පත්වූයේ පසුගිය වසරේ ඔක්තෝබර් මාසයේ ඩුබායි නුවර පැවැති සිව්දින සමුළුවේදීය. ඒ අනුව 2021 දී එහි පළමු තරගාවලිය බංග්ලාදේශයේ පැවැත්වීමට තීරණය වූ අතර, ඉන් පසු වසර දෙකකට වරක් යොවුන් කාන්තා ලෝක කුසලාන තරගාවලිය පැවැත්වීමට තීරණය විය.

කෙන්යානු මැරතන් ක්‍රීඩකයාට වසර හතරක තහනමක්

කෙන්යානු මැරතන් ක්‍රීඩක ඩැනියෙල් වන්ජිරුට තහනම් උත්තේජක චෝදනා යටතේ වසර හතරක තහනමක් පැන වූ බව මලල ක්‍රීඩා අන්තර්ජාතික සම්මේලනය පවසයි. 28 හැවිරිදි වන්ජිරු 2016දී ඇම්ස්ටර්ඩෑම් මැරතන් සහ 2017දී ලන්ඩන් මැරතන් තරගය ජයග්‍රහණ කළ ප්‍රබල ක්‍රීඩකයෙකි.

ඔහුට මලල ක්‍රීඩා ජෛව බලපත්‍රය උල්ලංඝනය කළ බවට චෝදනා එල්ල වී තිබේ. මලල ක්‍රීඩා ජෛව බලපත්‍රයේ ක්‍රීඩක ක්‍රීඩිකාවන් ගත් සියලු බෙහෙත් ද්‍රව්‍ය පිළිබඳ සටහන් විය යුතු අතර, වන්ජිරු එයට අමතර උත්තේජකයක් ලබා ඇති බවට කරුණු අනාවරණය වී ඇත.

ඔහුගේ තහනම 2023 දෙසැම්බර් දක්වා බල පැවැත්වෙන අතර, 2019 ලන්ඩන් මැරතන් තරගයේ 11 වැනි ස්ථානය ද ඇතුළුව පසුගිය වසරේ මාර්තු 9 සිට ඔහුගේ ප්‍රතිඵල සියල්ල අවලංගු වේ.

බංග්ලාදේශය අයිසීසීයේ අනුමැතිය සොයයි

ටෙස්ට් තරගයක් සහ එක්දින තරගයක් ඇතුළත් පාකිස්තාන සංචාරයට අන්තර්ජාතික ක්‍රිකට් කවුන්සිලයේ අනුමැතිය අපේක්ෂාවෙන් පසුවන බව බංග්ලාදේශ ක්‍රිකට් පාලක මණ්ඩලය ප්‍රකාශ කළේය.

අදියර තුනකින් යුතුව පසුගිය ජනවාරියේදී ආරම්භ කළ බංග්ලාදේශ පිලේ පාකිස්තාන සංචාරයේ අදියර දෙකක් කොරෝනා වසංගතයේ පළමු ව්‍යාප්තියට පෙර නිමාවට පත් කළ අතර, ටෙස්ට් තරගයක් සහ එක්දින තරගයක් ඉතිරිව ඇත්තේ අප්‍රේල් මාසයට නියමිතව තිබූ අවසන් අදියර කල් දැමීමට සිදු වීමෙනි.

ඉතිරිව ඇති ටෙස්ට් තරගය අන්තර්ජාතික ටෙස්ට් ශූරතාවලියට අයත් බැවින් එම තරගය පැවැත්වීමේ වැදගත්කම පෙන්වා දුන් බංග්ලාදේශ ක්‍රිකට් පාලක මණ්ඩලයේ ප්‍රධාන විධායක නිලධාරි නිසාමුඩීන් චවුද්රි ඉදිරියේදී පැවැත්වෙන අයිසීසී රැස්වීමේදී මේ පිළිබඳ අවසන් තීරණය ගත යුතු බවය. තරගය අවලංගු කරන්නේ නම් දෙපිල අතර ප්‍රසාද ලකුණු සමසමව බෙදී යායුතුව ඇත.

දෙපිල යළි මුණගැසීමට නියමිතව ඇත්තේ ටෙස්ට් තරග 2ක් සහ විස්සයි20 තරග 3ක් ඇතුළත්ව ලබන වසරේ නොවැම්බරයේ දී පැවැත්වෙන පාකිස්තාන පිල බංග්ලාදේශයේ සංචාරයේදීය.

වික්‍රමසිංහ යද්දී තිලක් සමඟ ශීලා එයි

ප්‍රින්ස් ගුණසේකර

ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ සහකාර ක්‍රීඩා අධ්‍යක්ෂ ආර්.බී. වික්‍රමසිංහ මහතා ක්‍රීඩා සංගම් විෂයෙන් ඉල්ලා අස් වී ජාතික ක්‍රීඩා විද්‍යායතනයට යයි. ක්‍රීඩා සංගම් විෂයට අදාළ ඔහු සතු සියලු ලිපි ලේඛන ක්‍රීඩා සංගම් විෂය භාර සහකාර ක්‍රීඩා අධ්‍යක්ෂවරුන් වූ තිලක් අල්පොන්සු හා ශීලා ද සේරම් යන මහත්ම මහත්මීන්ට වික්‍රමසිංහ මහතා ඊයේ දිනයේ භාර දුන්නේය.

ක්‍රීඩා සංගම් විෂය අලුතින් භාර වූ සහකාර ක්‍රීඩා අධ්‍යක්ෂවරුන් වූ තිලක් අල්පොන්සු හා ශීලා ද සේරම් යන මහත්ම මහත්මීන් ක්‍රීඩා අමාත්‍යාංශයේ දිගු කාලයක් සේවය කොට අත්දැකීම් ඇති දෙදෙනෙකි. වසර 6ක් තිස්සේ ක්‍රීඩා සංගම් පාලනය සම්බන්ධව හා ඒ ආශ්‍රිතව මතුවන ගැටලු විසඳීමේ කාර්ය වික්‍රමසිංහ මහතා විසින් ඉටු කළ අතර, නිලවරණ පැවැත්වීම හා නිලවරණවලදී මතුවන ගැටලු සම්බන්ධ පරීක්ෂණ කටයුතු මෙහෙයවීම ද සිදු කළේය.

ක්‍රීඩා සංගම් විෂයෙන් ඉල්ලා අස් වන ඒ මහතා ඉදිරියේදී ක්‍රීඩාවේ තාක්ෂණික කටයුතු සම්බන්ධ තනතුරක් ලබාදෙන ලෙස ඉල්ලීමක් කර තිබිණි. ක්‍රීඩා සංගම් විෂයෙන් ඉල්ලා අස්වී ක්‍රීඩාවේ තාක්ෂණික කටයුතු කෙරෙහි අවධානය යොමු කිරීමට අදහස් කළ බව 'දිනමිණ'ට පැවැසීය.

වික්‍රමසිංහ මහතා ජාතික බර ඉසිලීමේ පුහුණුකරු ලෙස විශාල කාලයක සිට කටයුතු කරමින් සිටින අතර, ඔහු යටතේ බර ඉසිලීමේ අන්තර්ජාතික පදක්කම් රැසක් දිනා ගැනීමට ශ්‍රී ලංකා ක්‍රීඩක ක්‍රීඩිකාවන් සමත් වූහ. පොදු රාජ්‍ය මණ්ඩලීය, ආසියානු හා දකුණු ආසියානු ක්‍රීඩා තරගවලදී දිනාගත් පදක්කම් වෙනුවෙන් ක්‍රීඩක ක්‍රීඩිකාවන් ඇගැයීමට ලක් වෙද්දී පුහුණුකරු ලෙස වික්‍රමසිංහ මහතා ද ඇගැයීමට ලක්ව මුදල් තෑගි හා සම්මාන අවස්ථා ගණනකදී ලබා ගත්තේය.

සහකාර ක්‍රීඩා අධ්‍යක්ෂවරයා ලෙස ක්‍රීඩා සංගම් විෂය භාරව කටයුතු කරද්දී දුන් තීන්දු තීරණ කිහිපයක් හේතුවෙන් ඒ මහතාට පසුගිය කාලයේ චෝදනා එල්ල විය.

සහිරා ක්‍රීඩා සංකීර්ණයට මුල් ගල්

රුසෙයික් ෆාරූක්

කොළඹ සහිරා විද්‍යාලයේ 'සහිරා ක්‍රීඩා සංකීර්ණය' සඳහා මුල් ගල් තැබීමේ උත්සවය පසුගියදා විද්‍යාලයීය පරිශ්‍රයේදී පැවැත්විණි.

ප්‍රධාන ආරාධිතයා වූ මොහොමඩ් හාජි ඕමාර් මහතා විසින් මුල් ගල් තබන අයුරු ක්‍රීඩා සංකීර්ණයේ ව්‍යායාම් ශාලාව, ස්කොෂ් පිටිය, කැරම් සඳහා ගෘහස්ථ ක්‍රීඩා ප්‍රදේශය, චෙස්, පැසිපන්දු, බැඩ්මින්ටන්, බොක්සිං, රයිෆල් වෙඩි තැබීම, මේස පන්දු සහ වොලිබෝල් ක්‍රීඩා කිරීමේ ස්ථානවලින් සමන්විත වේ. මේ අවස්ථාවට ප්‍රධාන ආරාධිතයා ලෙස ෆීනික්ස් වෙන්චර්ස් සමාගමේ අධ්‍යක්ෂ මොහොමඩ් හාජි ඕමාර් මහතා සහභාගී විය. විදුහල්පති රිස්වි මරික්කාර්, ව්‍යාපෘති සභාපති ජිස්ති ෆවුම්, පාලක මණ්ඩලයේ සභාපති ෆවුසුල් හමීඩ්, ආදී ශිෂ්‍ය සංගමයේ සභාපති නෙයිනා මොහොමඩ්, ලේබම් නුස්රි මන්සූර යන මහත්වරු සමඟින් ආදි සිසු පිරිසක් සහභාගි වූහ.

ඡායාරූපය - රුසෙයික් ෆාරූක්

ඇන්ඩි මරේ 115ට වැටේ

බ්‍රිතාන්‍ය ටෙනිස් ක්‍රීඩක ඇන්ඩි මරේ ජර්මනියේ කොලෝන්හි පැවැත්වෙන බෙට් 1 හල්ක්ස් ඒටීපී ගෘහස්ථ ටෙනිස් තරගාවලියේ පළමු වටයෙන්ම ඉවත් විසි වෙයි.

තරගාවලියේ 32 දෙදෙනාගේ වටයේදී මරේ පරාජය කිරීමට ස්පාඤ්ඤයේ ප්‍රනාන්දු වර්ඩාස්කෝ සමත් වූයේ 2-0කිනි. එහි ලකුණු තත්ත්වය වූයේ 6-4ක් සහ 6-4කි.

මේ සමඟ ලෝක ටෙනිස් ශ්‍රේණිගත කිරීම්වල 115 වැනි ස්ථානය දක්වා පහත බැසීමට 33 හැවිරිදි මරේට සිදු විය. කලක් ලොව අංක එකේ ක්‍රීඩකයා ලෙස කිරුළ දරා සිටි මරේ, විම්බල්ඩන් ශූරතා ත්‍රිත්වයක් සහ ඔලිම්පික් රන් පදක්කම් 2ක් දිනා ගෙන තිබේ. ඔහු 2020 තරග වාරය යටතේ එක් වූ සිව්වැනි තරගාවලිය මෙයයි. සැත්කමකට භාජනය වීමෙන් පසු පිටියට පිවිසි ඔහු මේ වසරේ පැවැති අමෙරිකානු තරගාවලියේ දෙවැනි වටයෙන් සහ ප්‍රංශ තරගාවලියේ පළමු වටයෙන්ම ඉවතට විසි විය.

දකුණු අප්‍රිකාවට ජගත් ක්‍රිකට් තහනමක්?

ක්‍රිකට් ක්‍රීඩාවට එරට රජය මැදිහත් වීම හේතුවෙන් දකුණු අප්‍රිකාවට අන්තර්ජාතික ක්‍රිකට් තහනමක් පැනවීමේ අවදානමක් මතුව තිබේ.

දකුණු අප්‍රිකානු ක්‍රීඩා ඇමැති නාති මෙත්වා මහතා විසින් පවතින දැඩි අර්බුද හේතුවෙන් ක්‍රිකට් ක්‍රීඩාව සඳහා මැදිහත්වීමක් පිළිබඳ ජගත් ක්‍රිකට් කවුන්සලයට දැනුම් දී තිබේ.

එරට ක්‍රිකට් ආයතනයේ ඉහළ නිලධාරීන් සිදු කර ඇති විෂමාචාර ක්‍රියා රැසක් වාර්තා වී ඇති අතර, මේ හේතුවෙන් මින් පෙර දකුණු අප්‍රිකානු ක්‍රීඩා සම්මේලනය සහ ජාතික ඔලිම්පික් කමිටුව එරට ක්‍රිකට් නිලධාරීන්ට සියලු පරිපාලන කටයුතුවලින් ඉවත් වන ලෙස දන්වා තිබිණි. ක්‍රිකට් ආයතනයේ සිදු වූ විෂමාචාර ක්‍රියා පිළිබඳ විමර්ශනයක් සිදු කිරීමට කමිටුවක් ද පත් කළ අතර, එම විමර්ශනවලට අනුව එහි ප්‍රධාන විධායක නිලධාරියා ද පසුගිය අගෝස්තු මාසයේදී ධුරයෙන් ඉවත් කෙරිණි. මින් පෙර දකුණු අප්‍රිකානු ක්‍රීඩා සම්මේලනය හා ඔලිම්පික් කමිටුව අයිසීසීයට ලිපියක් යොමු කරමින් කියා තිබුණේ මේ මැදිහත් වීම කිසිසේත් රජයේ මැදිහත් වීමක් ලෙස සැලකිය නොහැකි බවයි. කෙසේ වෙතත් පසුගියදා එරට ක්‍රීඩා ඇමැතිවරයා ප්‍රකාශ කර තිබුණේ මේ අර්බුද හේතුවෙන් එහි කටයුතුවලට මැදිහත් වන බවයි.

කෙසේ වෙතත්, සාමාජික රටක ක්‍රිකට් ආයතනවලට රජයේ මැදිහත් වීම ජගත් ක්‍රිකට් කවුන්සලයේ නීතිරීති අනුව පැටහැණි ක්‍රියාවක් වන අතර, එම ආයතන ස්වාධීනව ක්‍රියා කළ යුතුයි.

එසේ නොවන්නේ නම් අදාළ රටට එරෙහිව අන්තර්ජාතික තරග තහනමක් පැනවීමේ බලය අයිසීසීය සතු වන බැවින් මේ වන විට දකුණු අප්‍රිකාවට එවැනි තහනමක් පැනවීමේ අවධානමක් මතුව තිබේ.

කෙසේ වෙතත් මේ සම්බන්ධයෙන් දකුණු අප්‍රිකානු ක්‍රිකට් ආයතනය අයිසීසීයට පැමිණිලි කළ යුතු අතර, තවමත් එවැනි පැමිණිල්ලක් ලැබී ඇති බව අයිසීසීය සඳහන් කර නැත.

මධ්‍යම පළාත් වෙරළ කබඩි ශූරතා දෙකම මහනුවරට

මහනුවර දිස්ත්‍රික් පිරිමි සහ කාන්තා කණ්ඩායම් පුහුණුකරු අජිත් කුලතුංග මහතා සමඟ.

ඡායාරූප - මාතලේ දිසා විශේෂ

මාතලේ දිසා විශේෂ අසෝක හිඳගොඩ

මධ්‍යම පළාත් අන්තර් දිස්ත්‍රික් වෙරළ කබඩි තරගාවලියේ පිරිමි සහ කාන්තා ශූරතා දෙකම දිනා ගැනීමට මහනුවර දිස්ත්‍රික් කණ්ඩායම් සමත් විය.

මාතලේ අලුවිහාරේ වෙරළ වොලිබෝල් පිටියේ තරගාවලියේ පිරිමි අවසන් තරගයේදී නුවරඑළිය දිස්ත්‍රික් පිල ලකුණු 81-26කින් පරාජය කිරීමට හසිත තිවංකගේ නායකත්වයෙන් යුත් මහනුවර කණ්ඩායම සමත් වූ අතර, මහනුවර කාන්තා පිල හමුවේත් නුවරඑළිය කණ්ඩායම ලකුණු 52-26ක් ලෙස පරාජයට පත් විය. මහනුවර කණ්ඩායම හසිකා කුමුදුනිගේ නායකත්වයෙන් තරග වැදිණි.

මහනුවර කණ්ඩායම්වල පුහුණුකරු ලෙස අජිත් කුලතුංග මහතා කටයුතු කළ අතර, අනුශූරතා දිනාගත් නුවරඑළිය කණ්ඩායම්වල පුහුණුකරුවන් ලෙස මදුමී කෞෂිකා, ශෂික ප්‍රභාත් සහ කිංස්ලි කුමාර යන මහත්ම මහත්මීහු කටයුතු කළහ. මධ්‍යම පළාත් ක්‍රීඩා අධ්‍යක්ෂ ජේ.පී ජගත් කීර්ති මහතාගේ මඟ පෙන්වීම යටතේ මහනුවර දිස්ත්‍රික් කබඩි පුහුණුකරු අජිත් කුලතුංග මහතා විසින් මේ තරගාවලිය සංවිධාන කරන ලදි.

මිස්බා තනතුරක් අත්හරී

පාකිස්තාන ජාතික ක්‍රිකට් කණ්ඩායමේ ප්‍රධාන පුහුණුකරු සහ තේරීම් කමිටු සභාපති ලෙස කටයුතු කරන මිස්බා උල් හක් තනතුරක් අත් හැරීමට තීරණය කරයි.

එහෙත් ප්‍රධාන පුහුණුකරු ලෙස එම කාර්යට වැඩි අවධානයක් යොමු කිරීමේ අරමුණින් තමා තේරීම් කමිටු සභාපති ධුරයෙන් ඉල්ලා අස් වන බව පවසා ඇත. පසුගිය වසරේ ඔහු එම තනතුරුවලට පත් කෙරුණේ වසර 3ක කාලයකට බල පැවැත්වෙන පරිදිය.

අයිපීඑල් වේගවත්ම පන්දුව යැවූ ඇන්රිච් නෝර්ට්ජේ

දිල්ලි කැපිටල්ස් යළි පෙරමුණේ

අයිපීඑල් ක්‍රිකට් තරගාවලියේ රාජස්ථාන් රෝයල්ස් කණ්ඩායම සමඟ ඩුබායිහිදී පැවැති 30 වැනි තරගයෙන් ලකුණු 13ක ජයක් අත් කර ගැනීමට දිල්ලි කැපිටල්ස් කණ්ඩායම සමත් විය.

මේ සමඟ ප්‍රසාද ලකුණු සටහනේ දෙවැනි ස්ථානයේ සිට යළිත් පෙරමුණට පිවිසීමට දිල්ලි පිලට හැකි විය. තරග 8ක් ක්‍රීඩා කළ දිල්ලි පිල ජයගත් 6 වැනි තරගය මෙයයි. රාජස්ථාන් පිලේ ද 8 වැනි තරගය මෙය වූ අතර, ඔවුන් ලැබූ 5 වැනි පරාජය ලෙස මෙය සටහන් විය. ඔවුන් ප්‍රසාද ලකුණු සටහනේ 7 වැනි තැන පසු වෙයි.

මේ දෙපිල මූලික වටයේ 23 වැනි තරගයේදීත් හමුවූ අතර, එම තරගයෙන් ද දිල්ලි පිල ජය හිමිවිය.

තරගයේ පළමුව පන්දුවට පහර දුන් දිල්ලි පිල කඩුලු 7ක් දැවී ලකුණු 161ක් රැස් කළ අතර, පිළිතුරු ඉනිම ක්‍රීඩා කළ රාජස්ථාන් පිලට ඕවර 20 අවසානයේ කඩුලු 8ක් දැවී රැස් කළ හැකි වූයේ ලකුණු 148ක් පමණි.

රාජස්ථාන් පිළිතුරු ඉනිමේ වැඩිම ලකුණුලාභියා වූ බෙන් ස්ටෝක්ස් හතරේ පහර 6ක් සමඟින් පන්දු 35කින් ලකුණු 41ක් රැස් කළ අතර, ජොස් බට්ලර් පන්දු 9කින් ලකුණු 22ක් ඉනිමට එක් කළේය. රොබින් උතප්පා පන්දු 27කින් ලකුණු 32ක් සහ සංජු සැම්සන් ලකුණු 25ක් ඉනිමට එක් කළ ද රාජස්ථාන් පිලට ජයග්‍රාහී ඉලක්කය පසු කිරීමට නොහැකි විය.

පන්දු යැවීමේදී ඇන්රිච් නෝර්ට්ජේ සහ තුෂාර් දේෂ්පාන්ඩේ කඩුලු 2 බැගින් දවා ගත්හ.

තරගයේ වීරයා වූ නෝර්ට්ජේ යැවූ තරගයේ තෙවැනි ඕවරයේ 5 වැනි පන්දුව පැයට කිලෝමීටර් 156.22ක වේගයක් සටහන් වූ අතර, එය අයිපීඑල් ඉතිහාසයේ පන්දු යවන්නකු යැවූ වේගවත්ම පන්දුව ලෙස වාර්තා අතරට එක් විය.

පළමුව පන්දුවට පහර දුන් දිල්ලි ඉනිමට වේගවත් ආරම්භයක් දුන් ශිකර් ධවාන් තරගාවලියේ දෙවැනි අර්ධ ශතකය (57) වාර්තා කළේ පන්දු 33කි. හතරේ පහර 6ක් සහ හයේ පහර 2කින් ඉනිම වර්ණවත් කර ගත් ඔහු නායක ශ්‍රේයාස් අයියර් සමඟින් තෙවැති කඩුල්ලට ලකුණු 85ක සබඳතාවක් ගොඩනැඟීය. අයියර් පන්දු 43කදී හතරේ පහර 3ක් සහ හයේ පහර 2ක් සමඟ ලකුණු 53ක් රැස් කළේය.

පන්දු යැවීමේදී ජොෆ්ර ආචර් කඩුලු 3ක් බිඳ දැමූ අතර, ජාදෙව් උනඩ්කට් කඩුලු 2ක් දවා ගත්තේය.

මින් පෙර ප්‍රසාද ලකුණු සටහනේ පෙරමුණේ පසු වූ මුම්බායි ඉන්දියන්ස් පිලේ 8 වැනි තරගය අද (16) කොල්කටා නයිට් රයිඩර්ස් පිල සමඟ පැවැත්වීමට නියමිතය.

ගමක් සතුටු කරන අනූ තුන් වියැති අවුරුදු කුමාරයා

හීතලට පිනි වැටෙන උදුවප් මහ එළැඹුණු විටම ඔහු, අසල් වැසි නිවෙසකට ගොස් සිය ඇඳුම් ආයිත්තම් ටික සකසා ගනී. ඒ ඇඳුම් අතරේ ඇත්තේ, හිස වැසිය හැකි දිගු, උල් හැඩැති රතු තොප්පියකි. රතු බැහැයෙන් බබළන අත් දිග වූල් කමිසය ද, ඊටම ගැළපෙන රතු දිගු කලිසම ද, සුදෝ සුදු රැවුළ ද එහිදී සකසා ගනී. ඊටම ගැළපෙන උපැස් යුවළක් ද සොයා ගනී. දෙසැම්බරයේ විසිපස්වැනිදා හිමිදිරියේ ඔහු මේ සියලු ඇඳුම් ආයිත්තම් ඇඟලා ගනී. ඉණෙහි එල්ලෙන අමුතු බෑගයේ, පොඩිත්තන්ගේ හිත පැහැර ගන්නා රසවත් ටොෆිය. පැණි රස සූකිරිය. කපු කුඩය ද කිහිලි ගන්වා ගන්නා ඔහු, සිය දෙපා සරසන මිරිවැඩි සඟළ ද ලාගෙන, කණිණාඩිය අසලට ගොස් බලයි. අපූරුය. දැන් නම් ඔහු ඇත්තම ඇත්ත නත්තල් සීයාය. උදෑසනින්ම ගෙයින් පිටවන ඔහු, හැම ගෙයක් ඉදිරිපිටම නැවතී, සිනාපිරි මුවින් යුතුව බලා හිඳී.

"නත්තල් සීයා ඇවිල්ලා... නත්තල් සීයා ඇවිල්ලා..." හෙලුවැලි කොල්ලො කුරුටටන් දුවගෙන එන්නේ, සුපුරුදු පරිදි සෑම වසරකම නත්තල් සීයාට ඇඳගෙන ගම වටා යන බණ්ඩා සීයාගෙන් ටොෆියක් ගැනීමටය. ගෙදර සිටින සාමාජිකයන්ගේ ගණනට අත පුරා ටොෆී බෙදන ඔහු, සිනාපිරි මුවින් යුතුව කවියක් ගායනා කර, විනාඩි කිහිපයක නැටුමක් නටා එතැනින් නික්මේ. මේ නත්තල් සීයාගේ අපූරු වැඩ බැලීමට පාරට රොක් වන්නේ කුඩාවුන් පමණක් නොවේ, සෑම වයසකම අය පාරට බසී. එතරම් සොඳුරු මේ අපූරු මිනිසා හොරණ, කඳන්හේන, පුස්වැල්අද්දර නමැති සොඳුරු ගම්පියසේ ජීවත් වන, දිවි මගේ 93 වැනි විය සපිරූ, අලුත්ගේ දොන් ලෙයාස් සිංඤෝය. එහෙත් එදා සිට අද දක්වාම ගම්මුන් ඔහුට ආදරයට අමතන්නේ, 'බණ්ඩා මාමා' කියාය. ළමා ළපටින්ට නම් ඔහු 'බණ්ඩා සීයා'ය. ඔහුට වඩා වයසින් ටිකක් බාල වැඩිහිටියන්ට නම් ඔහු 'බණ්ඩයියා'ය. අනෙක් වැඩිහිටියන්ට ඔහු, 'බණ්ඩා මාමා'ය. එදා සිට අද දක්වාම ඔහු ගමට ළෙන්ගතු සිතැත්තෙකි. ගමට ආදරය කරන, ගමේවුන්ට හිතවතෙකි.

කොවුල් නාදය දසත නින්නාද වන බක් මහට ද ඔහු ළබැඳිය. එදාට ඔහු අවුරුදු කුමාරයාය. ගමටම සිරියාව කැන්දමින් ගම්පියස සිසාරා යන්නේ, ජේත්තුවට ඇඳගත් සැබෑම සැබෑ අවුරුදු කුමාරයෙකි. ඒ අවුරුදු කුමාරයා ද නිවෙස් ඉදිරිපිටට වී සිනා සිසී සිටින්නේ, අවුරුද්දේ සිරියාව ජීවිතවලට ළඟා කරමිනි.

"සුබ අලුත් අවුරුද්දක් වේවා" ඔහු හැමෝටම සුබ පතයි. ඉඟවටා එල්ලා ගත් ටොෆි බෑගයෙන් ටොෆියක් දෙකක් දී, ගම්මුන්ගේ ඇස් මායිමේ අමුතු රටා මවමින්, කපු කුඩයට වාරු දෙමින් ඉන් නික්ම යයි.

බණ්ඩා මාමා මේ අමුතු ඇඳුම් ඇඳගෙන ගමේ ඇවිදින්නට පටන් ගත්තේ අද ඊයේක සිට නම් නොවේ, මීට වසර දහයකට පමණ පෙර සිටය. ඔහුට එහෙම කරන්න හිතුණේ ඇයි? මගේ පැනයට ඔහු දුන්නේ මෙබඳු පිළිතුරකි.

"මං කොයි වෙලාවෙත් ජොලියෙ ඉන්න කැමැති කෙනෙක්. එදා ඉඳන්ම එහෙමයි. පුංචි කාලෙත් මං හරි හරියට ජොලි වැඩ කළ. අවුරුදු කුමාරයට, නත්තල් සීයට අඳින්න හිතුවෙත් ඒකයි. දැන් ඉතිං අවුරුදු 93ක්නෙ. ඉන්න ටිකේ ජොලියෙ ඉන්න ඕනෑ. මං එහෙම කළා කියලා කාටවත් කරදරයක් නැහැනෙ. මං මේ විධිහට ඇඳගෙන ඉන්නවා දැක්කහම, කාටවත් තරහක් එන්නෙ නෑ. හැමෝටම සතුටක් දැනෙනවා. කාව හරි හිනහා ගස්සන්න පුළුවන් නම්, ඒක තමයි ලොකුම දේ."

විටෙක ඔහුගේ නිවෙසින් ඇසෙන්නේ හේරී නාදයකි. තවත් විටෙක නින්නාද දෙන්නේ හේවිසියේ හඬය. තවත් විටෙක දවුල් නදය. මේ සියලු කන්කලු නාද සවන් පත් මත පැතිරෙමින් වා තලය පුරා සිසාරන විට, බණ්ඩා මාමාට විවේකයක් ලැබිලා විනෝද වන බව, ගම්මු හොඳාකාරවම දනිති. එහෙත් ඒ පරම්පරානුගතව ඔහුට ලැබුණු දායාදයක් නම් නොවේ, ස්වෝත්සාහයෙන් ලබාගත් දෙයකි.

"මං මේවා නාද කරන්න පුරුදු වුණේ තනිවමයි. එක එක පින්කම්වලට ගියහම, බෙර වාදනය කරන අය, හේවිසි ගහන අය එක්ක හිතවත් වෙනවා. ඒ අයගෙන් බෙර ඉල්ලගෙන ආසාව නිසාම ඒවා ගහලා බලනවා. මම මේවා වාදනය කරන්න පුරුදු වුණේ එහෙමයි. මීට අවුරුදු දහයකට පහළොවකට කලින් හවස් ජාමෙට පන්සලේ පවත්වන මල් පූජාවෙදි, බෝධි පූජාවෙදි හේවිසි ගැහුවා. ඒ කාලෙ මම කොලු ගැටව් පස් හයදෙනෙක් හේවිසි ගහන්න පුරුදු කරගෙන හිටියා. ඒත් උන් දැන් කරදඬු උස් මහත් වෙලා, රස්සාවලට යනවා. ඒ නිසා, මට තනියම ඒ වැඩේ කරන්න බැරි නිසා, ඒක අත්ඇරලා දැම්මා. මටත් දැන් ඒ කාලෙ වගේ හේවිසි ගහන එක දිගටම කරන්න අපහසු නිසා, මමත් ඒ කටයුත්තෙන් අයින් වුණා. මගෙ ගෝලයො ටිකත්, මමත් කරගෙන ආව ඒ ශබ්ද පූජා පිංකම මඟහැරිලා ගියේ ඒ විධිහටයි. දැන් ඉතිං මට කාටවත් පුරුදු පුහුණු කරන්න පුළුවන්කමකුත් නෑ." උන්දෑ සිය හපන්කම් ගැන කීවේ එසේය.

කොහොමත් ඔහු පන්සලට හිතවාදායක මහතෙකි. කාලයක් ඔහු සැමදාම පාහේ සවස් ජාමයට පන්සලට ගොඩවැදුණේ, හාමුදුරුවන්ට ගිලන්පස සකසා දීමටය. වසර ගණනාවක්ම ඔහු එම කාර්යය ඉටු කළේ, තමන්ට පැවරුණු වගකීමක් බව සිතාය.

සිහිකර මුනි සිරිපා වැඳ ඉසිවර ගරුකොට
ගුරුවරු අප පොදු පාසල බැහැ දැක සිරි පිරි බටුවිට
මුව සරසවි පිරිය උලෙළ දුටු දනමන සෙසු අප හට
අවසර සාහිත සබයෙන් විරිදු ගායනා කරන්ට

හිටිවනම ඔහු මුව විටින් ගලා ආයේ කවියකි. 'මේ කවිය මොකක්ද?' මම විමසීමි.

"මම ගියෙ බටුවිට පෙරේරා විදුහලට. මම ඒ විදුහලේ ආරම්භක සිසුන්ගෙන් කෙනෙක්. විදුහලේ සාහිත්‍ය උත්සවයේදී, අත් රබාන ගහ ගහා මම මේ විරිදුව කිව්වා. එතකොට මම හිටියෙ හතරෙ පන්තියෙ. මට විරිදු පන්තියක්ම පුහුණු කරවලා, සාහිත්‍ය උත්සවයට ගායනා කරන්න කියලා ඉගැන්නුවෙ, ඒ කාලෙ අපේ පන්තිය භාරව සිටි ගුරුතුමියයි. මං විරිදු පන්තිය කටපාඩම් කරගෙන කිව්වා. මට විරිදු විතරක් නෙවෙයි, හොඳට ශ්ලෝක චුණත් කියන්න පුළුවන්. මම කාලයක් අෂ්ටකත් කිව්වා. මංගල ජෝඩු දෙතුන් සියයකට ඒ විධිහට ආශිර්වාද කරලා ඇති. ඒ අය සතුටින් ජීවත් වෙනවා දැක්කහම මට තියෙන්නෙ පුදුම සතුටක්."

බණ්ඩා මාමා හැමදාම උදේ පාන්දරින්ම නැඟිසි. මුණ කට හෝදාගෙන, ගෙමිදුලට බසී. අනතුරුව ත් රැඳෙන්නේ ඉදලකි. ගේ වටා තනිවම අතුගා නා ඔහු, උදෑසන හය හමාර පමණ වන විට ගේ හිඳුවා ඇති එළවළුවලට, බුලත් කොරටුවට දමයි. අනතුරුව සරමක් කැසපොට ගන්වා නා ඔහු, කමිසයක් ද හැඳ ගනී. තොප්පිසේ රුවා ගනී. බෙල්ල වටා ලේන්සුවක් ගන, කපු කුඩයකට වාරු දෙමින් ගම වටා ය ඔහුගේ විනෝදාංශයය. මඟතොට හමුන් සමඟ විහිළුවක් කරයි. විකට කථාවක් පවසයි. නැවත ගමන් ආරම්භ කරයි.

"යන යන හැම තැනකම කපු කුඩයක් අරගෙන යන්නේ, කාටහරි මඟුල් තුලාවක්වත් කතා කරන්නද?" මම විමසීමි.

"ආපෝ මම කාලයක් තිස්සෙම තරුණ වයසෙ කොල්ලන්ට කෙල්ලන්ට මඟුල් තුලා කතා කළා. දැන් ඉතිං මට ඕවා කරන්න බැහැ. උන් උන් හොයා ගන්න කාලයක්නෙ මේ. ඇරත් මම දැන් වයසයිනෙ. ඒ වගේ වැඩවලට යොමු වෙන්න දැන් මට බැහැ. ඒ නිසා මං මොනවා හරි වැඩක් කරගෙන ජොලියෙ ඉන්නවා. ඒකයි අවුරුදු කුමාරයට අඳින්නෙ. නත්තල් සීයා ගේ සැරසෙන්නෙ.

මං හොඳ නීරෝගි කෙනෙක්. මට ෂුගර්, ප්‍රෙෂර් නෑ. කොලෙස්ටරෝල් නෑ. හොඳට ඇස් පේනවා. ඇහෙන එක නම් පොඩ්ඩක් විතර මදි. දැන් ඉතිං වයසයිනෙ. ඒත් මං ජොලියෙන් අපි ජීවත් වුණේ හරි හරියට මහන්සිවෙලා ගොවිතැන් කරලයි. මං ඉස්කෝලෙන් අයින් වුණාට පස්සෙ කුඹුරු යායක් වැපිරුවා. හරක් හැදුවා. කඩයක් කළා. දමිළ ජාතිකයෙක් එක්ක හොරණ පොළේ මනිබඩු වික්කා. සිංහල බෙහෙත් වෙළෙඳසලක වැඩ කළා. මේ හැමදේම කළේ විනෝදෙන්.

මීට අවුරුදු දහයකට පහළොවකට විතර කලින් මට අංශභාගෙ හැදුණා. ඒත් මං මානසිකව වැටුණේ නෑ. ඇඳේ හිටිද්දිම ව්‍යායාම කළා. බෙහෙත් ටික හරියට කළා. මට ටික කාලෙකින්ම නැඟිට ගන්න පුළුවන් වුණා. ඊට පස්සෙ මම දිගටම ඇවිදින්න ගත්තා. උදේට පැයක් දෙකක් ගමේ එක පැත්තකට ඇවිදිනවා. දවල් දොළහට විතර ගෙදර ඇවිදින්, හවස තුනට විතර ආයෙ ගමේ අනෙක් පැත්තට ඇවිදින්න යනවා. ඇවිදින එක, ගොවිතැන් කරන එක ඇඟට හොඳයි. නීරෝගීව, ආයුෂ වැඩියෙන් ජීවත් වෙන්න ඒක හොඳ බෙහෙතක්. හිතේ සතුටින්, විනෝදෙන් ඉන්නවා නම් ලෙඩ හැදෙන්නේ නෑ. මේ වෙද්දි මේ ගමේ ඉන්න වයසකම කෙනා මම වෙන්නැති."

දීර්ඝායුෂ විඳින අයුරු, ඔහු සිහිපත් කරන්නේ එසේය.

"ලොවෙන් එකෙක් එක දෙයකට වෙයි සමත" යැයි කියමනක් ඇත. එහෙත් බණ්ඩා මාමා ගැන නම් එසේ කීමට නොහැකිය. ඔහු කලාගාරයකි. දැනුම් ගබඩාවකි. රසවතෙකි. සෑමටමත් වැඩිය හිත හොඳ මිනිසෙකි. ඔහු මිනිසුන්ට පමණක් නොව, සතුන්ට ද හිතැතිය. සෑම මසකම පුන් පෝදාට පෙර දින බණ්ඩා මාමාට නින්දක් නැත. සෑම පෝයකටම උදේ පාන්දරින්ම බලු කපුටු දානයක් දීම ඔහුගේ සිරිතය. රෑ තිස්සේ සිටම පසුදාට ඉවුම් පිහුම් කිරීමට අවශ්‍ය කරවල මාළු කපා තබා ගන්නා ඔහු, පාන්දරින්ම ඇහැරී බලු කපුටු දානය සඳහා බත සකසා ගනී. අවශ්‍ය මාළු කරවල ද උයා ගනී. අහල පහළ ත්‍රීවීලරයක් කථා කර ගන්නා ඔහු, කෑම ටික සහ හබරල, කෙසෙල් කොළ එහි පුරවාගෙන, දානය බෙදීම සඳහා උදෙන්ම පිටත්ව යයි. ඒ දානය දීම ද, වසර ගණනකම සිටම ඔහුගේ පුරුද්දකි.

"බලු කපුටු දානෙ දෙන්න වෙලා දැනට අවුරුදු ගානක් වෙනවා. බුලත් කොටුවෙන් හම්බවෙන සල්ලි, දරුවො දෙන මුදල් තියාගෙන ඉඳලා තමයි මේ වැඩ ඔක්කොම කරන්නෙ. ඒකෙන් පිනකුත් ලැබෙනවා. ඒ වගේම විනෝදජනක වැඩක්. මං කොහොමත් බොහෝ කාලෙක ඉඳන් සතුන්ට සලකනවා. ඒ කාලෙදි මම හරකුන්ට අසනීප වුණහම බෙහෙත් කළා. විවිධ කෙම් ක්‍රම පාවිච්චි කරලා මං හරකුන්ගේ ලෙඩ සනීප කළා. කෙම් කරන්න යනකොට කා එක්කවත් කතා කරන්නේ නැතිව යන්නේ. එහෙම යනකොට සමහර අය මඟදි මුණගැහිලා මා එක්ක කතා කරනවා. මම සද්ධයක් නැතිවම යනවා. කථා කළහම කතා කළේ නැහැ කියලා සමහර මිනිස්සු මා එක්ක තරහා වෙලත් තියෙනවා. ඒත් මං පස්සේ ඒ අයට ඇත්ත පැහැදිලි කරලා දෙනවා. එහෙම කළහම ඒ අය ඇත්ත තේරුම් ගන්නවා."

බණ්ඩා මාමා නොයන මඟුල් ගෙයක්, මළ ගෙයක්, දානෙ ගෙයක් නැත. හැමෝම ඔහුට ළෙන්ගතු නිසා, ඒ හැම දේම ඔහුට දන්වයි. විධාවක් නොසිතාම ඔහු ඒ හැම දේටම සහභාගි වෙයි.

ඔහු විටෙක විශ්වකෝෂයකි; දැනුම් සයුරකි. තොරතුරු ගබඩාවකි. ගමේ අයට බෙහෙතක් හේතක් ඕන වුණ විගස ඒ අය ඔහු සොයා එයි. බෙහෙත් ඖෂධයේ හැඩරුව ද, ඒවා තිබෙන තැන්ද පවසන ඔහු, වහාම ඒ තැනැත්තන්ට පිහිට වේ. අවශ්‍ය නම්, එම පුද්ගලයා සමඟ පිට වී, බෙහෙත සොයා දෙයි. ගමේ ගැබිනි මවක සිටියි නම්, ඇයට අවශ්‍ය ගමේ ගොඩේ පලතුරු, කැඳකට අවශ්‍ය කොළ රැගෙනවිත් දීමට නොපැකිළෙන ඔහු, සැමටම උදවු කරන්නේ පින් සිතිනි.

"ජෙග..ජෙග..ජෙග..ජෙග..ජෙග.."

දිවි ගමනේ බෝ කම්කටුලු, දුක් දොම්නස්වලට වඩා ඔහු, සතුටින් ගෙවූ කාල අපමණය. ඒ සියලු දේ ඔහුට අද මෙන් මතකය. සියවසකට ආසන්න අපරිමිත ජීවන අත්දැකීම්වලින් පිරිපුන් ඔහු, රටේ සිදු වුණු සියලු සිදුවීම් අද මෙන් මෙනෙහි කරයි. විධාබර නොවූ ගමන නැවතත් අරඹයි.

මිදුලක සිටින කුඩා දරුවකු දෙස බලා ඔහු බෙර පදයක තාලයට හඬ නඟයි; රංගනයක් ද ඉදිරිපත් කරයි. හඬතළා සිනාසෙයි; නැවතත් ගමන අරඹයි.

ඉරෝෂිණී දීපිකා

■ ජී.එස්.තැලිගම - කිරිඳිවැල සමූහ.

ගම්මුන්ගෙන් පහර කෑ ගයාන් පොලිස් සිරමැදිරියේ දී මැරී වැටිලා

පූගොඩ පොලිස් බල ප්‍රදේශයේ මණ්ඩාවල කන්ද පාරේ පදිංචිව සිටි ගයාන් පුෂ්ප කුමාර නැමති (21) විවාහක තරුණයකු 11 දින දහවල් පූගොඩ පොලිසිය විසින් අත්අඩංගුවට ගෙන සිටියදී එදින රාත්‍රී රෝගාතුර වීම නිසා රදාවාන රෝහලට ඇතුළත් කිරීමෙන් අනතුරුව රාගම රෝහලට ස්ථාන මාරුකර ප්‍රතිකාර ලබමින් සිටියදී එදින රාත්‍රියේදී මිය ගොස් ඇත.

ඔහු ඇඹිළිපිටිය පල්ලේබැද්ද ප්‍රදේශයේ පදිංචිකරුවකු වන අතර ප්‍රේම සම්බන්ධතාවයක් මත මණ්ඩාවල කන්ද පාරේ එම නිවෙසේ තරුණිය සමඟ විවාහ වී එම නිවෙසේ පදිංචිව සිටි අයෙකි. ඔහු කුලී වැඩ කරමින් ජීවනෝපාය කරගෙන ගිය අයකු බවත් මත් ද්‍රව්‍ය පානයට ඇබ්බැහිවී සිටි අයකු බවටත් අනාවරණය වී ඇත. 11 දින දහවල් මණ්ඩාවල පොල්ගස් කන්ද ග්‍රාමයේ පදිංචි කුමාර නමැති අයකු එම ග්‍රාමයේ සිමෙන්ති බ්ලොක්ගල් ලොරියකට පැටවීම සඳහා මොහු කැඳවාගෙන ගොස් ඇත. එහිදී එම ලොරියේ තිබූ රු.50000/- ක් සමඟ බෑගය අතුරුදන් වීම නිසා එම මුදල් හිමිකරු සහ ප්‍රදේශවාසීන් මොහු සැකකර පහර දී ඇති බව අනාවරණය වී ඇත. පසුව ඔහු ගෙදරට ගෙනවිත් සිටියදී පූගොඩ පොලිසියට දැනුම් දීමෙන් අනතුරුව එම ස්ථානයට පැමිණ ඔහු අත්අඩංගුවට ගෙන පොලිස් කූඩුවේ සිටියදී මෙලෙස අසනීප තත්වයට පත්වී ඇත.

මෙම හදිසි මරණය පිළිබඳ පශ්චාත් මරණ පරීක්ෂණය සඳහා පූගොඩ දිසා විනිසුරු මහේස්ත්‍රාත් පසන් අමරසේන මහතා සිද්ධිය වූ ස්ථානයට පැමිණ පරීක්ෂණ සිදු කරන ලදී.

මේ සම්බන්ධයෙන් පරීක්ෂණ පැවැත්වීමට වැඩ බලන පොලිස්පති විසින් ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරීවරයකු පත් කර ඇත.

■ රාහුල් සමන්ත හෙට්ටිආරච්චි - අම්බලන්තොට සමූහ

ගොන්නොරුවේදී රියට පහරදුන් අලියා ලෙඩ වෙයි

හම්බන්තොට ගොන්නොරුව මාර්ගයේ කැලණි ගම වැව ආසන්නයේදී පසුගිය 11 වැනිදා මෝටර් රථයකට පහරදුන් වන අලියා රෝගාතුරවී හම්බන්තොට ගොන්නොරුව කැලණිගම වැව තුළ වැටී සිටියදී අලියාට ප්‍රතිකාර කිරීමේ කටයුතු උඩවලව ඇත් අතුරු සෙවණේ පශු වෛද්‍ය මාලක අබේවර්ධන මහතා ප්‍රමුඛ වනජීවී නිලධාරීන් කණ්ඩායමක් විසින් 13 වැනිදා ආරම්භ කරන ලදී.

මසක පමණ කාලයක සිට තුවාල ලබා රෝගාතුරව සිටින මෙම වන අලියාට හට වනජීවී නිලධාරීන් විටින් විට ප්‍රතිකාර ලබාදෙමින් සිටින අතර අලියා එම වැව ආසන්නයේම සිටින බවයි ප්‍රදේශයේ ජනතාව කියා සිටින්නේ.

කෙසේනමුත් එම ස්ථානයෙන් පසුගිය 11 වැනිදා මෝටර් රථයකින් ගමන්ගත් පිරිසක් වන අලියා දැක බියවී වහනය නතරකර වෙනත් වාහනයකට නැග ඇති අතර පසුව වන අලියා විසින් එම මෝටර් රථයට පහරදී පෙරලා දැමීම සිදුකර තිබේ.

පාදයට වෙඩි වැදීම හේතුවෙන් මසක පමණ කාලයක් හම්බන්තොට ගොන්නොරුව කැලගමණිවැව ආසන්නයේ සිටින මෙම වන අලියාට වයස අවුරුදු 35 ක පමණ වනබවයි වනජීවී නිලධාරීන් කියා සිටින්නේ

■ උතුරු පළාත් විශේෂ රසුල දිල්හාර ගමගේ

කැබ්-යතුරුපැදි අනතුරින් 5කට තුවාල

වවුනියාව යාපනය මාර්ගයේ ශාන්තසෝලේ හන්දිය අසලදී කැබ් රථයක් යතුරු පැදියක ගැටීම නිසා පුද්ගලයන් පස් දෙනෙකු තුවාල ලබා 12 දා සවස වවුනියාව මහ රෝහලට ඇතුළත් කොට තිබේ. අධික වේගයෙන් ගමන් කළ කැබ් රථය යතුරු පැදියේ ගැටීමත් සමගම පාරෙන් ඉවතට පැන එය බෝක්කුවක් පහළට ඇද වැටීම නිසා කැබ් රථයේ සිටි තුන් දෙනකු හා යතුරු පැදියේ ගමන් කළ දෙදෙනකු තුවාල ලබා තිබේ.

වවුනියාව පොලීසියේ රථවාහන අංශය මෙම අනතුර පිළිබඳව පරීක්ෂණ පවත්වා ගෙන යයි.

■ සරත් මනුල වික්‍රම - අනුරාධපුර විශේෂ

සුදුසුකම් ඇති අය පැත්තකින් තියා උතුරු මැද පුස්තකාලවලට ලැව් හෝදන අය පත්කරලා

අනුරාධපුරයේ දී ශ්‍රී ලංකා පුස්තකාල සේවා සංගමය රැස්වූ අවස්ථාව

උතුරුමැද පළාතේ මහජන පුස්තකාල සඳහා පුස්තකාල සේවකයන් බඳවා නොගෙන කම්කරුවන් එම සේවයට යෙදවීමෙන් පුස්තකාල සේවාව ක්ෂයවීමකට ලක්ව ඇති බව උතුරුමැද පළාත් පුස්තකාල සේවා මණ්ඩලයේ සභාපති අශෝක රාජපක්ෂ මහතා ප්‍රකාශ කළේය.

ශ්‍රීලංකා පුස්තකාල සේවා සංගමයේ 60 වැනි සංවත්සරය වෙනුවෙන් අනුරාධපුරයේ පැවැති විශේෂ වැඩසටහනට එක්වෙමින් සභාපතිවරයා මේ බව ප්‍රකාශ කළේය. පුස්තකාල සේවාව සඳහා සුදුසුකම් සපුරා ඇති සේවකයන් යොදවා සිටින්නේ වෙනත් රාජකාරි සඳහා වන අතර කාලීන අවශ්‍යතාවයට අනුව පුස්තකාලාධිපතිවරුන් 63 දෙනෙකු අවශ්‍යව තිබිය දී උතුරුමැද පළාතටම සිටින්නේ පුස්තකාලාධිපතිවරුන් 5 දෙනෙකු පමණක් බව ද ඒ මහතා එහි දී කියාසිටියේ ය. මෙම ගැටලුව මුලින්ම මතුකළ අනුරාධපුර මහ නගර සභා මහජන පුස්තකාලයාධිපති කේ.පී. අයි. සමතපාල මහත්මිය 1997න්පසු මේ දක්වා උතුරුමැද පළාත සඳහා පුස්තකාල සේවාවේ 3වන පන්තියට සේවකයන් බඳවාගෙන නැති බව පෙන්වා දුන්නා ය. පුස්තාකල සේවාවට අදාළ වෘත්තිකයන් අනුරාධපුර දිස්ත්‍රික්කයට 3 දෙනෙකු හා පොලොන්නරු දිස්ත්‍රික්කයට 2 දෙනෙකු වශයෙන් පමණක් සිටින බව විස්තරකළ ඇය වසර 23ක් තිස්සේ එම සේවකයන් බඳවාගෙන නොමැති බව සඳහන් කළාය.

උතුරුමැද පළාතේ ජනතාවගේ දැනුම වර්ධනය සම්බන්ධයෙන් ඇතිකර තිබෙන මෙම කණගාටුදායක තත්ත්වය වසර 15ක් පුරා කිසිවකුගේ අවධානයට ලක් නොවීම ඊටත් වඩා බරපතළ කරුණක් බවද පළාත් පුස්තකාලසේවා මණ්ඩල සභාපතිවරයා කියා සිටියේ ය. "මේක වසර පහළවක් පමණ තිස්සේ පළාතේ කිසි කෙනෙකුගේ ඇස නොගැටුණු ප්‍රශ්නයක්.මේ ගැන පෙන්වා දෙන්න බලපෑම්කණ්ඩායම් නොසිටියේ ද කියන එකත් ප්‍රශ්නයක්. පුස්තකාල තනතුරුවල ඉන්නේ එම තනතුරුවලට අදාළ අය නොවේ.මාර්ග කම්කරුවන්,සනීපාරක්ෂක කම්කරුවන් වැනි අය.පුස්තකාල සේවයේ තනතුරු වල ඉන්න අය යොදවා ඇත්තේ වෙනත් අංශ වලට. පළාත්පාලන දෙපාර්තමේන්තුව මෙය නිවැරදි කර නෑ. මේ දක්වා ගෙන ඇති හිතුවක්කාරී තීන්දු නිසා මෙම සේවාව ක්ෂයවීමටලක්වෙලා." යනුවෙන් සභාපතිවරයා ප්‍රකාශ කළේ ය.

දේශපාලන අවශ්‍යතා මත බඳවා ගන්නා සේවකයන් මෙලෙස මහජන පුස්තකාලයට යොදවනවා සේම පුහුණුව ලබන පාසල් ගුරු පුස්තකාලයාධිපතිවරුන් ද විදුහල්පතිවරුන් විසින් හිතුමතේට වෙනත් රාජකාරීන්ට යොදවන බව කියාසිටි ශ්‍රීලංකා පුස්තකාල සේවා සංගමයේ තොරුතුරු සන්නිවේදන හා මහජන සම්බන්ධතා නිලධාරි සහ ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ තාක්ෂණ පීඨයේ ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති සමන් ඉලංගසිංහ මහතා තම සංගමය ලබාදෙන පුහුණුවලින් ද උතුරුමද පාළාත ප්‍රයෝජනයක් නොගන්නා බව කීවේය. මේ සියල්ල පිළිබඳව පළාතේ පසුවිපරමක් සිදුනොවීම ඊට හේතුව බව රජරට විශ්වවිද්‍යාලයේ පුස්තකාලාධිපතිනි අශෝකා සිරිවර්ධන මහත්මිය එහි දී පෙන්වා දුන්නාය. උතුරුමැද පළාතේ පවතින මෙම තත්ත්වය නිසා පාඨකයන් පුස්තකාල වෙත ඇදගැනීමේ කිසිදු වැඩපිළිවෙළක් නොමැති බව ඒ අනුව අනාවරණය වන බව සියලු දෙනා කියාසිටියහ.

■ චන්ද්‍රදාස මලවරආරච්චි මිහින්තලේ විශේෂ

ඉපනැල්ලේ මුං වගාව සාර්ථකයි

අනුරාධපුර මහවිලච්චිය ගොවි ජනපදයේ පසුගිය අතරමැදි කන්නයේ වගා කළ මුං ඇට වගාව සාර්ථක වී ඇතැයි ගොවීහු පවසති.

පසුගිය 2019/2020 මහ කන්නය වගා කටයුතුවල අස්වනු නෙළීමෙන් පසුව මහවිලච්චිය වම් ඉවුර වගා බිම් අක්කර 300 ක් මුං වගාවට යොදාගත් බව නේවාසික ව්‍යාපාර කළමනාකාරිනි එච්.එම්.කේ.සී. හේරත් මහත්මිය පැවසුවාය .

ගොවීන් මෙලෙස මුං ඇට වගා කර ඇත්තේ වී අස්වනු නෙළාගත් කුඹුරු බිම් සකස් කිරීමෙන් හා ඉපනැල්ලේ වගාවක් වශයෙන්වීම විශේෂත්වයකි.

මෙම මුංඇට වගාවේ අස්වනු නෙළීම ද දැන් ආරම්භ කර ඇති බව ද ගොවි සංවිධාන නියෝජිතයෝ පවසති. අක්කර එකක වගා බිමකින් මුං ඇට කිලෝ 300 ක පමණ අස්වැන්නක් ලැබෙන බවට කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ වාර්තා පෙන්වාදෙයි.

■ සුනිල් ප්‍රනාන්දුපුල්ලේ - වෙන්නප්පුව විශේෂ

හොර මත්පැන් ස්ප්‍රීතු නිෂ්පාදනාගාරයක් වටලයි

ගම්වාසීන්ටත් හොරා ඌරුකොටුවලට මැදිවනසේ ඉතාමත් රහසිගත ස්ථානයක පවත්වාගෙන ගිය නීතිවිරෝධි මත්පැන් ස්ප්‍රීතු නිෂ්පාදනාගාරයක් කොස්වත්ත පොලිසිය විසින් මේ මස 13 වන දින අලුයම වටලා එක් සැකකරුවකු හා ගෝඩා ඩ්‍රැම්ස් 19000 ක් ද සමග අත්අඩංගුවට ගෙන තිබේ.

එම පොලිස් වසමට අයත් හාල්දඬුවන අයියනායක දේවාලය පාරට යාබද ව්‍යාපාරික නිවෙසකට අයත් ඉඩමේ කොනක මෙම නිෂ්පාදනාගාරය පවත්වාගෙන ගොස් තිබුණු බව පොලිසිය කියයි.

මෙම ඉඩම අවට නිවැසියන්ට මත්පැන් දුගඳ නොදැනෙනසේ එම නිෂ්පාදනාගාරය වටා ඌරන් ඇති කිරීම සිදුකර තිබුණු අතර ගම්වාසින් කිසිවෙක් මෙම මත්පැන් නිෂ්පාදනාගාරය පිළිබඳ තොරතුරු දැනසිට නැතැයිද පොලිසිය කියයි.

ගෝඩා-ගෑස් කෑන් 02 ක් ගෑස් ලිප් 02 ක් හා මත්පැන් පෙරීමට ගන්නා උපකරණ හා දඟර තොගයක්ද පොලිසිය භාරයට ගෙන තිබේ.

■ ප්‍රාර්ථනා ලියනගේ - හිනිඳුම සමූහ

නැතිවූ මුදල් බෑගය අයිතිකාරියට

අම්බලන්ගොඩ සිට ගාල්ලට පැමිණි කනම්පිටිය ප්‍රදේශයේ කාන්තාවකට බස්රථයේ අමතකව ගිය බැංකුවකින් ලබාගත් මුදල් සහිත බෑගය විනාඩි කිහිපයක් තුළ සොයාදීමට ගාල්ල බස්නැවතුම්පොළ පොලිස් ඒකකය භාර ස්ථානාධිපති විමල් ජයසේකර මහතා කටයුතුකර තිබේ.මෙම අවස්ථාවේ බස්රථයේ කොන්දාස්තරවරයා ලෙස කටයුතු කළ ශාන්ත ප්‍රේමලාල් බස් රථයේ රියදුරු විරාජ් එරංග දෙපළටද විමල් ජයසේකර මහතා ස්තුතිය පළකළේය.ඡායාරූපයෙන් දැක්වෙන්නේ එම මුදල් සහිත බෑගය හිමිකාර කාන්තාවට භාරදුන් අයුරුය.

■ ටී.එල්.ඒ.පී.හේමපාල - නාගොඩ සමූහ

සරුසාර ගෙවත්තකට බද්දේගම සභාවෙන් අත්වැලක්

බදේගම ප්‍රාදේශීය සභාවේ සභාපති අනුර නාරංගොඩ උප සභාපති අනුර බටුවත්ත යන මහත්වරුන් ඇතුළු මන්ත්‍රී මණ්ඩලයේ එකමුතුවෙන් ගෙවතුවල වස විසෙන් තොර සරුසාර වගාවක් ආරම්භ කිරීමට සහයෝගය දැක්වීමක් ලෙස කාබනික පොහොර නොමිලේ ලබාදීමේ වැඩසටහන ආරම්භ කර තිබේ.ඒ අනුව ගනේගම දකුණ දිරිලිය කාන්තා සමිතියට සහ ගනේගම නැගෙනහිර අභිමානී කාන්තා සමිතියට සභාපති අනුර නාරංගොඩ මහතා විසින් කාබනික පොහොර නොමිලේ ලබාදී සිදුකරන ලද අයුරුයි මේ.

■ දකුණු පළාත් විශේෂ ප්‍රභාත් විතානාච්චි

පන්වලින් රටා මවන සිරිමලී

කකුල් දෙකේ කුඩැල්ලන් එල්ලිලා ලේ උරා බොනවා. ඒත් ඇයට ඒක ගානක්වත් නැහැ. අත්දෙකම කටු ඇනිලා ලේ ගලනවා. ඒත් ඇය සිනාසෙයි. උදේ පාන්දරම වැටකෙයියා කොළ ටික කපාගෙන ගෙදරට ගෙනිච්චම තව දවස් දෙක තුනක් යනව වියන්න පටන් ගන්නකොට.

වැටකෙයියා කොළ කපලා ගත්ත ගමන්ම වියන්න බැහැනේ. තව දවස් දෙක තුනක් යනවා ඉතිරි වැඩ ටිකට. ගැහැණියක් වුණත් පිරිමියෙක් වගේ තමයි වැඩ.

ඇය සිරිමලීය. නිකම්ම සිරිමලී නොව, දෙල්පාගොඩ ගමගේ සිරිමලීය. වයස අවුරුදු හැටක් වුණත් හිතත් ගතත් තවම තරුණය. පදිංචිය ගිංතොට කුරුඳුවත්තේය. පන් කපා ගෙනැවිත් කටු හැර ඉරා දින දෙකක් විතර වතුරේ තම්බා වියළාගෙන පන්වලින් විවිධ රටා මවන්නට ඇය ඉතා හපන් ය. දස රටා, විසි රටා, තාරුකා රටා, හුළං පෙති රටා, පහන් කූඩු රටා ඒ අතරින් කිහිපයකි.

එදිනෙදා ජීවිතයේදී පැදුරට තියෙන්නේ සුළුපටු තැනක් නොවේ. මඟුලට මරණයට දෙකටම පැදුර නැතුවම බැරිය. පන් වලින් පැදුරු විතරක් නොව ඇය බෑග්, පොත් බෑග්, මල් වර්ග ද වියයි. පළාතෙන් පළාතට විවීමේ රටාව වෙනස් වුණත් වැටකෙයියා කොළ වලට අමතරව තුන්හිරියා, ගල්ලැහැ, පොතුපත්, තුමැස්ස ගස්වලද කොළද වියන්න ගනී.

අපේ කතා නායිකාව සමග කතා කරන විට ඇය තමන් කරන දැනට රටේ නැත්තටම නැති වී ගෙන යන පන් කර්මාන්තය ගැන කිව්වෙ මෙහෙම අදහස් ටිකක්. මේ කර්මාන්තය මම කරන්න අරගෙන දැනට අවුරුදු හතළිස් පහක් විතර වෙනවා . මම අවුරුදු දොළහේදී තමයි මේක පටන් ගත්තෙ. අපි පාරම්පරික ව තමයි මේක කරගෙන එන්නේ. මගේ අම්මා කළා, මගේ පොඩි අයියත් කළා. එයා තමයි මට මේක කරන්න පාර පෙන්නුවේ. මේක පාරම්පරික දෙයක් නිසා මගේ වෑයම අවසානය තෙක් මේක කරගෙන යන්න. මෙහේ විතරක් නෙමෙයි මම වියපුවා රට රටවල් වලටත් ගෙනියලා තියෙනවා. අපිට මේකට ඕන අමුද්‍රව්‍ය කාටවත් සපයන්න බැහැ. ඒක අපට සොයාගන්න පුළුවන්. අපට තියෙන ගැටලුව වෙළෙඳපොළක් නැතිකම. ඊයේ පෙරේදා මම ගොඩක් දේවල් වියලා කරලා තිබුණා. ඒ තුළින් එළියට එන්නේ අපේ මේ ලේ, කඳුළු. ඒ කියන්නේ මම රෑ එළිවෙනකල් වියනවා. ඒ වෙලාවට පන් කටුවක් අතේ ඇනකොටා නින්ද ගියත් ආපහු හැරෙනවා. මේ පන් කටු අතේ ඇනිලා බත් ටික වත් කන්න බැරි වුණ වෙලාවල් තියෙනවා. මෙහෙම දුක් විඳලා හරි කරන්නේ මේක තමයි මගේ ජීවිතය. මම ජීවත් කරවපු කර්මාන්තය. මේ කර්මාන්තය කරපු අය තවත් හිටිය ඉස්සර අපේ මේ ගමේ. ඒ අය මඟ තොටදී හමු උනහම ඇහුවම කියන්නෙ අමාරුවෙන් හරි මේවා කරාට දෙන්න කෙනෙක් නැහැ කියලා. ඒ අය නවත්තලා දාලා.

■ එන්.විජේරත්න - නාගොඩ විශේෂ

කළුතර නගර සභා බල ප්‍රදේශයේ මාර්ග කි.මී. 10කට කාපට්

වත්මන් රජය මගින් ක්‍රියාත්මක කරනු ලබන මාර්ග කිලෝමීටර් ලක්ෂයේ වැඩ සටහනට සමගාමීව කළුතර නගර සභා බල ප්‍රදේශය තුළ මාර්ග කිලෝමීටර් 10ක් කාපට් අතුරා සංවර්ධනය කිරීමට කටයුතු කර තිබේ.

වරාය හා නාවික කටයුතු පිළිබඳ ඇමැති රෝහිත අබේගුණවර්ධන මහතාගේ මෙහෙයවීම යටතේ හිටපු පළාත් සභා මන්ත්‍රී රෝහණ අබේගුණවර්ධන මහතාගේ අධීක්ෂණය මත කළුතර නගර සභාවේ විපක්ෂ නායක ප්‍රදීප් කරුණාමුනි මහතාගේ යෝජනා අනුව මෙම මාර්ග සංවර්ධන කටයුතු සිදු කෙරේ.

ඒ යටතේ උතුරු කළුතර සුමංගල මාර්ගය සහ ලෙස්ලි පෙරේරා මාර්ගය මෙලෙස කාපට් අතුරා සංවර්ධනය කිරීමට පියවර ගෙන තිබේ.

වසර 30 කට පමණ පසුව කළුතර උතුර සුමංගල මාර්ගය කාපට් අතුරා සංවර්ධනය කර ඇති අයුරු මින් දැක්වේ

■ පී.ජී.ගුණතිලක - ගලේවෙල මධ්‍යම සමූහ

දඹුල්ලේ ලොකු ලූණු කිලෝව 180ට බැහැලා

දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානයේ පසුගිය 12 වැනිදින වනවිට ලොකුලූණු කිලෝවක තොගමිල රුපියල් 180/= දක්වා පහළ බැස ඇති බව ගොවීහු පවසති.රුපියල් 240/= දක්වා ඉහළ ගොස් තිබූ ලොකුලූණු කිලෝව ක්ෂණිකව කඩා වැටුණේ පසුගිය දිනවල කොරෝනා රෝගීන් දෙදෙනෙක් එම මධ්‍යස්ථාන භූමියේ ගැවැසීම නිසා බව වාර්තාවේ.ඒ හේතුවෙන් ආර්ථික මධ්‍යස්ථානයට පිට පළාත්වලින් වෙළෙඳුන් පැමිණීම අඩු වී තිබෙන බව ඔවුහු පෙන්වා දෙති.

■ දඹදෙණිය- සම්පත් අබේසිංහ

කුරුණෑගල මන්ත්‍රී සමන්ප්‍රියගෙන් නිලධාරීන් දැනුවත් කිරීමක්

කුලියාපිටිය බටහිර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සියලුම රාජ්‍ය නිලධාරීන් සමග මේ අසීරු අවස්තාවේ මුහුණ දිය යුතු ආකාරය හා ඉදිරිය පිළිබඳ ව සාකච්ඡාවක් පසුගියදා පැවැත්විණි. කුරුණෑගල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී සමන්ප්‍රිය හේරත් මහතා හා අනෙකුත් සියලු මහජන නියෝජිතයන් හා රාජ්‍ය සේවය සමගින් සාකච්ඡාව පැවැත්වූ අයුරු.

බී.ඒ.එන්.ශාන්ත කුමාර - කටුපොත විශේෂ

වයඹ පළාතට බීජ පරීක්ෂණාගාරයක්

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් වයඹ පළාත සඳහා බීජ පරීක්ෂණාගාරයක් වාරියපොළ කෘෂිකර්ම පුහුණු ආයතනයේ පිහිටුවා ඇත.

වයඹ පළාතේ ගොවීන්ට අවශ්‍ය බීජ වී සහ අතිරේක බෝග බීජ ආදිය වගා කටයුතු සඳහා සුදුසු ද යන්න පරීක්ෂා කර බලා සුදුසු බීජ පමණක් අනුමත කිරීම මෙය පිහිටුවීමේ අරමුණ වී තිබේ.

වැඩි අස්වැන්නක් ලබා ගත හැකි බීජ වර්ග ගොවීන්ට හඳුන්වා දී ඔවුන්ගේ නිෂ්පාදන ශක්තිය වැඩි දියුණු කොට ආර්ථිකය ඉහළ නැංවීම තවත් අරමුණක්වී ඇත.

දැනට ගන්නෝරුව සහ පේරාදෙනියේ පිහිටි බීජ පර්යේෂණාගාර මට්ටමකට නුදුරු අනාගතයේදී වාරියපොළ බීජ පරීක්ෂණාගාරය පත් කරන බවට වයඹ පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂක ඩබ්ලිව් .ඒ සීලරතන මහතා පැවසීය.

සුමිත්‍රා කුමාරිහාමි - කන්තලේ සමූහ

වැහි කාලෙට අපේ පෝරණු දිය වෙනවා

වසංගතෙන් අපි කබලෙන් ලිපට වැටුණා

කන්තලේ පේරාතුවලී කුඹල්කරුවන්ගේ දුකයි මේ

දේශීය කර්මාන්ත නගා සිටුවීම සඳහා ජනාධිපතිවරයාගේ අවධානය යොමුවී ඇති මෙවැනි වකවානුවක මෙතෙක් කලක් කිසිවකුගේ ඇසට හසු නොවූ කන්තලේ කුඹල් කර්මාන්තයේ යෙදෙමින් ජීවත්වීම සඳහා මහත් අරගලයක යෙදී සිටින පවුල් කිහිපයක් පේරාතුවලී ගම්මානයෙන් අපට හමුවිය.

සිංහල , දමිළ, මුස්ලිම් යන ජන කොටස් තුනම ජීවත් වන කන්තලේ මෙම කර්මාන්තයේ යෙදී සිටින්නේ මෙම ගම්මානයේ දමිළ පවුල් කිහිපයක් වීමද විශේෂත්වයකි. පරම්පරාවෙන් උරුම වී ඇති එම කර්මාන්තය නගා සිටුවා ගැනීමට නොහැකිව ඔවුන් පසුවන්නේ කලකිරීමෙනි.

මේ පිළිබඳව අදහස් දැක්වූ මැටි කර්මාන්තයේයෙදී සිටින **සරෝජනී මහත්මිය**- මේ මගේ අක්ක ගේ නිවස . එයාගේ මහත්තයා නැහැ . ඒනිසා අපි මේ ගෙදර ඉන්නවා. ඔක්කොම කට්ටිය 13 දෙනෙක් මේ ගෙදර ඉන්නවා. මහත්තයා තමයි වළං කර්මාන්තය කරන්නේ . මෙහේ වැඩ නැති කාලෙට කිලිනොච්චියේ ගිහිල්ලා මේ කර්මාන්තය කරනවා.

හදපු වළං දැන් විකිණෙන්නේ නැහැ. ඒවගේම වැස්සට අපේ පෝරණුව දිය වෙලා ගියා. ඒකට හරි හැටි ආවරණයක් කර ගන්න ආදායමක් නැහැ. අවුරුද්ද, ජනවාරි පළවෙනිදාට ටිකක් බිස්නස් තියෙනවා. ඒත් ඉතින් මේ සැරේ මේ වසංගතය නිසා අපිට ඒකත් නැතිවුණා.

කේ.කන්දප්පු මහතා - මේ කර්මාන්තය අපිට පරම්පරාවෙන් එන උරුමයක් . මට දැන් මැටි පාගන්න කකුළ හුඟක් අමාරුයි. මැෂිමක් ගන්න සල්ලි එකතු කරනවා . ලක්ෂයක් විතර වෙනවා මැෂින් එකක්. ඒකත් බිස්නස් අඩු වුණාම එකතු කරන සල්ලි වියදම් වෙනවා. මෙහේ මැටි ගන්න නම් තාම ගැටලුවක් නැහැ.

ඒත් පිට පළාත් වලින් ගේන්න තියෙනවා නම් හොඳයි. ඒවා හොඳ තත්ත්වයේ ඒවා. මැටි ලැබෙනවා නම් හොඳ නිර්මාණ කරන්න පුළුවන්. අපි හැමෝටම තියෙන්නේ වහලක් නැති පෝරණු . වැහි කාලෙට දිය වෙනවා. ඒවා ගොඩනගා ගන්න වත්කම මදි. මේ ආණ්ඩුවේ අපේ කර්මාන්තෙට වෙනම ඇමති කෙනෙක් ඉන්නවා. එතුමා වත් මැදිහත් වෙලා අපේ කර්මාන්තය දියුණු කර ගන්න උදව් කරනවා නම් හොඳයි.

එස් සෙල්වකුමාර් මහතා - මම සෙල්ලම් බඩු තමයි හදන්නේ. අපි හැමෝටම තියෙන්නේ එකම ප්‍රශ්න තමයි. අපිට කවිරුන් හෝ රජයෙන් උදව්වක් කරනවා නම් ඒක ලොකු පිණක් . දරු පවුල් ජීවත් කරන්න අපිට හුඟාක් වෙහෙස වෙන්න සිදුවෙනවා. ආදායම් අඩු කාලයට අපේ අය කුලී වැඩට යනවා.

මෙහෙම වුණොත් පරම්පරාවෙන් එන අපේ කර්මාන්තය නැතිවෙලාම යයි කියලා තමයි අපිට දුක. අපේ කර්මාන්තය භාරදීල තියෙන ඇමතිතුමාවත් අපිට පිහිට වෙනවානම්. අපි වෙනුවෙන් ඇමතිකෙනෙක් පත් කිරීම සම්බන්ධවත් අපි හුඟාක් සතුටු වෙනවා.

කාටවත් අත නොපා ජීවත් වෙන්න අපි කොතෙක් ඉල්ලීම් කළත් මෙතෙක් කිසිම රාජ්‍ය නිලධාරියෙක් අපි දිහා බැළුවේ නැහැ. ඇළුම්ණියම් බඩු වලින් කුස්සි පුරවන්න උදව් වෙනවා. අපේ රටේ අපේම දේ , සෞඛ්‍ය ටත් හිතකර මේ භාණ්ඩ ගන්න අලුත් ආණ්ඩුව මිනිසුන්ව උනන්දු කරවනවා නම් ඒ වගේම නවීන උපකරණ ගන්න උදව් කරනවා නම් අපේ කර්මාන්තය දියුණු කරගන්න පුළුවන් .

ජී.ඒ.ගුණසේන ගිනිගත්හේන විශේෂ

නිරෝධායන නීති උල්ලංඝනය කළ රැස්වීම විසුරුවයි

නිරෝධායන නීති උල්ලංඝනය කරමින් වටවල ප්‍රදේශයේ ග්‍රාමීය ප්‍රජා ශාලාවක පවත්වමින් තිබූ එම ගම්වාසීන්ගේ රැස්වීමක් විසුරුවා හැරීමට වටවල පොලීසිය මගින් පියවර ගනු ලැබිය.

එම ප්‍රදේශයේ කෘෂිකර්ම නිලධාරින්ද සම්බන්ධ කරගෙන ගොවි රැස්වීමක් ලෙසින් සංවිධානය කර තිබූ එම රැස්වීම සඳහා ඇතැම් මව්වරුන් කුඩා දරුවන්ද රැගෙනවිත් තිබූ අතර එම ප්‍රජා ශාලාව ඔවුන්ගෙන් පිරී තිබුණේ මීටරයක දුරස්ථභාවය පවා නැතිවන අන්දමටය.

එවැනි රැස්වීමක් පැවැත්වෙන බව දැනගෙන අඹගමුව ප්‍රාදේශිය සභා මන්ත්‍රීවරුන් වන ජෝ මැල්කම්, එම්.රමේශ්වරන්, ලාල් මෙනේරිපිටිය හා ඉන්දික දොරකුඹර යන මහත්වරුන් සමගින් එහි ගිය එම ප්‍රාදේශීය සභාවේ සභාපති එල්.පී.ජයසංඛ පෙරේරා මහතාගේ දැනුම් දීමකට අනුව එහි පැමිණි වටවල පොලීසියේ නිලධාරීන් පිරිසක් එම රැස්වීම විසුරුවා හැරිය.

නිරෝධායන නීති උල්ලංඝනය වන පරිදි පැවැත්වූ එම රැස්වීමට සහභාගීවූ නිලධාරීන්ට එරෙහිව තමා මධ්‍යම පළාත් ආණ්ඩුකාරවරයාට මෙන්ම හැටන් පොලිස් අධිකාරිතුමාටද පැමිණිලි කළ බව අඹගමුව ප්‍රාදේශීය සභාවේ සභාපති එල්.පී.ජයසංඛ පෙරේරා මහතා පැවසීය.

ආර්.ඤාණදාස - අම්බලන්ගොඩ සමූහ

රත්ගම ප්‍රා. සභාවෙන් විදුලි පහන්

රත්ගම ප්‍රාදේශීය සභාව මගින් එම සභාවට අයත් වන ගාල්ල - කොළඹ මහා මාර්ගයේ ඌරවත්ත පාලම අසළ සිට ගිංතොට පාලම දක්වා වූ කොටසේ සහ අතුරු මාර්ග හන්දිවල හා විහාරස්ථානවල මෙන්ම තම ප්‍රදේශයේ ග්‍රාමීය රෝහල් වලටත් අධිබලැති එල්.ඊ.ඩී විදුලි පහන් සවි කොට තිබේ. දැනට මෙවැනි විදුලි පහන් දෙසිය විසි පහක් සවි කොට ඇති අතර තවත් විදුලි පහන් පන් සියයක් පමණ සවි කිරීමට කටයුතු යොදා ඇති බැව් රත්ගම ප්‍රාදේශීය සභාවේ සභාපති ටී.නිමල් මහතා පැවසුවේය.

මෙම එක විදුලි පහනක් රුපියල් දොළොස් දහස් පන් සියයක් වන බවත්, පළාත් පාලන අමාත්‍යාංශය මගින් විදුලි පහන් තුන් සියයක් ප්‍රාදේශීය සභාවට ලබාදී තිබෙන අතර රාජ්‍ය අමාත්‍ය මොහාන් පී.ද.සිල්වා මහතා විසින් මේ වෙනුවෙන් ඒ මහතාගේ විමධ්‍යගත මුදලින් රුපියල් ලක්ෂ පහක මුදලක් ලබා දී ඇති බවත් සභාපතිවරයා වැඩි දුරටත් පැවසුවේය. මෙමගින් ප්‍රදේශ රැසකට රාත්‍රී කාලයේදී නව ආලෝකයක් ලැබී තිබෙන අතර මෙම විදුලි පහන් සවි කිරීමෙන් විදුලි පරිභෝජනය ද පහත වැටී තිබෙන බව ද සභාපති ටී.නිමල් මහතා පෙන්වා දුන්නේය.

ඒ.ඒ.එල්.ඩයස් - මාතලේ දිස්ත්‍රික් සමූහ

තාක්ෂණ නිලධාරීන් හිඟය දඟුයි

දිගුකලක සිට පවතින තාක්ෂණ නිලධාරීන්ගේ හිගය නිසා මාතලේ දිස්ත්‍රික්කයේ රාජ්‍ය ආයතනයන්හි ඉදිකිරීම් කටයුතු පවත්වාගන යාම මහත් අසීරු කරුණක්වී ඇතැයි එම ආයතන ප්‍රධානීහු පවසති.

මෙම තත්ත්වය නිසා පෙදෙසේ සුළු පරිමාණ වාරි ක්‍රමයන්හි මෙන්ම ග්‍රාමීය මාර්ගයන්හිද ඉදිකිරීම් බොහෝ දුරට අඩාලවී ඇත. පවතිනන මෙම තාක්ෂණ නිලධාරින්ගේ හිගය මගහැරවීමට මෙතෙක් අදාළ අංශ කිසිදු පැහැදිලි ක්‍රියාමාර්ගයක්නොගැනීම නිසා මෙම තත්ත්වය උග්‍රවෙමින් පවතින බවද මොවුහු පවසති.

එමෙන්ම මෙම තත්ත්වය තවදුරටත් පැවතුනහොත් රජය විසින් ක්‍රියාත්මක කර ඇති සංවර්ධන ක්‍රියාවලියේ අපේක්ෂිත ප්‍රගතිය ළඟා කර ගැනීම ඉතා අපහසුවන බවද මෙම නිලධාරින්ගේ මතයවී ඇත.

තත්ත්වය මෙසේ බැවින් දිස්ත්‍රික්කයේ පවතින තාක්ෂණ නිලධාරින්ගේ හිගය මගහැරවීමට රජය විසින් වහා පියවර ගතයුතු බව ඔවුහු අවධාරණය කරති.

ඊ.සී.ප්‍රනාන්දු - මුන්නේශ්වරම සමූහ

හොර ගංජා අසුවෙලා

පුත්තලම දෙසින් හලාවත දෙසට ධාවනය වෙමින් පැවැති වෑන් රථයක් පරීක්ෂා කළ අවස්ථාවේ දී ඒ තුළ තිබි නීති විරෝධී ලෙසින් ගෙන යමින් තිබූ කේරළ ගංජා තොගයක් සොයා ගත් පසු එම ගංජා තොගය හා වෑන් රථයක් එහි රියදුරුත් අඩංගුවට ගත් බව පොලිස් මත්ද්‍රව්‍ය නාශක කාර්යාශය කියයි.

එම කාර්යාංශයට ලැබී තිබූ තොරතුරක් අනුව කාර්යාංශයේ පොලිස් නිලධාරින් පිරිසක් හලාවත පුත්තලම මාර්ගයේ දැදුරු ඔය සිත්තමඩම පොලිස් මාර්ග බාධකය අසල රැඳී සිටිය දී මෙම අත්අඩංගුවට ගැනීම සිදු කර ඇති බව කියයි.

වෑන් රථය නවතා පරීක්ෂා කළ අවස්ථාවේ දී ඒ තුළ කේරළ ගංජා කිලෝ හතරකුත් මිලිග්‍රෑම් දෙසිය දහයක් තිබි සොයා ගෙන ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු වෑන් රථයේ රියදුරු වැල්ලවත්ත ප්‍රදේශයේ පදිංචිකරුවකු වන බවත් ඔහු වවුනියාව ප්‍රදේශයේ සිටි මෙම ගංජා තොගය වැල්ලවත්ත ප්‍රදේශයට ගෙන යමින් සිටි බවත් කියයි.

අත්අඩංගුවට ගත් කේරළ ගංජා තොගය වෑන් රථය හා ගංජා තොගය නිතිමය කටයුතු සඳහා හලාවත පොලිසියට බාර දී ඇත .

එස්.ජී.විජේරත්න - කටුගස්තොට සමූහ

හෙරොයින් සමග හතක් අසු වෙති

දිගන අඹකොටේ පිහිටි පොලිස් විශේෂ කාර්ය බළකා කඳවුරේ නිලධාරින් පිරිසක් හා කටුගස්තොට පොලිසියේ නිලධාරින් පිරිසක් විසින් සිදුකර ඇති වැටලීම් දෙකකදී හෙරොයින් සමග හත් දෙනකු අත්අඩංගුවට ගෙන තිබේ.

පසුගියදා පොලිස් විශේෂ කාර්ය බළකා නිලධාරින් විසින් බරිගම ප්‍රදේශයේදී හෙරොයින් සමග පුද්ගලයන් පස් දෙනකු අත්අඩංගුවට ගෙන ඇති අතර ඔවුන් සන්තකයේ හෙරොයින් මිලිග්‍රෑම් 462 ක් තිබී ඇත. අත්අඩංගුවට ගත් පුද්ගලයන් පස්දෙනා 20 සිට 30 දක්වා වූ වයස් කාණ්ඩවල පසුවන අයවලුන්ය.

එදිනම කටුගස්තොට පොලිසියේ දූෂණ මර්දන අංශයේ නිලධාරින් පිරිසක් විසින් කටුගස්තොට ගාලවත්ත ප්‍රදේශයේදී 24 හැවිරිදි තරුණයෙක් හා 63 හැවිරිදි කාන්තාවක් හෙරොයින් මිලිග්‍රෑම් 170 ක් සමග අත්අඩංගුවට ගෙන තිබේ.

පොලිස් විශේෂ කාර්ය බළකා නිලධාරින් විසින් අත්අඩංගුවට ගත් සැකකරුවන් ඉදිරි කටයුතු සිදුකිරීම පිණිස කටුගස්තොට පොලිසිය වෙත භාරදී තිබුණු අතර සැකකරුවන් හත් දෙනා ඊයේ(13)දින මහනුවර මහෙස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු යොදා තිබුණි.

ශිෂ්‍ය භික්ෂු ගුරු උපහාර උළෙල

දමන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් ඓතිහාසික හිඟුරාන උත්තර ජයමහා විහාරස්ථානයට අනුබද්ධිත අම්/සිරි ධම්මරතන මහ පිරිවෙනේ ගුරු උපහාර උළෙල මෙවර රටේ පවතින අයහපත් සෞඛ්‍ය තත්ත්වය හේතුවෙන් සෞඛ්‍ය ආරක්ෂිත ක්‍රම හා විධි අනුගමනය කරමින් ඉතා චාම් අන්දමින් විහාරස්ථ ධර්ම ශාලාවේදී පැවැත්විණි.

හිඟුරාන උත්තර ජයමහා විහාරාධිපති හිඟුරාණේ සිරිධම්ම හිමියන්ගේ මග පෙන්වීම හා අනුශාසනා මත අම්/සිරිධම්මරතන මහ පිරිවෙනේ අධ්‍යාපනය හදාරන ශිෂ්‍ය භික්ෂූන් වහන්සේ විසින් මෙම ගුරු උපහාර උළෙල සංවිධානය කළහ. අම්/ සිරිධම්ම රතන මහ පිරිවෙනේ පරිවේනාධිපති හිරියල ගම්මන සරණසෝම හිමි සහ හිඟුරාන උත්තර ජයමහා විහාරවාසී ආචාර්ය දිවියාගල සමිතරංසි හිමි ඇතුළු පිරිවෙනේ ගුරු මණ්ඩලය උපහාරයෙන් පිදුම් ලැබූහ.

වජිර පුෂ්පිත ගුනවර්ධන - තෙලිජ්ජවිල සමූහ

දෙනියාය පරගල කන්න රැස්වීම මෙවරත්

දෙනියාය පරගල 2020/2021 මහ කන්නයේ කන්න රැස්වීම පරගල ශ්‍රී ශීලානන්ද විහාරස්ථානයේදී පසුගිය දා පැවැත්විණි. දෙනියාය මූලස්ථාන කෘෂිකර්ම උපදේශක චම්න්ද කරවිට මහතා ගේ ප්‍රධානත්වයෙන්, දෙනියාය 2 කලාපයේ කෘෂිකර්ම උපදේශක ආර්. පී .එන්. සම්පත් මහතා සහ කෘෂිකර්ම නිෂ්පාදන සහකාර ප්‍රියන්ත මහතා ගේ සහභාගිත්වයෙන් රැස්වීම පැවති අතර අක්කර හැත්තෑවක් වූ එම යායේ කන්නයේ වගා කටයුතු සිදුකළ යුතු දින හා නොමිලේ ලබාදෙන පොහොර ලබාදීමේ දින වකවානු පිළිබඳ සාකච්ඡා විය. එසේම වී වගාවේ කාලීනව සිදුකළ යුතු කටයුතු පිළිබඳ ගොවිජනතාව දැනුවත් කිරීමද සිදු කෙරිණි.

ප්‍රභාත් විතානාච්චි - දකුණු පළාත් විශේෂ

ඩෙංගු සහ ජලභීතිකාවට ඉදිරි ක්‍රියාමාර්ග

කොවිඩ් 19 රෝගය දෙවන වරටත් ව්‍යාප්ත වීම වැළැක්වීම සඳහාත් ගාල්ල දිස්ත්‍රික්කය තුළ මේ වන විට පවතින ඩෙංගු රෝගය සහ ජලභීතිකා රෝගය පිළිබඳව ඉදිරි ක්‍රියාමාර්ග පිළිබඳ සාකච්ඡාවක් පසුගියදා දකුණු පළාත් ආණ්ඩුකාරවර විලී ගමගේ මහතාගේ ප්‍රධානත්වයෙන් ගාල්ල ලබුදූව දක්ෂිණපාය ශ්‍රවණාගාරයේ දී පැවැත්විණි.

මෙම අවස්ථාවට වැලි කර්මාන්ත ඇමැති වෛද්‍ය රමේෂ් පතිරණ, රාජ්‍ය ඇමැති මොහාන් පී. ද සිල්වා, දිස්ත්‍රික් සංවර්ධන කමිටු සභාපති සම්පත් අතුකෝරාල, දිස්ත්‍රික් මන්ත්‍රීවරුන් වන චන්දිම වීරක්කොඩි, ගයන්ත කරුණාතිලක යන මහත්වරු සහභාගී වූහ.

මීට අමතරව ගාල්ල දිස්ත්‍රික් ලේකම් , දකුණු පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ඇතුළු ගාල්ල දිස්ත්‍රික්කයේ සෞඛ්‍ය නිලධාරින් පිරිසක් ද සහභාගී වූහ.

සුනිල් සාන්ත - කළුතර මධ්‍යම විශේෂ

කළුතර දිස්ත්‍රික් ස.ක. සභාපති වැඩ භාරගනී

කළුතර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී සංජීව එදිරිමාන්න මහතා ,කළුතර දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපති වශයෙන් ,කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය , සම්බන්ධීකරණ කමිටු සභාපති කාර්යාලයේදී රාජකාරි භාර ගත්තේය.

මේ අවස්ථාවට කළුතර දිස්ත්‍රික් වැඩබලන ලේකම් වැ.බ.දිසාපති තිලංකා වෙත්තසිංහ, කළුතර දිස්ත්‍රික් අතිරේක ලේකම් විමල් ගුණතුංග යන මහත්ම මහත්මීන් ඇතුළු අංශ ප්‍රධානීන් කිහිප දෙනෙක්ද දැඩි සෞඛ්‍ය ආරක්ෂක ක්‍රම යටතේ එක් වූහ.

සංජීව එදිරිමාන්න මහතා රාජකාරි භාර ගැනීම හා එම රාජකාරි ලිය කියවිලි කළුතර වැඩ බලන දිසාපති මහත්මියට මෙහිදී භාර දුනි.

දිනමිණ දිසත දස අත ම එක තැන

රත්තොට සමූහ කිංස්ලි රිචඩ් ද සිල්වා

බිල්ඩිමට කෝටි 51යි ඒත් අඩුපාඩු පිරිලා

ලග්ගල නව නගරයේ ඉදි කර ඇති ලග්ගල ප්‍රාදේශීය රෝහලට සියලු පහසුකම් සහිත යැයි සිතුවද එය එසේ නොවේ.

කෝටි පනස්එකක අති විශාල වියදමක් දරා ඉදි කළ මෙම රෝහලට සූතිකාගාරයක් නැත. මේ තත්ත්වය නිසා පවුල් පන්දහසකට අධික ප්‍රමාණයකට අයත් ගැබිනියන්ට මාතලේ දඹුල්ල හෝ මහියංගන රෝහල් වලට යාමට සිදුවී ඇත.

මේ පිළිබඳ එම රෝහලේ නිලධාරියකුගෙන් විමසූ විට ඔහු පැවසුවේ මෙම රෝහලේ ප්‍රසව හා නාරිවේද වෛද්‍යවරයකු නොමැතිවීමත් ශල්‍ය වෛද්‍යවරු නොමැතිවීමත් මත මේ තත්ත්වය මතුව ඇති බවයි.

වකුගඩු අවදානම තදින් පවතින මේ ප්‍රදේශයේ ඒ සඳහා වන රුධිර කාන්දුකරණය කිරීමට මෙම රෝහලේ පහසුකම් නැත.

මෙම අත්‍යවශ්‍යම අඩුපාඩු ඇතුළු අඩුපාඩු රැසක් ඇති මෙම රෝහලට කෝටි 51ක මුදලක් වැය කිරීම ලග්ගල නව නගරය ආශ්‍රිතව පදිංචි අයට විශාල ගැටළුවක් වී ඇත

ආනන්ද විජේතිලක - මාවතගම විශේෂ

කුරුණෑගල බාලදක්ෂ සංගමයෙන් ලේ දන් දීමක්

කුරුණෑගල දිස්ත්‍රික් බාලදක්ෂ සංගමය 25 වැනි වරටත් ලේ දන් දීමේ මහා පුණ්‍යකර්මයක් කුරුණෑගල තරුණ බෞද්ධ සංගම් ශාලාවේ දී සංවිධානය කරන ලදී.

ශ්‍රීමත් අනගාරික ධර්මපාලතුමාගේ ජන්ම දිනය වෙනුවෙන් එතුමාටත් ලේ පරිත්‍යාගීලී සියලුදෙනාටත් පින් පිණිස පසුගිය වසර 25 ක්ම අඛණ්ඩව මෙම ලේ දන්දීමේ කඳවුර සැප්තැම්බර් 17 දින සිදු කරන ලද අතර මෙවර කොරෝනා හේතුවෙන් රටේ උත්සව සංවිධානය නොකිරීම නිසා ධර්මපාල තුමාගේ ගුණ සමරු උත්සවය නොපැවැත්වුවද ලේ දන්දීමේ කඳවුර පැවැත්විණි. එහිදී පසුගිය වසර වලදී උපරිම 150 දෙනෙක් පමණ ලේ දන්දීමට සහභාගි වුවත් මෙවර 175 දෙනෙක් ලේ දන් දුන් අතර කාලවේලා ඉක්ම ගිය නිසා 50 දෙනෙක් පමණ ආපසු හැරී ගියහ.

කොරෝනා වැනි වසංගතවලදී අප සුරැකෙන්නේ මෙවැනි මහා පුණ්‍යකර්මයන්ට දායක වන නිසා යැයි අප විශ්වාස කරන බවත්, හදිසි ආපදාවන්ට ලක්වන රෝගීන්, ශල්‍ය කර්මයන්ට භාජනය වන රෝගීන්, තැලසීමියා සහ වකුගඩු රෝගීන් වෙනුවෙන් කුරුණෑගල මහ රෝහලේ ලේ බැංකුව දිනපතා රෝහලේ ලේබැංකුවෙන් බාහිරව මෙවැනි කඳවුරු පවත්වමින් ලේ රැස්කිරීම සිදු කරනු ලබන අතර මෙම සත්ක්‍රියාවට දායක වෙමින් තමා විසින් 25 වෙනි වරටත් මෙම පුණ්‍යකර්මය සිදු කරන්නට ලැබීම වාසනාවක් බව කුරුණෑගල බාලදක්ෂ දිසා කොමසාරිස් යු. බී. දිසානායක මහතා පැවසීය. එතුමා මේ වන විට 32 වතාවක් ලේ පරිත්‍යාග කර ඇත.

එස් දියගහගේ දකුණු පළාත් සංචාරක

විදුලි පංකාව සොරාගත් සැකකරු කොටු

ගාල්ල නගරයේ විදුලි භාණ්ඩ අලෙවිසලකින් රුපියල් 9500ක පමණ වටිනා විදුලි පංකාවක් සොරකම් කළ සැකකරුවකු රිමාන්ඩ් බන්ධනාගාර ගත කිරීමට ගාල්ල ප්‍රධාන මහේස්ත්‍රාත් හර්ෂණ කැකුණවෙල මහතා නියෝග කළේය.

මෙසේ රිමාන්ඩ් බන්ධනාගාර ගත කරනු ලැබුවේ දොඩම්පෙ අයෙකි.

සැකකරු ඉකුත් අගෝස්තු මස 21වනදින දහවල් යතුරු පැදියකින් ගාල්ල නගරයේ වෝඩ් වීදිය හරහා ගමන් කරමින් සිටියදී විදුලි භාණ්ඩ වෙළඳසලකට ගෙනැවිත් දොරකඩ ඉදිරිපිට ගොඩ ගසා තිබූ විදුලි පංකාවක් සහිත පෙට්ටියක් යතුරු පැදියේ තබාගෙන ගොස් ඇත.

එම සිද්ධිය අසල ආරක්ෂිත කැමරා පද්ධතියක සටහන්ව තිබී ඇති අතර ඒ අනුව පොලිසිය යතුරු පැදියේ අංකය ඔස්සේ පරීක්ෂණ පවත්වා එහි අයිතිකරු සොයාගෙන ගොස් ඇත. එය අයිතිකරු සැකකරුගේ මව වන අතර පසුව මවගේ තොරතුරු අනුව විදුලි පංකාව සහ සැකකරු සොයාගෙන අධිකරණයට ඉදිරිපත් කෙරිණි.

ගාල්ල පොලිසියේ අපරාධ විමර්ශන අංශයේ ස්ථානාධිපති පොලිස් පරීක්ෂක ඩී.ජී. ආනන්ද මහතාගේ උපදෙස් පරිදි උප පොලිස් පරීක්ෂක මහිලාල් මහතා විසින් පැමිණිල්ල මෙහෙයවනලදී.

එස්. ලොකුකරවිට - කරාපිටිය සමූහ සහ ප්‍රභාත් විතානච්චි - දකුණු පළාත් විශේෂ

වක්වැල්ල ජල පොම්පාගාරයට නව යන්ත්‍ර සූත්‍ර

ගාල්ල දිස්ත්‍රික්කයට පානීය ජල පහසුකම් සැපයීම සඳහා පිහිටුවා ඇති, ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලයට අයත් වක්වැල්ල ජල පොම්පාගාරය නිරීක්ෂණය කිරීම සඳහා වැවිලි ඇමැති රමේෂ් පතිරණ මහතා පසුගියදා ඒහි ගියේය. එහි අබලන්ව ඇති පැරැණි යන්ත්‍ර සූත්‍ර වෙනුවට නව යන්ත්‍ර සවි කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම චාරිකාවේ අරමුණ විය. අඛණ්ඩ ජල සැපයුමක් නොලැබීම හේතුවෙන් සහ නව ජල සබඳතා ලබා ගැනීමට නොහැකි වීම හේතුවෙන් දිස්ත්‍රික්කයේ බොහෝ පිරිසක් අපහසුතාවට පත්ව සිටිති.

මේ අවස්ථාවට හිටපු පළාත් සභා මන්ත්‍රී චානක මාදුගොඩ මහතා ඇතුළු පිරිසක් ද සහභාගී වූහ.

හැටන් සමූහ - චන්දන ජයවීර

හැටන් - කාසල්රී ජනපදයේ ජනතාවට කෙනෙහිලි ඇයි මේ

ලංකා විදුලිය බල මණ්ඩලයේ අදාළ බලධාරීන් වසර 60කට වඩා කාලයක් පදිංචි වී සිටින තම නිවාසවලට තීන්ත ටිකක් හෝ ආලේප කර ගැනීමට, දිරාගිය සෙවිලි තහඩුවක් මාරුකර ගැනීමට,වැසිකිළියක් ඉදිකර ගැනීමටවත් නොදී සාමාන්‍ය ජීවන රටාවට පවා බලපෑම් කරන බවට හැටන් - කාසල්රී ජනපදයේ ජනතාව මැසිවිලි නඟති.

කාසල්රී ජනපදය යනු ලංකා විදුලිය බල මණ්ඩලය විසින් 1960 වර්ෂයට පෙර කාසල්රී ජලාශය නිර්මාණය කරන කාල වාකවානුවේ දී ජලයෙන් යටවූ ප්‍රදේශවල පැවති ජනාවාසවල ජීවත් වූ ජනතාව වෙනුවෙන් ඉදි වූ ගම්මානයකි.එවකට ජලයෙන් යට වන ප්‍රදේශවලින් ඉහළ ප්‍රදේශවලට පැමිණි ජනතාව ජලාශය ඉහළින් පිහිටි ප්‍රදේශවල පිරිසක් නිවාස ඉදිකරගෙන තිබෙන අතර ඇතැම් අය වෙනත් ප්‍රදේශ වෙත පදිංචියට ගොස් තිබේ.මෙලෙස පදිංචි වූ පිරිසේ එම කාල වකවානුවට වඩා මේ වන විට පවුල් සංඛ්‍යාව ඉහළ ගොස් තිබෙන අතර වර්තමානයේ පවුල් 500ට වැඩි පිරිසක් ඔවුන්ගේ පරම්පරා සහගතව ජීවත් වූ නිවාසවල හා නව නිවාස ඉදිකරගෙන වාසය කරමින් සිටිති.ජනාධිපතිවරයාගේ උපදෙස් මත පදිංචි ඉඩම්වලට ඔප්පු ලබා දීමට කටයුතු කිරීමේ වැඩපිළිවෙළ යටතේ මේ සියලුම පවුල් ඉල්ලුම්පත් යොමු කිරීමටද කටයුතු කර ඇති බව පවසති. මෙලෙස පරම්පරා ගණනාවක් ජීවත් වූ නිවාසවලට පහළින් පිටිහි කාසල්රී ජලාශ මායිම වසරකට පමණ පෙර හැටන් - නෝර්ටන් බ්‍රිජ් ප්‍රධාන මාර්ගයට ද ඉහළින් සලකුණු කර CEB යනුවෙන් සඳහන් කළ කොන්ක්‍රිට් කණු සිටවීමෙන් පසු ලංකා විදුලිය බල මණ්ඩලය විසින් ගම්වාසින්ට ගැටලු ඇති කරන බව පවසති.

මේ වන විට පරම්පරා හතරකට වැඩි කාලයක් ජීවත් වන මේ නිවාසවල කිසිදු අලුත්වැඩියා කටයුත්තක් සිදු කිරීමට ලංකා විදුලි බල මණ්ඩලයේ නෝර්ටන්බ්‍රිජ් කාර්යාලයේ නිලධාරීන් අවස්ථාව නොදෙන බව පවසන ගම්වාසින් දෛනිකව ගම්මානය වෙත එන ලංකා විදුලිය බල මණ්ඩලයේ ආරක්ෂක අංශයේ නිලධාරීන් විසින් බලපෑම් කරන බවට ද චෝදනා කරති.විශේෂයෙන්ම වසරේ වැඩි කාලයක් වර්ෂාව පවතින මේ ප්‍රදේශයේ නිවාසවල අබලන් වූ වහලයක සෙවිලි තහඩු මාරුකර ගැනීම,මංගල හෝ වෙනත් උත්සව අවස්ථාවක් වෙනුවෙන් නිවෙස්වල බිත්ති තීන්ත හෝ සුදු හුණු ආලේප කිරීම වැනි නවීකරණයක් වත් කිරීමට අවස්ථාන නොදෙන බවත්,එසේම වැසිකිළියක් හෝ අලුතෙන් ඉදි කරන්නට අවස්ථාව නොදෙන බවද පවසන අතර බොහෝ අවස්ථාවල අඩක් ඉදිකරන ලද ගොඩනැඟිලි පවා කඩා ඉවත් කරන ලෙස බලපෑම් කළ බවත් එම බලපෑම් හමුවේ ඉදිකරමින් තිබූ කොන්ක්‍රිට් කණු පවා කඩා දැමීම සිදු කළ බවද කියති.

මෙලෙස පරම්පරා ගණනාවක් ජීවත් වන නිවෙස්වල නිදහසේ ජීවත් වීමට අවකාශ සලසා දෙන මෙන් වගකිවයුත්තන් කොතෙක් දැනුවත් කළ ද විසඳුම් නොලැබුණු බව පවසන ගම්වැසියන් ඇතැම් අවස්ථාවල තම නිවාස අලුත්වැඩියා කිරීම නිසා ලංවීම ආරක්ෂක අංශ විසින් ගම්වාසින් පොලීසියට පවා කැඳවූ බවද පවසති. ගම්වාසීහු විසින් කරන ඉහත චෝදනා සම්බන්ධයෙන් නෝර්ටන් බ්‍රිජ් විදුලිය බලගාරයේ ඉංජිනේරුවරයා සම්බන්ධ කර ගැනීමට උත්සහ කළ ද එම උත්සාහය ව්‍යර්ථ විය.

ආර්.ශ්‍රදාණදාස - අම්බලන්ගොඩ සමූහ

ගංජා ළඟ : සැක දෙදෙනා ඇතුළට

ගංජා ග්‍රෑම් 350ක් සන්තකයේ තබා ගෙන ජාවාරමේ යෙදුණ බව කියන සැකකරුවන් දෙදෙනකු සහ ගංජා ප්‍රවාහනය කළ මෝටර් රථයත් සමඟ අම්බලන්ගොඩ පොලීසිය මඟින් අත්අඩංගුවට ගෙන බලපිටිය අධිකරණය වෙත ඉදිරිපත් කළ සැකකරුවන් දෙදෙනකු ලබන විසිහය වැනි දින දක්වා රක්ෂිත බන්ධනාගාර ගත කරන ලෙස බලපිටිය මහේස්ත්‍රාත් හංසදේව සමරදිවාකර මහතා නියෝග කළේය. මෙසේ රක්ෂිත බන්ධනාගාර ගත කරනු ලැබුවේ බලපිටිය හීනටිය ප්‍රදේශයේ පදිංචිකරුවන් දෙදෙනෙකි. අම්බලන්ගොඩ රහස් තොරතුරු අංශයේ නිලධාරීන්ගෙන් ලැබුණු තොරතුරු මත පොලිස් උපාය දූතයකු යොදවා ගංජා ග්‍රෑම් දහයක් මිලදී ගෙන ඊට පසුව තවත් ගංජා ග්‍රෑම් 300ක් අවශ්‍ය බව පොලිස් දූතයා පවසා තිබේ. දෙවැනි සැකකරු පළමු සැකකරුට ඒ බව පැවැසීමෙන් පසුව පළමු සැකකරු මෝටර් රථයෙන් ගංජා ග්‍රෑම් 300ක් රැගෙන එම ස්ථානයට පැමිණීමෙන් පසුව දෙදෙනාම පොලීසිය විසින් අත් අඩංගුවට ගෙන තිබේ. මේ සැකකරුවන් අධිකරණ වෙත ඉදිරිපත් කරනු ලැබුවේ අම්බලන්ගොඩ පොලීසියේ පොලිස් කොස්තාපල් රුක්මාල් (86261) මහතා විසිනි.

පී.මද්දුමගේ - මාවරල සමූහ

සුපිරි වෙළෙඳ සලකින් භාණ්ඩ සොරාගෙන දඩ

මාතර ප්‍රධාන පෙළේ සුපිරි වෙළෙඳ සලකින් රුපියල් තුන්දහස් තුන්සිය තිස්හයක් වටිනා පාරිභෝගික භාණ්ඩ සොරකම් කර සන්තකයේ තබාගත් බවට චෝදනා ලැබූ කාන්තාවක්,වරද පිළිගත් නිසා මාතර ප්‍රධාන මහේස්ත්‍රාත් සහ අතිරේක දිසා විනිසුරු ඉසුරු නෙත්තිකුමාර මහතා විසින් මාස 18 සිර දඬුවමක් ද, රුපියල් තුන්දහසක දඩ මුදලක්ද නියම කළේය. දඩ මුදල නොගෙවන්නේ නම් තවත් මාස දෙකක සිරදඬුවමක් සහ වෙළෙඳ සලට අලාබය ලෙස රුපියල් 7500ක මුදලක් ගෙවීමටද නියම කෙරිණි. මෙසේ වරද පිළිගෙන දඬුවම්වලට යටත් වූයේ ගන්දර පදිංචි, කෝට්ටගේ ප්‍රියංගිකා නැමැති කාන්තාවකි. මාතර පොලීසිය මඟින් සොරකම් කරන ලද බවට සැක භාණ්ඩ සහ සැකකාරිය අධිකරණයට ඉදිරිපත් කර නඩු පවරා තිබිණි.

රාගම සමූහ

වාහනවල කොටස් සොරකම් කළ කල්ලිය දැලේ

කැලණිය කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යාංශයට ලද තොරතුරක් මත කාලයක් මුළුල්ලේ සිදුකරන ලද මහා පරිමාණයේ වාහන කොටස් සොරකමක තොරතුරු අනාවරණය කරගෙන ඇත.

තම නිවෙස අසල වාහනය නවතා තිබියදී කොටස් රහසිගතව ගලවා ගෙන ගොස් කොළඹ පංචිකාවත්ත ප්‍රදේශයට සහ යක්කල ප්‍රදේශයට අලෙවි කර ඇති බව කියන තිදෙනකුගෙන් යුත් මේ කණ්ඩායම මෙසේ අත්අඩංගුවට පත්ව තිබේ. මින් එක් අයෙක් තාවකාලිකව නැවතී සිටි කැලණිය වනවාසල බෝඩිමේදීත් අනෙක් පුද්ගලයා සීදූවේදීත් අනෙක් තැනැත්තා ලොරියකින් මේ වාහන කොටස් ප්‍රවාහනය කරමින් සිටියදීත් පොලිස් අත්අඩංගුවට ගෙන ඇත. කොටදෙණියාව, ගලේවෙල කුරුණෑගල, ඒකල, නාරම්මල, පොතුහැර, නිකවැරටිය යන ප්‍රදේශවල නිවාස ආසන්නයේ නවතා තිබූ වැගන් ආර් රථවලින් මෙලෙස කොටස් ගලවා ගෙන කුලියට ගන්නා වාහනවලින් ඒවා කොළඹ පංචිකාවත්ත ප්‍රදේශයට රැගෙන ගොස් අලෙවි කර ඔවුන් තිදෙනා අතර එම මුදල් බෙදාගෙන ඇත.

වාහන අටක කොටස් නැතිවූ බවට පැමිණිලි ලැබී ඇති අතර ඉන් වාහන හයක කොටස් පොලීසිය මේ වන විට සොයාගෙන ඇත.ගලේවෙල ප්‍රදේශයෙන් වාහන තුනක කොටස්ද පොතුහැරින් එකක් ජාඇළ එකක් ලෙස සොයාගෙන ඇති මෙම වාහන අමතර කොටස් සියල්ලේ වටිනාකම රුපියල් ලක්ෂ 35කට ආසන්න යැයි පොලීසිය පවසයි.

එස්. දීයගහගේ - දකුණු පළාත් සංචාරක

අධිවේගයේ ඇල්බීසියා ගස් 7ක් හොරෙන් කපලා

දක්ෂිණ අධිවේගි මාර්ගය අයිනේ රක්ෂිතයේ ඇල්බීසියා ගස් හතක් කපා සොරකම් කිරීම සම්බන්ධයෙන් අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කරන ලද සැකකරුවන් දෙදෙනාට එක් අයකුට රුපියල් ලක්ෂ පහ බැගින් වූ ශරීර ඇප දෙකක් මත මුදා හැරීමට ගාල්ල ප්‍රධාන මහේස්ත්‍රාත් හර්ෂණ කැකුණවෙල මහතා නියෝග කළේය. මෙසේ ඇප මත මුදා හරිනු ලැබුවේ අඟුලුගහ ප්‍රදේශයේ පදිංචිකරුවන් වන කොස්ගල්ලන දුරගේ ගයාන් සම්පත් සහ වේරගම හේවගේ ජගත් චන්ද්‍ර නමැති සැකකරුවන් දෙදෙනෙකි. සැකකරුවන් විසින් කපා සොරකම් කොට අක්මීමණ සහ ගිනිගල ප්‍රදේශයේ ලී මෝල් දෙකකට විකුණා තිබූ ඇල්බීසියා දැව කඳන් 46ක්ද පොලීසිය විසින් සොයාගෙන තිබේ.

දක්ෂිණ අධිවේගි මාර්ගයේ 101 කණුව අසල මාර්ගය දෙපස වැටට සිටුවා තිබූ වට අඩි 5.1/2 සහ වට අඩි 6.1/2 ප්‍රමාණයේ ඇල්බීසියා ගස් හතක් කපා ට්‍රක් රථවල පටවා ගෙන ගොස් ඇති බවට වැඩ පරික්ෂකවරයකු විසින් ඉමදූව පොලීසියට කරන ලද පැමිණිල්ලක් අනුව සැකකරුවන් සහ දැව කඳන් තොගය අත්අඩංගුවට ගෙන ඇත. ඉමදූව පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරික්ෂක උපුල් කුමාර මහතාගේ උපදෙස් පරිදි සැරයන් කරුණාදාස(6115) මහතා විසින් සැකකරුවෝ අධිකරණයට ඉදිරිපත් කරනු ලැබූහ.

ගාල්ල දිසා සමූහ

මෝටර් රථයකින් අයිස් ගෙන යද්දී තරුණයෝ තිදෙනා දැලේ

අයිස් මත්ද්‍රව්‍ය මිලිග්‍රෑම් 495ක් සමඟ අත්අඩංගුවට ගත් සැකකරුවන් තිදෙනකු ගාල්ල ප්‍රධාන මහේස්ත්‍රාත් හර්ෂණ කැකුණවෙල මහතා වෙත ඉදිරිපත් කිරීමෙන් පසු එක් අයකුට රුපියල් 5000 බැගින් වූ රුපියල් 15000ක දඩ මුදලක් මහේස්ත්‍රාත්වරයා විසින් නියම කළේය. මෙසේ දඩ මුදල් නියම වූයේ කිරින්ද පුහුල්වැල්ල ප්‍රදේශයේ පදිංචි වයස අවුරුදු 29,26 හා24 යන වියේ පසුවන විවාහකයන් තිදෙනකුටය.කාර් රථයකින් ගමන් කරමින් සිටි මේ සැකකරුවන් තිදෙනා අයිස් මත්ද්‍රව්‍ය මිලිග්‍රෑම් 495ක් සමඟ පසුගිය (12)වැනිදා දක්ෂිණ අධිවේගි මාර්ගයේ පින්නදූව පිවිසුම ආසන්නයේ දී ගාල්ල පොලීසියේ කොට්ඨාස දූෂණ මර්දන අංශය මඟින් අත්අඩංගුවට ගෙන තිබිණි. ඇල්ටෝ වර්ගයේ කාර් රථයකින් පැමිණි මෙකී සැකකරුවන් තිදෙනා පින්නදූව පිවිසුමෙන් අධිවේගී මාර්ගයට ඇතුළු වීමට යැමට පැමිණ ඇති බව විමර්ශනවලදි අනාවරණය වී ඇත.මොවුන් තිදෙනා සන්තකයේ අයිස් මත්ද්‍රව්‍ය පැකට් 03ක් තිබූ බව පොලීසිය පවසයි. කාර් රථය පොලිස් බාරයට ගෙන ඇති අතර යම්කිසි අපරාධයක් කිරීම සඳහා මේ කාර් රථය යොදාගෙන ඇද්ද යන්න පිළිබඳ පොලීසිය විමර්ශන සිදු කරයි.ගාල්ල පොලීසියේ කොට්ඨාස දූෂණ මර්දන අංශයේ ස්ථානාධිපති පො. ප.නිමල්, උ.පො.ප කීර්ති, පො.සැ. 58907 හසන්ත, පො.සැ. 22982 තරංග යන නිලධාරීහු විසින් සැකකරුවන් අත්අඩංගුවට ගත්හ.

කපිල සෝමරත්න - පානදුර සමූහ

පාණදුර නීතිඥවරයකුගේ දුරකතන සොරාගැනීම: සැකකාරිය රිමාන්ඩ්

පාණදුර මහේස්ත්‍රාත් අධිකරණයේ නීතිඥ අරුණ දීපාල් මහතාට අයත් ජංගම දුරකථන දෙකක් 06-10-2020 දින පාණදුර ඉඩම් ලියාපදිංචි කාර්යාලයේදී සොරකම් කිරීම සම්බන්ධයෙන් අත්අඩංගුවට ගෙන පානදුර දකුණු පොලීසිය විසින් අධිකරණයට ඉදිරිපත් කරන ලද කාන්තාව ලබන 19වැනිදා දක්වා පාණදුර අතිරේක මහේස්ත්‍රාත් චන්දන කලංසූරිය මහතා විසින් නියම කරන ලදී. මේ සැකකාරිය සම්බන්ධයෙන් නීතිඥවරයා විසින් පාණදුර දකුණු පොලීසියට පැමිණිල්ලක් ඉදිරිපත් කිරීමෙන් පසු පරික්ෂණ ආරම්භ කෙරිණි.නීතිඥ, අරුණ දීපාල් මහතා 06-10-2020 දින පාණදුර ඉඩම් ලියාපදිංචි කාර්යාලයට ගොස් තම ජංගම දුරකතන දෙක ඉඩම් කාර්යාලයේ මේසය මත තබා රාජකාරි කටයුත්තකට සහභාගී වෙමින් සිටියදී සැකකාරිය විසින් ඒවා සොරකම් කර ඇති බව පොලිස් පරික්ෂණයේදී අනාවරණය වී ඇත. සොරකම් කරන ලද දුරකතන දෙක සමඟ පොලීසිය විසින් සැකාරිය අත්අඩංගුවට ගන්නා ලද්දේ බණ්ඩාරගම මිල්ලනියේදීය.

බුද්ධික වීරසිංහ - හික්කඩුව සමූහ

පිළියන්දල අඩුආදායම්ලාභී පවුලක නිවෙසට නොමිලේ විදුලිය

ලංකා විදුලි බල මණ්ඩලයේ රත්මලාන ප්‍රධාන කාර්යාලයේ පාරිභෝගික සම්බන්ධීකරණ සුබ සාධක සංගමය මඟින් අඩු ආදායම්ලාභී පවුලක් සඳහා නොමිලේ විදුලි සම්බන්ධතාව ලබාදීමට කටයුතු කරන ලදි. පිළියන්දල,ජල්තර මොල්ලියවත්ත ප්‍රදේශයේ නිවෙසක් මේ සඳහා තෝරාගන්නා ලදි.මෙහිදී එම නිවෙසේ පදිංචි අය වෙත වියළි ආහාර ද්‍රව්‍ය ලබා දීමක් ද සිදුකරන ලදී. විදුලි සම්බන්ධතාව විවෘත කිරීම රත්මලාන ප්‍රධාන කාර්යාලයේ ඉංජිනේරු ධම්මික ජයසේකර මහතා විසින් සිදුකරනු ලැබූ අතර වියළි සලාක බෙදාදීම ඉංජිනේරු දීපා මායාදුන්න මහත්මිය අතින් සිදු කරන ලදි.

මේ අවස්ථාවට සුබසාධක සංගමයේ සභාපති ඒ.පී.රංජිත් කුමාර සහ භාණ්ඩාගාරික ඩබ්ලිව්. පියදාස,මහේෂ් ප්‍රසන්න ප්‍රනාන්දු ඇතුළු සියලුම කාර්යය මණ්ඩල නිලධාරි මහත්ම,මහත්මීහු සහභාගි වී සිටියහ.

ඒ.පී.දයාචන්ද්‍ර - ඌරුබොක්ක විශේෂ

ඌරුබොක්ක පොලීසියෙන් ලක්ෂ 26ක දඩ ආදායමක්

2020-01-01 සිට 2020-09-30 දක්වා මාස 9ක් තුළ ඌරුබොක්ක පොලීසියේ රථවාහන අංශයෙන් රථවාහන වැරැදි සම්බන්ධයෙන් දඩපත් 1421ක් නිකුත් කර ඇති අතර ඒ කාලය තුළ දඩපත්‍ර 1407ක් සඳහා රුපියල් 2611000.00ක ආදායමක් දඩපත්‍රවලින් ලබාගෙන ඇත.තවත් දඩපත්‍ර 14ක් සඳහා දඩපත්‍ර ලබාගත් රථවාහන හිමියන් විසින් ගෙවීම් පැහැර හැර ඇත.පසුගිය සැප්තැම්බර් මාසය තුළ පමණක් දඩපත්‍ර 161ක් නිකුත් කර ඇති අතර ඒ මාසය තුළ ගෙවා අවසන් දඩපත්‍ර 201කි. 2020.01.01 සිට 2020.09.30 දක්වා කාලය තුළ රථවාහන අංශය විසින් ලබා ගන්නා ලද නඩු ගණන 2385කි.නඩු පැවැරීම් 145ක් ඇති අතර වරදකරු වීමෙන් අවසන් වූ නඩු 120කි.පසුගිය මාස නවයක කාලය තුළ රථවාහන හිමියන් 764 දෙනෙකු සඳහා රථවාහන වැරැදි සම්බන්ධයෙන් අවවාද කර ඇත. රථවාහන වැරැදි සම්බන්ධයෙන් රියැදුරන් 69දෙනෙකු සඳහා ඉදිරියේදී නඩු පැවැරීමට ඇති අතර දැනට විභාග වන නඩු ගණන 25කි. රථවාහන වැරැදි සම්බන්ධයෙන් නඩු 2385ක් අනාවරණය කරගෙන ඇති අතර එයින් රියැදුරන් 1421ක් සඳහා දඩ පත්‍ර නිකුත් කර රුපියල් 2611000.00ක ආදායමක් උපයාගෙන ඇත. 2020.01.01 සිට 2020.09.30 දක්වා කාලය තුළ පමණක් රුපියල් 2669500.00ක ආදායමක් ලැබී ඇත. රිය අනතුරු සම්බන්ධයෙන් අධිකරණයෙන් දඩවලින් ලැබූ ආදායම රුපියල් 192500.00කි.

2020 ජනවාරි 01 දින සිට 2020 සැප්තැම්බර් 30 දක්වා කාලය තුළ ඌරුබොක්ක පොලීසියේ රථවාහන අංශයෙන් පමණක් රුපියල් 5473000.00ක ආදායමක් ඌරුබොක්ක පොලීසියෙන් පමණක් රජයට ලබා දීමට සමත්ව ඇත. පසුගිය සැප්තැම්බර් 01 සිට සැප්තැම්බර් 30 දක්වා කාලය තුළ පමණක් දඩ පත්‍ර වලින් රුපියල් 154500.00ක ආදායමක් ලැබී ඇති අතර රථවාහන වැරැදි සම්බන්ධයෙන් අධිකරණයේ නඩු පැවැරීම්වලින් රුපියල් 25000.00ක ආදායමක් සහ රිය අනතුරු සම්බන්ධයෙන් අධිකරණයේ නඩු පවරා ලැබූ ආදායම රුපියල් 12500.00කි.

ඩබ්ලිව් රෝහණ - බුලත්කොහුපිටිය සමූහ

බුලත්කොහුපිටිය ප්‍රාදේශීය සභාවේ අයවැය පරාදයි

බුලත්කොහුපිටිය ප්‍රාදේශීය සභාවේ 2021 වර්ෂය සඳහා වූ අය වැය කෙටුම්පත එක් ඡන්දයකින් පරාජයට පත් විය.අය වැයට පක්ෂව මන්ත්‍රීවරු 7 දෙනෙක් ඡන්දය ප්‍රකාශය කළ අතර විපක්ෂව මන්ත්‍රීවරු 8ක් ඡන්දය ප්‍රකාශ කළහ. මන්ත්‍රීවරු තිදෙනෙක් ඡන්ද ප්‍රකාශය කිරීමෙන් වැළැකී සිටියහ.

බුලත්කොහුපිටිය ප්‍රාදේශීය සභාවට සභාපති රුවන් සංජීව මහතා (එ.ජ.නි.ස) අයවැය ඉදිරිපත් කළේය.එහි දී අය වැය කොටුම්පත සඳහා සිදු කළ ඡන්ද විමසීමේ දී එම අය වැය කෙටුම්පතට විපක්ෂව ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණේ ජගත් ලිලාරත්න (උප සභාපති),සුමිත් වල්පොල,අජිත් නයනකාන්ත,නිශ්ශංක ලංකේශ්වර,සචිනි ගොඩගම,අලවතුරේ රතනවංශ හිමි, එක්සත් ජාතික පක්ෂයේ නිහාල් රෝහිත හා ස්වාධීන මන්ත්‍රී ගාමිණි ප්‍රේමවංශ යන මන්ත්‍රීවරු ඡන්දය ප්‍රකාශය කළහ.

අය - වැය කොටුම්පතට පක්ෂව එක්සත් ජාතික පක්ෂය නියෝජනය කළ ලලිත් විජේරත්න,කපිල රණසිංහ,රලීනා උම්මා, එම්. පුෂ්පනාදන්, එක්සත් ජනතා නිදහස් සංධානය නියෝජනය කළ සභාපති රුවන් සංජීව ,තමරා කුමාරි මල්ලව හා රාජ් කුමාර යන මන්ත්‍රීවරු ඡන්දය ප්‍රකාශ කළහ. ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ ඒකනායක රාජපක්ෂ හා සේරුවාවිල ධම්මාලෝක හිමි ,එක්සත් ජාතික පක්ෂයේ එස්. බිසෝ මැණිකේ යන මන්ත්‍රීවරු ඡන්දය දීමෙන් වැළැකී සිටියහ. ඇති වූ වාතාවරණය මත සභාපතිවරයා විසින් දින 14ක් සඳහා මහා සභාව කල් තබන ලදී.කෙටුම්පතෙහි 2021 වර්ෂය සඳහා අපේක්ෂිත ආදායම රුපියල් 59,263500කි. අපේක්ෂිත වියදම 59,262900කි.

■ වෝල්ටර් දයාරත්න - අනුරාධපුර දිසා විශේෂ, චන්ද්‍රදාස මලවරආරච්චි - මිහින්තලය විශේෂ

අනුරාධපුර නගරය අනවසර ඉදිකිරීම්කරුවන්ගේ පාරාදීසයක්

❱ සුසිල් තිලකරත්න (ශ්‍රීලපොපෙ)

අනවසරයි කියලා ඉවත් කරන්නේ දුප්පතාගේ පෙට්ටි කඩේ විතරයි

❱ ඉන්ද්‍රාණි මුණසිංහ (ශ්‍රීලනිප)

දිසත දස අත ම එක තැන

සැම රැස්වීමකදීම කතා කළත් මෙතෙක් කිසිම පියවරක් නොගැනීම නිසා මේ වන විට මේ ඓතිහාසික අනුරාධපුර නගරය අනවසර ඉදිකිරීම්කරුවන්ගේ පාරාදීසයක් වී ඇතැයි නාගරික මන්ත්‍රී සුසිල් තිලකරත්න මහතා (ශ්‍රීලපොපෙ) පැවැසීය. මන්ත්‍රීවරයා එසේ පැවසුවේ පසුගිය දින පැවැති අනුරාධපුර මහ නගර සභා රැස්වීමේ දීය. මෙම රැස්වීම නගරාධිපති එච්.පී. සෝමදාස මහතාගේ (ශ්‍රීලපොපෙ) ප්‍රධානත්වයෙන් මහ නගර සභා රැස්වීම ශාලාවේදී පැවැත්විණි.

විපක්ෂ නායක ඉන්දික අරුණ කුමාර මහතා (එජාප) - මයිලගස් හන්දියේ ප්‍රජා ශාලාවේ පෙර පාසලක් පවත්වාගෙන යනවා. ඒ ගොඩනැඟිල්ලේදීම නැටුම් පුහුණුවක්ද පටන් ගෙන තිබෙනවා. මෙය දරුවන්ගේ අධ්‍යාපනයට විශාල හිරිහැරයක්. ඒ නිසා පෙර පාසල වෙනත් ස්ථානයට ගෙන යන්න.

සුපුනි සඳමාලි මහත්මිය (ශ්‍රීලපොපෙ) - විටි දරුවන් ගැන මම හැමදාම කියනවා. දැන් විටි දරුවන් වෙනුවෙන් රාජ්‍ය ඇමැතිවරයකු දිවයින පුරා මධ්‍යස්ථාන අටක් ගොඩනගන්න රජය කටයුතු කරන බව රාජ්‍ය ඇමැතිවරයා ප්‍රකාශ කරනවා. ඒ ගැන රජයටත් රාජ්‍ය ඇමැතිවරයාටත් ස්තුතිය ප්‍රකාශ කරන අතර ඒ මධ්‍යස්ථාන වලින් පළමුවැනි මධ්‍යස්ථානය අනුරාධපුර ගොඩනගන ලෙසට මා ඉල්ලා සිටිනවා.

නියෝජ්‍ය නගරාධිපති එම්. ඩබ්ලිව් ප්‍රේමදාස මහතා (ශ්‍රීලපොපෙ) - ගස්කැපීම නවත්වා පරිසරය ආරක්ෂා කළ යුතුයි. නගරයේ අනවසර ඉදිකිරීම් ගැන සොයන්න කියපුහම ඒ අය ගිහිල්ලා අපිව පාවාදීලයි කටයුතු කරන්නේ.

ප්‍රේමසිරි හෙට්ටිආරච්චි මහතා (ශ්‍රීලනිප) - මහ නගර සභාවක් තියෙද්දි සමහරු ඇතැම් ස්ථානවල අයිතිකරුවන් වෙන්න හදනවා. නගර සීමාව ඇතිවන සෑම දෙයක්ම නගර සභාවේ අනුමැතිය මත කළ යුතුයි. නාගරික සංවර්ධන අධිකාරියට හෝ වෙනක් කිසිම කෙනකුට අප නගර සභාවේ අවසරයක් නැතුව මොනම දෙයක්වත් කරන්න බැරි බව අපි ඒ අයට පෙන්වා දිය යුතුයි.

අනුරාධපුර මහ නගර සභාව

සුරංගි රේණුකා සමරතුංග මහත්මිය (ශ්‍රීලපොපෙ) - අපි කමිටු පිහිටුවල තියනවා. ඒ කමිටු රැස්වීම්වලදී විවිධ තීරණ ගන්නවා. යෝජනා එහෙත් කිසිම දෙයක් ක්‍රියාත්මක වෙන්නේ නෑ.

නලින් සංජය සිරිවර්ධන මහතා (ශ්‍රීලපොපෙ) - කොට්ඨාසයක සංවර්ධනයක් හෝ මොනම දේ කළත් ඒ කොට්ඨාසය නියෝජනය කරන මන්ත්‍රීවරයාව දැනුම්වත් කළ යුතුයි. මන්ත්‍රීවරුන්ට තියන වගකීම වෙන කාටවත් දෙන්න එපා අන්තිමට අපට නොදැනී එක් එක් අය කරන වැඩ නිසා බැනුම් අහන්න වෙන්නේ අපිටයි. මේ ගැන කොමසාරිස්තුමා වගකිව යුතුයි.

ඉන්ද්‍රාණි මුණසිංහ මහත්මිය (ශ්‍රීලනිප) - අනුරාධපුර පැරැණි බස් නැවතුම්පොළත්, නුවර වැවත් අතර අනවසර ඉදිකිරීම් කරන්න ගිහිල්ලා ඉවත් කරලා තියෙන්නේ පුංචි මිනිසුන්ගේ පෙට්ටි කඩ විතරයි. නුවර වැව් බැම්මේ තියන මහ පරිමාණයේ කඩවලට අත තියලවත් නෑ.

නගරාධිපති එච්.පී. සෝමදාස මහතා (ශ්‍රීලපොපෙ) - අනුරාධපුර ශික්ෂණ රෝහල ඉදිරිපිට ඉදිකළ මෝත්සිරි සෙවණ වකුගඩු රෝහල් ගොඩනැඟිල්ලත් මහ නගර සභාවේ අනුමැතියෙන් තොර ඉදිකළ එකක්.

සීතා හේරත් මහත්මිය (ජවිපෙ) - පුස්තකාලයක් කියන්නේ සුබසාධක වැඩක්. අපේ දරුවන්ගෙන් අය කරන මුදල වැඩි කරන්න එපා

■ සුනිල් ගමගේ - අක්මීමන විශේෂ

පොලීසියයි සුරාබදු එකයි කසිප්පු අල්ලන්න එන්නේ නෑ

❱ හසිත කෞෂල්‍ය (ශ්‍රීලපොපෙ)

ගාල්ල දිස්ත්‍රික්කයේ වැඩියෙන්ම මත්ද්‍රව්‍ය භාවිතා වන්නේ හාලිඇළ කොට්ඨාසයේ. එහෙත් ඒ ප්‍රදේශයේ මත්ද්‍රව්‍ය වැටලීම් කිසිවක් සිදුනොකරන අතර පොලීසිය, සුරාබදු හෝ වෙනත් කිසිදු ආයතනයක් මේ ප්‍රදේශයේ මත්ද්‍රව්‍ය වැටලීමට එන්නේ නැතැයි ප්‍රාදේශීය අක්මීමන ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රී හසිත කෞෂල්‍ය මහතා (ශ්‍රීලපොපෙ) පැවැසීය.

දිනමිණ

අක්මීමන ප්‍රාදේශීය සභාව

මන්ත්‍රීවරයා මෙසේ ද කීය. මේ ප්‍රදේශයේ ගංජා, කුඩු, අයිස් වැනි මත්ද්‍රව්‍ය භාවිතා කරනනේ කවුද කියල කවුරුත් දන්නවා. කසිප්පු විකුණන කෙනා මාසයකට පොලීසියට ගිහින් නඩුවක් දෙනවා. ප්‍රදේශයේ ග්‍රාම නිලධාරීන් මත්ද්‍රව්‍ය පිළිබඳ පොලීසියට කිව්වම ස්ථානාධිපති කිව්ව උසස් නිලධාරීන් දැනුම්වත් කළා කියල. එහෙත් කවුරුත් මත්ද්‍රව්‍ය වැටලීම් වලට ආවෙනම් නෑ.

උපසභාපති ඒ.කේ. සුගත් මහතා (ශ්‍රීලපොපෙ) - මත්ද්‍රව්‍ය වැටලීම් පිළබඳව අපට තිබෙන්නෙ කනගාටුදායක තත්ත්වයක්. ජනාධිපතිතුමා, ආරක්ෂක ලේකම්තුමා කිව්ව බල ප්‍රදේශයේ මත් ජාවාරම් වෙනත් ප්‍රදේශයකින් ආරක්ෂක අංශ ඇවිල්ල අල්ලනවනම් වැඩක් නෑ කියල. කසිප්පු පොළ වටලන්න යනවනම් ඉස්සෙල්ල දුරකතන ඇමතුමක් දෙනවා අපි එනව කියල. ඉතින් වැටලීම් කළාම බඩු නෑ. පොලිස් නිලධාරීන් අවුරුදු පහෙන් පහට මාරු කරන්න. නැත්නම් මේ ජාවාරම්කරයන් එක්ක ඔවුන් එකතුවෙලා ජාවාරම ජයටම කරගෙන යනවා.

අනිල් ප්‍රියදර්ශන මහතා (ශ්‍රීලනිප) - වසමක ජනතාව 4000ක ඇති. වසමකට රාජ්‍ය නිලධාරීන් හත් දෙනෙක් විතර ඉන්නවා. මෙච්චර නිලධාරීන් ඉඳලත් ඇයි මේ පිළිබඳව දැනුම් නොදෙන්නෙ.

අරුණ ශ්‍රී ලාල් මහතා (ශ්‍රීලපොපෙ) - පොලීසිය, එස්.ටී.එෆ්, සුරාබදු යන ආයතන එකතැනකට ගෙනල්ලා මේ පිළිබඳ දැනුම්වත් කර වැටලීම් කරන්න කියල සාකච්ඡාවක් තියෙනව. හියාරේ තමයි විෂ මත්ද්‍රව්‍ය බහුලව තිබෙන්නෙ.

උපසභාපති ඒ.කේ. සුගත් මහතා (ශ්‍රීලපොපෙ) - මේ වැටලීම් හැමතැනම ක්‍රියාත්මකයි. කතරගම ඉඳල මෙහාටම මේ කටයුත්ත කෙරෙනවා. අක්මීමන බෝපෙ පෝද්දල තමයි මේ වැටලීම් කෙරෙන්නෙ නැත්තෙ.

සුගත් ආනන්ද මහතා (ජවිපෙ) - මත්ද්‍රව්‍ය වගේම අපේ වනාන්තර පද්ධතියක් විනාශ වෙනවා. ඒ නිසා වන සම්පත ගැනත් වන සංරක්ෂණ දෙපාර්තුමේන්තුවේ අවධානය යොමු කරවනන. අපෙ ප්‍රදේශවල වනාන්තර විනාශ වෙනවා. මත්ද්‍රව්‍ය වගේම වන සංහාරයත් ජයටම කෙරෙනවා. ඒ ගැනත් අවධානය යොමුකරන්න.

ප්‍රීති ගාමිණී මහතා (එජාප) - මේක රටේ උග්‍ර වෙච්ච ප්‍රශ්නයක්. අක්මීමන බෝපෙ පෝද්දල ඇත්ත වශයෙන්ම මේ ප්‍රශ්නෙ තියෙනවා. මේව 'ඊසි කෑශ් ක්‍රමයට' කෙරෙන ව්‍යාපාර. පොලීසිය මේ ගැන අඩුවෙන් තමයි බලන්නෙ .පොලීසිය කිව්ව ජංගම සේවයක් දාන්න. එහෙත් කෙරුණෙ නෑ.

රජිත ගුණසේකර මහතා (ශ්‍රීලපොපෙ) - පාලනයක් නොවේ සමාජ ආරක්ෂණයක් විය යුතුයි. මම දන්න ළමයෙක් ඉන්න රුපියල් 100ක බීඩි අරගෙන උදේ පාසලට ඇවිත් යාළුවොත් එක්ක බෙදාගෙන බොනව. මේ අය තමයි බීඩිය, සිගරට් එක, ගංජ අන්තිමට කුඩුවලින් ඉවරවෙන්නෙ.

එම්. එච්. ප්‍රභාත් මහතා (එජාප) - ඩලස් ඇමතිතුමා කිව්ව විදුලි මාෆියාව තියෙන්නෙ පාර්ලිමේන්තුවෙ කියල. මේ ජාවාරමත් තියෙන්නේ නිලධාරීන් ඇතුළෙ. දේශපාලන අධිකාරියේ හයියෙන් මත් ජාවාරම, කැලෑ කැපීම මේ ඔක්කෙම පාර්ලිමේන්ත්‍රුව ඇතුළෙ ඉඳන් ක්‍රියා කරන්නෙ.

■ එන්. නවරත්න - මීගහකිවුල සමූහ

සභාව තියෙන්නේ කුණු අදින්නයි ගලි අදින්නයි විතරද?

❱ ආර්. ඒම්. නාමල් රත්නායක (ජවිපෙ)

සපිරි ගමක් වැඩසටහනේ සංවර්ධන යෝජනා යටතේ අපේ ගම්වලටත් සංවර්ධන යෝජනා ලැබුණා. දැන් මාස කිහිපයක් ගෙවිලා තිබ්බත් කැටවත්ත, මොරහෙල ප්‍රදේශවලට ලැබුණු ලක්ෂ 20 යෝජනා 2ම තාම කරන්න බැරි වෙලා. යෝජනා 12ක් විතරයි අනුමත වෙලා තියෙන්නේ. ඉතිරි යෝජනා තාම ක්‍රියාත්මක වෙන්නේ නෑ යැයි මීගහකිවුල ප්‍රදේශීය සභාවේ මන්ත්‍රී ඩී.ආර්.චන්ද්‍රසිරි දිසානායක මහතා (ශ්‍රීලපොපෙ) පැවැසීය. ඒ මහතා මේ අදහස් ප්‍රකාශ කළේ සභාවේ මාසික රැස්වීමට සහභාගි වෙමිනි.

සභාපති ලලිත් ජයවර්ධන මහතාගේ ප්‍රධානත්වයෙන් ප්‍රාදේශීය සභා ශ්‍රවණාගාරයේදී රැස්වීම පැවැත්විණි.

මන්ත්‍රීවරයා මෙසේ ද පැවසීය. අපි පසුගිය දිනවල ජනතාව සමඟ කිව්වා අපි ගමට ලක්ෂ 20ක සංවර්ධන යෝජනා ගේනවා කියලා. ගමේ ජනතාව දැන් අහනවා කෝ ගමට ගේනවා කිව්ව සල්ලි කියලා. ගිය සභාවෙත් මම මේ ගැන කතා කළා.

රජයේ රැකියා ලක්ෂයේ වැඩපිළිවෙළ යටතේ අඩු ආදායම්ලාභීන්ට රැකියා ලබාදෙන වැඩපිළිවෙළක් ක්‍රියාත්මක වුණා. එම ක්‍රියාවලිය කෙසේ වූවාද දන්නේ නෑ.මගේ කොට්ඨාසයේ මම පෞද්ගලිකව හඳුනන අසරණ මිනිස්සුන්ගේ නම් ඒ ලිස්ට් එකේ තිබුණේ නෑ. ඒ පිළිබඳ මම කනගාටුව ප්‍රකාශ කරනවා.

මීගහකිවුල ප්‍රාදේශීය සභාව

කේ.පී. බාලසුන්දරම් මහතා (එජාප) - රෝබේරිය, පිටමාරුව, වටගොම්මන ප්‍රදේශවලට අයත් සුසාන භූමි දවසින් දවස එක එක්කෙනා අල්ලගෙන යනවා . අන්තිමට මිනිස්සුන්ට මරණයක් වළ දාගන්නවත් තැනක් නැතිවෙන තත්ත්වයක් උදාවෙමින් පවතිනවා. විටි ලාම්පු ලබා දෙනවා කියලා කිව්වා. ඉදිරියේදී ඒ විටි ලාම්පුත් ලැබෙයි කියලා හිතනවා. අපේ ගමෙත් රජයේ රැකියා ලබා දෙන වැඩ සටහනේ දැන් ලැබිලා තියෙන නාමලේඛනයට වඩා අසරණ දුප්පත් ජනතාව ඉන්නවා.

සපිරි ගමක් වැඩසටහන යටතේ රෝබේරිය ප්‍රදේශයටත් ලක්ෂ 20ක වැඩසටහනක් ආවා. මා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ඇහුවම ඒ අය කියනවා යෝජනාවලින් හයයි අනුමත වෙලා ඇවිල්ල තියෙන්නෙ කියලා. ඒ ගැන සොයා බලන්න. මීගහකිවුල සිට පිටමාරුව දක්වා යනකොට 17 කණුව සිට 19 කණුව දක්වා පාර ගොඩක් අබලන් වෙලා. පුළුවන් නම් බැකෝ යන්ත්‍රය යොදා පාර සකස් කරලා දෙන්න.

වටගොම්මන රත්කැළේ මාර්ගය කිලෝමීටර් භාගයක පමණ ප්‍රමාණයක ගමන් කරන්න බෑ. ප්‍රධාන මාර්ගයත් කැඩිලා. රෝබේරියෙත් එහෙම පාරවල් තියෙනවා. ඒවාට බැකෝ යන්ත්‍රය දාලා පාර සකස් කරලා දුන්න නම් හොඳයි.

ආර්. එම්. නාමල් රත්නායක මහතා (ජවිපෙ) - වෙලාවකට හිතෙනවා සභාව තියෙන්නේ කුණු අදින්නයි, ගලි අදින්නයි විතරද කියලා. ඔබතුමා තමා සභාවේ සභාපතිවරයා. ඔබතුමාගේ පක්ෂයෙන් ජනාධිපතිවරයා, අගමැතිවරයා, කැබිනට් අමාත්‍යවරු පාර්ලිමේන්තුවෙත් බහුතර බලයක් ලැබිලා තියෙනවා. ඉතින් මේ අවස්ථාවේදී ප්‍රාදේශීය සභාව හුදකලා නොකර මෙය වැඩක් කළ හැකි ආයතනයක් ලෙස පෙන්නුම් කරන්න කටයුතු කරන්න.

රැකියා විරහිත උපාධිධාරීන්ට පත්වීම් 50,000ක් ලබාදුන්නා.ඒ පත්වීම් මැතිවරණ කොමසාරිස්තුමාගේ විධිවිධාන යටතේ මැතිවරණ හේතු පදනම් කරගෙන කල් දැම්මක් සිදු කළා. සමහර පිරිසක් රජයේ ආයතනවල පත්වීම් භාරගෙන දින කීපයක් වැඩටත් ගියා. එහෙත් ඊළඟට ඉදිරිපත් කරපු නාම ලේඛනයේ සමහර නම් නෑ. ජනාධිපතිතුමා කියන්නේ වගකීමක් අරගෙන හොඳ දැක්මකින් වැඩ කරන පුද්ගලයෙක්. ඒක ගැන සමාජයේ යම් අවබෝධයක් තිබ්බා.

කපිල ආනන්ද රාජපක්ෂ මහතා (එජාප) - අපේ සභාව සතු දේපළක් වන පුංචි ලෝකාන්තය කිසියම් ආයතනයක් විසින් අයුතු ලෙස භාවිතා කරනවා කියලා ආරංචියි. පුංචි ලෝකාන්තයේ සංවර්ධන කටයුතුවල වත්මන් තත්ත්වය දැන ගන්න කැමැතියි.

අපි ප්‍රාදේශීය සභාවට පත්වෙලා අපි අවුරුදු තුනකට ලගයි. අපි 17දෙනා එකතුවෙලා වෙනසක් නැතුව කටයුතු කරත් ආපහු මැතිවරණයකට යද්දී මිනිස්සු අපෙන් අහයි 17 දෙනා එකතු වෙලත් මොනාද ගමට කරේ කියලා. ඒ නිසා අපි ගමට යනකොට ගමක් විදිහට මේ දේ අපි කරා කියන්න පුළුවන් වාතාවරණයක් හදාගන්න ඕනි.

නන්දන සම්පත් උදය කුමාර (එජාප) - මම පසුගිය සභා වාරයේදී කිව්වා පුංචි ලෝකාන්තයේ තිබුණු ගැටලුවක් ගැන. පිටින් අය ඇවිත් කඳවුරු බඳින්න මුදල් අය කරනවා.ඒකට ගත්ත ක්‍රියාමාර්ග දැනගන්න කැමතියි.දැනටත් කීපදෙනෙක් සංචාරකයින්ට විවිධ පහසුකම් සපයනවා. අපිට පුළුවන් මේ අය සභාවේ ලියාපදිංචි කරලා වර්ෂයකට ආදායමක් ලැබෙන විදියට කටයුතු කරන්න.

සභාපති ලලිත් ජයවර්ධන (ශ්‍රීලපොපෙ) - පුංචි ලෝකාන්තය සම්බන්ධයෙන් බලය 90%ක් අපි වෙත ලබාගෙන තියෙනවා. අපි දැන් වැසිකිළි, පානීය ජල පහසුකම් දීලා තියෙන්නේ. ඒ නිසා දැන් ටිකට් කඩන්න හැකියාව තියෙනවා. පසුගිය දිනවල තිබුණු ගැටලු නිසා සිදු කිරීමට හැකියාව ලැබුණේ නෑ.

නන්දන සම්පත් උදය කුමාර (එජාප) - මොරහෙල පෙර පාසලකට යන්න ලැබුණා. පෙර පාසල අලුතින් ආරම්භ කරලා තියෙන්නෙ. කොරෝනා නිසා පෙර පාසල් වලට ලබාදුන් අත් සෝදන යන්ත්‍ර එයාලට ලැබිලා නෑ . ඒකත් පෙර පාසලක්. නම නෑ කියලා අතාරින්න බැරි නිසා ඒ අයටත් ලබාදෙමු.

සභාපති ලලිත් ජයවර්ධන (ශ්‍රීලපොපෙ) - එයාලා ලියාපදිංචි වෙලා නැද්ද? මුල් ළමාවිය සංවර්ධන නිලධාරිනියගෙන් තමයි පෙරපාසල් ලිස්ට් එක ඉල්ල ගත්තෙ.ඒ ලිස්ට් එකට අනුව තමයි අත් සෝදන යන්ත්‍ර ලබා දුන්නේ.

■ සිසිල ගුණතිලක - ගම්පහ දිස්ත්‍රික් විශේෂ, නිමල් ජයසිංහ - ගම්පහ සංචාරක, ඔලිවර් පෙරේරා - ගම්පහ මධ්‍යම සමූහ

යක්කල ලෝහ සංස්ථාව නැවත අරඹන්නැයි ඉල්ලීම්

❱ සභාපති රංජිත් ගුණවර්ධන (ශ්‍රීලපොපෙ)

යක්කල ලෝහ භාණ්ඩ සංස්ථාව මඟින් විශාල සේවයක් රටටම සිදු වුණා. එය වසා දැමීමෙන් රටට, ප්‍රදේශයට සිදු වූ පාඩුව ගැන නැවත වරක් සිතා අපේ රජය මගින් එය නැවත රජයට පවරා ගන්නා ලෙසත්, එය නැවත ආරම්භ කරන ලෙසත් එම ආයතනය සුරැකීමේ සංවිධානයක් මගින් ලිපියක් අප සභාවට ද එවමින් යෝජනා කර ඇතැයි ගම්පහ ප්‍රාදේශීය සභාවේ සභාපති රංජිත් ගුණවර්ධන මහතා (ශ්‍රීලපොපෙ) පැවැසීය.

සභාපතිවරයා එසේ පැවසුවේ ගම්පහ ප්‍රාදේශීය සභාවේ මාසික රැස්වීමට සහභාගි වෙමිනි. රැස්වීම ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේදී පැවැත්විණි.

ගම්පහ ප්‍රාදේශීය සභාව

ප්‍රේඩික් පුෂ්පලාල් පෙරේරා මහතා (එජාප)- වැලිවේරිය ප්‍රදේශයේ අක්‍රිය වීටී පහන් ගැන අවධානය යොමු කරන්න. හොඳ ප්‍රමිතියෙන් යුත් වීටී පහන් සවිකළ යුතුයි. ප්‍රමිතියෙන් තොර ලාභ භාණ්ඩ යෙදීමෙන් සභාවට පාඩුයි.

මානෙල් කරුණාවංශ මහතා (ශ්‍රීලපොපෙ)- අප ඉදිකළ ක්‍රීඩාංගණය නැවත ඉදිකළා. මංමාවත් 4ක් කාපට් කෙරෙව්වා. සතිපොළ අඩුපාඩු සපුරාලීමට ක්‍රියාකරනවා. අනවසර ඉදිකිරීම් ගැන බලනවා.

ජූඩ් සාන්ත මහතා (එජාප)- බොල්ලත ප්‍රසිද්ධ මාවතක කානු කැට යෙදීම අවශ්‍යයි. ප්‍රජාශාලාවේ විදුලිය ද විසන්ධි කරලා.

සභාපති- විසන්ධි කර ඇති විදුලිය ලබා දීමට කටයුතු යොදනවා. මන්ත්‍රීවරයා අඩුපාඩු ගැන කිව්ත් පසුගිය ආණ්ඩුව අපේ සභාවට සවලක්වත් ලබා දුන්නේ නෑ.

අංජන ශ්‍රීනාත් මහතා (ශ්‍රීලපොපෙ)- අඩු වශයෙන් බිම පිස දමන උපකරණයක්වත් ලබා දුන්නේ නෑ.

උපුල් ද අල්විස් මහතා(ශ්‍රීලපොපෙ)- ගණේමුල්ල සුමේධ මාවතේ ජලය රැඳෙන ස්ථාන ගැන ගැටලුව විසඳන්න. මේ නිසා පාර කැඩෙනවා. පාසල් යන සිසුන්ටත් මෙය බාධාවක් වෙලා. අප බල ප්‍රදේශයේ ක්‍රීඩා පිටිය සකසා දෙන්න. වාසනා ක්‍රීඩා පිටියේ පොදු වැසිකිළිය ද හැදිය යුතුයි. ගණේමුල්ල පැරැණි තැපැල් කාර්යාලය තිබූ තැන කැලෑව වැවිලා.

නැගෙනහිර කොස්සින්න සරුමණ්ඩිය ප්‍රදේශයේ ජල ව්‍යාපෘතිය ඉටුකර දීමට වාසුදේව ඇමැතිතුමා ක්‍රියාකළා. එයටත් තුති පුදනවා.

රේණුකා ශ්‍යාමලී පෙරේරා මහත්මිය (එජාප) - අද රටේ ජීවන තත්ත්වය උග්‍ර වී ඇත්තේ බඩු මිල අධික නිසයි.

ශ්‍යාමල් චින්තක මහතා (ශ්‍රීලපොපෙ)- මොරගොඩ පොදු සුසාන භූමිය පවිත්‍ර කරන්න. ප්‍රදේශයේ නිවාස අහිමි ග්‍රාමසේවා වසම් පහක එවැනි අය තෝරා නිවාස හදා දීමට ක්‍රියා කරනවා. මුදුන්ගොඩ පොදු ක්‍රීඩාංගණය සංවර්ධනය කරමු.

නිශාන්ත කුමුදු ප්‍රියදර්ශන මහතා (ශ්‍රීලපොපෙ)- ගණේමුල්ල නගරයේ ජල ගැලීම් සිදුවෙනවා. අනවසර ගොඩ කිරීම්, ඉදි කිරීම් ගැන අවධානය යොමු කරන්න.

සච්චිනි සෙව්වන්දි සේනාරත්න මහත්මිය (ශ්‍රීලපොපෙ)- වැලිවේරිය ආදාහනාගාරයෙන් පිටවන දුම යාබද ප්‍රදේශවාසීන්ට හානිදායකයි. ගල්ඔලුව හික්ගනමුල පාර සහ බෝක්කුවක් කැඩිලා.

■ දේව දෙවිනිස් ද සිල්වා - බූස්ස සමූහ

පළාත් සභාව ජේ. ආර්. අටවපු උගුලක්

❱ පියල් රංජන් (ශ්‍රීලපොපෙ)

අද වනතුරු පළාත් සභා මැතිවරණ තියන්න හෝ නොතියන්න තීරණයක් ගෙන නැහැ. හැකි ඉක්මනින් පැරැණි ක්‍රමයට හෝ නව ක්‍රමයට පළාත් සභා මැතිවරණය පැවැත්වීමට ජනාධිපතිතුමාගේ හා අගමැතිතුමාගේ අවධානය යොමු විය යුතු බවට මා යෝජනා කරනවායැයි රත්ගම ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඉඳුනිල් කෝරලගේ මහතා (ශ්‍රීලපොපෙ) පැවැසීය.

ඒ මහතා එසේ පැවසුවේ රත්ගම ප්‍රාදේශීය සභා රැස්වීමේදී ය. සභාපති ටී. නිමල් මහතාගේ (ශ්‍රීලපොපෙ) ප්‍රධානත්වයෙන් ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ දී රැස්වීම පැවැත්විණි.

රත්ගම ප්‍රාදේශීය සභාව

යුරේෂ් ධම්මික මහතා (ශ්‍රීලපොපෙ) - පළාත් සභාවටත්, ප්‍රාදේශීය සභාවටත් අයිති දේවල් තියෙනවා. පාලන තන්ත්‍රයට ලොකු අවහිරයක් කරන ආයතනයක් පළාත් සභාව. ඕනෑම ක්‍රියාවලියකදී සම්බාධකය වී තිබෙන්නේ මේක. මේක අනිවාර්යෙන්ම ඉවත් කළ යුතුමයි. රටේ සෞභාග්‍ය දැක්ම ජනතාව වෙනුවෙන් කරගෙන යෑමට ජනාධිපතිතුමාට බාධකයක් වී තිබෙන්නේ පළාත් සභාව. පළාත් සභාව අත්‍යාවශ්‍යයි කියන යෝජනාවට මා විරෝධය පළ කරනවා.

රුවන් ප්‍රීති කුමාර මහතා(ශ්‍රීලපොපෙ) - පළාත් සභා අවශ්‍යයි. අපට පාරට බහින්න වෙනවා. අනේ මේ පළාත් සභාව තියන්න කියලා.

සුජිත් චමින් කුමාර මහතා (ශ්‍රීලපොපෙ) - මේ පළාත් සභාව ඉන්දියාව වගේ රටකට වටිනවා. පළාත් සභාව අපේ රටට අවශ්‍ය නැහැ. එහෙත් එකවරම අහෝසි කිරීමත් ගැටලුවක්. මේක අයින් කරාම අපේ හිටපු මන්ත්‍රීවරුන් කොතනටද වැටෙන්නේ ?

නිශාන්ත කුමාර මහතා (ශ්‍රීලපොපෙ) -තමන් බලයට ගෙනාවේ කවුද කියන එක අමතක කිරීම කනගාටුවට කරුණක්.

පියල් රංජන් මහතා (ශ්‍රීලපොපෙ) - ජේ. ආර්. ජයවර්ධන මහත්තයා අටවපු උගුලක් මේ. අම්හිරි සිද්ධීන් ගොඩක් ඇති වෙලයි මේ පළාත් සභා බිහිවුණේ.

සභාපති ටී. නිමල් මහතා (ශ්‍රීලපොපෙ) - මේ පළාත් සභාවම ක්‍රියාත්මක වෙනවා නම් ඉදිරියේ දී ගැටලු රැසක් ඇතිවෙනවා.

දුලාජ් තරංග මහතා (එජාප) - ඕනෑම දෙයක් කරන්න ජනාධිපතිතුමාට තුනෙන් දෙකක බලයක් ලැබී තිබෙනවා.

ඉඳුනිල් කෝරලගේ මහතා (ශ්‍රීලපොපෙ) - අද මේ සභාව නීත්‍යානුකූල නැහැ. තමන්ගේ අභිමතය පරිදි සභාව රැස්වුණේ.

සභාපති ටී. නිමල් මහතා (ශ්‍රීලපොපෙ) - නීත්‍යානුකූල දින බැරිවුණා කියලා සභා සම්මත කරලා කරන්න පුළුවන්. සභා වාර්තාව කලින් හැදුවේ. සියලු දෙනාගෙන් සමාව ඉල්ලනවා. මින්පසු මේ වගේ දේවල් වෙන්නේ නැහැ. අද අලුත් ගොඩනැඟිල්ලේ ප්‍රථම වරට සභාව රැස් වෙන්නේ. අවුරුදු විස්සකට ආසන්න කාලයක් මම ප්‍රාදේශීය සභාවේ උප සභාපති, සභාපති ලෙස කටයුතු කළා. කලින් එකේ ඉන්න තැනක් තිබුණේ නැහැ. පහසුකම් කිසිවක් තිබුණේ නැහැ. දැන් සියලු පහසුකම් තිබෙන ගොඩනැඟිල්ලේ ලස්සන වගේම ජනතාව බලාපොරොත්තු වන වැඩත් හරියට පිළිවෙළට කෙරෙන්න ඕනෑ.

පියල් රංජන් මහතා(ශ්‍රීලපොපෙ) - තොටගමුව පාලමෙන් එහා දෙල්දූව දක්වා අයට අපහසුතා ඇති වෙනවා. ඔවුන්ට සාධාරණයක් ඉටු විය යුතුයි.

සභාපති ටී. නිමල් මහතා (ශ්‍රීලපොපෙ) -ඒ සඳහා වැඩපිළිවෙළක් මොහාන් ඇමතිතුමා සමඟ සාකච්ඡා කර ක්‍රියාත්මක කරනවා.

සම්පත් සුනන්ද මහතා (ශ්‍රීලපොපෙ) - පරිසර අධිකාරියේ කුණු ගඳ ගහන කොම්පෝස්ට් ව්‍යාපෘතියට අපි අකැමැතියි. පළාත් පාලන රාජ්‍ය ඇමැතිතුමා පොරොන්දු වූ පරිදි කසළ ප්‍රතිචක්‍රීකරණ යන්ත්‍රයක් ලැබේවි යැයි බලාපොරොත්තු වෙනවා.

සභාපති ටී.නිමල් මහතා (ශ්‍රීලපොපෙ) - ඒ ව්‍යාපෘතිය එක්ක අපේ සම්බන්ධයක් නැහැ. මැස්සෝයි ගඳයි එක්ක විතරයි අපි සම්බන්ධ.

පියල් රංජන් මහතා (ශ්‍රීලපොපෙ) - කුණු ප්‍රශ්නය පිළිබඳ පැහැදිලි විසඳුමක් දීමට කටයුතු කරන්න.

චමින්ද දර්ශන මහතා (ශ්‍රීලපොපෙ) - පරිසර අධිකාරිය ආරම්භ කර ඉවත් වුණා. අපේ කට්ටියක් මඟ හරිනවා. උසාවියට යන්නෙත් හතර පස් දෙනයි. පරිසර හානිය වළක්වන්න මීට වඩා අවධානයක් යොමු කරන්න.

යුරේෂ් ධම්මික මහතා (ශ්‍රීලපොපෙ) - ප්‍රාදේශීය සභාව තිබෙන තැන කියන්න අපහසුතාවක් ඉතිහාසයේ අපට තිබුණේ. දැන් මෙතනට එන කොට ලොකු අභිමානයක් ඇති වෙනවා. මාදම්පේ සිට තොටගමුවටත් මෙවැනි නවෝදයක් ඇති කරන්න.

සභාපති ටී.නිමල් මහතා (ශ්‍රීලපොපෙ) - බල ප්‍රදේශයේ ගම්මාන කීපයක සුනාමි අනතුරු පුවරු සවි කිරීමට පියවර ගෙන තිබෙනවා. දැනට අවසන් කර නොමැති මාර්ගවල ලේඛනයක් අවශ්‍ය වී තිබෙනවා සංවර්ධනය කිරීමට.

පියල් රංජන් මහතා (ශ්‍රීලපොපෙ) - සභාවේ අවසරයක් නැතිව ඉදිකර ඇති උස් තාප්ප කඩා වැටුණොත් මඟීන්ට ලොකු අනතුරක් විය හැකියි.

සභාපති - අනවසර ඉදිකිරීම් අනිවාර්යෙන්ම කඩනවා.

■ එස්.එම්. ෆාරුක් - වැලිමඩ විශේෂ

ප්‍රදේශයේ ජල උල්පත් හිඳිලා: පයිනස් හා ටර්පන්ටයින් වගා කිරීම නවත්වනවා

❱ පාර්ලිමේන්තු මන්ත්‍රී මේජර් සුදර්ශන දෙනිපිටිය

පයිනස් වගාව නිසා මධ්‍යම කඳුකරයේ ජල උල්පත් හා ජල මූලාශ්‍ර සිඳී යෑමේ තර්ජනයකට ලක්වී ඇති බැවින් මින් ඉදිරියට බදුලු දිස්ත්‍රික්කයේ පයිනස් හා ටර්පන්ටයින් අලුතින් වගා නොකිරීමට තීරණය කළ බව බදුල්ල දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපති පාර්ලිමේන්තු මන්ත්‍රී මේජර් සුදර්ශන දෙනිපිටිය කීය.

ඔහු එසේ පැවසුවේ බදුල්ලේ දී පැවති මාධ්‍ය හමුවකදී ය.

මන්ත්‍රීවරයා මෙසේ ද කීය. දැනට වසර තිහ හතළිහකට පමණ පෙර බදුල්ල දිස්තික්කයේ කඳුකර ප්‍රදේශවල දක්නට තිබූ ජල උල්පත් කුඩා කඳුරු කුඩා දියඇලි හා දිය කඩිති මේ වන විට මුළුමනින්ම සිඳී ගොස් තිබෙනවා. මෙයට ප්‍රධානම හේතුව වී තිබෙන්නේ පයිනස් හා ටර්පන්ටයින් වගාව බව පර

කොරෝනා නිසා බිඳ වැටුණු මෙරට සංචාරක කර්මාන්තය නංවන්න එ.ජා. සංවිධානයේ සහාය

මහින්ද අලුත්ගෙදර

ඒ අනුව කොරෝනා වසංගතය හේතුවෙන් බිඳ වැටී තිබෙන ශ්‍රී ලංකාවේ සංචාරක කාර්මාන්තය නංවාලීම සඳහා සිය පූර්ණ සහාය පළ කරන බවට එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් මෙරට සංචාරක සංවර්ධන අධිකාරිය වෙත දැනුම් දී තිබේ.

සංචාරක ඇමැති ප්‍රසන්න රණතුංග මහතා සහ එක්සත් ජාතීන්ගේ මෙරට නිත්‍ය නියෝජිත හැනා සිංගර් මහත්මිය අතර පෙරේදා (14) පැවැති විශේෂ සාකච්ඡාවේදී මේ බව අවධාරණය කෙරිණි. මෙම විශේෂ සාකච්ඡාව සංචාරක අමාත්‍යාංශ කාර්යාලයේදී පැවැත්විණි.

සංචාරක ව්‍යාපාරයේ නිරත පුද්ගලයන් වෙනුවෙන් සමාජ ආකර්ෂණ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීම සඳහාද සිය සහාය හිමි වන බව හැනා සිංගර් මහත්මිය මෙහිදී ප්‍රකාශ කළ අතර ඇමැති ප්‍රසන්න රණතුංග මහතා සඳහන් කළේ මේ සම්බන්ධයෙන් දැනටමත් ශ්‍රී ලංකා රජයේ අවධානය යොමුකර ඇති බවයි. එක්සත් ජාතීන්ගේ සංවිධානය මඟින් ඉදිරිපත් කළ සංචාරක කාර්මාන්තය නංවාලීම සඳහා වන යෝජනාවලිය සම්බන්ධයෙන්ද සංචාරක සංවර්ධන අධිකාරිය සිය අවධානය යොමු කර ඇති බව ප්‍රසන්න රණතුංග මහතා පෙන්වා දුන්නේය.

කොවිඩ් 19 පාලනය කිරීමෙන් අනතුරුව මෙරටට සංචාරකයන් කණ්ඩායම් වශයෙන් සෞඛ්‍ය නිර්දේශ අනුව ගෙන්වා ගැනීමට සැලසුම් කර ඇති බව පෙන්වා දුන් ඇමති ප්‍රසන්න රණතුංග මහතා කොවිඩ් 19 තුන් වැනි රැල්ල පාලනය කිරීමට රජය සිය උපරිමයෙන් කටයුතු කරමින් සිටින බවද කීවේය. මේ අතර එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මෙරට නියෝජිත හැනා සිංගර් මහත්මිය අවධාරණය කළේ කොවිඩ් 19 පාලනය සඳහා රජය ගෙනයන වැඩපිළිවෙළට සිය ප්‍රසාදය පළකරන බවයි.

අන්තර්ජාතික කම්කරු සංවිධානය හා සංක්‍රමණිකයන් පිළිබඳ ජාත්‍යන්තර සංවිධානය මඟින් සංචාරක හා ගුවන් සේවා ක්ෂේත්‍ර සඳහා ලබාදෙන සහාය සම්බන්ධයෙන්ද දෙපාර්ශ්වය අතර දීර්ඝ ලෙස සාකච්ඡා කෙරිණි.

මෙම සාකච්ඡාව සඳහා සංක්‍රමණිකයන් සඳහා වූ ජාත්‍යන්තර සංවිධානයේ ශ්‍රී ලංකා හා මාලදිවයින ප්‍රධානී සරත් ඩාෂ්, සංචාරක අමාත්‍යාංශයේ ලේකම් එස්. හෙට්ටිආරච්චි, රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් මාධව දේවසුරේන්ද්‍ර මහත්වරුද එක් වූහ.

කොවිඩ් 19 උවදුර හමුවේ වුවද භාණ්ඩාගාර බිල්පත්වලට අධික ඉල්ලුමක්

ජයසිරි මුණසිංහ

කෝවිඩ් 19 ගෝලීය වසංගතය දෙවැනි රැල්ල හමුවේ රාජ්‍ය ණය වෙළෙඳපොළ තරමක් තිගැස්සී සිටියදී පවා ශ්‍රී ලංකා මහ බැංකුව පෙරේදා (14) පවත්වන ලද භාණ්ඩාගාර බිල්පත් වෙන්දේසියේදී ඒ සඳහා දැඩි ඉල්ලුමක් පැවැතිණි.

ඒ අනුව රුපියල් මිලියන 40,000ක් ලබා ගැනීම සඳහා ඉල්ලුම්පත් කැඳවූ අතර ඒ සඳහා රුපියල් මිලියන 79,244 තරම් අධික ඉල්ලුමක් පැවති බව මහ බැංකුවේ රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව සඳහන් කරයි.

දින 91කින් කල් පිරෙන භාණ්ඩාගාර බිල්පත් රුපියල් මිලියන 9000ක් ලබා ගැනීමේ ඉලක්ක කොට වෙළෙඳපොළට ඉදිරිපත් කළ අතර ඒ සඳහා රුපියල් මිලියන 9000කම ලන්සු ලැබිණි. එනමුත් මින් රුපියල් මිලියන 1600ක් පිළිගැනීමට ශ්‍රී ලංකා මහ බැංකුව කටයුතු කළ බව රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව පවසයි.

දින 182කින් කල් පිරෙන රුපියල් මිලියන 15,000ක් ලබා ගැනීමේ අපේක්ෂාවෙන් ඉදිරිපත් කළ බිල්පත් සඳහා රුපියල් මිලියන 24,815කට අධික ඉල්ලුමක් පැවතිණි. මින් ණය දෙපාර්තමේන්තු පිළි ගත්තේ රුපියල් මිලියන 12,665ක් තරම් ප්‍රමාණයකි.

ඊට අමතරව රුපියල් මිලියන 16,000ක් ලබා ගැනීමේ අරමුණින් දින 364කින් කල්පිරෙන බිල්පත් ඉදිරිපත් කළ අතර ඒ සඳහා රුපියල් මිලියන 45,429ක ලංසු හිමි විය. මේ අතුරින් ණය දෙපාර්තමේන්තු පිළිගනු ලැබුවේ මිලියන 25,735 ක ලංසු ප්‍රමාණයකි.

දින 91කින් කල් පිරෙන භාණ්ඩාගාර බිල්පත් සඳහා සියයට 4.59 පොලියක්ද, දින 182කින් කල් පිරෙන ඒවාට සියයට 4.71ක්ද, සියයට 4.99 පොලිය ලෙස දින 364කින් කල් පිරෙන බිල්පත් සඳහාද ගෙවීමට මහ බැංකුව සූදානම් බව රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව සඳහන් කරයි.

බඩල්කුඹුරේදී කුඩු සමඟ සහෝදරයෝ දෙදෙනකු අත්අඩංගුවට

ඩී.එස් ගුණතිලක
ඌව වෙල්ලස්ස විශේෂ

බඩල්කුඹුර පොලිස් බල ප්‍රදේශයේ අබලන්ද - කරවිල ප්‍රදේශයේදී බඩල්කුඹුර පොලිසිය මඟින් පසුගියදා (13) සිදු කළ වැටලීමකදී හෙරොයින් ග්‍රෑම් 04යි මිලිග්‍රෑම් 250ක් සමඟ සැකකරුවන් දෙදෙනකු අත්අඩංගුවට ගෙන තිබේ.

මෙම සැකකරුවන් දෙදෙනා වයස අවුරුදු 24 සහ 22 වියෙහි පසුවන එකම පවුලේ සහෝදරයන් (අයියා සහ මල්ලී) බව පොලිස් පරීක්ෂණවලදී අනාවරණය වී ඇත.

අත්අඩංගුවට ගත් එක් සැකකරුවකු ළඟ තිබී හෙරොයින් ග්‍රෑම් 02යි මිලිග්‍රෑම් 110ක්ද අනෙක් සැකකරු ළඟ තිබී හෙරොයින් හෙරොයින් ග්‍රෑම් 02යි මිලිග්‍රෑම් ග්‍රෑම් 140ක්ද සොයා ගෙන ඇති අතර සැකකරුවන් 14 වැනිදා මොනරාගල මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමට නියමිතව තිබිණි.

බඩල්කුඹුර පොලිසියේ පොලිස් ස්ථානාධිපති සුනිල් දිසානායක මහතා ඇතුළු නිලධාරීන් කණ්ඩායමක් විසින් වැටලීම කර ඇත.

රාජ්‍ය නැටුම් හා සංගීත කණ්ඩායම් සඳහා ශිල්පීන් බඳවා ගැනීම ඇරැඹේ

උපාලි කරුණාරත්න

රාජ්‍ය නැටුම් හා සංගීත කණ්ඩායම් සඳහා ශිල්පීන් බඳවා ගැනීමට සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව කටයුතු යොදා තිබේ.

මේ සඳහා අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය මෙම මස 23 දක්වා දීර්ඝ කර ඇති අතර අදාළ අයදුම්පත් අධ්‍යක්ෂ, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, 08 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු බව සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව පැවසීය.

නැටුම් කණ්ඩායම් සඳහා අයදුම්කරන්නන්ගේ වයස් සීමාව අවුරුදු 18 - 25 වන අතර, සංගීත කණ්ඩායම් සඳහා අයදුම් කරන්නන්ගේ වයස 18 - 45 විය යුතුය. බඳවා ගැනීමේදී යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය හා වෘත්තීය පරීක්ෂණ සඳහා ඉදිරිපත්විය යුතු අතර එම පරීක්ෂවල ලකුණු අනුව බඳවා ගැනීම් කෙරේ.

වැඩි විස්තර 0112882637 දුරකතන අංකයෙන් හෝ www.culturaldept.gov.lk වෙබ් අඩවියෙන් හෝ www.facebook.com / culturaldept.gov.lk ෆේස්බුක් පිටුවට පිවිසීමෙන් ගත හැක.

මහා භාරකාර තනතුරට ගනේෂ් ආර්. ධර්මවර්ධන

ගනේෂ් ආර්. ධර්මවර්ධන මහතා ඊයේ (15) මහා භාරකාර තනතුරේ වැඩ බාර ගත්තේය. ඒ මහතා මහා සංඝරත්නයේ ආශීර්වාද මධ්‍යයේ, සුබ මොහොතින් එම තනතුරේ වැඩ බාර ගත් අතර එම අවස්ථාවට පාර්ලිමේන්තු මන්ත්‍රී ප්‍රේමිනාත් සී. දොළවත්ත මහතාද සහභාගී විය.

ඡායාරූපය - රංජිත් අසංක

කොවිඩ් 19 ආසාදිතයන් සමාජයෙන් කොන් නොකළ යුතුයි

කොළඹ නීතිඥ සංගමය

චන්දිමා කරුණාරත්න

කෝවිඩ් - 19 වයිරස් තත්ත්වය පැතිරීම පාලනය කිරීමට සෞඛ්‍ය ආරක්ෂණ ක්‍රමවේද හා යහපත් සෞඛ්‍ය පුරුදු අනුගමනය කළ යුතු බවත් සමාජ ආකල්පමය වශයෙන් දියුණු පිරිසක් වශයෙන් කෝවිඩ් - 19 වයිරස් ආසාදිතයන් සමාජයෙන් කොන් කිරීමෙන් වැළකී, ඔවුන් නිරෝධායන කටයුතුවලට දායක කිරීම අවශ්‍ය බවත් කොළඹ නීතිඥ සංගමය පවසයි.

කෝවිඩ් ආසාදිත රෝගීන්ගේ ගරුත්වය හා මානව හිමිකම් ආරක්ෂාවන සමාජයක් ගොඩනැඟීම මෙහිදී අත්‍යාවශ්‍ය කාරනාවක් බවත් එම සංගමයේ සභාපති විජය ගමගේ මහතා ප්‍රකාශ කරයි.

කෝවිඩ් - 19 වයිරස් තත්ත්වය පැතිරීම පාලනය කිරීම සඳහා රජය, සෞඛ්‍ය අංශ, ආරක්ෂක අංශ හා පොදු මහජන නිලධාරීන් සියලු දෙනා කරන කැපකිරීම ප්‍රශංසනීය බවත් එම සංගමය පවසයි.

දැනට පවතින තත්ත්වය යටතේ මේ වසංගත තත්ත්වය සමාජයේ විවිධ රැකියාවන්වල නිරතවන පුද්ගලයන් අතර පැතිරෙමින් පවතින බවක් දක්නට ඇති බවත් මෙලෙස හමුවන රෝගීන් සම්බන්ධයෙන් විදුත් හා මුද්‍රිත මාධ්‍යයන් හරහා සිදුකරන ප්‍රචාරණය නිසා වෘත්තීය ආචාරධර්ම උල්ලංඝනය වන තත්ත්වයක් දක්නට ඇති බවත් සඳහන් කරයි.

මාධ්‍ය හරහා කරන ඇතැම් ප්‍රචාරණ කටයුතු නිසා කෝවිඩ් ආසාදිතයන් සම්බන්ධව සමාජයේ පවතින සෘණාත්මක ආකල්පයන් නිසා රෝගීන් නිරෝධායන කටයුතු හා ප්‍රතිකාර සඳහා යොමු නොවීමේ ප්‍රවණතාවක් පවතින බව විජය ගමගේ මහතා කීවේය. වයිරස ව්‍යාප්තිය අවම කිරීමට නිසි සෞඛ්‍ය ආරක්ෂණ ක්‍රමවේද හා යහපත් සෞඛ්‍ය පුරුදු අනුගමනය කළ යුතු බවත් සමාජ ආකල්පමය වශයෙන් දියුණු පිරිසක් වශයෙන් කෝවිඩ් - 19 රෝගය වැළඳුණු පිරිස් සමාජයෙන් කොන් නොකර, ඔවුන් නිරෝධායන කටයුතුවලට දායක කරගැනීම අවශ්‍ය බවත් එම සංගමය පෙන්වා දෙයි.

ඒ නිසා කෝවිඩ් ආසාදිතයන් හඳුනාගැනීමත් සමඟ ඔවුන්ට වරදකාරී අදහස් යොමුකිරීම, සමාජයෙන් කොන් කිරීම, උපහාසයට හා අපහසුතාවයට ලක් කිරීම ආදී කටයුතුවලින් වැළැකී මානව ගරුත්වය හා මානව හිමිකම් ආරක්ෂාවන අයුරින් කටයුතු කළ යුතු බවත් ඒ හරහා කෝවිඩ් වයිරස් තත්ත්වය පැතිරීම පාලනය කිරීමෙන් රටත් ජනතාවත් ආරක්ෂා කරගැනීමට හැකි වන බවත් එම සංගමයේ සභාපති විජය ගමගේ මහතා වැඩිදුරටත් පවසයි.

වගා ඉතිහාසයේ වැඩිම ඉඩම් ප්‍රමාණයක් වගා කරන්නේ මෙවර මහ කන්නයේ

අමෝදා ජයමහ

2020 මහ කන්නය මෙරට වගා ඉතිහාසයේ වැඩිම ඉඩම් ප්‍රමාණයක් වගා කරන වර්ෂය ලෙස සටහන් වන බව පරිසර ඇමැති මහින්ද අමරවීර මහතා පැවසුවේ ය.

ඇමැතිවරයා මේ බව පැවසුවේ පරිසර අමාත්‍යංශයේ ඊයේ (15) පැවති මාධ්‍ය හමුවකට එක් වෙමිනි.

තවදුරටත් ඇමැතිවරයා මෙසේද පැවසීය.

ජනාධිපතිවරයා ගොවියාට තම අස්වැන්නට නිසි මිලක් ලබාදෙන බවට විශ්වාසයක් ලබා දී තිබෙන නිසාම මේ වනවිට පුරන්ව ගිය කුඹුරු පවා නැවත අස්වැද්දීමට ජනතාව ආරම්භ කර තිබෙනවා.

ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ සෞභාග්‍යයේ දැක්ම වැඩපිළිවෙළ යටතේ මෙරට නිපදවිය හැකි එහෙත් දැනට පිටරටින් ආනයනය කරන සියලු භෝග මෙරට වගා කිරීමට ජනාධිපතිවරයා ලබාදුන් උපදෙස් අනුව මේ වන විට වගා කටයුතු ආරම්භ කර තිබෙනවා.

අක්කර තිහ හතළිහ ඉඩම් හිමි පුද්ගලයන් ද ආණ්ඩුව ගත් තීරණ නිසාම සිය ඉඩම් තුළ වගාවන් සිදු කිරීම ආරම්භ කර තිබෙනවා. සිය පෞද්ගලික ඉඩම් මේ ආකාරයට වගාවට යෙදවීම සමාජය තුළ සිදුව ඇති ඉණාත්මක පෙරළියක්.

රට සෑම අතකින් ස්වයංපෝෂිත කිරීමේ ජනාධිපතිවරයාගේ දැක්ම ඉදිරියට යමින් තිබෙනවා.

ඇමැති රමේෂ් පතිරණ වක්වැල්ල ජල පිරිපහදු මධ්‍යස්ථානයේ හදිසි සංචාරයක

දකුණු පළාත් විශේෂ
ප්‍රභාත් විතානච්චි

වැවිලි කර්මාන්ත ඇමැති වෛද්‍ය රමේෂ් පතිරණ මහතා ඊයේ (15) වක්වැල්ල ජල පිරිපහදු මධ්‍යස්ථානයේ හදිසි සංචාරයක නිරත විය. ගාල්ල දිස්ත්‍රික්කයේ ජනතාවට පවතින උග්‍ර ප්‍රශ්නයක් වන පානීය ජලය හිඟකමට විසඳුම් වශයෙන් ජල පිරිපහදු මධ්‍යස්ථානය පිළිබඳ සොයා බැලීමට ඇමැතිවරයා කටයුතු කළේය.

එහිදී එම ස්ථානයේ නිලධාරීන් සමග සාකච්ඡා කර එම මධ්‍යස්ථානයේ අබලන්ව ඇති පැරණි යන්ත්‍ර සූත්‍ර හේතුවෙන් ඇති වන ජලය විසන්ධි වීම වළක්වා ගැනීම සඳහා නව යන්ත්‍ර සවි කිරීමට අවශ්‍ය කටයුතු පිළිබඳ නිලධාරීන් දැනුම්වත් කළේය.

ලේක්හවුස් හිටපු ත්‍රිකුණාමලය වාර්තාකරු
කේ. ඩී. ජයසේකර මහතාගේ තෙමස් පූර්ණ පින්කම

ලේක්හවුස් ආයතනයෙන් 'ඩේලි නිවුස්' පුවත්පතේ ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ප්‍රථම වාර්තාකරු වූ කේ. ඩී. ජයසේකර මහතා මියගොස් මේ මස 17 වැනි දිනට තෙමසක් සපිරේ. ත්‍රිකුණාමලය සාන්ත ජෝශප් විද්‍යාලයේ ඉංග්‍රීසි මාධ්‍යයෙන් අධ්‍යාපනය හැදෑරූ ඒ මහතා රාජකීය ගුවන් හමුදාවේත්, රාජකීය - නාවික හමුදාවේත් සේවය කොට ඇත.

පසුව ඉන් ඉවත් වී 1953 වසරේදී ලේක්හවුස් ආයතනයට සම්බන්ධ වූයේ 'සිලෝන් ඩේලි නිවුස්' පුවත්පතේ ත්‍රිකුණාමලය වාර්තාකරු ලෙසිනි.

විදෙස් රටවලින් මුද්දර හා මුල් දින කවර ගෙන්වූ ඒ මහතා, සිහිවටන කවර මුද්‍රණය කොට මුද්දර සමාජයක් පිහිටුවා 'සිලෝන් පිලටෙලික්' නමින් මුද්දර තොරතුරු ඇතුළත් සඟරාවක්ද මුද්‍රණය කොට විදෙස් රටවලට යැවීමටද කටයුතු කළේය.

ලේක්හවුස් ආයතනයේ සිංහල - දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය පුවත්පත්වලට ප්‍රවෘත්ති සැපයූ ඒ මහතා ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ හා රූපවාහිනී සංස්ථාවේද ත්‍රිකුණාමල දිස්ත්‍රික් වාර්තාකරු විය. ඊට අමතරව 'රොයිටර්', 'ප්‍රංශ පුවත්', 'ලංකා පුවත්' වැනි ජාත්‍යන්තර මාධ්‍යවලටත් 'ඒෂියා වීක්' සඟරාවටත් ප්‍රවෘත්ති සැපයීය.

මීට පස් වසරකට පෙර මියගිය බන්දුවතී ජයසේකර මහත්මියගේ ස්වාමිපුරුෂයා වූ ජයසේකර මහතා දියණියන් තිදෙනකුගේ පියෙකි. මානෙල් ජයසේකර (වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව), තක්ෂිලා ජයසේකර (ලේක්හවුස් - මාංචු පුවත්පතේ කර්තෘ), විශාඛා ජයසේකර (හිටපු මාධ්‍යවේදිනී), වෛද්‍ය උපුල් වාසල (බෑණා), චන්දිප් වාසල - මුණුපුරා (නාලන්දා විද්‍යාලය) ඔහු සිහිකොට අතුරුගිරිය, මිලේනියම් සිටි හි පිහිටි නිවෙසේ පිංකම් මාලාවක් පැවැත්වීමට කටයුතු යොදා ඇත.

නීති විරෝධී ක්‍රියාවල නිරත වූ සැකකරුවන් 311ක් අත්අඩංගුවට

රක්ෂණ ශ්‍රියන්ත

බස්නාහිර පළාත තුළ සිදුකළ විශේෂ වැටලීම්වලින් දිනක් තුළ සැකකරුවන් 311ක් අත්අඩංගුවට ගෙන ඇත.

හෙරොයින් ඇතුළු මත් ද්‍රව්‍ය විශාල ප්‍රමාණයක් මෙන්ම ගණිකා නිවාසයක් පවත්වාගෙන ගිය සැකකරුවන් අත්අඩංගුවට ගැනීමට හැකිව තිබේ. හෙරොයින් ග්‍රෑම් 85 මිලි ග්‍රෑම් 206ක් සමඟ සැකකරුවන් 110ක්,ගංජා ග්‍රෑම් 329ක් මිලි ග්‍රෑම් 710ක් සමඟ සැකකරුවන් 73ක්, නීති විරෝධී මත් පැන් බෝතල් 441ක් සමඟ සැකකරුවන් 87ක්, ගෝඩා බැරල් 15ක් සමඟ සැකකරුවන් 7ක්, අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 31 මිලි ග්‍රෑම් 860ක් සමඟ සැකකරුවන්14ක් අත්අඩංගුවට ගෙන ඇත. එසේම මාවා මලි ග්‍රෑම් 189000ක්, නීති විරෝධී සිගරට් 216ක්, බල පත්‍ර නොමැතිව වැලි ප්‍රවාහනය කිරීම් දෙකක්, බලපත්‍ර නොමැතිව විකිණූ බියර් බෝතල් 12ක්, නීති විරෝධී රා සහ මත් පෙති සමඟ සැකකරුවන් 20ක් සහ ගණිකා නිවාසයක් වටලා සැකකරුවෙකු සහ සැකකාරියක අත්අඩංගුවට ගෙන තිබේ.

බොරැල්ල පොලිස් වසමේ දී හෙරොයින් ග්‍රෑම් 10 මිලි ග්‍රෑම් 520ක් සමඟ සැකකරුවකුද, මෝදර පොලිස් වසමේ දී හෙරොයින් ග්‍රෑම් 07 මිලි ග්‍රෑම්150ක් සමඟ සැකකාරියක්ද, බොරැල්ල පොලිස් වසමේදී හොරොයින් ග්‍රෑම්05 මිලි ග්‍රෑම් 860ක් සමඟ සැකකාරියක ද අත්අඩංගුවට ගෙන ඇත.

මහ පාරේ රේස් ගිය යතුරු පැදිකරුවන් දෙදෙනාට තුවාල

රක්ෂණ ශ්‍රියන්ත

ප්‍රධාන මාර්ගයේ රාත්‍රීයේ යතුරු පැදිවලින් රේස් ගිය යතුරු පැදිකරුවන් දෙදෙනකු පාණදුර උතුර පොලිස් ස්ථානාධිපතිවරයාගේ ජීප් රථයේ ගැටී බරපතල තුවාල ලබා ඊයේ (15) කොළඹ ජාතික රෝහලට ඇතුළත් කර ඇත. ඊයේ (15) අලුයම නීති විරෝධී යතුරු පැදි ධාවන තරගයක් පැවැත්වෙන බවට පානදුර උතුර පොලිස් ස්ථානයට ලද තොරතුරක් මත, ස්ථානාධිපතිවරයා එම ස්ථානයට ගොස් තිබූ ඇති අතර පොලිස් ජීප් රථය මාර්ගයේ නතර කර ඉදිරියට යමින් සිටි දී එක් යතුරුපැදියක් ස්ථානාධිපතිවරයාගේ ජීප් රථයේ ගැටී ඇත. අනෙක් යතුරුපැදිය වේගය පාලනය කර ගත නොහැකිව පොලිස් ජීප් රථයේ ගැටී අනතුරට ලක්ව ඇති බව පොලිසිය පවසයි. අනතුරින් බරපතළ තුවාල ලැබූ ස්ථානාධිපතිවරයා හා යතුරු පැදිකරුවන් දෙදෙනා කොළඹ ජාතික රෝහලට ඇතුළත් කර තිබේ.

ජනතා මණ්ඩපය

■ ජනතා මණ්ඩපය, දිනමිණ, ලේක්හවුස්, කොළඹ 10
■ ෆැක්ස් 2429220 ■ ඊ මේල් - janathamadapayaancl@gmail.com

පාරට ස්තූතියි

අත්තනගල්ල ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ උදම්විට රාමනායක මාවතේ 3 වන පටුමග සහ ඒ අවට තවත් මාර්ග දෙකක් කොන්ක්‍රීට් අතුරා වැඩ නිම කර ඇත. මේ සඳහා තම දායකත්වය ලබා දුන් ප්‍රාදේශීය සභාවේ සභාපති ප්‍රියන්ත පුෂ්පකුමාර මහතාට සහ සම්පත් අකුරැවිය මහතාට ප්‍රදේශවාසීන්ගේ ස්තූතිය මෙසේ පුද කරන්නෙමු.

ප්‍රදේශවාසී ජනතාව

ගුරු වැටුප් විෂමතාව ගැටලුවක්

දැනට ක්‍රියාත්මක විදුහල්පති හා ගුරු සේවා ව්‍යවස්ථාවල ඉතාමත් කඩිනමින් සිදු කළ යුතු සංශෝධනයන් සිදු කිරීම ප්‍රමාද කිරීම. (2008-09-08 හා 2008-10-06 දිනවලදී SCFR/282/8 නඩුව විභාගයේදී දුන් එහෙත් එක් නොකළ සහන කීපයක් එක් කළ යුතුව ඇත.) මේ පිළිබඳව 2020-07-14 දින අධ්‍යාපන ලේකම්තුමා ඇතුළු නිලධාරීන් සමඟ අදාළ සංශෝධනය විය යුතු කරුණු ඉදිරිපත් කරමින් සාකච්ඡා කළ මුත් ඉදිරි පියවර පිළිබඳව දැනුවත් කර නොමැත. නැවත සාකච්ඡාවක් ඉල්ලුම් කර ලිපි කිහිපයක් යොමු කළද මෙතෙක් පිළිතුර දී නැත.

1994 දී 1997 දී ඇතිවී ක්‍රමයෙන් රාජ්‍ය පරිපාලන වැටුප් චක්‍රලේඛ 15/2003, 9/2004, 6/2006, 3/2016 චක්‍රලේඛ මඟින් වැඩි දියුණු වූ විදුහල්පති හා ගුරු වැටුප් විෂමතා ඉවත් කිරීමට එම සේවාවන් සංවෘත සේවාවන් බවට පත් කරන බවට පොරොන්දු දී ඇත. එහෙත් එම කටයුතු ප්‍රමාද විය හැකි බැවින් කැබිනට් පත්‍රිකාවක් පවා ඉදිරිපත් කර ඇති අතුරු වැටුප් දීමනා ලබා දීමේ කටයුත්ත ද, ප්‍රමාද වෙමින් පවතී. ඒ පිළිබඳව දැනුවත් කිරීම් ද නැත.

2016-01-01 දින සිට 3/2016 රාජ්‍ය පරිපාලන වැටුප් චක්‍රලේඛයෙන් කරන ලද රාජ්‍ය සේවක වැටුප් වැඩි කිරීමට අදාළව 2016-01-01 සිට 2019-12-31 දක්වා අතර කාලය තුළ විශ්‍රාම ගිය රාජ්‍ය සේවකයින්ට හිමි විශ්‍රාම වැටුප රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 35/2019 (1) න් අත්හිටුවීම නිසා එම කාලය තුළ විශ්‍රාම ගිය විදුහල්පතිවරුන්ටත්, ගුරුවරුන්ටත් දැඩි අසාධාරණයක් සිදු වී ඇත. මේ ගැන අදාළ නිලධාරීන්ගේ අවධානය පිණිසය.

විදුහල්පති හා ගුරු සංගම් එකමුතුව

සෞඛ්‍ය අමාත්‍යාංශයේ අවධානයට : වෑතර දිසා රෝහලේ බාහිර අංශය

වෑතර දිසා රෝහල කහතුඩුව අධිවේගී මාර්ගය අසල පවතින 120 මහා මාර්ගයට මුහුණලා පවතින රෝහලකි. අතීතයේ පටන්ම රෝගීන්ගේ ජනාදරයට පත් වූ රෝහලකි. මෙම රෝහලට දිනකට 500 කට ආසන්න ප්‍රමාණයක් බාහිර රෝගීන් පැමිණෙන අතර වෛද්‍ය සායන සඳහා දිනකට 200 කට ආසන්න පිරිසක් පැමිණේ. මේ වන විට මෙම ආයතනයේ විශේෂඥ වෛද්‍යවරුන් ද සිටින අතර පසුගිය කොවිඩ් සමයේදී මෙම රෝහල කොවිඩ් රෝගීන් සඳහා භාවිතා කිරීමට අවශ්‍ය බව පවසමින් බාහිර රෝගී අංශය දිරාපත්ව පවතින ගොඩනැගිල්ලක් වන අංක 01 වාට්ටුව පැවති ගොඩනැගිල්ලට තාවකාලිකව ගෙන යන ලදි.

මෙම ගොඩනැගිල්ල විධිමත් ආලෝකයකින් තොර වන අතර වාට්ටුව දෙකට බෙදා එක කොටසක වෛද්‍යවරුන් ප්‍රතිකාර කරන අතර අනිත් කොටස ඖෂධාගාරය ලෙස භාවිතා කරනු ලබයි. තිබෙන කුඩා ඉඩකඩෙහි වෛද්‍යවරුන් 06 දෙනෙකු පමණ ප්‍රතිකාර දෙනු ලබන අතර ඖෂධාලයේ කවුන්ටර 02 ක් තුළින් ඖෂධ සංයෝජකවරුන් තිදෙනෙකු ඖෂධ නිකුත් කරනු ලබයි. ඖෂධාලය හා වෛද්‍යවරුන්ගේ මේස පවා වැසි දිනවලට තෙමෙන අතර, ඖෂධ තෙමීම නිසා ඖෂධවල ගුණාත්මකභාවය ද අඩුවනු ඇතැයි රෝගීන් වන අපට සිතේ. එමෙන්ම රෝගීන් සඳහා හිඳ ගැනීමේ හෝ නැවතී සිටීමේ කිසිම පහසුකමක් නොමැති අතර රෝගීන්ට කොරිඩෝවේ සිටගෙන වැහි හිරිකඩට තෙමෙමින් සිටීමට සිදුව ඇත. රෝගීන්ගේ පෞද්ගලිකත්වය ආරක්ෂා වන ආකාරයට රෝගී පරීක්ෂක ඇඳක්වත් තබාගැනීමට සුදුසු ස්ථානයක් දැනට බාහිර රෝගී අංශය පවතින ස්ථානයේ නැත. ඇඳට දමා පරීක්ෂා කළ යුතු රෝගීන් හදිසි ප්‍රතිකාර ඒකකය වෙත යැවීමට වෛද්‍යවරුන් ක්‍රියාකරනු අප දැක ඇත. එමෙන්ම වෛද්‍ය සායනය සඳහා ද රෝගීන් පරීක්ෂා කිරීමේ ස්ථානයක් මේ වන විට නොමැති අතර වෛද්‍යවරුන් ඉතා අපහසුවෙන් මෙම කටයුතු සිදු කරනු දක්නට ලැබෙන අතර රෝගීන් ද දැඩි පීඩාවට පත්ව ඇත. මේ සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයේ අවධානය ලැබෙනු ඇතැයි විශ්වාස ය.

එල්. ඩී. ජයනෙත්ති

වැඩිහිටි අපටත් දැනුම විනෝදය



වැඩිහිටියන් ලෙස විශේෂ අවශ්‍යතා ඇති අප පොත්පත් කියවීම, වෛද්‍ය සායන පැවැත්වීමට සමාජයේ තනි නොවන පුද්ගලයන් බවට ඒත්තු ගැන්වීම ඉතා වැදගත්.

මේ සඳහා අපට ගොඩනැගිල්ලක් නොමැත. එසේ ගොඩනැගිල්ලක් තිබේ නම් රංගන, නර්තන හා ගායන කුසලතා මඟින් ඔවුන්ගේ මනස පිනවිය හැක. එසේම කුඩා පුස්තකාලයක් පවත්වාගෙන යා හැකි නම් මෙම අයට මානසික වින්දනයක් මෙන්ම දැනුම ලබා දීම ද කළ හැකිය.

මෙම ගොඩනැගිල්ල සෑදීම සඳහා ඉතා මනරම් සුන්දර ප්‍රදේශයක පිහිටි ඉඩමකි. එය රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව සතු අතර ඔවුන්ගේ විරුද්ධත්වයක් පැන නොනගින බව අපේ විශ්වාසයයි.

ඒ අසල කුඩා වැවක් බඳු ජලය රඳන ස්ථානයකි. එහි ඔරු පැද විනෝද වීමට ද අවස්ථාව ඇත. රුවන්වැල්ල නගරයේ සිට මෙම ඉඩමට ළඟා විය හැකි මාර්ග කිහිපයකින් යුතු නිසල පරිසරයකි. මෙම ඉඩමට යාබදව කිරිවාන මරණාධාර සමිති ගොඩනැගිල්ල ද ඇත. එය දෙමහල් ගොඩනැගිල්ලක් ලෙස වැඩි දියුණු කරන්නේ නම්, එයද ජනතාවට අස්වැසිල්ලක් විය හැක. එසේම යෝජිත ගොඩනැගිල්ලේ සෞඛ්‍ය සේවා වැඩමුළු, ළමා බර කිරීමේ, පවුල් සෞඛ්‍ය සේවා කටයුතු, කෘෂිකාර්මික රැස්වීම් මෙන්ම සීල භාවනා වැඩසටහන් සඳහා ද යොදාගත හැක. වැඩිහිටි ප්‍රජාව රටත්, සමාජයත් විසින් ආරක්ෂා කිරීම, පෝෂණය හා සුඛසාධනය සඳහා සුවිශේෂී සේවාවන් සලසා දීම ජාතික යුතුකමක් සහ වගකීමක් ලෙස අපි දකින්නෙමු. මේ සඳහා අදාළ බලධාරීන්ගේ අවධානය යොමු කරන්නේ නම් මැනවි.

ජයතිලක වෙලගෙදර
සභාපති
රුවන්වැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස වැඩිහිටි බලමණ්ඩලය

විදුලිය උපකරණ කරදර

වෙළෙඳපොළ ඇති හුදෙක් උපකරණ අතර ගෘහ විදුලි උපකරණවලට විශේෂ තැනක් හිමිවේ. මෙම විදුලි උපකරණ තුළ පාරිභෝගිකයා අතරමං වන්නේ සිතාගත නොහැකි ආකාරයටය.

දහසකුත් නිෂ්පාදන අතර හොඳ නරක තෝරා බේරාගැනීමට නොහැකිව අතරමං වන අප පාරිභෝගිකයා අසරණ තත්ත්වයට පත්වේ. මීට බලපාන ප්‍රධානම සාධකය වන්නේ ගුණාත්මක බවින් යුත් නිෂ්පාදන තුළට බාල තත්ත්වයේ කුඩා නිෂ්පාදන ආයතන තුළින් නිපදවන භාණ්ඩ වර්ග වෙළෙඳපොළ ආක්‍රමණය කිරීමය.

වැඩි මිලක් දී ගුණාත්මක බවින් යුත් භාණ්ඩයක් මිලදී ගත් විට එය පසුම්බියට දැනුණත් ඒ තුළ ඇති දීර්ඝායුෂභාවය ඉමහත්. එහෙත් ජනතාවගේ ආර්ථික මට්ටම තුළ ඉහළ මිලක් ගෙවීමට වඩා බොහෝ දෙනෙකු උත්සුක වන්නේ අතේ ඇති මුදලට එම භාණ්ඩය මිලදී ගෙන ඉතිරි වන මුදලින් අනෙකුත් අවශ්‍යතා ද සපුරා ගැනීමටය. දහඩිය මහන්සියෙන් උපයා ගන්නා මුදලෙන් බාල තත්ත්වයේ උපකරණ මිලදී ගෙන දින දෙක තුනකින් ගබඩා කාමරයේ හෝ උපකරණ අලුත්වැඩියා කරන තැන්වලට දෙනවාට වඩා සැලකිය යුතු මුදලක් ගෙවා හෝ උසස් නිෂ්පාදන මිලදී ගැනීම පාරිභෝගික ඔබගේ යුතුකමකි.

ඩබ්. ඒ. කේ. මොහාන්
මහවැලි සී කලාපය
දෙහිඅත්තකණ්ඩිය

උතුරුමැද කලා උලෙළට කප්පාදුවක්?

උතුරුමැද කලා උලෙළ යනු වසර 30ක් මුළුල්ලේ අනුරාධපුර හා පොළොන්නරුව දිස්ත්‍රික්ක දෙකේ අංකුර කලාශිල්පීන්ට අතහිත දෙමින් ඔවුන් ජාතික තලයට ඔසවාලූ ලංකාවේ සුවිශේෂී කලා මංගල්‍යයකි. එහි කැපී පෙනෙන්නේ නර්තන අංශය හා නාට්‍ය අංශය වේ. එහෙත් මෙවර 2020 උතුරුමැද කලා උලළේ එම අංශ දෙකම කප්පාදු කර තිබීම ගැන රජරට කලාශිල්පීන් දැඩි ලෙස විරෝධය පල කර සිටී. චක්‍රලේඛණ ප්‍රකාරව සාහිත්‍ය තරග කීපයක් පමණක් පවත්වා කලා උලෙළ පැවැත්වීමට අදහස් කරගෙන ඇති බව පළාත් සංස්කෘතික නිලධාරීහු පවසති. වසර 30ක් මු ල්ලේමෙම කලා උලෙළ පිළිබඳ විදුත් හා මුද්‍රිත මාධ්‍යවේදීන් විශේෂ මෙහෙයක් ඉටු කළේ මෙවැනි කලා උලෙළක් ලංකාවේ කිසිඳු තැනක නොපැවැත්වෙන හෙයිනි. වසංගතය තත්ත්වය තිබියදී පවා පේරක්ෂා නාට්‍ය උලෙළ සහ රාජ්‍ය නාට්‍ය උලෙළ පැවැත්වූයේ නාට්‍යශිල්පීන් දිරිගැන්වීමටය. එහෙත් උතුරුමැද පළාතේ ජනතාවගේ රසවින්දනය උදෙසා එවැනි නාට්‍ය උලෙළ නොපැවැත්වූයේ අදාළ බලධරයන්ට රසවින්දනයක් නොමැති වීම නිසා විය හැකිය. වසංගතය හේතුවෙන් කිසිම කලා කටයුත්තක් පළාතේ සිදු නොවන අතර බොහෝ දෙනා කාර්යාලවල සිට පරිගණක ක්‍රීඩා කරමින්, පුද්ගලික කටයුතු ඉටුකරගනිමින් සිටිති. එහෙත් ඒවා සොයා බලන්නටද කිසිදු බලධාරියෙක් නොමැත.

පළාත් සභා පිහිටවූ දා සිට උතුරුමැද කලා උලෙළ වාර්ෂිකව සංවිධානය කළ අතර ත්‍රස්ත උවදුරුවලදී පමණක් වසර දෙකක් පැවැත් වූයේ නැත. උතුරුමැද කලා උළෙල, මෙරට විශිෂ්ඨතම කලා උලෙළක් කරන හැටි බලන්න නම් උතුරුමැදට යා යුතු, යැයි ප්‍රකාශ කළේ ප්‍රවීණ නාට්‍යවේදී හා සිනමා වේදී ජයන්ත චන්ද්‍රසිරි මහතාය. මුල්ම කලා උලෙළ දිසාපති කාර්යාල මුල් කරගෙන සංවිධානය විය. වික්‍රම නම් සංස්කෘතික නිලධාරි මහතාත්, හෙන්ඩීර වීරවංශ මහතාත් (හිටපු පළාත් සංස්කෘතික ඇමති) උතුරුමැද කලා උලෙළට කළ මෙහෙවර හා කැප කිරීම අදත් අප සිහි කරන්නේ ගෞරවයෙනි. ඒ දිනවල සිටි ආරියදාස නම් ලේකම්වරයාත් එසේමය.

අනුරාධපුරයෙන් කලා කරුවන් පිරිසක් බිහිවුණු අතර , බිහි වෙමින් සිටින සිටී.

මේ සම්බන්ධයෙන් පෙනි සිටි අදාළ නිලධාරීන්ට අවශ්‍යවී ඇත්තේ පරණ චක්‍රලේඛණ අනුකූලව ලිපි ගොනු පිරවීම පමණි. කලාශිල්පීන්ගේ දුක සැප විමසමින් උතුරුමැද පළාතේ කලාශිල්පීන් දිරිගැන්වීමට කිසිඳු වැඩපිළිවෙළක් නොමැත. ඒ ගැන අපට ඇත්තේ කනගාටුවකි. කලකිරීමකි. කලා සාහිත්‍ය පෝෂණය කිරීම තුළින් යහගුණ පිරි හෘදයාංගම ජනතාවක් සකස් කිරීමට පිටුවහලක් වන බව බොහෝ දෙනා නොදනිති. එය ගරු ජනාධිපතිතුමාගේ සෞභාග්‍යයේ දැක්මට කරන අගෞරවයකි.

පාසල් නාට්‍ය හා රංග කලාව හා සෞන්දර්ය විෂයවල ප්‍රායෝගික පරීක්ෂණ වහා නවතා ලිමට සූදානමක් තිබෙන බැව් දැනගන්නට ලැබී තිබේ. එය එසේ වුවහොත් දැනුමක් පමණක් ම ඇති අනුවණ ජනතාවක් ව්‍යාප්ත වීම වළක්වාලීම අපහසුය.

අනුරපුර රගහල සිහිනයට දැනට වසර 15කි. වර්තමාන ජනාධිපතිතුමන් ඒ සඳහා මැදිහත් වුවහොත්, ඒ සිහිනය මල්ඵල දරනු ඇත .

ජයසුන්දර රාජපක්ෂ

මාවතගම වෙළෙඳපොළ අතුරු මාර්ගය අබලන්

පොල්ගහවෙල මැතිවරණ කොට්ඨාසයේ මහපිටිය තලවත්තේගෙදර මාර්ගයේ මානින්ගමුව මංසන්ධියේ දකුණට ඇති මාවතගම හරහා වෙළෙඳ පොළ මංසන්ධිය දක්වා ඇති අතුරු මාර්ගයේ කොටසක් කාලයක් මුළුල්ලේ සිටම දැඩිසේ කැඩී බිඳී අබලන් තත්ත්වයක පවතී. පොල්ගහවෙල ප්‍රාදේශීය සභාවට අයත් මෙම මාර්ගය මෙසේ අබලන් වීම නිසා රථවාහන ගමනාගමනයට ද තර්ජන එල්ල වී ඇත.

කිලෝමීටර් 3 ක් පමණ ඇති මෙම මාර්ගය ඔස්සේ දිනපතා දහස් ගණනක් මගී ජනතාව මෝටර් රථ යතුරුපැදි හා බර වාහන ගමන් කරයි. මෙම මාර්ගයේ කොන්ක්‍රීට් යොදා ඇති සමහර ස්ථානවල ගල් ගැලවී කොන්ක්‍රීට් තට්ටු පිටින් ගැලවී ඇත. තවද මාර්ගය දෙපස කැලෑවෙන් වැසී පවතී.

මේ සම්බන්ධයෙන් අදාළ බලධාරීන්ගේ අවධානය යොමු වේවා.

සේන ඉදිරිසිංහ

සාම විනිසුරු පදවි ලබයි

ගම්පහ ගණේමුල්ල ජයකොඩි වත්ත අංක 292/2, හි පදිංචි ආචාර්ය ඩබ්ලිව්.එම්. ජේ. බණ්ඩාර මහතා මු දිවසිනටම බල පැවැත්වෙන පරිදි සමාදාන විනිශ්චයකරුවකු ලෙස අධිකරණ අමාත්‍යාංශය විසින් පත්කොට ඇත. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ හා කෘෂිකර්ම අමාත්‍යාංශයේ නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂකවරයෙකු වශයෙන්ද, ප්‍රධාන කෘෂි විද්‍යාඥ වශයෙන්ද සේවය කොට විශ්‍රාම ලබා ඇති ඒ මහතා දැනට කෘෂිකර්ම ක්ෂේත්‍රයට සම්බන්ධ රජයේ ආයතන කිහිපයක කමිටු සාමාජිකයෙකු ලෙස ක්‍රියාකරයි. ඔහු ගණේමුල්ල ප්‍රදේශයේ ප්‍රජා සමිති සමාගම් කිහිපයකද ක්‍රියාකාරී නිලතල දරයි.

රත්නපුර රෝහලට විකල්ප මඟක්

කොළඹ බදුල්ල මාර්ගයේ රත්නපුර නගරයට ආසන්නව පිහිටි රත්නපුර රෝහල් පරිශ්‍රයට ප්‍රවේශ වීමට ඇත්තේ රෝහල හන්දියෙන් පටන් ගන්නා එකම ප්‍රවේශ මාර්ගය පමණකි.

මෙම ප්‍රවේශ මාර්ගය ප්‍රමාණවත් නොවන අවස්ථා කොතෙකුත් අපි නිරීක්ෂණය කොට ඇත්තෙමු. කොළඹ, රත්නපුර මාර්ගයේ තදබදයක් ඇතිවන අවස්ථාවල පමණක් නොව ගංවතුර වැනි ස්වාභාවික විපත් ඇතිවන අවස්ථාවලදී ද, මෙම ගැටලුව වඩාත් ප්‍රබලව කැපී පෙනේ. මේ සඳහා විකල්ප මාවතක් අත්‍යවශ්‍ය බව අපගේ විශ්වාසයයි.

පැරණි වෙරළුප පාර සංවර්ධනය කොට එය හරහා වෙරළුප වෙල මැදින් නව මාර්ගයක් නිර්මාණය කිරීම පහසු වුවත් නිතර නිතර ඇතිවන ගංවතුර විපත් නිසා තිරසර විසඳුමක් නොවන බව අපගේ විශ්වාසයයි. එහෙත් ඒ වෙනුවට රත්නපුරය නව නගරය කච්චේරිය හන්දියෙන් ආරම්භව ගල්කඩුව බෑවුම ඔස්සේ සමන් පෙදෙස හරහා රත්නපුර රෝහල දක්වා ඇති මාර්ගය සංවර්ධනය කිරීම වඩාත් යෝග්‍ය බව අපගේ විශ්වාසයයි.

මේ පිළිබඳව රජයේ අවධානය යොමු කර රත්නපුර නගර සංවර්ධනයේ තවත් පියවරක් ලෙස මෙම ව්‍යාපෘතිය කඩිනමින් ක්‍රියාත්මක කරන මෙන් ඉල්ලමු.

ඕමල්පේ සිරි සීලානන්ද හිමි
පුබුදුගම ධර්ම නිකේතනය
නව නගරය - රත්නපුර

පොලිස් රාජකාරිය මේක පමණක් ද?

අප දන්නා ආකාරයට පොලීසිය මහජන ආරක්ෂාව ප්‍රධාන කරගත් දෙපාර්තමේන්තුවකි. මෑතක සිට මාතර දිස්ත්‍රික්කයේ පාරවල්වල සතියට දින 2 පොලිස් නිලධාරීන් 6 - 8 පමණ පැමිණ මාර්ගයේ ගමන් ගන්න වාහන පරීක්ෂාව සිදු කරයි. ඒ කිසිම දිනයක තහනම් අවි, මත්ද්‍රව්‍ය හෝ වෙනත් අපරාධ සම්බන්ධව අදාළ වූ දෙයක් අසුවී ඇති බවක් දැනගන්නට නැත. සිදුවනුයේ නීතිගරුක පෞද්ගලික වාහනවල යන ජනතාවට තම ගමන විනාඩි 20 - 30 ප්‍රමාද වීමයි. මේ ලියුම්කරු එක දිනකදී ස්ථාන 3 බස්සවා පරීක්ෂා කිරීම නිසා හදිසි ගමනක් පැයක පමණ කාලයක් ප්‍රමාද විය.

පොලීසිය මූලිකව කළ යුත්තේ අසරණ යතුරුපැදි, ත්‍රිරෝද රථ ආදී අයට දඬ කොළ ලිවීම නොව සෑම පොලීසියකම වසමේ නොවිසඳී ඇති අපරාධ වැළලී යෑමට පෙර ඒවා සොයා බලා වැරදිකරුවන් නීතිය හමුවට පමුණුවාලීමයි. වාහන වැරදි සෙවීමට දිනපතා තංගල්ල සිට මාතර දක්වා නිරතුරු යතුරුපැදි පොලිස් නිලධාරීන් 2 බැගින් ස්ථාන 8 - 10 රාජකාරි කරන බව සියලු දෙනාටම දැකගත හැකි කාර්යයකි. එවැනි සේවයක් දිනපතා තිබියදී මේ කරන වැඩපිළිවෙළ අවශ්‍ය නොවන බව අපට පෙනී යයි.

මෑතක සිට මාතර පොලිස් අධිකාරි බල ප්‍රදේශයේ සිදු කරන මේ කටයුත්ත හුදෙක්ම පෞද්ගලික වාහනවල යන බොහෝ දෙනෙක් ප්‍රමාද කරමින් රථයෙන් බස්සවා කාලය කා දමන ප්‍රතිඵල විරහිත ක්‍රියාමාර්ගයකි. මාර්ගයේ වැරදි සම්බන්ධව අදාළ පොලිස් වසමේ මාර්ග පරීක්ෂක නිලධාරීන් වැඩි කර කටයුතු කිරීම මීට වඩා ප්‍රතිඵලදායක බව අප කළ අධ්‍යයනයේදී පෙනී යයි.

පී. ගාමිණී සමරසිංහ
මෝදර පාර, තංගල්ල

ලාවලුගහහේනට කරන්ට් එක ඕනෑ

වැලිගම ආසනයේ වැලිගම ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශයට අයත් කොටවිල ලාවලුගහහේන ප්‍රදේශයට ලැබෙන විදුලියේ වෝල්ටීයතාවය ප්‍රමාණවත් නොවන බව ප්‍රදේශවාසීහු කියති.

මේ නිසා ස්වයං රැකියාවල නිරත අයට සහ පාසල් සිසුන් මෙන්ම පොදු මහජනතාව තම කටයුතු කර ගැනීමේදී බලවත් අපහසුතාවන්ට පත්ව සිටිති.

තවද මෙම ප්‍රදේශයට නළ ජල පහසුකම් පවා නොමැති නිසා ළිංවලින් ජලය ගැනීමට අවශ්‍ය වෙලාවට ජල මෝටර් ක්‍රියාත්මක කර ගැනීමට නොහැකි නිසා මහත් දුෂ්කරතාවන්ට මුහුණ දීමට සිදුව ඇත.

මේ පිළිබඳව විදුලිබල මණ්ඩලයේ ඉහළම වගකිවයුතු බලධාරීන්ට දන්වා වසර කීපයක් ගතවී ඇතත් මේ දක්වා කිසිදු පියවරක් ගෙන නොමැත.

එබැවින් වගකිවයුතු බලධාරීන්ගේ අවධානය යොමු වී නොපමාව කොටවිල ලාවලුගහහේන ප්‍රදේශයට ප්‍රමාණවත් විදුලිය දීමට අවශ්‍ය කටයුතු කර දෙන මෙන් ඉල්ලා සිටිමි.

වසන්ත ද සිල්වා
වැලිගම

කඹුරුගමුව සමුද්‍ර තීර ප්‍රජා ශාලා ගොඩනැගිල්ල වැටෙන්න ළඟයි

වැලිගම ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශයේ 408 සී කඹුරුගමුව දකුණ ග්‍රාම නිලධාරි වසමේ සමුද්‍ර තීර සුනාමි නිවාස 25 ක් සමඟ සාදා ඇති ප්‍රජාශාලා ගොඩනැගිල්ල ඉතාම අබලන් තත්ත්වයක පවතී.

එහෙත් මේ දක්වා වැලිගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ හෝ වගකිවයුතු බලධාරියකුගේ අවධානයට යොමු නොවීම නිසා මෙම ප්‍රජාශාලා ගොඩනැගිල්ල කඩා වැටීමට ඉඩ ඇත.එම නිසා දැන්වත් වගකිවයුතු බලධාරීන්ගේ අවධානය යොමු වී නොපමාව මෙම ප්‍රජාශාලා ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කර ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කරන මෙන් අවධාරණයෙන් දන්වා සිටිමි.

වසන්ත ද සිල්වා, වැලිගම.

මත පිටුදකිමු

මත්ද්‍රව්‍යවල "දොරටුව" දුම්වැටිය බවට අද විද්‍යාඥයන් හඳුනාගෙන තිබේ. දෙවන ලෝක යුද සමයේ නාසි ආඥාදායක "හිට්ලර්" විසින් යුද්ධයේදී කකුල් අතපය දරුණු ලෙස තුවාල වූ රෝගීන්ගෙන් එම අවයව වේදනාවකින් තොරව ඉවත් කිරීමට මෝෆින් නමැති වේදනා නාශක ද්‍රව්‍ය සොයාගෙන ඇත. මෙය අද මත්ද්‍රව්‍යයක් ලෙස අවභාවිතා වේ. මෙම මත්ද්‍රව්‍ය කෙලෙස කුමන ආකාරයෙන් ලෝකයට බිහිවූවත් ලෝකයට එය දරුණු ඛේදවාචකයක් වී තිබේ.

ශ්‍රී ලංකාවට මුලින්ම හෙරොයින් නමැති මත්ද්‍රව්‍ය ඇතුළු වන්නේ 1980 කාලයේදීය. 1981 සිට විෂ මත්ද්‍රව්‍ය මැඩලීම සඳහා නීති රීති පැනවේ. විවෘත ආර්ථිකය සමඟ සමාජයට පැමිණි භයානක දේවල් අතර, මෙම මත්ද්‍රව්‍ය ද විය. මත්ද්‍රව්‍ය විකුණා ලැබෙන අධික ලාභය නිසා ඒවා ප්‍රවාහනයට සහ විකිණීමට සමාජයේ ඉතා සුළු කොටසක් හුරු පුරුදු විය. මෙහිදී විකිණීම, බෙදා හැරීම, තරගකාරිවීම නිසා "කුඩු පාතාලය" ඇති විය. ජීවිත බිලිගන්නා අවි ගැටුම් දක්වා මෙම වෙළෙඳාම දුර දිග ගොස් ඇත. මත්ද්‍රව්‍ය ව්‍යාප්තිය කොතෙක් ද යත් එහි අවසාන ගොදුර වූයේ පාසල් ළමුන්ය. එවකට පැවති රජයන් විසින් මෙම ගැටලුව නිරාකරණය කිරීම සඳහා විවිධ ආයතන සංවිධාන ඇති කරන ලදි. නමුත් එම සංවිධානවලට අද පවා මෙම මත්ද්‍රව්‍ය සමාජයෙන් සහමුලින් ඉවත් කිරීමට හැකියාවක් නොලැබුණි. මත්ද්‍රව්‍ය නිවාරණය යන වචනය අප හඳුනාගන්නෙ මේ යුගයේදීය.

මත් උවදුර නැත්තටම නැති කළ හැක්කේ ආකල්පමය වෙනසක් ඇති කිරීමෙන් පමණි. 5 හෝ 6 වසර පන්තිවල සිටම දරුවන්ගේ පෙළ පොතට මත්ද්‍රව්‍යවල ආදීනව හා නිවාරණයේ වැදගත්කම වටහා දෙන පාඩම් ඇතුළත් කළ හැකිය. එලෙසම මත්ද්‍රව්‍ය පානය කරන්නා "කුඩුකාරයා" ලෙසත් ඒවා විකුණන ව්‍යාපාරිකයා "මන්ත්‍රීතුමන්ලා" ලෙසත් හඳුන්වන ක්‍රමය වහාම නතර කළ යුතුය. මෙවැනි පුද්ගලයන්ට සමාජයේ කිසිදු පිළිගැනීමක් නොමැතිව ඔවුන් අය කොන් කිරීමේ කාලය පැමිණ ඇත.

ඉන්දික රුවන් හේවගේ
බොරුල්ල සුසමයවර්ධන
ම. විදුහලේ ආදි ශිෂ්‍ය

In conversation with...

අප විලාසිතා වෙළෙඳපොළ වෙනස් කළා

ෆැෂන් බග් ආයතනයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී දිනේෂ් ඒකනායක

අනුව දශකයෙන් පසු විලාසිතා වෙළෙඳ-පොළෙහි සිදු වූ වෙනස්කම් කිහිපයකි. ඇඳුම් සාප්පු සංකල්පය ඉක්මවා ඇඟලුම් ප්‍රදර්ශනාගාර සංකල්පය පැමිණියේ මේ වක-වානුවේදීයි. මේ මඟින් එතෙක් පැවති ඇඳුම් මිල දී ගැනීම මෙන්ම විකිණීම් රටාව ද උඩු යටිකුරු විය. ඒ වෙනසට මුල පිරූ ආයතන අතර 'ෆැෂන් බග්' පුරෝගාමී වෙයි. ඒ පිළිබඳ සහ ඇඟලුම් වෙළෙඳපොළෙහි නව ප්‍රවණතා පිළිබඳවත් අප සංවාදයක නිරත වූයේ 'ෆැෂන් බග්' ආයතනයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී දිනේෂ් ඒකනායක සමඟයි.

● 'ෆැෂන් බග්' දැක්ම කුමක් ද?

වැඩි දෙනාගේ තේරීම වන මෝස්තර කඩ-නමින් ගෙන ඒම අපගේ මුඛ්‍ය අරමුණයි. එම අරමුණ ජය ගැනීම සඳහා මෝස්තර වෙළෙ-ඳපොළෙහි අප කළ වෙනස්කම් බොහෝයි. 'ෆැෂන් බග්' පළමු ශාඛාව 1994 ආරම්භ කළේ බණ්ඩාරවෙල නගර මධ්‍යයේයි. එසේ ආරම්භ කිරීමට ප්‍රථම මෙරට විලාසිතා වෙළෙඳපොළ පිළිබඳ මෙන්ම පාරිභෝගිකයාගේ අවශ්‍යතා පිළිබඳ පූර්ව අධ්‍යයනයක් තිබුණා. සභාපති රිසාල් සුබියන් මහතා සහ නියෝජ්‍ය සභාපති අසාන් සුබියන් යන මහත්වරු මෙන්ම ජ්‍යෙෂ්ට අධ්‍යක්ෂ ඒ. සී. එම්. තාරික් යන මහත්වරුන්ගේ දැක්ම වුණේ මෙරට නිමි ඇඳුම් වෙළෙඳපො-ළෙහි කැපී පෙනෙන වෙනසක් කිරීමටයි. බණ්ඩාරවෙල ශාඛාව ආරම්භ කිරීමත් සමඟ ඒ සඳහා විශාල පිළිගැනීමක් ඇති වුණා. මෝස්තර මුදල් දීලා ගන්න පුළුවන් කියන අදහස ඇති වුණේ මේ ශාඛාවත් සමඟයි. වැඩි දෙනෙක් පුරුදු වෙලා හිටියේ පොදු සරල මෝස්ත-රයක් ටේලර් (tailor) කෙනකු ලවා මසා ගැනීමටයි. එහෙත් තමන් කැමැති නවතම මෝස්තරයක් මුදල් ගෙවා ලබා ගැනීමට හැකියි යන සංකල්පය ඇතිවීම ආරම්භ වූයේ මේ වකවානුවේදීයි.

● සම්ප්‍රදායන් වෙනස් කිරීම දුෂ්කරයි, එවැනි ගැටලු ඇති වුණේ නැද්ද?

මුල් කාලයේ විසඳා ගත යුතු වූ ගැටලු කිහිපයක්ම ඇති වුණා. මේ ඇඳුම් හොඳින් මසා තිබෙනවා ද? මැහුම් ගැළවෙයි ද? සායම් යයි ද? මිල සාධාරණ ද? ගැළපෙයි ද? යනුවෙන් ගැටලු රාශියක් පාරිභෝගිකයා තුළ පැවතියා. ඇඳුමක් මිලට ගෙන ඇඳීම මේ කාලයෙත් යම් පමණකින් සිදු වුණා. නමුත් ඒ අවස්ථාව ලැබුණේ එක්තරා පන්තියකට පමණයි. එසේම ඇඳුම් සාප්පුවල තිබුණේ ශෝකේස්, නැති නම් රාක්ක ක්‍රමය. සරල මෝස්තර කිහිපයක ඇඳුම් තිබුණා. මුදලාලි ශෝකේස් එකෙන් අරගෙන පෙන්නන ඇඳුම් කිහිපයක් අතරින් එකක් තෝරා ගත යුතු වුණා. ඒත් බහුතර පිරිසක් පුරුදු වී සිටියේ තමන්ට ගැළපෙන සරල ඇඳුමක් ටේලර් ලවා මසා ගැනීමට. ඇඳුමක් මුදලට ගෙන ඇඳීම පිළිබඳ විශ්වාසයක් තිබුණේ නෑ. අප සතු මුල් අභියෝගය වූයේ විශ්වාසය තහවුරු කර ගැනීමයි. ඒ සඳහා අපිට වෙනස්කම් කිහිපයක්ම හඳුන්වා දීමට සිදු වුණා. ඒ අනුව මුලින්ම හඳුන්වා දුන්නේ Fit on සංකල්පය ඇඳුම් ඇඟලා බලා ගැළපේ නම් පමණක් මිල දී ගැනීමට ඇති හැකියාව. ඒ සමඟම Fixed price concept ඇඳුම සඳහා නිශ්චිත වට්නාකමක් දීම කළා. මේ වකවානුව වන විට පාරිභෝගිකයාගේ පුරුද්ද වුණේ රෙදි සාප්පුවට ගොස් කේවල් කිරීම. ඇඟලුම් මිල දී ගැනීමේදී කේවල් කර මිල දී ගැනීමේ සම්ප්‍රදායක්ව පැවතුණා. ඇතැම් විට වෙළෙඳුන් මිල කියන්නේම මුදලක් අඩු කර දීමේ අපේක්ෂාවෙන්. පාරිභෝගිකයාගේ පුරුද්ද වුණෙත් කෙතරම් සරිලන මිලක් වුණත් කීයක් හෝ අඩු කර මිල දී ගැනීම. මේ තත්ත්වය වෙනස් කළේ සෑම ඇඳුමකම නිශ්චිත මිලක් සඳහන් කිරීමෙන්. මුල් කාලයේ බාකෝඩ් ක්‍රමයක් තිබුණේ නෑ. නමුත් මිල සඳහන් රඳවන (Tag) ක්‍රමයක් හඳුන්වා දුන්නා. මේ හේතුව නිසා ඇති වූ වෙනස විශාලයි. ඉන් පාරිභෝගිකයාට අත් වූ වාසිය ඇඳුමක නිසි වට්නාකමට ගෙවීමට හැකි වීමයි. වෙළෙඳපොළ තරගකාරීත්වයත් සමඟ නොවට්නා මිලකට ඇඳුමක් මිල කිරීමට කිසිවකුට හැකියා-වක් ඇත්තේ නෑ. ඇඟලුම් වෙළෙඳපොළෙහි එතෙක් නොපැවති නිශ්චිත මිල සංකල්පය නිසා නිසි වට්නාකම (value for money concept) තත්ත්වය වෙළෙඳපොළෙහි නිර්මාණය වුණා.

● මේ වකවානුවේම වගේ නේද exchange policy අවස්ථාව පාරිභෝගිකයා වෙත දුන්නේ?

රුචිය මත ඇඳුම් මාරු කිරීම සඳහා අවස්ථාව ලබා දුන්නේත් මුලින්ම අපේ ආයතනය. පාරිභෝගිකයාගේ පොදු ස්වභාවයක් තමයි ඇඳුමක් ඇඟලා බලා මිල දී ගත්තත් නැවතත් මාරු කිරීමට වුවමනාව ඇති වීම. ප්‍රදර්ශනාගාරයේ දුටු වෙනත් ඇඳුමක් පිළිබඳ කැමැත්තෙන් පසුවීම. මේ අවශ්‍යතාව පිළිබඳවත් අපි සැලකිලිමත් වුණා. ඒ අනුව කොන්දේසි කිහිපයකට යටත්ව ඇඳුම් මාරු කර දීමේ ක්‍රමයක් ඇති කළා. පසුව පාරිභෝගිකයා සතු පොදු පහසුකමක් බවට එය පත් වුණා.

● රටේම ඇඟලුම් ප්‍රදර්ශනාගාර මේ අනුව වෙනස් වූ බව ද පවසන්නේ?

බණ්ඩාරවෙල ප්‍රදර්ශනාගාරය වර්ග අඩි තුන්සියයක් පමණ කුඩා ඉඩක පැවති ප්‍රදර්ශනාගාරයක්. එහි මුලින් සේවය කළේ දොළොස් දෙනයි. ඒත් පාරිභෝගිකයාගේ අදහස් හඳුනාගෙන අප කළ වෙන-ස්කම් නිසාම දවසින් දවස අප වෙත ඇදෙන පිරිස වැඩි වුණා.ඒ සඳහා විශේෂ ප්‍රචාරණ අවශ්‍ය වුණෙත් නෑ. අප ඉදිරිපත් කළ විලාසිතාවන් හා නිමාව හේතුවෙන් පිරිස අප වෙත ඇදී ආවා. ඒ අනුව වසර දෙකකට පසු මහනුවර ප්‍රදර්ශනාගාරය ආරම්භ කළා. මහනුවර ප්‍රවේශයට මූලික හේතුව වුණේ ජනතාවගේ දැඩි ඉල්ලීමයි. එසේම එහි ස්ථාපිත කිරී-මෙන් අනතුරුව ඉහළ ප්‍රතිචාරයක් ලැබුණා. ඉන් අනතුරුවයි කොළඹ ඩුබ්ලිකේෂන් පාරේ ෆැෂන් බග් ප්‍රදර්ශනාගාරය විවෘත කළේ. මේ වක-වානුව වන විට ඒ සමඟ මේ ක්ෂේත්‍රයට තවත් අය ප්‍රවේශ වුණා. අප ඇති කළ වෙනස්කම් ඒ අයත් අනුගමනය කිරීම නිසා වෙළෙඳපොළෙ නිශ්චිත ක්‍රමයක් සකස් වුණා.

● මෙරට පාරිභෝගිකයාට සරිලන size chart ක්‍රමවේදයක් සැකසීමටත් ඔබ ආයතනය ප්‍රමුඛ වී තිබුණා ?

නිමි ඇඳුම් ගැනීමට පැමිණියත් බොහෝ පාරිභෝගිකයන්ට තමන්ට ගැළපෙන ඇඳුමේ ප්‍රමාණය (size) පිළිබඳ නිවැරදි අවබෝධයක් තිබුණේ නෑ. ඊට හේතුව ඒ අයගේ උරහිස් ප්‍රමාණය ඉණ ආදි වශයෙන් නිශ්චිත මිමිමක් පිළිබඳ අවබෝධයක් නොමැතිකම. මේ හේතුව නිසාම අප වෙතට පැමිණෙන පාරිභෝගිකයන් පිළිබඳ මනා අධ්‍යයනයකින් යුතුව ලෝකයේ භාවිත වන ක්‍රම පිළිබඳ මනා අවබෝධයකින් අපේ රටේ පාරිභෝගිකයාගේ ශරීර ප්‍රමාණ පිළිබඳ ජීව විද්‍යාත්මක පදනම-කින් යුතුව මේ Standard sizes ක්‍රමවේදය සැකසුවා. මේ නිශ්චිත සැලසුමට අනුව මේ වන විට වෙළෙඳපොළෙහි small, medium, large XL, XXL වැනි ප්‍රමාණ අනුව ඕනෑම කෙනකුට තමන්ගේ ශරීරයට ගැළපෙන ලෙස ඇඳුම් මිලදී ගැනීමේ හැකි-යාව ලැබී තිබෙනවා. මේ ක්‍රමය සකස් කෙරුණේ අපගේ මෝස්තර නිර්මාණ කණ්ඩායම සහ නිෂ්පාදන කණ්ඩායමේ දායකත්වයෙන්.

● මේ අනුවද 'ෆැෂන් බග්' ආයතනයේ නිෂ්පාදන ක්‍රියාවලිය සිදු වෙන්නේ?

ඔව්, මූලික වශයෙන් ඒ ප්‍රමාණ අනුව නිෂ්පාදනය කරනු ලබන මෝස්තර සහ තොග පිළිබඳ තීරණය කෙරෙනවා. අපි ළඟ මනා පුහුණුවකින් යුතු මෝස්තර නිර්මාණ ශිල්පීන් කණ්ඩායමක් ඉන්නවා. ඒ අය ගෝලීය ප්‍රවණතා පිළිබඳ සැලකිලිමත් වෙමින් ඉදිරි මාස තුන ඇතුළත වෙළෙඳපොළෙහි ජනප්‍රිය වන මෝස්තර ගෙන ඒමට කටයුතු කරනවා. ඒ මෝස්තර නිෂ්පාදනය කරන්නේ අප ආයතනයට සම්බන්ධ නිෂ්පාදන කණ්ඩායම් විසින්. එසේ අප වෙතම නිෂ්පාදනයන් ලබා දෙන කණ්ඩායම් 25ක් 30ක් පමණ ගිවිසුම්ගත වී කටයුතු කරනවා. විලාසිතාව ලබාදෙන්නේ අපි. ඒ අනුව උසස් නිමාවකින් යුතුව ඇඳුම් නිෂ්පාදනය කිරීමයි එම කණ්ඩායමට පැවරෙන වගකීම. නිමාව පිළි-බඳ සහතිකය (quality) අපි නිරන්තරයෙන් සැලකිලිමත් වෙනවා. නිෂ්පාදනයන් සඳහා අවශ්‍ය වන රෙදි පිළි ඇතුළු අනෙකුත් අමුද්‍රව්‍ය අප ආයතනය විසින් ලබා දෙනවා. ඇඳුම් ආනයනය කොට අලෙවි කිරීමට වඩා මේ ක්‍රමයටයි අපි මූලිකත්වය ලබා දෙන්නේ. අවම වශයෙන් මේ එක් කණ්ඩායමක සේවකයන් 10ක් සේවය කරන බවට අනුමාන කළත් 3,000ක් පමණ පිරිසක් ඊට අනුබද්ධව සේවය කරනවා. සාජුවම ෆැෂන් බග් ප්‍රදර්ශනාගාරවල සේවයේ නිරත පිරිස 800ක් පමණ වෙනවා. ඒ පිරිස ගැන විශේෂයෙන් සඳහන් කළ යුතුයි. මනා පුහුණුවකින් යුතු ඒ අය අප ආයතනයේ සාර්ථකත්වයේ පළමු සාධකයයි. මේ අනුව 4,000කට අධික පිරිසක් ආයතය හා බද්ධ වී කටයුතු කරනවා. ඒ පිළිබඳ ආයතනයක් විදිහට අප පවසන්නේ මහත් සතුටින් යුතුවයි.

● කොවිඩ් 19 සමඟ 'ෆැෂන් බග්' ක්‍රියාකාරීත්වය කෙබඳු ද?

මුල් කොවිඩ් 19 රැල්ල අවස්ථාවේ අප ඉතා හොඳින් මුහුණ දුන්නා. ඒ අවස්ථාවේ අප කඩිනමින් ඊට මුහුණ දීම සඳහා අපිටම ආවේණික විසඳුම් සොයා ගත්තා. මූලික වශයෙන් අපගේ සේවකයන් ආරක්ෂා කරමින් පාරි-භෝගිකයාත් ආරක්ෂා කළ යුතුයි. ඒ අතරේ ඔවුන්ට අවශ්‍ය සේවාව සැප-යීම සඳහා ආරක්ෂිත ක්‍රමවේද සැකසිය යුතු වුණා. ඔන්ලයින් මාර්කටිං වගේම ඊ මාර්කටින් සංකල්ප අපි නිරන්තරයෙන් සාර්ථකව භාවිත කරන ක්‍රමවේද. ඔන්ලයින් මාර්කටින් සඳහාම විශේෂයෙන් වෙන් වූ කාර්ය මණ්ඩලයක් අප සමඟ කටයුතු කරනවා. අපගේ ප්‍රදර්ශනාගාර නොමැති ප්‍රදේශවල පවා ඒ ක්‍රමයට පාරිභෝගිකයන් විශාල සංඛ්‍යාවක් මේ වන විට අප වෙතට අලුතින් එක් වී තිබෙනවා. ඒ සඳහාම වෙන් වුණු ප්‍රදර්ශනාගා-රයක් අප සතුයි. කොවිඩ් 19 සමඟ සටනේදී මෙය සර්වකාලීන පිළියමක්. ඒ සඳහා අප හඳුනාගත් තවත් විසඳුම් රාශියක් තිබෙනවා. වට්ස්ඇප්, ෆේස් බුක් වැනි සමාජ මාධ්‍ය භාවිතයෙන් කොවිඩ් මුල් වකවානුවේ අප pick and buy නමින් ක්‍රමයක් සැකසුවා. ඒ ක්‍රමයත් වඩා සාර්ථක ක්‍රමයක් බව හඳුනාගෙන තිබෙනවා. පාරිභෝගික-යාට අවැසි ඇඳුමට අදාළ ඡායාරූප වට්ස්ඇප්, වයිබර් හෝ ෆේස් බුක් ඔස්සේ ගෙන්වා ගැනීමෙන් අනතුරුව ඔවුන් ඇණවුම් ලබා දෙනවා. ඒ අනුව අවශ්‍ය ඇඳුම් ඇසුරුම්ගත කොට සූදානම් කරනවා. පාරිභෝගිකයා වෙනත් වැඩකට යන අතරතුර වුණත් අපගේ ආයතනය සමීපයට පැමිණ මුදල් ගෙවා තමා ඇණවුම් කළ ඇඳුම් ලබාගත හැකියි. ඒ මඟින් සමාජ දූරස්ථභාවය ආරක්ෂා කර ගනිමින් අවශ්‍යතා ඉටු කර ගැනීමට හැකි වෙනවා. එවැනි ක්‍රම-යක් මේ ක්ෂේත්‍රයේ මුලින්ම අත්හදා බැලුවේ අපියි. එපමණක් නොවෙයි. පසුගිය සමයේ පාරිභෝගික අව-ශ්‍යතා සලකා අප මනා සේවයක් සැලසුවා. කිසිදු තැනක සාප්පුවක් විවෘත කර නැති අවස්ථාවක දරු-වන් ලැබෙන්නට සිටි මවුවරුන්ට අවශ්‍ය ඇඳුම් ලබා ගැනීම වැනි හදිසි අත්‍යවශ්‍ය සාධක ඇඳුම් පිළිබඳ පැන නැඟී තිබුණා.

එවැනි අය සඳහා අවශ්‍ය ඇඳුම් ආයිත්තම් රෝහල් වෙතටම යැවීම සිදු කළා. එසේ හදිසියේ ඇඳුම් අත්‍යවශ්‍ය වූ අවස්ථා තවත් කොතෙ-කුත් උදා වී තිබුණා. අලුත ඉපදුණු දරුවන්ට මාස තුනක් පමණ ගත වන විට මුලින්ම ඇන්දවූ ඇඳුම් ඇඳීමේ හැකියාවක් නෑ. එවැනි අව-ශ්‍යතා වෙනුවෙන් අප වෙතින් ඇඳුම් සපයන ලෙසට ඉල්ලීම් කොතෙකුත් තිබුණා. එවැනි අය වෙත අප ඔවුන් සමීපයටම ගොස් ඇඳුම් ලබාදෙන ක්‍රමයක් ක්‍රියාත්මක කළා. වත්මන් තත්ත්වය රටේ සෑම අංශයකටම බලපෑම් කරන තත්ත්වයක්. ඊට හොඳින් මුහුණ දිය හැක්කේ තාක්ෂ-ණික විකල්ප කෙරෙහි හා මානුෂික කරුණු පිළිබඳ සැලකිලිමත් වීමෙන් පමණයි. අභියෝග නැති නම් සාර්ථකත්ව-යකුත් නෑ. ඒවාට මුහුණ දීමෙන් පමණයි පරිණත බව අත්වෙන්නේ. තරගකාරීත්වය මෙන්ම ස්වාභාවික අභියෝගත් සාර්ථක-ත්වයට අවැසියි.

● ජාතික මෙන්ම අන්තර්ජාතික ඇගයීම් කිහිපයක්ම ඔබ ආයතනය වෙත ලැබී තිබුණා?

අන්තර්ජාතිකව මෙන්ම දේශීයව ඉහළම ඇගයීම් හා සම්මාන රාශියක් අප හිමි කරගෙන තිබෙනවා. හොඳම බෙදාහරින්නා මෙන්ම සන්නාම ප්‍රවර්ධකයා ලෙසත් අවස්ථා කිහිපයකදීම නම් කර තිබෙනවා. ආයතනයක් ලෙස ලත් ඇගයීම් මෙන්ම ඉහළ කළමනාකරණය ලත් සම්මාන මේ අතර වෙන්ව හඳුනාගත හැකියි. ආසියා රිටේල් කොංග්‍රසය වසරේ තරුණ ව්‍යවසායකයා සම්මානය අප ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරි ශබ්යර් සුබියන් මහතා වෙත පිරිනැමීම. මීට අමතරව 2016 වසරේදී හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන විසින් අපගේ අයතනික සමාජ සත්කාරක ව්‍යාපෘතිය ජාතික කර්තව්‍යයක් ලෙස පිළිගැනීම අප ලත් සම්මාන-යක් ලෙසයි සලකන්නේ.

මෙපමණක් නොවේ 2018, 2019, 2020 සේවය කිරීම සඳහා සුදුසුම ස්ථාන ලෙස අඛණ්ඩව වසර තුනක් නම් කර තිබීම. 2020 වසරේ කාන්තාවන්ට සේවය කිරීමට සුදුසුම ස්ථානය. 2020 ආසියාවේ හොඳම සේවා ස්ථානය පමණක් නොවේ 2019 ස්ලිම් නැස්කෝ හොඳම සිල්ලර කළමනාකරු (Best retail Manager) මොහොමඩ් අස්ලම් (වැල්ලවත්ත ප්‍රදර්ශනාගර කළමනාකරු) නම් කිරීම. 2019 ස්ලිම් නැස්කෝ හොඳම විකුණුම් විධායක (Best sale executive) ලෙස මොහොමඩ් සලීම් (වත්තල ප්‍රදර්ශනාගාරය) නම් කිරීම සේම ගෝල්ඩන් ග්ලෝබල් ටයිගර් සම්මානය අප වෙත හිමි වූයේ විලාසිතා හා ජීවන රටා බාණ්ඩයේ සන්නාම විශිෂ්ටත්වය සඳහායි. මෙවන් සම්මාන අප යන ගමන පිළිබඳ විශ්වාසය තහවුරු කරන දිරිගැන්වීම් ලෙසයි අප සලකන්නේ.

සටහන - බුද්ධිකා බ්‍රාහ්මණගේ

පීපල්ස් ලීසිං විශිෂ්ටතම ආයතනික සමාජ සත්කාරක දහය අතරට

ශ්‍රී ලංකාවේ බැංකු නොවන ප්‍රමුඛ-තම මූල්‍ය සමාගම වන පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් සමාගමේ ආයතනික සමාජ වගකීම් 'ඉයන් ඩයස් අබේසිංහ අනුස්ම-රණ 'JASTECA CSR/Sustainability Award - 2020' සම්මාන උලෙළේදී පසු-ගියදා හොඳම ආයතනික සමාජ සත්කාර 10 අතරේ ඇගයීමට ලක්විය. 'ජපන් ශ්‍රී ලංකා තාක්ෂණික හා සංස්කෘතික සංග-මය 'JASTECA' විසින් වාර්ෂිකව සංවිධාන කරන මේ සම්මාන උලෙළ 24 වැනි වරටත් ශ්‍රී ලංකාවේ ජපාන තානාපති කාර්යාලයේ ඇමැති ටොෂිහිරෝ කිතමුරා මහතාගේ ප්‍රධා-නත්වයෙන් පසුගියදා කොළඹදී පැවැත්විණි. ආයතනික සමාජ සත්කාරය, තිරසාරත්වය ක්ෂේත්‍රයෙහි විවිධ අංශ 10ක විශිෂ්ටත්වය උදෙසා පිරිනමන මේ 'ඉයන් ඩයස් අබේ-සිංහ අනුස්මරණ 'JASTECA CSR/ Sustainability Award - 2020' සම්මාන උලෙළේදී මෙවර පීපල්ස් ලීසිං සමාගම ඇගයීමට පාත්‍ර වූයේ අප රටේ මුල් ළමාවිය අධ්‍යාපනය නඟාසිටුවීමට එම සමාගම ලබා-දුන් දායකත්වය වෙනුවෙනි. දරුවන්ගේ මුල් ළමාවිය අධ්‍යාපනය සඳහා පීපල්ස් ලීසිං සමා-ගම එම ආයෝජනය කරනුයේ දැයේ මානව සම්පතේ ගුණාත්මකභාවය ඉහළ නැංවීමට පදනම මුල් ළමා වියේදී ලැබෙන බැවිනි.

නවීන පුස්තකාල බවට පත් වන භාවිතයෙන් ඉවත ලූ බස් රථ

ශ්‍රී ලංකා ටෙලිකොම් සහ මොබිටෙල්, මනු-සත් දෙරණ සමඟ අත්වැල් බැඳගනිමින් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ (SLTB) ඉවත් කරන ලද බස් රථ 25ක් නවීන හා අංග සම්පූර්ණ පුස්තකාල බවට පරිවර්තනය කිරීමට සමත් වී ඇත. මේ පුස්තකාල බස් රථවල කියැ-වීමේ පහසුකම්, වයිෆයි සම්බන්ධතාව සහ තොරතුරු ලෝකය සමඟ සම්බන්ධ වීමට දරු-වන්ට හැකි වන පරිදි ආධාරක පද්ධති අඩංගු වේ. මේ පුස්තකාල ඉගෙනුම් මධ්‍යස්ථාන ලෙස ක්‍රියා කරන අතර, එමඟින් අධ්‍යා-පන සම්පත් අඩු සිසුන්ට සමාන අවස්ථා ලබා දෙන අතර, කියැවීමේ වැදගත් පුරුද්ද ඇති කිරීමට ද උපකාරී වේ. ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය හා ශ්‍රී ලංකා ටෙලිකොම් සමඟ එක්ව මේ වැඩපිළිවෙළ ක්‍රියාත්මක කරන ලදි. දිවයින පුරා ග්‍රාමීය පාසල් 25ක් සවිබල ගැන්වීම සඳහා ශ්‍රී ලංකා ටෙලිකොම් සමූහය මේ නවීකරණය කරන ලද බස් රථ පුස්තකාල බවට පරිවර්තනය කිරීමේ ජාතික ආයතනික සමාජ වගකීම් ව්‍යාපෘතිය කෙරෙහි අවධානය යොමු කළේය.

පළමු බස් රථ පහ භාරදීම සනිටුහන් කළ උත්සවය පසුගි-යදා ජනාධිපති ලේකම් කාර්යාලයේ දී පැවැත්විණි. මේ අව-ස්ථාවට ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ සහ SLT සමූහයේ සභාපති රොහාන් ප්‍රනාන්දු, SLT සමූහයේ ප්‍රධාන විධායක නිලධාරි ලලිත් සෙනෙවිරත්න, SLT ප්‍රධාන විධායක නිල-ධාරි කිත්ති පෙරේරා, මොබිටෙල් ප්‍රධාන විධායක නිලධාරි නලින් පෙරේරා, SLT ප්‍රධාන මෙහෙයුම් නිලධාරි එම්. බී. පී. ෆර්නැන්ඩස්, SLT ප්‍රධාන අලෙවි නිලධාරි ප්‍රභාත් දහනා-යක, මොබිටෙල් ආයතනයේ ප්‍රධාන අලෙවි නිලධාරි ශශික සෙනරත් මහත්වරුද, ශ්‍රී ලංකා ටෙලිකොම්, මොබිටෙල් සහ ගමනාගමන මණ්ඩලයේ (SLTB) අනෙකුත් සම්භාවනීය ආරාධිතයෝ රැසක් ද සහභාගී වූහ.

ලොව ප්‍රථම කාබන් අක්‍රිය ක්ෂුද්‍ර ජීවී මර්දක විෂබීජහරණ සේවාව එක්ස්ටර්මිනේටර්ස්

ආසියාවේ ප්‍රථම කාබන් අක්‍රිය පළි-බෝධ මර්දක සමාගම වන 'ද එක්ස්ටර්මිනේටර්ස්' කොවිඩ් 19 ගෝලීය වසංගතය පිටුදැකීම සඳහා ලෝකයේ පළමු වැනි විශේෂිත ක්ෂුද්‍ර ජීවී මර්දක විෂබීජහරණ සේවාව අරඹයි. පරිසරය සුරැකීමට කැප වූ ද එක්ස්ටර්මිනේටර්ස් සමාගම ගෝලීය වශයෙන් පිළිගන්නා කාබන් අක්‍රිය සහතිකය හිමි කර ගෙන ඇත. අදාළ විෂබීජහරණ සේවයේ හරි-තාගාර වායු විමෝචන මට්ටම් පරීක්ෂාව සිදු කළේ ඉකුත් සය වසර මුළුල්ලේම සමාගමේ වායු නිකුතුව කළමනාකරණයට උපදෙස් දුන් කාබන් කන්සල්ටින් සමාගමය. මේ විශේෂිත විෂබී-ජහරණ සේවය සඳහා කාබන් අක්‍රිය සහතිකය පිරි-නමන ලද්දේ ISO 14064 ප්‍රමිතියට අනුව සංවිධාන හා ව්‍යාපෘතිවල හරිතාගාර වායු විමෝචන තහවුරු කිරීමේ බලය ලත් එකම ශ්‍රී ලාංකික සමාගම වන සස්ටේනබල් ෆියුචර් සමූහයය.

දේශීය ජන සමාජයටත් ව්‍යාපාරික ක්ෂේත්‍රයටත් එක සේ අභියෝගකාරී වත්මන් වසංගත තත්ත්වය තුළ විශේෂ විෂබීජහරණ සේවාවක් සඳහා පුහුණු කරන ලද එක්ස්ටර්මිනේටර්ස් විශේෂඥ කණ්ඩායම මේ දක්වා වැඩිහිටි නිවාස 71ක්, පොලිස් ස්ථාන 29ක්, පූජනීය ස්ථාන 15ක්, පාසල් 13ක් හා පොදු ස්ථාන 12ක් පවිත්‍ර කළේය. මේ උතුම් කාර්යය සඳහා රට පුරා කිලෝමීටර් 5,700ක් සංචාරය කළ එක්ස්ටර්මිනේටර්ස් කණ්ඩායම නිරෝධායන මධ්‍යස්ථාන ගණනාවක් මෙන්ම නෙළුම් කුලුනද විෂබීජහරණය කළේය. එක්ස්ටර්මිනේටර්ස් සේවය යටතේ විෂබීජහරණය කළ කිසිදු ස්ථානයකින් කොවිඩ් ආසාදිතයකු වාර්තා වී නොතිබීම විශේ-ෂත්වයකි. "ශ්‍රී ලංකාවේ පුරෝගාමී හා ප්‍රමුඛතම විෂබීජහරණ ව්‍යාපාරය වශයෙන් මේ සහතිකය ලැබීම අපේ ගමන් මඟෙහි සුවිශේෂ සන්ධිස්ථාන-යක්. ලෝකයේ කාබන් අක්‍රිය සහතිකය ලත් ප්‍රථම විෂබීජහරණ සේවය මෙය බව අපේ විශ්වාස-යයි." එක්ස්ටර්මිනේටර්ස් නිර්මාතෘ කළමනා-කාර අධ්‍යක්ෂ මාලන් ෆෙරෙයිරා මහතා පැවසීය. කොවිඩ් වසංගතය පවතින තාක් මේ සේවාව සපයන බවත් ඉදිරියේදී නව අභියෝගවලට මුහුණ දීමට සූදානම් බවත් හෙතෙම සඳහන් කළේය.

දේශවංශය
දේශයේ පාලන මාවත

JR ගෙන් ප්‍රේමදාසට ලැබුණු විධායක බලය



ව්‍යවස්ථාවට අනුව, විධායක ජනාධිපති ආණ්ඩුවේ නායකයා, විධායකයේ ප්‍රධානියා, සන්නද්ධ සේවාවන්හි සේනා විධායකයා ද රාජ්‍ය නායකයා වන්නේ ය යනුවෙන් (38) 1 වගන්තියේ සඳහන් වී තිබේ. ජනපතිවරයා වීමට අවශ්‍ය සුදුසුකම් ලෙස වයස අවුරුදු 30 ඉක්මවීම, ශ්‍රී ලංකා පුරවැසියකු වීම, දෙවරකට වඩා ජනපති වී නොමැති වීම සහ දෝෂාභියෝගයක් මගින් ධූරයෙන් පහ කළ අයකු නොවිය යුතු ය ව්‍යවස්ථාව මගින් පෙන්වා දී තිබේ. මෙම ජනපතිවරයාට පාර්ලිමේන්තුව කැඳවීම, කල් තැබීම, විසුරුවා හැරීම ස්ව කැමැත්තට අනුව කළ හැකි වුව ද පළමු වර්ෂය තුළ සහ දෝෂාභියෝගයක් පාර්ලිමේන්තු න්‍යායපත්‍රයට ඇතුළත්කොට ඇත්නම් ඔහුට ද පාර්ලිමේන්තුවක් විසුරුවා හැරිය නොහැකි ය. කෙසේ වෙතත් මෙරට විධායක ජනාධිපතිවරයාට ඇත්තේ අසීමිත බලයක් බැව් දත යුත්තකි. ඔහුට ජනමත විචාරණයක් කැඳවීම, ඇමති ධූර පිරි නැමීම, විශේෂ අවස්ථාවල පාර්ලිමේන්තුවේ මුලසුන දැරීම, අගමැති පත් කිරීම, කැබිනට් මණ්ඩලය පත් කිරීම, රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශය ඉදිරිපත් කිරීම, ඉහළ රාජ්‍ය නිලධාරීන් පත් කිරීම, තානාපතිවරුන්-මහ කොමසාරිස්වරුන් පත් කිරීම, ඔම්බුඩ්ස්මන් පත් කිරීම, විදෙස් ගිවිසුම්වලට එළඹීම, පළාත් ආණ්ඩුකාරවරුන් පත් කිරීම, විශ්වවිද්‍යාල උපකුලපතිවරු පත් කිරීම, රාජ්‍ය සේවා කොමිෂන්සභාව පත් කිරීම, ඉහළ උසාවිවල විනිසුරුවරුන් පත් කිරීම, වරදකරුවන්ට සමාව දීම, නීතිපති පත් කිරීම, අධිකරණ සේවා කොමිෂන්සභාව පත් කිරීම ආදී වූ අසීමිත බලතල ප්‍රමාණයක් ඔහුට ව්‍යවස්ථාවෙන් පත් හිමිය.

විධායක ජනාධිපතිවරයකු ඉවත් කිරීමේ එක ම ක්‍රමවේදය දෝෂාභියෝගය යි. 78 ව්‍යවස්ථාවට අනුව එහි (38) 02 වගන්තියෙහි දෝෂාභියෝගයක් සඳහා අවැසි විධිවිධාන දක්වා ඇත. ඒ සඳහා වන ක්‍රියාදාමයක් ද ඇත. පළමුව අදාළ චෝදනා සහිත ව පෙත්සම සකස් කළ යුතු ය. ඉන් අනතුරු ව පාර්ලිමේන්තුවේ සම්පූර්ණ මන්ත්‍රීන්ගෙන් 2/3ක් හෝ වැඩි අත්සන් සහිතව කථානායක වෙත ඉදිරිපත් කළ යුතු ය. එසේ නොවේ නම් පාර්ලිමේන්තු න්‍යාය පත්‍රයට එය අන්තර්ගත නොකර සිටීමට කථානායකට හැකි ය. අත්සන් සහිතව ලබා දීමෙන් පසුව කථානායක විසින් එය න්‍යායපත්‍රයට ඇතුළත් කරනු ලැබේ. පාර්ලිමේන්තු න්‍යාය පත්‍රයට ඇතුළත් කළ හොත් පාර්ලිමේන්තුව විසුරුවා හැරීමේ බලය ජනපතිට අහිමි වේ. ඒ අනුව පළමු විවාදය සිදුවන අතර එය අවසන 2/3ක බහුතරයකින් එය අනුමත විය යුතු ය. ඉන් අනතුරු ව ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සම ඉදිරිපත් කරනු ලැබේ. අගවිනිසුරු ප්‍රමුඛ පංච පුද්ගල විනිසුරු මඬුල්ලක් හමුවේ එය විභාගයට ගැනේ. අධිකරණයෙන් ද වැරදිකරු වුව හොත් එම තීරණයෙන් පසු නැවතත් පාර්ලිමේන්තුවට ගෙනෙන අතර විවාදයකින් පසු ව එය ද 2/3ක බහුතරයකින් සම්මත විය යුතු ය. මේ විධිවිධාන පරීක්ෂා කිරීමේ දී අපට පැහැදිලි වෙන්නේ දෝෂාභියෝගයකින් ජනපතිවරයෙක් ඉවත් කිරීම කිසිසේත්ම පහසු කටයුත්තක් නොවන බවය.

1977 පැවති මහමැතිවරණයෙන් එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව දැවැන්ත පොරොන්දු මල්ලක් ද සමඟ ජයග්‍රහණය කරයි. එවක බලයේ සිටි සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ ආණ්ඩුව පරාජය කොට බලයට පැමිණෙන ජේ.ආර්.ජයවර්ධන ජනාධිපතිවරයා සිය විධායක බලතල වැඩි කර ගැනීම සඳහා 3/5ක ජන බලය බුද්ධිමත් ව යොදා ගත්තේ ය. ඒ අනුව 1978 ව්‍යවස්ථාව සකසා විධායක ජනපති බලය සියතට ගත්තේය. ඔහුට අවැසි පරිදි රට මෙහෙයවන්නට ජයවර්ධන ජනපතිට හැකි විය. ඔහුගෙන් අනතුරුව ලංකාවේ දෙවැනි විධායක ජනපතිධූරයට පත්වන්නේ රණසිංහ ප්‍රේමදාස මහතා ය. ලංකාවේ ප්‍රථම දෝෂාභියෝගයට මුහුණ දෙන්නේ ඔහුය. මේ එම කතාව යි.

1977 පැවති මහමැතිවරණයෙන් එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව දැවැන්ත පොරොන්දු මල්ලක් ද සමඟ ජයග්‍රහණය කරයි. එවක බලයේ සිටි සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ ආණ්ඩුව පරාජය කොට බලයට පැමිණෙන ජේ.ආර්.ජයවර්ධන ජනාධිපතිවරයා සිය විධායක බලතල වැඩි කර ගැනීම සඳහා 5/6ක ජන බලය බුද්ධිමත් ව යොදා ගත්තේ ය.

ප්‍රේමදාස ආණ්ඩුවේ ප්‍රබලයන් දෙදෙනකු වූ ලලිත් ඇතුළත්මුදලි සහ ගාමිණී දිසානායක මහත්වරුන් අතර සීතල යුද්ධයක් එවක අග්‍රාමාත්‍ය තනතුර සඳහා තිබුණු අතර එය උපක්‍රමික ව යොදාගත් ආර්. ප්‍රේමදාස ජනපතිවරයා කළේ තමාට අභිමත පරිදි පාලනය කළ හැකි ඩී.බී.විජේතුංග මහතා අගමැති කරවීම යි. එයින් දැඩි හිත් වේදනාවට පත්වීම ලලිත්-ගාමිණී සංයෝගයට හේතු විය. මහජනතාවගේ නායකයා වශයෙනන් ච්‍රප්‍රසිද්ධියට පත් වී අග්‍රාමාත්‍ය තනතුරටත් පසුව විධායක ජනපති තනතුරටත් පත් රණසිංහ ප්‍රේමදාස මහතා 1990 වන විට ජනප්‍රියත්වයෙන් කිසියම් ආකාරයක පිරිහීමකට ලක් වී සිටියේ ය. මේ අවස්ථාව ප්‍රයෝජනයට ගත් ලලිත්-ගාමිණී සහ විපක්ෂ නායක සිරිමා බණ්ඩාරනායක ලන්ඩන් නගරයේ දී මුණ ගැසී ප්‍රේමදාස බලයෙන් පහ කිරීමට සැලසුම් සකස් කළහ. සාවිශ්වාව එකඟතාවකින් තොරව අවසන් වුව ද 1991 වන විට ජනපතිවරයා තමන්ට නොරුස්සන අයට දැඩි ප්‍රහාරයක් දියත් කරන්නට කටයුතු කළේ ය. ගාමිණී දිසානායක මහතා ඔහු දැරූ අමාත්‍යධූරයෙන් ඉවත් කළේ ය. ලලිත් ඇතුලත්මුදලි මහතාගේ බලතල සීමා කළේ ය. කථානායක එම්.එච්.මොහොමඩ් මහතාගේ පුතාට කොළඹ නගරාධිපති ධූරය ලබා නොදුන්නේ ය. එම්.එච්.මොහොමඩ් දැරූ බොරැල්ල ආසන සංවිධායකකම අහිමි කළේ ය.

ලලිත්-ගාමිණී වූ කලී ක්‍රියාකාරි මෙන් ම බුද්ධිමත් නායකයන් වශයෙන් නිහඬව නොසිටියහ. මුලින් ඔවුන්ගේ අදහස වූයේ මුදල් පනතක් පරාජය කිරීම මගින් කැබිනට් මණ්ඩලයට ඉල්ලා අස්වීමට සැලැස්වීම යි. පසුව එය දෝෂාභියෝගයක් ලෙස වෙනස් කර ගන්නා ලදී. මේ වනවිට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ බල අරගලයක් ද හටගෙන තිබුණි. සිරිමා පිල සහ අනුර පිල

වශයෙන් පිල් බෙදී තිබුණි. ලලිත්-ගාමිණී සිරිමා නැවත මුණ ගැසී දෝෂාභියෝගය ගෙන එන්නට සැලසුම් කළහ. මේ සඳහා කතානායකගේ සහයෝගය ද ලැබුණු බැව් කියැවේ.

මේ සඳහා තිබුණු ප්‍රධානත ම අභියෝගය වූයේ මේ සඳහා අත්සන් ලබා ගැනීම යි. විපක්ෂයේ පමණක් නොව ආණ්ඩු පක්ෂයේ ද මන්ත්‍රීන්ගේ සහයෝගය ලබා ගත යුතු විය. ඒ වනවිට ත් ඔවුන් සමඟ සිටි සියලු ම විපක්ෂ මන්ත්‍රීන්ගේ සහය මේ සඳහා ලැබෙන විට ස්ටැන්ලි තිලකරත්න පමණක් ඊට අත්සන් යෙදුවේ නැත. දෝෂාභියෝගය පිළිබඳ දැනලත් වහා ම ඒ පිළිබඳ ජනාධිපතිවරයාගේ ප්‍රවෘත්ති ලේකම් වූ එවන්ස් කුරේ මහතාට දුරකථනයෙන් දැනුම් දෙන ලද්දේ ද ඔහු විසිනි. කෙසේවෙතත් අවශ්‍ය අත්සන් ලබාගෙන එය කතානායක වෙත භාරදීමට ඔහුවු කටයුතු කළහ. කතානායකවරයාගේ සහයෝගය ද මේ වනවිට ලලිත්-ගාමිණී එකමුතුවට ලැබී තිබීම මේ සඳහා ආශීර්වාදයක් විය. මෙයට දවිඩ එක්සත් විමුක්ති පෙරමුණ ද අත්සන් තබන ලදී.

දෝෂාභියෝගය පිළිබඳ ප්‍රසිද්ධ ව තිබුණු හේතු සාධක ලෙස ජනපතිවරයාගේ මානසික හෝ ශාරීරික අබලතාව හේතුවෙන් ධූරයේ රාජකාරි ඉටු කිරීමට නොහැකි බව මූලිකව පෙන්වා දී තිබූ බැව් පෙනේ. එහිදී පාර්ලිමේන්තු හා කැබිනට් අමාත්‍යවරුන්ගේ බලතලවලට හානි පමුණුවමින් ව්‍යවස්ථාවේ විධිවිධාන උල්ලංඝනය කර තිබීම, අමාත්‍යවරුන් නොසලකා ඔවුන්ගේ අමාත්‍යංශ ලේකම්වරුන්ට කෙලින් ම නියෝග ලබා දීම, අමාත්‍යංශවල ලේකම්වරුන් ලවා ඔවුන්ගේ අමාත්‍යවරුන් සම්බන්ධ රහස් වාර්තා ලබා ගැනීම, එල්.ටී.ටී.ඊ සංවිධානයට ආයුධ සැපයීම, ඉන්දියානු සාමසාධක හමුදාව පිටත්කොට ජාතික ආරක්ෂාවට තර්ජනයක් ඇති කිරීම, අමාත්‍යවරුන්ගේ පෞද්ගලික දුරකථන සංවාදවලට නීති විරෝධී ව සවන් දීම, ගම්උදාව සඳහා විශාල වශයෙන් මහජන මුදල් නාස්ති කිරීම, ඒකාධිපති පාලනයක් ඇතිකිරීමට උත්සාහ කිරීම වැනි චෝදනා ඒ අතර ප්‍රධාන ය.

1991 අගෝස්තු 28වැනි දින මන්ත්‍රීවරුන්ගේ අත්සන් සහිත ව තමා වෙත ලබාදුන් දෝෂාභියෝගය භාරගත් කතානායක එම්.එච්.මොහොමඩ් මහතා ඒ පිළිබඳ දන්වමින් එම මස 29වැනි දින ජනාධිපති ලේකම් කාර්යාලයට ත් මැතිවරණ කොමසාරිස්ටත් ආරක්ෂක ප්‍රධානීන්ට ත් ලිපියක් මගින් දැනුම් දෙන්නට කටයුතු කළේ ය. මේ පිළිබඳ පූර්වයෙන් ම ජනපති වෙත ප්‍රවෘත්ති ලේකම් විසින් දැනුම් දී තිබුණ ත් එය එතරම් තැකීමකට නොගත් ප්‍රේමදාස මහතා ලිපිය ලැබීමෙන් මහත් කැළඹීමකට පත් වූ බැව් කියැවේ. එවක ඔහුගේ නීති උපදේශක වූ චොක්ෂි මහතාගේ ත් නීති උපදේශකයන්ගේ ත් සහයෝගය පැතූ ඔහු ඊට සුදුසු ම ක්‍රියාමාර්ගය ලෙස පාර්ලිමේන්තුව වාරාවසාන කිරීමට තීරණය කළේ ය. ඊට පෙර කැබිනට් මණ්ඩලයේ දී රනිල් වික්‍රමසිංහ මහතා විසින් දෝෂාභියෝගය පරාජය කිරීමට යෝජනාවක් ඉදිරිපත්කොට එය ඒකමතික ව සම්මත කරගන්නා ලදී. අමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතා ජනපති ප්‍රේමදාස සමඟ ඒ දුෂ්කර මොහොතේ සිටියේ ය. ඒ අතර විරුද්ධ ව ගිය මන්ත්‍රීවරුන් තමා වෙත නම්මවා ගැනීමට ප්‍රේමදාස මහතා විවිධ උපක්‍රම යොදන ලදී. ඒ සඳහා ඉන්දියානු ගුප්ත විද්‍යාඥයන් පවා ගෙන්වා විවිධ ප්‍රයෝග කටයුතු ද සිදු කරන ලදී.

මේ අතර ප්‍රේමදාස මහතා 1991 වර්ෂයේ සැප්තැම්බර් මාසයේ දිනක ආණ්ඩු පක්ෂ මන්ත්‍රීවරුන්ගේ රැස්වීමක් කැඳවා සමස්ත මන්ත්‍රීන් 123න් ඊට සහභාගී වූ 116 දෙනා ඇමතී ය. ඒ වනවිට ඔවුන් සහභාගී වී සිටින ඡායාරූප සහ වීඩියෝ දර්ශන ද මාධ්‍ය වෙත නිකුත් කරන්නට කටයුතු කළේ ය. එහි දී කතා කළ ජනපති ප්‍රේමදාස,"මං මේ වෙලාවෙ කිසි ම ගනුදෙනුවකට ලෑස්ති නැහැ. මං ඒකයි ලලිත් ඇතුළත්මුදලි ඇමතිතුමාට කිවුවෙ, ගාමිණී දිසානායක ප්‍රශ්නෙ ගැන. මංගාව ගනුදෙනු නෑ. ...ඒ නිසා මං කියන්න කැමතියි තමුන්නාන්සේලාට මේ කරුණු හරියට තේරුම් ගන්න. තේරුම් අරගෙන නිසි විදියට ක්‍රියා කරන්න. මං කිවුවා. මගේ මේක ඉල්ලීමක් නොවෙයි. ආයාචනයක් නොවෙයි. අභියාචනයක් නොවෙයි. කන්නලව්වක් නොවෙයි. ඉහත ප්‍රකාශය තුළ ඔහු ස්වකීය හඬ ආධිපත්‍ය සහ විධායක ආධිපත්‍ය මෙන් ම ආණ්ඩුවේ අධිපතිකම ද ආරෝපණයකොට ගෙන ඉහත ප්‍රකාශය කර ඇති අයුරු පෙනේ. ඔහු 03දිනට යෙදී තිබුණු පාර්ලිමේන්තු සැසිවාරය චක්‍රෙල්ඛයක් මගින් සැප්තැම්බර් 24 දක්වා කල් දැමීමේ ය. ඔහු ඒ පිළිබඳ ව මෙසේ පැවසී ය.

"ඇයි මම පාර්ලිමේන්තු සැසිවාරය කල් දැමීමේ. 03වැනිදාට තිබුණු පාර්ලිමේන්තු සැසිවාරය. පැමිණිලි ගලා එන්න පටන්ගත්තා. මේ ජනාධිපතිවරයා අස්කරන්න 'ඉම්පීච්මන්ට්' මෝසන් එකක් ගෙනල්ලා තියෙනවා. අපෙන් බොරු අත්සන් අරන් තියෙනවා ය. ඉතිං මං කල්පනා කළා මේ තත්ත්වය පැහැදිලි වෙන්න ඉඩ දෙන එක හොඳයි. ඒක නිසා කල් දැම්මා" යනුවෙන් ඔහුගේ තීරණය සාධාරණීකරණය කළේ ය.

සැප්තැම්බර් 24වන දින පාර්ලිමේන්තු සැසිවාරය විවෘත කිරීමේ අවස්ථාවේ දී සිය කතාව පැවැත්වීමට සභාගර්භයට පිවිසි ජනපතිට විරුද්ධ පක්ෂයෙන් තදබල ලෙස විවේචන එල්ල විය. බාධා කිරීම් හා විරෝධතා එල්ල විය. 'ඒකාධිපතියා, වන් මෑන් ෂෝ' ආදී වාග් ප්‍රහාර එල්ල විය. මේ වනවිට ත් ආණ්ඩු පක්ෂ මන්ත්‍රීන් 116දෙනා පෞද්ගලික ව ම කතානායක හමු වී දෝෂාභියෝගයට තමන්ගේ සම්බන්ධයක් නැති බව ත් ජනපතිට පූර්ණ පක්ෂපාතිත්වය පළ කරන බව ත් ප්‍රකාශකොට තිබුණත් කතානායක එහිදී නිහඬ ව සිටියේ ය.

මේ අතර ලලිත්-ගාමිණී ප්‍රමුඛ 'අටේ කල්ලිය' එජාපයෙන් නෙරපා දමන ලදී. ඊට විරුද්ධ ව ඔවුහු ව්‍යවස්ථාවේ (99) 13 අ වගන්තිය යටතේ ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු පැවරුවෝ ය. ජනපති ප්‍රේමදාස කතානායක දිනා ගැනීම සඳහා තමන්ගේ ක්‍රියා පිළිවෙත ද අටේ කල්ලිය තමන්ගේ ක්‍රියාදාමය ද නොනවත්වා සිදුකරගෙන ගියහ. අවසන වැඩි වාසි ප්‍රේමදාස ජනපතිවරයාට ලැබෙන බැව් පෙනෙන්නට තිබුණි.

මේ අතර කතානායක එම්.එච්.මොහොමඩ් තම පාර්ශ්වයට නවා ගන්නට ජනපති ප්‍රේමදාස සමත් වී තිබුණි. දෝෂාභියෝග යෝජනාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට අවශ්‍ය අත්සන් සංඛ්‍යාව නොමැති බව පෙනී යන හෙයින් ඒ සම්බන්ධයෙන් තවදුරටත් ක්‍රියා නොකිරීමට තීරණය කොට ඇත යනුවෙන් ලිඛිත ව ලිපියක් කතානායකගේ අත්සනින් ලබා ගැනීමට ඔක්තෝම්බර් 08වැනි දින වනවිට ඔහුට හැකි වී තිබුණි. ප්‍රේමදාස මහතා එය ඒ වනවිට ත් සිය ප්‍රවෘත්ති ලේකම් හරහා ජනමාධ්‍ය වෙත ලබා දී තිබුණ ද එය ඔක්තෝම්බර් 09වන දින එනම් පසු දින කතානායක විසින් ප්‍රකාශ කළාට පසු ව ප්‍රසිද්ධ කරන ලෙස එම ආයතනවලට පූර්ව දැනුම්දීම් කොට තිබුණි. මෙහි දී ප්‍රේමදාස ජනපතිවරයාගේ සාමර්ථතාවය වූයේ 09වන දින කතානායක ප්‍රකාශ කිරීමට තිබූ දෙය ලිඛිත ව ඊට පෙර දින ලබා ගැනීම ය. බලාපොරොත්තු වූ පරිදි ම කතානායකවරයා එම ප්‍රකාශය සිදු කළේ ය. ලලිත්-ගාමිණී, අටේ කල්ලිය මෙන් ම ආණ්ඩු පක්ෂයේ අය ද ගල් ගැසුණහ. කතානායක සිය අරගලය පාවා දුන්නේ ය යන කේන්තියෙන් කතානායකට හැකි තරම් බැණවදින්නට විය. ඒ වනවිට ත් මුලසුනේ සිටියේ නියෝජ්‍ය කතානායක වරයා ය. දෝෂාභියෝගය එසේ නිම විය. 1991 දෙසැම්බර් 31 දින පක්ෂ තහනමට එරෙහි ව ගොනුකළ පෙත්සම නිශ්ප්‍රභා විය. ලලිත් ගාමිණී 'රාජාලියා ලකුණෙන්' ප්‍රජාතන්ත්‍රවාදී එක්සත් ජාතික පෙරමුණ' නමින් නව පක්ෂයක් පිහිටුවූහ.

◣ගයාන් පීරිස්

පාකිස්තාන පුරවැසිභාවය එපා කියූ ලාංකික දේශප්‍රේමියා ටී.බී. ජායා

බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදයට එරෙහි ලාංකේය නිදහස් සටනේ අවසන් අදියරට නායකත්වය දුන් නායකයන් අතර විවිධ ජනවර්ග නියෝජනය කළ පිරිස් සිටියහ. ඒ අතර ඩී. ඇස්. සේනානායක, සර් පොන්නම්බලම් රාමනාදන්, සර් ඩී. බී. ජයතිලක, සර්. ජේම්ස් පීරිස් මෙන්ම ටී. බී. ජායා චරිතයද කැපී පෙනුණි. අපේ රටේ පමණක් නොව ලොව බොහෝ තැන්වල කුමන ආගම ඇදහුවද කුමන වර්ගය නියෝජනය කළ ද කුමන කුලයට අයත් වුව ද තම රට කෙරෙහි සැබෑ ආදරයක් ඇති දේශප්‍රේමීන් සිටින්නේ කලාතුරකිනි. ටී. බී. ජායා, යනු වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම සැබෑ දේශප්‍රේමී ශ්‍රී ලාංකිකයෙකි. ලක්දිව නිදහස අත්පත් කරගැනීමට ආසන්න අවස්ථාවේ ලංකා පනත රාජ්‍ය මන්ත්‍රණ සභාවට ඉදිරිපත් වූ විට ටී. බී. ජායා සිදු කළ ප්‍රකාශයෙන් ඔහුගේ දේශප්‍රේමීත්වය මනාව ප්‍රදර්ශනය වෙයි

"ශ්‍රී ලංකාවට නිදහස ලබා ගැනීමට සඳහා අප ඕනෑම ක්‍රියාමාර්ගයකට යටත්ව කටයුතු කිරීමට සූදානමින් සිටිමු. මුස්ලිම්වරුන් ලෙස තමන් භුක්ති විඳින වාසි සහ ලාභ ප්‍රයෝජන පවා ඊට කැප කිරීමෙන් හෝ එය කිරීමට අප සූදානම්. පටු දැක්මකින් බලන විට මුස්ලිම් ජනයාට මෙම පනත අවාසිදායක වුවත් රටේ නිදහස වෙනුවෙන් මේ පනතට සහාය දීමට මම සූදානම්....."

1890 ජනවාරි මස පළමුවන දින මහනුවර ගලගෙදර ප්‍රදේශයේදී උපන් ටී. බී. ජායාගේ පියා කසිම් ජායා වූ අතර මව බයා සෞජා විය. ටී. බී. ජායා යන මුලකුරු නාමයෙන් අදටත් කවුරුත් හොඳින් හඳුනන මෙම දේශප්‍රේමියාගේ සම්පූර්ණ නම තුවාන් මුර්හාදීන් ජායා ය. ටී. බී. ජායා ප්‍රාථමික අධ්‍යාපනය ලැබුවේ කුරුණෑගල ස්වභාෂා පාසලෙන් වන අතර ද්විතීයික අධ්‍යාපනය සඳහා ගල්කිස්ස ශාන්ත තෝමස් විද්‍යාලයට ඇතුළත් විය. එහිදී උසස් ලෙස විභාගවලින් සමත් වන ජායා මහනුවර ධර්මරාජ විද්‍යාලයේ ගුරුවරයෙක් ලෙස තම වෘත්තිය ජීවිතය ආරම්භ කළේය. පසුව මොරටුව වේල්ස් කුමර විද්‍යාලයේත් කොළඹ ආනන්ද විද්‍යාලයෙත් ගුරුවරයෙක් වශයෙන් සේවයට බැඳෙන ටී. බී. ජායා මරදාන සහිරා විද්‍යාලයේ විදුහල්පති ධුරයට පත් වන්නේය.

දෙවන ලෝක යුද්ධ සමයේ අගනුවර පාසල් වසා දැමුණු අතර මරදාන සහිරාවටද එම ඉරණමට මුහුණ පෑවේය. එහිදී අගනුවර බොහෝ පාසල්වල ශාඛාවන් කොළඹින් ඈත ප්‍රදේශවල ස්ථාපිත විය. සහිරාවේ ශාඛා කිහිපයක් අලුත්ගම, පුත්තලම, ගම්පොළ, මාතලේ ඉදි කිරීමට ටී. බී. ජායා විදුහල්පතිරයා වශයෙන් මූලිකත්වය ගෙන කටයුතු කළේය. කෙසේ නමුත් කොළඹ සහිරාව ටී. බී. ජායා විසින් බාර ගනිද්දී ළමයින් 59ක්, ගුරුවරුන් 6 දෙනකු සහ ගරා වැටුණු ගොඩනැගිල්ලක් සහිත කුඩා පාසලක් විය. ටී. බී. ජායා සහිරාවෙන් නික්මෙන විට එහි සිසුන් 3500ක් ගුරුවරුන් 100ක් සේවය කරන තරමට එය සංවර්ධනය කරන්නට ඔහු කටයුතු කළේය. ඒ ඔහුගේ දක්ෂතාවයි. ගුරුවරයෙක් ලෙස ටී. බී. ජායාගේ සෙවණේ සිප් නැණ ලැබූ රටේ ප්‍රධානියෝ රැසකි. ඒ අතර අපේ රටේ බිහි වූ ප්‍රකට දේශපාලනඥයන් වූ ආචාර්ය ඇන්. ඇම් පෙරේරා, පිලිප් ගුණවර්ධන, රොබට් ගුණවර්ධන, හිටපු කතානායකවරයෙක් වූ බකීර් මාකර් මෙන්ම හිටපු විශිෂ්ට අධ්‍යාපන අමාත්‍යවරයෙක් වූ බදියුදීන් මහමූද් ආදී විශාල පිරිසක් ටී. බී. ජායාගෙන් අකුරු උගත්හ.

මේ සියල්ල අතර ටී. බී. ජායාගේ දේශපාලන භූමිකාව ද අතිශය කැපී පෙනුණි. ඔහු ව්‍යවස්ථාදායක සභාවේ මන්ත්‍රීවරයකු ලෙස 1924 වසරේදී දේශපාලනයට පිවිසෙන්නේය. එහිදී 1930 දක්වා දෙවරක්ම ව්‍යවස්ථාදායක සභාව නියෝජනය කරන ජායා 1936 සහ 1947 යන වසරවලදී රාජ්‍ය මන්ත්‍රණ සභාවට තේරී පත් ව එහි නියෝජනය දරන්නේය. 1936 මැතිවරණයෙන් ඒ. ඊ. ගුණසිංහ හමුවේ ටී. බී. ජායා පරාජයට පත් වුවත් එතුමාව රාජ්‍ය මන්ත්‍රණ සභාවට නම් කරන ලද්දේ හෙතෙම රටට සිදු කළ සුවිසල් සේවාව හේතු කරගෙනය. ලක්දිව ප්‍රධානතම දේශපාලන පක්ෂයක් වන එක්සත් ජාතික පක්ෂය පිහිටුවීමේදී ද ටී. බී. ජායා එහි ප්‍රධානත්වය ගෙන කටයුතු කළේය. ටී. බී. ජායා විසින් ගොඩ නගන ලද සමස්ත ලංකා මුස්ලිම් ලීගයේ ශක්තිය එක්සත් ජාතික පක්ෂයට හිමි කර දුන්නා පමණක් නොව එහි පළමු උප සභාපතිවරුන් පස්දෙනා අතර එක් අයෙක් විය. 1947 ලංකාවේ පළමු පාර්ලිමේන්තුවේ කම්කරු සහ සමාජ සේවා අමාත්‍ය ධුරය ටී. බී. ජායා මහතාට හිමි විය. දේශපාලනයෙන් විශ්‍රාම යෑමෙන් පසුව ටී. බී. ජායා මහතා පකිස්තානයේ ලංකා මහ කොමසාරිස් ධුරයට පත් කරනු ලැබීය. ඔහු එම තනතුර ලද පළමු තැනැත්තා විය. එහිදී පකිස්තානය විසින් ටී. බී. ජායා මහතාට පකිස්තානයේ සම්මාන පුරවැසි භාවය පිරිනමන නමුත් ඔහු එය ප්‍රතික්ෂේප කළේ තම උපන් බිම කෙරෙහි වූ දේශප්‍රේමය නිසාමය.

1960 වසරේදී මක්කම වන්දනාවට සහභාගීවන ඔහු ඒ අතරතුර ලාංකීයන් වෙනුවෙන් නේවාසිකාගාරයක් ඉදිකිරීම සඳහා කටයුතු සැලසුම් කරමින් සිටියේය. එහෙත් අවාසනාවකට මෙන් එහිදී හදිසියේ රෝගී වූ ටී. බී. ජායා මහතා මෙලොවින් සමුගන්නේ ලාංකික දේශපාලනය තුළ ජාතික සංහිඳියාව උදෙසා මෙන්ම රටේ නිදහස වෙනුවෙන් නොමැකෙන සේවයක් සිදු කළ පුද්ගලයෙක් ලෙස ඉතිහාසයට එක් වෙමිනි.

◣පසිඳු මිහිරාන් රැවියල

බෝතලේ වලව්වේ දේශපාලනය අවසන් ද?

මිපහ දිස්ත්‍රික්කයේ මීරිගම බෝතලේ ගමේ බෝතලේ වලව්වේ ස්පේටර් සේනානායක එකළ ධනවත් ව්‍යාපාරිකයකු වූ ජෙරෝනිස් ද සොයිසාගේ වතු හා රේන්ද ව්‍යාපාරවල කළමනාකරුවකු වශයෙන් ක්‍රියාකළ අයෙකි. පසුව අරක්කු රේන්ද ව්‍යාපාරයෙන් උපයාගත් ධනයෙන් ආණ්ඩුවේ මුඩු ඉඩම් මිලදී ගත් ස්පේටර් සේනානායක එසේ මිල දී ගත් මුඩු ඉඩම්වල මිනිරන් තිබීම හේතු කොටගෙන අරක්කු රේන්ද ව්‍යාපාරයෙන් ඉවත් වී මිනිරන් කර්මාන්තයට යොමු වී ඇත. මහව, අඹේපුස්ස පතල ඇතුළු මිනිරන් පතල් 03ක් හිමිව තිබූ මොහු කුරුණෑගල හා මීගමුව යන දිස්ත්‍රික්කවලින් පොල් ඉඩම් අක්කර 2000ක පමණ හිමිකරුවෙක් ද විය. ඔහු යටතේ 3000ක් පමණ සේවක පිරිසක් සිටි බව ද වාර්තාවල සඳහන් වේ. බෝතලේ අසල කෙහෙලැල්ල නමැති ගම් පියසෙහි වැදගත් පිළිගත් පවුලකට අයත් කැතරින් එලිසබෙත් පෙරේරා ස්පේටර් සේනානායකගේ මැතිනිය විය. ජපානය, යුරෝපය හා එක්සත් රාජධානියට මිනිරන් අපනයනය කරමින් විශාල ධනපතියකු වූ ස්පේටර් සේනානායක වික්ටෝරියා අක්ෂි රෝහලට කරන ලද පරිත්‍යාගයක් සලකා වෙස්ට් රිජ්වේ ආණ්ඩුකාරවරයා ඔහුට මුදලි නාමයක් ද පිරිනැමීය.

ස්පේටර් සේනානායක හා කැතරින් එලිසබෙත් පෙරේරා යුවළට පිරිමි දරුවන් තිදෙනෙක් හා එක් දුවණියක් සිටි අතර, 1884 ඔක්තෝබර් 20 දින පවුලේ තුන්වැනියා ලෙස ඩී.එස්. සේනානායක මෙලොව එළිය දුටුවේය. 'කොළඹ ජෝන්' නමින් හැඳින්වූ වැඩිමහල් සහෝදරයා වූ ඩී.සී. සේනානායක කොළඹ ව්‍යාපාරික කටයුතුවල නිරත වීමෙන් එම නම ලැබූ අතර, එෆ්. ආර්. සේනානායක කේම්බ්‍රිජ් විශ්වවිද්‍යාලය වෙතින් නීති උපාධිය හදාරා උගතකු වී මෙරට ජාතික ව්‍යාපාරයට නායකත්වය දුන් දානපතියකු වූ නිසා "ලන්ඩන් ජෝන්" නමින් හැඳින් විය. හැඩි දැඩි සිරුරකින් යුත් ඩී.එස් සේනානායක ක්‍රීඩාව ප්‍රිය කළ දඟකාර බවින් යුතු නිසා ඔහු "කැලෑ ජෝන්" ලෙස හඳුන්වා ඇත. මේ දරුවන් තිදෙනාම ප්‍රාථමික අධ්‍යාපනය මාතලේ ඉංග්‍රීසි විද්‍යාලයෙන් ලබා ද්විතීයික අධ්‍යාපනය සඳහා ශාන්ත තෝමස් විද්‍යාලයට ඇතුළත්ව ඇත. මේ තිදෙනාගෙන්ම ඉගෙනීමට උනන්දුවක් දක්වා ඇත්තේ ඇෆ්.ආර්. සේනානායක පමණක් වූ අතර ඔහු අවුරුදු 21 දී එනම් 1904 දී අධිනීතිඥයකු වශයෙන් කේම්බ්‍රිජ් විශ්වවිද්‍යාලයේ සිට මෙරටට පැමිණ ඇත. 1910 දී මෙරට මිනිරන් රජු ලෙස ප්‍රකටව සිටි මුදලිඳු ඩී.ජී.ජී. ආටිගල මහතාගේ කනිටු දියණිය වූ ඇලන් සමඟ විවාහ විය.

1912 ජූලි 14 වන දින කොළඹ ආනන්ද විද්‍යාලයේ දී ආරම්භ කරන ලද ලංකා අමද්‍යප සංගමයට පූර්ණ දායකත්වය දැක්වූ ඩී.එස්. ඇතුළු සහෝදරයෝ තිදෙන තවත් සිංහල බෞද්ධ නායකයන් රාශියක් ද සමඟ ඊට සම්බන්ධ වූහ. තම පියා එනම් ස්පේටර් සේනානායක මුලසුන දැරූ මෙම රැස්වීමේදී ලේකම් වශයෙන් ඩබ්.එච්.ඩබ්. පෙරේරාත් සහකාර ලේකම් ධුරයට ජී.පී. මලලසේකර මහතාත් පත්වූ බව පුවත්පත් වාර්තා කර තිබිණි. බ්‍රිතාන්‍ය යටත්විජිත ආණ්ඩුවේ සුරා පනත මඟින් රටේ අස්සක් මුල්ලක් නැර තැබෑරුම් ඇරීමට ගත් උත්සාහයට මෙම අමද්‍යප සංවිධානයෙන් බරපතළ විරෝධයක් ඇතිකිරීමට හැකි වීම නිසා රජයේ අරමුණු සාක්ෂාත් කර ගැනීම අපහසු විය. මේ තත්ත්වය යටතේ තම උපන්ගම් පෙදෙස වූ මීරිගම නගරය ඇතුළු සමස්ත හාපිටිගම් කෝරලය පුරා එකදු තැබෑරුමක් විවෘත කිරීමට බ්‍රිතාන්‍ය ආණ්ඩුවට නොහැකි විය. මේ හේතුව නිසාම අමද්‍යප ව්‍යාපාරය පිළිබඳ බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරයාගේ බලවත් විරෝධතාවක් ඇති විය. මේ අතර ජාතික ව්‍යාපාරයට නායකත්වය දෙමින් උඩරට පෙළපතකට අයත් උසස් පිළිගැනීමක් සහිත දුණුවිල වලව්වේ එස් මෞලි දුනුවිල සමඟ 1910 දී එනම් ඩී.එස්. සේනානායක අවුරුදු 26 වන විට විවාහ ජීවිතයට ද ඇතුළත් විය.

අමද්‍යප ව්‍යාපාරයේ නායකයන් දඩයම් කිරීමට ඇඟිලි ගනිමින් සිටි බ්‍රිතාන්‍ය ආණ්ඩුව 1915 ජනවාරි 27 දින කුරුණෑගල මුස්ලිම් පල්ලියක් පසුකරමින් ගිය බෞද්ධ පෙරහරකට මුස්ලිම්වරුන් පහරදීම නිසා ඇතිවී ගිය ජාතික කෝලාහල මැඩපැවැත්වීමට ඩී.ඇස්. හා සහෝදරයන් ප්‍රයත්න දරා ඇත. එය උපයෝගී කරගනිමින් සේනානායක සොයුරන් තිදෙනා ඇතුළු අමද්‍යප නායකයින් 1915. 06.14 දින අත්අඩංගුවට ගෙන දින 46ක් රඳවා තබා කිසිදු චෝදනාවක් රහිතව නිදහස් කළ බවට වාර්තා විය.

දේශපාලන හා සමාජීය කටයුතුවලට වඩා නැඹුරුව සිටි ඇෆ්.ආර්. සේනානායක මහතා කොළඹ පිටිය නාගරික ආසනයේ නියෝජිතයාව සිටියදී 1925 දඹදිව වන්දනා චාරිකාවක යෙදුණු අතරතුර 1926 ජනවාරි 1 දින ඇපෙන්ඩිසයිටිස් රෝගය වැළඳී කල්කටාවේදී අභාව ප්‍රාප්ත විය. මියයන විට අවු 44ක් වූ අතර එසේ අකාලයේ මිය නොයන්නට නිදහස් ලංකාවේ ප්‍රථම අගමැති වීමේ භාග්‍යය ලබන්නේ ඩී.එස්. නොව ඇෆ්.ආර්. සේනානායකයානන්ය.

ඩී.එස්. සේනානායක දේශපාලනයට කැඳවාගත්තේ සොහොයුරු ඇෆ්.ආර්. සේනානායක වූ අතර, 1924 වසරේ ඔක්. 24 වනදා ව්‍යවස්ථාදායක මන්ත්‍රී මණ්ඩලයේ ප්‍රථම රැස්වීමට මීගමුව දිස්ත්‍රික් ආසනය වෙනුවෙන් 1924 සැප් 27 වනදා ඩී.එස්. සේනානායක මහතා නිතරගයෙන් තේරී පත් විය. එෆ්.ආර්. සේනානායකගේ මරණයෙන් පසු වඩ වඩා දේශපාලනයට නැඹුරු වූ ඩී.එස්. සිංහල ජාතික නායකයන් අතර කැපී පෙනෙන චරිතයක් විය.

මියගිය එෆ්.ආර්. සේනානායකට දූ පුතුන් 06ක් සිටි අතර, ගෝධාභය, චිත්‍රා, තිස්ස, රූපවතී, උපාලි, ස්වර්ණා යන එම අය අතරින් ගෝධාභය හෙවත් ආර්.ජී. සේනානායක දේශපාලනයට අවතීර්ණ වූ චරිතයක් විය. ඔහු කේම්බ්‍රිජ් අධ්‍යාපනය ලැබූ අධි නීතිඥයෙක් ද විය. 1936 රාජ්‍ය මන්ත්‍රණ සභාවේ නාරම්මල ඡන්ද කොට්ඨාසයේ මන්ත්‍රී ලෙස තේරී පත් වූ සිරිපාල සමරක්කොඩි මහතාගේ දියණියන් සමඟ විවාහ වූ ආර්.ජී. සේනානායක සමරක්කොඩිගේ මරණයත් සමඟ 1944 පැවැති අතුරු මැතිවරණයෙන් නාරම්මල අසුන වෙනුවෙන් තේරී පත්විය. මේ වන විට ඩී.එස්. සේනානායක මහතා සිංහල නායකයන් අතරින් දෙවැනි වූයේ ඊ.ඩබ්. පෙරේරා, සර් ඩී.බී. ජයතිලක හා එස්. ඩබ්. ආර්.ඩී. බණ්ඩාරනායකට පමණි.

1931 පළමු රාජ්‍ය මන්ත්‍රණ සභාවට මිනුවන්ගොඩ ආසනය සඳහා නිතරගයෙන් තේරීපත් වූ ඩී.එස්. සේනානායක මහතා කෘෂිකර්ම හා ඉඩම් ඇමැතිවරයා විය. 1936 මැතිවරණයේදී නැවත මිනුවන්ගොඩ ආසනය සඳහා නිතරගයෙන් තේරී පත්විය. මෙම මැතිවරණයේදී ජ්‍යෙෂ්ඨත්වය හා ප්‍රමුඛතාව අනුව ඉදිරියෙන්ම සිටි ඊ.ඩබ්.පෙරේරා හොරණ කොට්ඨාසයෙන් පරාජය වීමට සලස්වා තරුණ නීතිඥයකු වූ ඒ.පී. ජයසූරිය ජයග්‍රහණය කරවූ බවට වාර්තා වී තිබිණ. මේ වනවිට සර් ජෝන් කොතලාවල සර් අයිවර් ජෙනිංස්, සෝල්බරි සාමි සමග නිදහස ලබාගැන්මේ වැඩපිළිවෙළක් දියත් කරමින් එම අදහස සාර්ථක වන අවස්ථාව වන විට ජ්‍යෙෂ්ඨත්වය හා ප්‍රමුඛතාව අනුව තමාට ඉදිරියෙන් සිටි ඊ.ඩබ්.පෙරේරා හා ප්‍රමුඛතාව අනුව තමාට ඉදිරියෙන් සිටි ඊළඟ පුද්ගලයා වූ සර්.ඩී.බී. ජයතිලක ඉන්දීය මහ කොමසාරිස්වරයා ලෙස ඉන්දියාවට පත් කර යවමින් සභානායක ධුරයට හා අමාත්‍ය මණ්ඩලයේ උප සභාපති ධුරයට ඩී.ඇස්. සේනානායක පත් විය. රාජ්‍ය මන්ත්‍රණ සභාවේ බලවත්ම කණ්ඩායම් නායකයා වූ ඩී.එස්. සේනානායක 1946.09.06 දින වෙනත් පක්ෂ හා කණ්ඩායම් එක්කර ගනිමින් එක්සත් ජාතික පක්ෂය පිහිටුවා එහි නායකයා විය.

ඩී.එස්. මෞලී දුනුවිල යුවළට දරුවන් දෙදෙනකු සිටි අතර ඔවිහු ඩඩ්ලි හා රොබට් නම් විය. ඩඩ්ලි අවිවාහක ජීවිතයක් ගත කළත්, රොබට් එෆ්.ආර්.සේනානායකගේ දුවණියක් (ආර්.ජී.ගේ නංගි) හා විවාහ විය. පසු කළෙක ඩී.ආර්. විජයවර්ධනගේ පුත් රංජිත් විජයවර්ධන විවාහ වූයේ ඩඩ්ලි සේනානායකගේ සොහොයුරු රොබට් සේනානායකගේ දියණියක් වූ රංජනී සේනානායක සමගය. රංජනී සේනානායක රොබට් සේනානායකගේ පුතා වූ රුක්මන් සේනානායකගේ සහෝදරිය විය. ඩඩ්ලි සේනානායක මහතා 1936 දෙවැනි රාජ්‍ය මන්ත්‍රණ සභාවට දැදිගම ආසනයෙන් පළමු වරට තේරී පත් විය.

ඩී.එස්.සේනානායක මහතා 1947 පාර්ලිමේන්තු මැතිවරණයෙන් මිනුවන්ගොඩ ආසනයෙන් තේරීපත් වූ අතර 1948 පෙබරවාරි 04 දින ශ්‍රී ලංකාවට බ්‍රිතාන්‍ය ආණ්ඩුවෙන් නිදහස ලබා දෙන විට නිදහස් ලංකාවේ ප්‍රථම අගමැති ලෙස තේරී පත් විය. 1947 මැතිවරණයේදී ඩී.ඇස්ගේ පුත් ඩඩ්ලි දැදිගම ආසනයට තරඟ කර ඉන් ජය ලබා ඩී.ඇස්. සේනානායක විසින් ගොඩනගන ලද ආණ්ඩුවේ කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍ය තනතුරට පත් විය. සිංහල භාෂාව හා බුද්ධාගම පිළිබඳවත් ශ්‍රී ලංකාවේ අනන්‍යතාව පිළිබඳවත් දැඩි හැඟීමකින් කටයුතු කළ ඩී.ඇස්.සේනානායක මහතා කෘෂිකර්මය නඟා සිටුවීම සඳහා දැඩි කැපවීමකින් කටයුතු කළේය. 1952 මාර්තු 21 දින ගාලු මුවදොර පිටියේදී සුපුරුදු පරිදි ව්‍යායාම කරමින් අසු පිටින් ගමන් ගනිද්දී ඇති වූ අසාතයකින් අසුපිටින් වැටී හිස පොළවේ වැදී සිහිනොමැතිවූ අතර, බ්‍රිතාන්‍ය අග්‍රාමාත්‍ය ශ්‍රීමත් වින්ස්ටන් චර්චිල් මහතාගේ අතිවිශිෂ්ඨ ශල්‍ය වෛද්‍ය හියු කේන්ස් කඩිනමින්අගමැතිතුමාට ප්‍රතිකාර කිරීම සඳහා මෙරටට එවූ නමුත් සිහිය ගැන්මට අපහසුව පසුදින සිහිය නොලබාම ප.ව. 3.30ට පමණ දැයෙන් සමුගතේය.

නිදහස් ලංකාවේ ප්‍රථම අග්‍රාමාත්‍යවරයා මෙසේ දැයෙන් සමුගනිද්දී මරණයට පෙර අග්‍රාණ්ඩුකාර සෝල්බරි සාමිවරයාගෙන් කර තිබූ ඉල්ලීම අනුව ඊළඟ ජ්‍යෙෂ්ඨ නායකයා වූ සර් ජෝන් කොතලාවල අභිභවා ඩී.ඇස්ගේ පුත් ඩඩ්ලි සේනානායකට අග්‍රාමාත්‍ය ධුරය දුන්නේය. එතැන් පටන් 1952 දීත් 1960 මාර්තුවේදීත් 1965 දීත් අග්‍රාමාත්‍ය ධුරය දැරීමට ඩඩ්ලි සේනානායක වාසනාවන්ත විය. 1970 මැතිවරණයෙන් පරාජයට පත් එ.ජා.පය ආණ්ඩුවේ නායකයා වූ ඩඩ්ලි සේනානායක පාර්ලිමේන්තුවේ විපක්ෂ නායක ධුරය ජේ.ආර්.ජයවර්ධනට පවරා පසු පෙළ මන්ත්‍රීවරයකු වශයෙන් රැඳී සිටි අතර 1973 අප්‍රියෙල් 13 වනදා ඔහු අභාවප්‍රාප්ත විය. ඩඩ්ලිගේ අභාවයෙන් පසුව දැදිගම ආසනයට 1973 ජූලි මසදී අතුරු මැතිවරණයට තරඟ කර ජය ලබන්නට ඩඩ්ලිගේ සහෝදරයාගේ එනම් රොබට් සේනානායකගේ පුත් රුක්මන් සේනානායකට හැකි විය. එහෙත් පක්ෂ නායක ජේ.ආර්ට විරුද්ධව කටයුතු කිරීම නිසා 1976 අප්‍රියෙල් මාසයේ දී එ.ජා. පක්ෂයෙන් නෙරපනු ලැබූ රුක්මන් සේනානායක 1989 දී එක්සත් ලංකා ජනතා පක්ෂය නමින් පක්ෂයක් පිහිටුවා දේශපාලනයේ නිරත විය. 1990 දී එක්සත් ලංකා ජනතා පක්ෂය විසුරුවා හරිමින් නැවත එ.ජා.ප යට එකතු වී 1994 පාර්ලිමේන්තු මැතිවරණයේදී පොලොන්නරුව දිස්ත්‍රික්කයෙන් තරග කර එ.ජා.ප මන්ත්‍රීවරයකු ලෙස තේරී පත්විය.

ශ්‍රී ලංකා දේශපාලනයෙහි සේනානායක පරපුර නියෝජනය කරන එකම පුද්ගලයා වසන්ත සේනානායක වුවද අවස්ථා ගණනාවකදී පක්ෂ මාරු කළ ඔහු මෙවර මැතිවරණයෙන් පරාජයට පත් වීම සේනානායක පරපුරේ අවසානය වේ ද යන්න අනාගතය තීන්දු කරනු ඇත.

◣සමරසේන මුදලිගේ

මැතිවරණයක් එපා කියූ ජන්දයක්

1982 ජනමත විචාරණය

ජනමත විචාරණයක් යනු කිසියම් නිශ්චිත කරුණක් පිළිබඳ ජනමතය විමසා බැලීමය. ශ්‍රී ලංකා දේශපාලන ඉතිහාසය තුළ එවැනි ජනමත විචාරණ එකක් පමණක් දක්නට ලැබුණි. එම ජනමත විචාරණය පවත්වන්නේ ජේ. ආර්. ජයවර්ධන ජනාධිපතිවරයාගේ නායකත්වයෙන් එක්සත් ජාතික පක්ෂය බලය හොබවන 1982 වසරේ දී යි. ජනමත විචාරණයට හේතු වූ කරුණ වූයේ 1983 වර්ෂයේ දී නිමා වීමට නියමිතව තිබූ 1977 පාර්ලිමේන්තු වාරය දීර්ඝ කර ගැනීමය.

ජනමත විචාරණය ක්‍රියාවලිය ලෝකයේ දේශපාලන ඉතිහාසය තුළ ඉතා ඈතට දිව යන්නක්. අමෙරිකානු නිදහස් ප්‍රකාශනය" සම්මත කරවා ගැනීමට 1776 වසරේ ප්‍රථම වරට ජනමත විචාරණයක් පැවැත්වූ අතර 1793 ප්‍රංශයේ ද, පසු ව බ්‍රිතාන්‍යයේ ද ජනමත විචාරණ පවත්වා තිබෙනවා. ප්‍රංශයේ නැපෝලියන් බොනපාට් ද, ජර්මනියේ ඇඩොල්ෆ් හිට්ලර් ද තමන්ගේ බලය සුරක්ෂිත කර ගැනීම සඳහා ජනමත විචාරණ පවත්වා තිබේ.

ශ්‍රී ලංකාවේ ජනමත විචාරණ ගැන බැලීමේ දී 1982 වසරේ පළමු හා එකම ජනමත විචාරණය පැවැත්වූ අතර, ඒ සඳහා විමසා බැලුවේ මන්ත්‍රීවරුන්ගේ ධූර කාලය ඇතුළු ව පාර්ලිමේන්තුවේ කාලය තවත් වසර හයකින් වැඩි කිරීම සඳහා ජනතා කැමැත්ත විචාර අතර එහිදී පක්ෂ විපක්ෂ සලකුණු ලෙස ලාම්පුව සහ කළගෙඩිය ලකුණ වෙන් කර තිබුණි.

1977 දී පැවති පාර්ලිමේන්තු මැතිවරණයෙන් ජේ. ආර්. ජයවර්ධන ප්‍රමුඛ එක්සත් ජාතික පක්ෂය පාර්ලිමේන්තුවේ මුළු ආසන ප්‍රමාණය වූ ආසන 168න් ආසන 140ක් දිනා ගන්නවා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට හිමිවෙන්නේ ආසන 8ක් පමණයි. තවත් ආසන 18ක් දිනා ගැනීමට ද්‍රවිඩ එක්සත් විමුක්ති පෙරමුණට ජයගත් අතර එක්සත් ජාතික පක්ෂයට හයෙන් පහක් තරම් වැඩි බලයක් ලබා ගැනීමට හැකියාව ලැබුණි.

1982 ජනාධිපතිවරණයේ දී එක්සත් ජාතික පක්ෂ නායකයා ලෙස තරග කළ ජේ ආර් ජයවර්ධන මහතා සියයට පනස් දෙකක බහුතර බලයක් ලබා ගෙන ජය ගත් අතර ඉදිරියේ දී පැවැත්වීමට තිබුණේ පාර්ලිමේන්තු මහ මැතිවරණයයි. එම මහ මැතිවරණය පැවැත් වුවහොත් සමානුපාතික ඡන්ද ක්‍රමය යටතේ පෙර මෙන් මහා බලයක් ලබා ගත නොහැකි බව තේරුම් ගත් ජයවර්ධන මහතා තම තියුණු දේශපාලන සටකපටකම් උපයෝගී කර ගනිමින් 1977 මහ මැතිවරණයේ දී ලැබූ නියෝජනය දීර්ඝ කර ගැනීමට ජනමත විචාරණ ගැටය දේශපාලන පිටියට යොමු කළේය.

නැක්සලයිට්වරුන් බවට චෝදනා කරමින් විජය කුමාරණතුංග ඇතුළු පිරිසක් අත්අඩංගුවට ගන්නේ මේ කාලයේදීය. එවැනි දේ සිදු කිරීමට ප්‍රධාන ලෙස හේතු වූයේ 1982 ජනාධිපතිවරණයේ දී විපක්ෂයේ ප්‍රධාන අපේක්ෂකයා වූ හෙක්ටර් කොබ්බෑකඩුව මහතාට සහාය දුන් තරුණ නායකයන් වූ අතර ඔවුනට බාධා එල්ල කිරීම මඟින් ජනමත විචාරණයේ දී පහසු ජයග්‍රහණයක් ලබා ගැනීම ජයවර්ධන ජනාධිපතිවරයාගේ අරමුණ විය.

ඒ වන විටත් ජනමත විචාරණය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුළත් කර තිබුණි.

ඒ අනුව එක්සත් ජාතික පක්ෂය විසින් ආරම්භ කරන ලද වැඩසටහන් බාධාවකින් තොර ව ඉදිරියට රැගෙන යෑම සඳහා පවතින ආණ්ඩුව තව දුරටත් පවත්වාගත යුතු බවත් ඒ සඳහා ජනතා සහාය අවශ්‍ය බවත් ජේ. ආර්. ජයවර්ධන ජනාධිපතිවරයා ජනතාව වෙත ප්‍රකාශ කළේය. පාර්ලිමේන්තු නිල කාලය 1989 අගෝස්තු මාසය දක්වා දිගු කිරීම සඳහා ජනමත විචාරණය පැවැත්වීමට 1982 දෙසැම්බර් මස 22 වන දිනට දින තීරණය කෙරුණි.

ජනමත විචාරණය සඳහා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය හා තවත් පක්ෂ ගණනාවක් විරුද්ධත්වය ප්‍රකාශ කරන නමුත් නීතිමය ක්‍රියාමාර්ග මඟින් ඔවුන් වැළක්වීම, සිරගත කිරීම, ලිපිලේඛන අත්අඩංගුවට ගැනීම, හා විරුද්ධවාදී පුවත්පත් කාර්යාල සීල් තැබීමෙන් විරුද්ධවාදී සියලු අදහස් මර්දනය කිරීමට එවකට පැවති ජේ. ආර්. ආණ්ඩුව ක්‍රියා කරන ලදී.

1982 දෙසැම්බර් මස 22 වන දා ජනමත විචාරණය පැවැත්වෙන අතර, පාර්ලිමේන්තු කාලය තව වසර හයක් දීර්ඝ කිරීමට පක්ෂ නම් ලාම්පු ලකුණට කතිරය යෙදීම ද, එම යෝජනාවට විපක්ෂ නම් කළගෙඩි සලකුණට කතිරය යෙදීම ද මෙහිදී සිදු වුණි. ජනමත විචාරණයෙන් ජය ගැනීමට නම් ලියාපදිංචි ඡන්ද සංඛ්‍යාවෙන් අවම වශයෙන් සියයට පනහක ඡන්ද ප්‍රමාණයක් පක්ෂව ලැබිය යුතුව තිබුණි.

යෝජනාවට පක්ෂ ව (ලාම්පුව) ලැබුණ ඡන්ද ප්‍රමාණය 3,141,223 වූ අතර යෝජනාවට විපක්ෂව (කළගෙඩිය) 2,605,983ක ඡන්ද ප්‍රමාණයක් ලැබෙනවා. ප්‍රකාශිත ප්‍රමාණයෙන් 54%ක ප්‍රතිශතයක් යෝජනාවට පක්ෂ ව හිමි වුණි. ඒ අනුව ලංකාවේ ප්‍රථම හා දැනට පවත්වා ඇති එකම ජනමත විචාරණයෙන් ජය ගැනීමට එක්සත් ජාතික පක්ෂයට හැකියාව ලැබුණි ඒ සමග ම පාර්ලිමේන්තු කාල සීමාව තවත් වසර හයකින් දීර්ඝ වෙනවා. පෙර පැවති ජනාධිපතිවරණය මෙන්ම ජනමත විචාරණයත් දූෂිත බව විපක්ෂ දේශපාලනඥයන් විසින් දිගින් දිගටම ප්‍රකාශ කෙරුණි. එවකට සිටි මධ්‍යස්ථ විචාරකයන් ද සඳහන් කළේ මේ ජනමත විචාරණය මෙන්ම පෙර පැවැති ජනාධිපතිවරණයද දූෂිත බවයි.

ඉන්පසු දෙදහස වර්ෂයේ දී එවකට ජනාධිපති ධූරය දැරූ පොදුජන එක්සත් පෙරමුණු ආණ්ඩුවේ චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මහත්මිය නව ව්‍යවස්ථාවක් හඳුන්වා දීම සඳහා ජනමත විචාරණයක් පැවැත්වීමට උත්සාහ කළද පසුව එම උත්සාහය අතහරිනු ලැබිණි.

◣උදිත ගුණවර්ධන

බ්‍රසීල ජනපතිනිය ගෙදර යැවූ 2016 දෝෂාභියෝගය

බ්‍රසීල දේශපාලන ඉතිහාසයේ ජනපති ධුරයට පත්වූ පළමු කාන්තාව ඩිල්මා රූසෙෆ්ය. ඇය 2010 සිට 2014 දක්වා සිය පළමුධුර කාලය සම්පූර්ණ කළ අතර, අනතුරුව නැවත ජනපති පදවියට පත්වී 2014 සිට 2018 දක්වා දෙවැනි ධුරකාලය සම්පූර්ණ කිරීමට බලාපොරොත්තුවෙන් පසුවූවාය. නමුත් ඒ සිහිනය 2016දී හිටිහැටියේම බිඳ වැටුණේ දෝෂාභියෝගයකට හසුවී ගෙදර යෑමට සිදුවූ නිසාය. ඇයට මේ ඉරණම අත්වූයේ 'ඩාලින් ඩිල්මා' කියමින් පසුපස දැවටෙමින් සිටි හිටපු ජනාධිපති ලූලා ද සිල්වා නිසාය.

බ්‍රසීලයේ යකඩ ගැහැනිය ලෙස ප්‍රකටව සිටි එවකට 69 හැවිරිදි වියේ පසු වූ ඩිල්මා සහ හිටපු ජනාධිපති 71 හැවිරිදි ලූලා අතර පෙම් පළහිලව්වවක් තිබූ බැව් ප්‍රසිද්ධ රහසක් විය. එය ආරම්භ වූයේ ඩිල්මාට පෙර ලූලා ජනපති පදවියේ කටයුතු කරද්දීය. එවකට ඔහුගේ කාර්ය මණ්ඩලයේ ප්‍රධානියා ලෙස පත්ව සිටි ඩිල්මා අනතුරුව ලූලාගේ රජයේ බලශක්ති ඇමැතිනිය ලෙසත් කටයුතු කළාය. දෙදෙනා අතර අමුතු පෙමක් ලියලා වැඩුණේ ඒ අතරතුර කාලයේදීය. ඉන් පසු ඩිල්මාට ජනපති වන්නට මං විවර කරදුන් ලූලා ඇයගේ සමීපතම මිතුරා බවට පත්විය.

ඇයට ගෙදර යන තැනට වැඩ සිද්ධ වූයේ ලූලා ජනපති පදවියේ කටයුතු කරද්දී සිදු කරනු ලැබූ මහාපරිමාණයේ දූෂණ වංචා පිළිබඳ ඇය මුනිවත රැකීම නිසාය. දෙදෙනා අතර තිබූ අමුතු පෙම නිසා ඩිල්මා ඇස්කන් පියාගෙන සිටියාය. තමාගෙන් පසු ජනපති පදවියට ඩිල්මා නම් කරමින් ඇයගේ ජයග්‍රහණය වෙනුවෙන් දිවා රෑ නොබලා ඔහු කටයුතු කළේ ද මේ දූෂණ වංචා වැරදි සඟවා ගැනීමටය. නමුත් අවසානයේදී ඩිල්මාට එරෙහිව ලක්ෂ සංඛ්‍යාත බ්‍රසීල ජනතාවත්, එරට විපක්ෂයත් එක්ව දින ගණනාවක් පුරා ගෙන ගිය උද්ඝෝෂණ මාලාව අවසානයේදී දෝෂාභියෝගයක් කරා තල්ලු වී ගියේය.

සැබැවින්ම ඩිල්මාගේ පාර්ශ්වයේ වැඩි දෙනකුගේ සහාය ද ඊට ලැබී තිබූ බැව් පසුව හෙළිදරව් විය. ඒ සියලුදෙනාම ලූලාගේ වැඩකටයුතු පිළිබඳ අප්‍රසාදය පළ කළ පුද්ගලයෝ වූහ.

2016 සැප්තැම්බරය වෙද්දී තත්ත්වය එන්න එන්නම දරුණු අතට හැරිණි. හිටපු ජනාධිපති ලූලාගේ දූෂණ වංචා ඩිල්මා විසින් යටපත් කරනු ලැබීම එරට ජනතාව දැඩිසේ කෝපාවිශ්ට කළ කරුණක් විය. විපක්ෂය ද ඊට උඩගෙඩි දෙමින් දෝෂාභියෝගයක් සැළසුම් කරන්නට විය. එල්ල වූ පීඩනය ඩිල්මාට කිසිසේත්ම දරාගත නොහැකි එකක් විය.

සිය හොඳම මිතුරාට එරෙහිව පරීක්ෂණ කටයුතු සිදු කරන්නැයි පොලීසියට නියෝග දීමට ඇයට සිදුවූයේ කරන්නට දෙයක් නැති තැනය.

පොලිස් විමර්ශන වහා ඇරඹිණි. ලූලා බලයේ සිටිය දී ඔහුගේ පුතුන් සමග එක්ව කළ වංචා දූෂණ රැසක් පිළිබඳ පරීක්ෂණ කටයුතු ආරම්භ විය. තමාට එරෙහිව පරීක්ෂණ කටයුතු ආරම්භ කිරීමෙන් ලූලාට අසුහාරදාහට කේන්ති ගියේය. තම සහයෝගය මැද ජනපති පුටුවට පැමිණි ඩිල්මා දැන් තමාගේම ඉවසීම පරීක්ෂා කිරීමට සූදානම් වීම ඔහුගේ කෝපයට හේතු විය.

ඔහු කළේ වහාම ඩිල්මාට දුරකතන ඇමතුමක් දීමය. එකක් නොව දුරකතන ඇමතුම් පිට ඇමතුම් දුන්නේය. ඉන් නොනැවතී තමාට එරෙහි පරීක්ෂණ කටයුතු නොනවත්වන්නේ නම් රට පුරා දැවැන්ත උද්ඝෝෂණ මාලාවක් සංවිධානය කරමින් රජය පෙරළා දැමීමට කටයුතු කරන බවට ඩිල්මාට තර්ජනය කරන්නට විය. එය ජනපතිනිය කලබලයට පත්කරවීමට හේතු වූයේ ඒ වනවිටත් ඇගේ ජනප්‍රියත්වය බිඳුවට බැසී තිබූ නිසාය.

ඊළඟට ඩිල්මා සහ ලූලා අතර දුරකතන සංවාද රැසකි. ලූලා සහ ඩිල්මාගේ රජයේ ඉහළ නිලධාරීන් අතරත් එවැනිම දුරකතන සංවාද කිහිපයක් සිදු විය. ලූලාට එරට රජයේ කාර්ය මණ්ඩල ප්‍රධානියා ලෙස කැබිනට් ඇමැති බලතල හිමි වූයේ එහි ප්‍රතිඵලයක් ලෙසිනි. එය ලූලාට ඔහුට එරෙහිව නැගී ඇති චෝදනාවලින් නිදහස් වීමේ පළිහකි. බ්‍රසීල රජයේ නීතියට අනුව කැබිනට් තනතුරකට එරෙහිව නීතිය ක්‍රියාත්මක කිරීමට හෝ විමර්ශන කටයුතු කිරීමට පොලීසියට බලයක් නැත. එවැනි දෙයක් කළ හැකි බලය ඇත්තේ එරට ශ්‍රේෂ්ඨාධිකරණයට පමණි.

ඇය සහ ලූලා අතර පසුගිය සති කිහිපය පුරා පැවැති දුරකතන සංවාද මාලාවක් ජනතාව අතරට පත් වීමත් සමග තත්ත්වය තවත් උණුසුම් විය. මේ දුරකතන සංවාද රහසේම පටිගත කරනු ලැබුවේ විමර්ශන කටයුතු සම්බන්ධ විනිසුරුවරයකු විසිනි. ජනපතිනිය සිය මිතුරාට එරෙහිව ඇති චෝදනාවලින් ඔහු මුදාගැනීමට මේ තනතුර පිරිනැමූ බවට එය කදිම නිදසුනක් බවට පත්ඉ විය.

ඉන් එක් දුරකතන සංවාදයක මෙසේ සිදුවිය.

'මගේ පෙම්බරි ඩිල්මා.....' (ලූලා ඇය අමතන්නේ එලෙසිනි)

'ඇයි මොකද....?' ඩිල්මා ඇසුවාය.

'පොලිසිය ආපහු මගේ ගෙට පැන්නා.'

'මං දන්නවා.'

'මොනවද මේ වෙන්නේ..?

'මට කරන්න දෙයක් නෑ...'

'එයාලා මගේ පරණ ෆයිල් හොයා ගනීවි.'

'මට කරන්න දෙයක් නෑ..'

'ඩිල්මා මගේ පෙම්බරි... කරුණාකරලා ඒවා නවත්තන්න'

'මට ඒක කරන්න බෑ.'

'එහෙම වුණේ නැත්නම් මම පාරට බහිනවා. රට පුරාම උද්ඝෝෂණ රැලි පවත්වනවා. කොහොමටත් දැන් මිනිස්සුන්ට ආණ්ඩුව එපා වෙලයි තියෙන්නේ. ඔයා ඒක දන්නවා.'

අවසානයේදී ඩිල්මා ගෙදර යෑම ඉක්මන් වූ අතර. ලූලාට බන්ධනාගාර ගත වීමට සිදු විය.

◣ ෆවුස් මොහොමඩ්

බලය බෙදීමට දුන් පළාත් සභාව සුදු අලියෙක් ද?



පළාත් සංවර්ධනය සහ පළාත්වල වෙසෙන ජනතාවගේ යහපත උදෙසා පසුගිය කාලය තුළ පළාත් සභාවල ක්‍රියාකාරිත්වය සලකා බැලීම වටී. එයට පෙර පළාත් සභා ක්‍රමයේ ඉතිහාසය විමසා බැලීම උචිතය. පළාත් සභා පිළිබඳ සංකල්පය සහ එහි පරිණාමය 1920 දශකය වැනි ඈත යුගයක් කරා විහිදේ. මහාචාර්ය කීරවැල්ලේ පවසන පරිදි පරිපාලන කටයුතු විමධ්‍යගත කිරීම හරහා ජනතාවට සෙතක් සැලසෙනු ඇතැයි යන පදනම යටතේ ඩොනමෝර් කොමිසම පළාත් සභා පිහිටුවීම නිර්දේශ කළ අතර, 1955දී පළාත් පාලනය සම්බන්ධයෙන් පත් කරන ලද චොක්සි කොමිසම කලාපීය සභා (Regional Councils) සඳහා රට තුළ ප්‍රබල මතයක් ගොඩනැඟී තිබුණ මුත්, එය පසෙක ලා පළාත් කොමිටි (Provincial Committees) පිහිටුවීම නිර්දේශ කරන ලදී. පසුව 1957 දී බණ්ඩාරනායක - චෙල්වනායගම් ගිවිසුම මඟින් කලාපීය සභා (Regional Councils) පිහිටුවීම යළි කරළියට ගෙන ආ මුත් රට තුළ නැඟී ආ බලවත් දේශපාලන විරෝධය හමුවේ එම ගිවිසුම අහෝසි විය. ඊළඟට 1965 දී සේනානායක - චෙල්වනායගම් ගිවිසුමට දෙමළ භාෂාව සතු අයිතිය, ජනපද ව්‍යාපාරවල ඉඩම් දෙමළ ජනයාට ලබාදීම සහ කලාපීය පදනමක් යටතේ බලය බෙදාහැරීම ඇතුළත් වූ අතර, ඒ අනුව දිස්ත්‍රික් සභා (District Councils) පිහිටුවීමට යෝජනා විණි. මෙයට ලංකා සමසමාජ හා කොමියුනිස්ට් පක්ෂ විරෝධය පෑහ. නැඟී එන විරෝධය හමුවේ අග්‍රාමාත්‍ය ඩඩ්ලි සේනානායකට යෝජනාව ඉල්ලා අස් කර ගැනීමට සිදු විණි. 1977 දී දෙමළ ජනතාවගේ දුක්ගැනවිලි නිවාලීමේ අරමුණින් දිස්ත්‍රික් සංවර්ධන සභා පිහිටුවීම සඳහා ජේ. ආර්. රජය යෝජනා ඉදිරිපත් කළ ද එයට එරෙහිව ඒ වන විට දෙමළ දේශපාලන පක්ෂවල බලවත් විරෝධය මෙන්ම විශේෂයෙන් යාපනයේ තරුණ කොටස් අතරින් ආණ්ඩු විරෝධී ප්‍රචණ්ඩ ක්‍රියා මතු වී තිබුණි.

යළිත් වරක් ඉන්දියාවේ ආශීර්වාදය පිට දෙමළ පක්ෂ සමග පැවැති සාකච්ඡාවේදී එම පක්ෂ විසින් මූලධර්ම කීපයක් ඉදිරිපත් කළ අතර, ශ්‍රී ලංකා රජය විසින් ඉදිරිපත් කරන ලද බලය බෙදාහැරීමේ වැඩපිළිවෙළ දෙමළ පාර්ශ්වය විසින් ප්‍රතික්ෂේප කරන ලදී. ස්වකීය සීමාව ඉක්මවා යාමට නොහැකි බව ශ්‍රී ලංකා රජය ප්‍රකාශ කිරීමත් සමගම එම ව්‍යායාමය ද අසාර්ථක විය. 1986 දී පළාත් සභා බලය බෙදාහැරීමේ ඒකකය වශයෙන් ගෙන රජය සියලු දේශපාලන පක්ෂ සමග වට මේස සාකච්ඡාවක් පැවැත්වීය. ශ්‍රී ලංකා රජය දෙමළ විමුක්ති සංවිධානය සමග පැවැති සාකච්ඡා මත බලය බෙදාහැරීම අරමුණු කොටගත් පළාත් සභා කෙටුම්පත ඉදිරිපත් කෙරිණි. 1987 වන විට රට තුළ උග්‍ර තත්ත්වයක් මතු වුණ අතර, රජය සහ දෙමළ පක්ෂ අතර, සබඳතා පිරිහෙන්නට විය. අවසානයේදී ඉන්දියාවේ මැදිහත් වීම මත 1987 ඉන්දු - ශ්‍රී ලංකා ගිවිසුම යටතේ පළාත් සභා ස්ථාපනය විය.

අද රට තුළ උද්ගත වී ඇති ප්‍රශ්නය පළාත් සභා අවශ්‍යද? පළාත් සභා මූල්‍ය වශයෙන් රටට බරක් වී ඇති අතර, එය සුදු අලියෙක් යයි පැවසේ. පළාත් සභා පවත්වාගෙන යාම සඳහා වසරක් පාසා රුපියල් බිලියන 250ක් පමණ වැය වෙතැයි කියැවේ. පළාත් සභා වෙතින් සිදු වන සේවය දෙස බලන විට මේසා දැවැන්ත මුදලක් දරා තවදුරටත් පළාත් සභා පවත්වාගෙන යෑම යුක්තියුක්ත දැයි විමසා බැලීම වටී.

1948 නිදහසින් පසුව 1987 දක්වා අඩු වැඩි වශයෙන් විවිධ ආණ්ඩු යටතේ රට කරගෙන යෑම සිදු විණි. අදත් එයාකාරයෙන්ම එය කෙරෙමින් පවතී. දෙමළ ජනතාවගේ ප්‍රශ්නවලට පිළිතුරක් වශයෙන් වෙනත් රටක මැදිහත්වීම මත පළාත් සභා පිහිටුවූ මුත් අපේක්ෂිත ප්‍රතිඵල සිදු නොවූ අතර, ත්‍රස්තවාදී දෙමළ සංවිධාන දිහින් දිගටම රට තුළ ප්‍රචණ්ඩ ක්‍රියාවල නිරත වූහ. දෙමළ ජනතාවගේ ප්‍රශ්නවලට විසඳුමක් ලෙස පළාත් සභා මඟින් බලය බෙදාහැරීම ප්‍රතිඵල රහිත විය. රටේ අනෙක් කොටස්වල පළාත් සභා ක්‍රියාත්මක විය. බොහෝ තන්හි එකවර මධ්‍යම රජයේ පරිපාලන කටයුතු පළාත් සභා විසින් සිදු කිරීමේ ප්‍රවණතාවක් දක්නට ලැබිණි. පරිපාලනයේ දුර්වල අවස්ථාවක් වන මෙම එකම කාර්යය දෙපළකින් සිදු වීම Duplication of work වශයෙන් ප්‍රචලිතය. අයවැය විසින් පළාත් සභා වෙත සංවර්ධනය සඳහා වෙන් කරන ලද මූල්‍ය ප්‍රතිපාදන වසර අවසානයේ අඩුවෙන් වියදම් කර ඇති බැව් නිරීක්ෂණය වූ අවස්ථා නැත්තේ ද නොවේ. එපමණක් නොව සංවර්ධනය සඳහා වෙන් කළ ප්‍රතිපාදන, ඇතැම් පළාත් සභා නියෝජිතයන්ගේ විදේශ අධ්‍යයන චාරිකා සඳහා වැයකර ඇතැයි මාධ්‍යය විසින් හෙළි කරන ලදී. තායිලන්තයේ දියුණු කෘෂිකර්ම පද්ධතීන් අධ්‍යයනය කිරීම සඳහා පළාත් සභිකයන් විදේශ අධ්‍යයන සංචාරවල නිරතවූව ද එම ක්‍රම භාවිතයෙන් පළාතේ කෘෂිකර්ම හෝ අධ්‍යාපන කටයුතුවල විශේෂ ප්‍රගතියක් සිදු වූ බවක් වාර්තා නොවේ. හුදෙක් වසර පහක් සඳහා තෝරා පත් වන පළාත් සභිකයන්ට වඩා එබඳු අධ්‍යයන චාරිකාවකින් වඩාත් ප්‍රයෝජනයක් ගත හැකි වනුයේ කෘෂි ක්ෂේත්‍රයේ පර්යේෂකයන්ටය.

රටේ, විශේෂයෙන්ම රජරට, ඌව, මධ්‍යම සහ නැගෙනහිර ප්‍රදේශවල ජීවත් වන ගැමි ජනතාවට බිමට වතුර පොදක්, ගම්වාසීන්ට විශේෂයෙන් පාසල් ළමයින්ට ළඟම නගරයට හෝ පාසලට යාමට ගඟ හෝ ඇළ හරහා පාලමක්, අඩු තරමේ එල්ලෙන පාලමක් පවා නොමැතිකමින් මහත් දුෂ්කරතාවන්ට මුහුණපාන අයුරු රූපවාහිනියෙන් පෙන්වයි. සමහර අවස්ථාවල මිනී පෙට්ටිය පවා උණගස් දෙකක බැඳ ඇළෙන් එගොඩ වන අවස්ථා ද නොතිබුණා නොවේ. අඩු තරමෙන් මෙබඳු දැවෙන ජනතා ප්‍රශ්නවලට හෝ පළාත් සභා මඟින් විසඳුමක් ලබා දී ඇති බවක් නොපෙනේ. පළාත් සංවර්ධනය වෙනුවට පළාත් සභා කාර්යාල සඳහා තනා ඇති නවීන අංගෝපාංගයන්ගෙන් සමන්විත අධි සුඛෝපභෝගී මන්දිර ගැන ද පසුගියදා ජනමාධ්‍ය වෙතින් ප්‍රචාරය කෙරිණි. පළාත් සභා යයි කී පමණින්ම පළාත ගැන අවධානය ලක් වීම නිරූපණය වුවද, රටේ කෘෂිකාර්මික පෙදෙස්වල වගා කිරීමේ කටයුතුවල ගොවීන්ට ඔවුන්ගේ නිෂ්පාදනවලට, අතරමැදියාගේ මැදිහත් වීමකින් තොරව සාධාරණ මිලක් ගැනීම අද ගැටලුවක් වී තිබේ. තව ද, වගාව සඳහා ප්‍රධාන වශයෙන් අවශ්‍ය ජලය ලබාගැනීමේ ගැටලුවට පළාත් සභාවලට මැදිහත් වී විසඳුමක් දීමට හැකි වුවත් එසේ වී නොමැති බැව් රූපවාහිනිය ඉදිරියේ සිය දුක්ගැනවිලි ප්‍රකාශ කරන ගොවීන් වෙතින් මනාව පැහැදිලි වේ. මධ්‍යම රජයට වඩා පළාත් සභාව ගොවීන් ඇතුළු වෙනත් කෘෂිකාර්මික කටයුතුවල යෙදෙන කොටස්වලට සමීප නිසා ඔවුන්ගේ ගැටලුවලට පළාත් සභා හරහා විසඳුම් දිය හැකිය. සාධාරණ මිලක් ලබාගැනීමට අපොහොසත් වී සිටින කිරි ගොවියාගේ තත්ත්වය ඛේදජනකය. ග්‍රාමීය කිරි නිෂ්පාදනය විෂයයෙහි එය නඟාසිටුවීම හා ක්‍රමවත් කිරීම සඳහා පළාත් සභාව සතු වගකීම් අපමණය. කාලයක් පුරා පළාත් සභා පොලිස් සහ ඉඩම් බලතල ඉල්ලා ඇතත් එය ඉටුකළ නොහැකි බැව් වරින්වර බලයේ සිටි ආණ්ඩු පවසා ඇත. දෙමළ ත්‍රස්තවාදී ව්‍යාපාර නිසා භූමියේ ඒකාග්‍රතාවයට මෙන්ම පසුගිය කාලවල රටේ ජාතික ආරක්ෂාවට ත්‍රස්තවාදය වෙතින් එල්ල කරන ලද බලවත් තර්ජන නිසා පොලිස් සහ ඉඩම් බලතල දීම ගැන දෙවරක් සිතීම ප්‍රඥා ගෝචරය. පසුගිය කාලයේ අත්දැකීම් දෙස බලන විට, පොලිස් හා ඉඩම්බලතල දීම පනින රිළවුන්ට ඉණිමං තැබීමට දෙවැනි නොවේ.

රටේ ආර්ථික සහ මූල්‍ය ව්‍යුහය දෙස බලන විට අප සතු සීමිත සම්පත් ඉතා සකසුරු වම් අයුරින් ආයෝජනය කිරීම අත්‍යවශ්‍යය. හුදෙක් වර්ග සැතපුම් 25000 පමණ වන මේ කුඩා රට තුළ මධ්‍යම රජය විසින් සංවර්ධනය සඳහා කටයුතු කිරීම ප්‍රමාණවත් වන අතර, පළාත් සභා වැනි පහළ තලයක ආයතන ජාලයක් විසින් ඉහත කරුණු ඉටු කිරීමේ ජාතික අවශ්‍යතාවක් දක්නට නොමැත. ඒ සඳහා මධ්‍යම රජයේ පරිපාලන නිලධාරී සමූහයා හොඳටම ප්‍රමාණවත් වේ. ඉන්දියාව වැනි දැවැන්ත රාජ්‍යයකට එහි වෙසෙන ජනතාව ආර්ථික, සමාජීය වශයෙන් කෙළින් කර තැබීම උදෙසා ප්‍රබල පරිපාලන ජාලයක් අවශ්‍යමය. රටේ විශාලත්වය හා භූගෝලීය පිහිටීම අනුව විවිධ ආගම්, භාෂා හා සංස්කෘතීන්වලින් සමන්විත ජනකොටස්වල අභිලාෂයන් සපුරාලීම සඳහා ශක්තිමත් පළාත් පාලන ආයතන ජාලයක් අත්‍යවශ්‍යය. ඉන්දියාවට සාපේක්ෂව ශ්‍රී ලංකාවේ සීමිත ජනසමාජයේ ස්වභාවය හා අවශ්‍යතා වටහා ගැනීම දුෂ්කර නොවේ. පළාත් සභා උතුරේ ප්‍රශ්නවලට පිළිතුරක් වශයෙන් පිහිටුවන ලද මුත් උතුරු පළාත් සභාව මධ්‍යම රජයේ අයවැයෙන් ලබා දුන් මූල්‍ය ප්‍රතිපාදන ජනතාවගේ අවශ්‍යතා වෙනුවෙන් වැය නොකිරීම ඛේදජනකය.

◣ කිත්තම්පහුව

'මැතිවරණ සිතියම අවුරුදු දහයකට අකුළනවා'

පළමු ජනාධිපතිවරණයෙන් ජේ.ආර්. දිනුවේ මෙහෙමයි

1977 බලය ලබා ගැනීමෙන් පසුව හිටපු අගමැතිනි සිරිමාවෝ බණ්ඩාරනායක කෙරෙහි තිබූ බිය නිසා ජේ.ආර්. විශේෂ ජනාධිපති කොමිසමක් ඇති කර ඇයගේ ප්‍රජා අයිති අහිමි කරන්නට පියවර ගත්තේ ය. ඔහු එසේ කළේ ඉදිරියේදී පැවැත්වීමට නියමිත ජනාධිපතිවරණයදේ ඇය තමාට බරපතළ තර්ජනයක් වන බව දැන සිටි හෙයිනි. එහෙත් සිය ආණ්ඩුව ජනතාව අතර වේගයෙන් අප්‍රසාදයට පත් වෙමින් තිබෙන බව වැඩි කලක් යන්නට පෙර ඔහුට අවබෝධ විය.

1983 දී මහ මැතිවරණය පැවැත්විය යුතුව තිබිණි. මහ මැතිවරණයේදී ආණ්ඩුව පරාජය වන බව ද ආණ්ඩු බලය යොදා ජය ගත හැකි වුවත් 5/6ක බලය අහිමි වන බව ද ජේ.ආර්. පැහැදිලි ව ම දැන සිටියේය. එහෙත් ඒ අවදානම බාර ගන්නට ඔහු සූදානම් වූයේ නැත. ඒ වෙනුවට වහාම ක්‍රියාත්මක වූ හෙතෙම ඒ වන විට තමාටත් තම ආණ්ඩුවටත් තිබූ බලය රැක ගන්නට පියවර ගත්තේ ය. ඔහු කළේ මහ මැතිවරණයකට යෑමට පෙර ජනාධිපතිවරණයක් පවත්වා තමාගේ බලය තහවුරු කර ගැනීමයි.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව ජනාධිපතිවරණයක් පැවැත්විය යුතුව තිබුණේ 1984 දීය. එබැවින් ජේ.ආර්. කළේ මහ මැතිවරණයක් පැවැත්වීම වෙනුවට ඊට පෙර ජනාධිපතිවරණයක් පැවැත්විය හැකි වන පරිදි ව්‍යවස්ථා සංශෝධනයකට යෑමයි. වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තුන් වැනි සංශෝධනය කරළියට එන්නේ ඒ අනුවය. මේ සංශෝධනය ගෙන එන ලද්දේ පළමු වරට තේරී පත් වූ ජනාධිපතිවරයකුගේ දෙවැනි ධුර කාලයක් සඳහා සඳහා තරග කළ හැකි යැයි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දක්වා තිබූ කාල නියමයන් වෙනස් කිරීමටය.

1978 සම්මත කළ ව්‍යවස්ථාවේ දැක්වුණු අන්දමට ජනාධිපතිවරයකුට දෙවැනි ධුර කාලයක් සඳහා තරග කළ හැකි වූයේ පළමු ධුර කාලය අවසන් වීමට මාසයකට නොඅඩු මාස දෙකකට නොවැඩි කාල සීමාවක් ඇතුළතය. තුන් වැනි සංශෝධනයෙන් ඒ කාල නියමය ඉවත් කර, ජනාධිපතිවරයකුගේ පළමු ධුර කාලයෙන් අවුරුදු හතරක් සම්පූර්ණ වීමෙන් පසු ඔහුගේ හෝ ඇයගේ අභිමතය පරිදි ඕනෑ ම අවස්ථාවක ජනාධිපතිවරණයක් පැවැත්විය හැකි ප්‍රතිපාදනයක් යෝජනා කෙරිණි.

මේ ව්‍යවස්ථා සංශෝධන කෙටුම්පත රාජනීතිඥ එස් නඩේසන් විසින් ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියේ අභියෝගයට ලක් කරන ලදි. ඔහුගේ තර්කය වූයේ ජනාධිපතිවරයා පත් කෙරෙන්නේ සෘජු ව ම මහජනයාගේ ඡන්දයෙන් බැවින් ඒ ධුරය පිළිබඳ ව තීන්දු ගැනීමට පාර්ලිමේන්තුවට බලයක් නැති බවයි. ජනතාව සතු විධායක බලය ජනාධිපතිවරයාට පැවරීමේදී පාර්ලිමේන්තුව සම්බන්ධ නොවන නිසා, ජනාධිපතිවරයාගේ විෂය ක්ෂේත්‍රය හා කාර්යභාරයේ ස්වභාවය විමසීමේ හා තීරණය කිරීමේ අධිකාරි බලය ඇත්තේ ජනතාවට බැවින් සංශෝධනය පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක ඡන්දයෙන් සම්මත වීම පමණක් ප්‍රමාණවත් නොවන බවත් එය ජනමත විචාරණයකින් ද සම්මත විය යුතු බවත් ඔහු කියා සිටියේ ය. එහෙත් ජනාධිපතිවරයාගේ ධුර කාලය දීර්ඝ කිරීමක් යෝජනා නොකෙරන බැවින් සංශෝධන පනත් කෙටුම්පත නීතිගත කිරීමට පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක ඡන්දය ප්‍රමාණවත් බව ශ්‍රේෂ්ඨාධිකරණයේ මතය විය.

ඒ අනුව 1982 අගෝස්තු 27 දා පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක ඡන්දයෙන් ව්‍යවස්ථා සංශෝධනය සම්මත කර ගන්නා ලදි. එදිනම ජනාධිපති ජයවර්ධන දෙවැනි ධුර කාලයක් වෙනුවෙන් ජනාධිපතිවරණයට යෑම සඳහා තම අභිලාශය ප්‍රකාශයට පත් කරමින් නිල නිවේදනයක් නිකුත් කළේය. ඔහු මෙසේ ජනාධිපතිවරණයකට යන්නට තීරණය කරන්නේ සිය ප්‍රතිවාදිනිය වූ හිටපු අගමැතිනි සිරිමාවෝ බණ්ඩාරනායකගේ ප්‍රජා අයිතිය අහිමි කිරීමට අමතරව ඒ හේතුව නිසා ම ඇයගේ පක්ෂය බරපතළ අභ්‍යන්තර අර්බුදයකට ලක් වී තිබෙන පසුබිමකය.

ජේ.ආර්. ජයවර්ධන

හෙක්ටර් කොබ්බෑකඩුව

රෝහණ විජේවීර

කුමාර් පොන්නම්බලම්

ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා

වාසුදේව නානායක්කාර

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ පුරප්පාඩු වී ඇති කාර්මික නිලධාරී (සිවිල්) III ශ්‍රේණියේ තනතුරු සඳහා සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

(1) වැටුප් පරිමාණය :

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 යටතේ MN 3-2016 වැටුප් පරිමාණය අනුව රු.31,040-10X445-11X660-10X730-10X750-57,550/=

(2) තෝරා ගැනීමේ ක්‍රමවේදය :

අයදුම්කරුවන් ලිඛිත විභාගයකට යොමු කරන අතර එක් එක් ප්‍රශ්න පත්‍රයට අවම වශයෙන් 40% ක ලකුණු ප්‍රමාණයක් ලබා ගන්නා අයදුම්කරුවන්, එම විභාගයේ දී විෂයන් දෙක සඳහාම ලබා ගත් මුළු ලකුණු වල කුසලතා අනුපිළිවෙල අනුව සම්මුඛ පරීක්ෂණයකට භාජනය කර සුදුස්සන් තෝරා ගනු ලැබේ.

(3) අයදුම් කිරීම :

ඉල්ලුම්පත්‍රය, **www.agrariandept.gov.lk** වෙබ් අඩවියේ දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූලව ඒ4 කඩදාසියේ (21cmx29 cm) දෙපැත්ත භාවිත කරමින් සකස් කර අපේක්ෂකයා විසින් තම අත් අකුරෙන් ම පිරවිය යුතුය. අයදුම්පත්‍ර 2020.11.13 දින හෝ ඊට පෙර ලැබෙන සේ **"ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, අංක 42, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත, තැ.පෙ. 537, කොළඹ 07"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් පමණක් එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි **" ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරී, III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2019/2020 "** ලෙස සඳහන් කළ යුතුය. අපේක්ෂකයා/ අපේක්ෂිකාව තමා විභාගයට පෙනී සිටීමට අදහස් කරන භාෂා මාධ්‍යයෙන් අයදුම්පත සම්පූර්ණ කළ යුතුය.

මේ සම්බන්ධයෙන් වැඩිදුර තොරතුරු සඳහා **www.agrariandept.gov.lk** වෙබ් අඩවිය වෙත පිවිසෙන්න.

ඩබ්. එම්. එම්. බී. වීරසේකර
ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්,

2020 ඔක්තෝබර් මස 16 දින
ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 537,
කොළඹ 07.

IHRA
UNIVERSITY OF COLOMBO

මානව සම්පත් අභිවර්ධන ආයතනය
කොළඹ විශ්වවිද්‍යාලය

අධ්‍යක්ෂ තනතුර

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතෙහි (හා ඉන් පසුව කළ සංශෝධන අනුව) 24A(i) වගන්ති ප්‍රකාරව ක්‍රියා කරමින්, 2006 අංක 01 දරන මානව සම්පත් අභිවර්ධන ආයතන නියමාවලියේ (සංශෝධිත 1979 අංක 11 දරන සේවක අධ්‍යාපන ආයතනයේ නියමාවලිය) 8(I) වගන්ති ප්‍රකාරව කොළඹ විශ්වවිද්‍යාලයේ මානව සම්පත් අභිවර්ධන ආයතනයේ (IHRA) ශාස්ත්‍රීය කමිටුව විසින්, ආයතනයේ අධ්‍යක්ෂ තනතුර සඳහා අයදුම්පත්/ නාමයෝජනා කැඳවනු ලැබේ.

අදාළ අයදුම්කරුවන්/ නම් කළ අයවලුන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතු අතර, වයස අවුරුදු 63 කට අඩු විය යුතුය. සාර්ථක අයදුම්කරුවන්/ නම් කළ අයවලුන් අදාළ තනතුරෙහි පත්වීම ලද දින සිට වසර 3ක් හෝ ඔහු/ ඇය වයස අවුරුදු 65 සම්පූර්ණ කරන තුරු රාජකාරී කළ යුතු අතර, ඉන් පළමුවෙන් එළඹෙන අවස්ථාව බලාත්මක වනු ඇත.

IHRA යනු කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කළ, උපාධි, ඩිප්ලෝමා හා සහතික පත්‍ර පාඨමාලා පවත්වනු ලබන ආයතනයකි. වර්තමානයේ, මෙම ආයතනය විසින් කොළඹ විශ්වවිද්‍යාලය මගින් ප්‍රදානය කරනු ලබන පශ්චාත් උපාධි හා උපාධි අධ්‍යයනයන් සඳහා අවස්ථාවන් සම්පාදනය කරනු ලබන අතර, ඩිප්ලෝමා හා සහතික පත්‍ර වැඩසටහන් පවත්වනු ලබයි. IHRA ශිෂ්‍ය ප්‍රජාව, ප්‍රධාන වශයෙන් සමන්විත වන්නේ, දැනට රාජ්‍ය හා පෞද්ගලික අංශයන්හි සේවයේ නියුක්ත වූවන්ගෙනි. තවද, මෙම ආයතනය, පර්යේෂණ හා උපදේශන සේවාවල ද නිරතව සිටී.

අධ්‍යක්ෂවරයා ආයතනයෙහි පූර්ණකාලීන නිලධාරියෙකු වන අතර, අධ්‍යයන හා පරිපාලන ප්‍රධානියා ලෙස ද කටයුතු කරයි. එසේම, ඔහු/ ඇය ආයතනයේ ගිණුම්කරණ නිලධාරියා ද වන අතර, ආයතනයේ පාලනාධිකාරය වන ශාස්ත්‍රීය කමිටුවේ (Academic Syndicate)නිලබලයෙන් පත් වූ සාමාජිකයෙක් මෙන්ම සභාපතිවරයා ද වේ. අධ්‍යක්ෂවරයාගේ රාජකාරිය වන්නේ චින්විද්‍යාවය හා වගවීම් පවත්වා ගැනීම වන අතර, අධ්‍යයන නායකත්වය ලබාදීමේ වගකීම ද දරයි. එසේම, ඔහු ආයතනය ඇතුළත චිතය පවත්වා ගැනීම පිළිබඳ වගකීම ද දරයි. ඔහු/ ඇය ආයතනයේ සේවාදායකයින්ගේ සහ කාර්යය මණ්ඩලයේ අවශ්‍යතා පිළිබඳ අවබෝධයක් තිබිය යුතු අතර, අරමුදල් උත්පාදනය කිරීමටත්, විශ්වවිද්‍යාල-ආයතන හා කර්මාන්ත අතර සහයෝගීතාවය වර්ධනය කිරීම මෙන්ම අධ්‍යයන කටයුතු පිළිබඳ ජාත්‍යන්තර සම්බන්ධතා වර්ධනය කිරීමටත් හැකි විය යුතුය.

අධ්‍යක්ෂවරයා, ඔහුගේ/ ඇයගේ බුද්ධිමත්භාවයේ මෙන්ම කළමනාකාරීත්ව බුද්ධි ප්‍රභාව තුළින් ආයතනයේ අරමුණු ඉටු කර ගැනීමට සමත් දැක්මක් ඇති අයකු විය යුතුය. අයදුම්කරු/ නම් කළ අය, ඉහළ අධ්‍යයන පත්තරයක් හා ඒකාග්‍රතාවයක් ඇති ඉහළ පර්යේෂණ ප්‍රකාශන අංශ දර්ශකයක්, සනාථ කළ නායකත්ව ගුණාංගයන් සහ ඉහළ තලයේ අන්තර් පුද්ගල නිපුණතාවයෙන් යුත් අයෙක් විය යුතු අතර, ප්‍රතිපත්ති සහ ගැටලු සම්බන්ධව පැහැදිලි අවබෝධයක් තිබිය යුතුයි.

මෙම තනතුර සඳහා මහාචාර්යවරයකුගේ වැටුප සමඟ තනතුරට අදාළ අනෙකුත් දීමනා ද ගෙවනු ලැබේ.

අදාළ අයදුම්පත් / නාමයෝජනා සමඟ පහත සඳහන් ලේඛන තිබිය යුතුය.

(i) අයදුම්කරුගේ/ නම් කළ අයගේ උපන්දිනය සමඟ සම්පූර්ණ ජීව දත්ත (උප්පැන්න සහතිකයේ සහතික කළ පිටපතක් අනිවාර්යයෙන් අමුණා තිබිය යුතුය.)

(ii) ආයතනයේ සංවර්ධනය උදෙසා දැක්මේ ප්‍රකාශයක්.

(iii) අධ්‍යක්ෂ තනතුරට පත්කරනු ලැබුවහොත්, ඔහු/ ඇය සාක්ෂාත් කරගැනීමට අපේක්ෂිත අරමුණු සම්බන්ධව කෙටි විස්තරයක්.

(iv) නම් කරනු ලබන අයදුම්කරුවන් සම්බන්ධයෙන්, අදාළ අයදුම්කරුගේ එකඟතාව පළකරන ලිපියක්.

(v) මානව සම්පත් අභිවර්ධන ආයතනය හැර රාජ්‍ය අංශයේ, සංවිධානවල, ව්‍යවස්ථාපිත මණ්ඩලවල හා උසස් අධ්‍යාපන ආයතනවල සේවය කරන අයදුම්කරුවන්/ නම් කළ අයවලුන් සිය සේවායෝජක වෙතින් ඔහු/ ඇය මෙම තනතුරට පත්කර ගනු ලැබුවහොත් දැනට දරන තනතුරින් නිදහස් කළ හැකිද යන කරුණු සඳහන් ලිපියක් ඉදිරිපත් කළ යුතුය.

තෝරාගැනීමේ ක්‍රමවේදය, 2020 සැප්තැම්බර් 11 වන දිනැති අංක 07/ 2020 දරන UGCචක්‍රලේඛය ප්‍රකාරව ලබාදී ඇති උපදෙස් නියමයන් අනුව සිදු කෙරේ. (මෙම චක්‍රලේඛය, www.ugc.ac.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.)

සම්පූර්ණ කළ අයදුම්පත්/ නාම යෝජනා, **ලේකම්, ශාස්ත්‍රීය කමිටුව, මානව සම්පත් අභිවර්ධන ආයතනය, අංක 275, බෞද්ධාලෝක මාවත, කොළඹ 07** ලිපිනයට, **2020 නොවැම්බර් 06 වන දින පස්වරු 3.00 ට** පෙර ලියාපදිංචි තැපෑලෙන් එවීමට හෝ එම කාර්යාලය වෙත ගෙනවිත් භාරදීම සිදු කළ හැකිය. අයදුම්පත්/ නාමයෝජනා බහාලූ අදාළ කවරයේ වම්පස ඉහළ කෙළවරේ, **"අධ්‍යක්ෂ තනතුර"** යනුවෙන් සඳහන් කළ යුතුය.

අදාළ අවසාන දිනයට පසුව ලැබෙන අයදුම්පත්/ නාමයෝජනා ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ශාස්ත්‍රීය කමිටුවේ ලේකම්,
මානව සම්පත් අභිවර්ධන ආයතනය,
කොළඹ විශ්වවිද්‍යාලය.
2020 ඔක්තෝම්බර් 16

දිනමිණ The Dinamina ටෙන්ඩර් හා අනෙකුත් දැන්වීම්

දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වගන්තිය යටතේ පහත සඳහන් සමාගම 2020 සැප්තැම්බර් 21 දින සංස්ථාපනය කළ බවට කරනු ලබන නිවේදනයයි.

සමාගමේ නම
ආර්ක් රිනිවබල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ ලියාපදිංචි අංකය :
පීවී 00227729
ලියාපදිංචි ලිපිනය :
359/1 ඒ, ගාලුපාර, ගල්කිස්ස, රත්මලාන.

සමාගමේ අධ්‍යක්ෂක මණ්ඩලය අණ පරිදි
ග්‍රෙගරිස් පාර්ටිනර්ස්
සමාගම් ලේකම්
53/3, ග්‍රෙගරිස් පාර, කොළඹ 07.

කොළඹ දිස්ත්‍රික්කයේ, කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 60/2, වල්පොල, මුල්ලේරියාව නව නගරයේ පදිංචි **ෂම්මි ඩික්සන්** නමින් හැඳින් වූ මා මෙතැන් සිට **කරන්දෙනිය රත්නායකගේ ෂම්මි ඩික්සන්** යනුවෙන් භාවිත කරන බව ශ්‍රී ලංකා රජයටත්, මහජනතාවටත් මෙයින් දැනුම් දෙමි.

මෙයට, **කරන්දෙනිය රත්නායකගේ ෂම්මි ඩික්සන්**

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වගන්තිය යටතේ කරනු ලබන නිවේදනයයි.

සමාගමේ නම
වූජෝ ලංකා ඉන්වෙස්ට්මන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය :
පීවී 00213323
සංස්ථාගත කළ දිනය :
2019.07.05
ලියාපදිංචි ලිපිනය : අංක 510, ගුරුගල්ල, දෙහිඕවිට.

සමාගම් ලේකම්

දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වගන්තිය යටතේ පහත සඳහන් සමාගම, 2020 ජූලි 26 දින සංස්ථාපනය කළ බවට කරනු ලබන නිවේදනයයි

සමාගමේ නම :
ප්‍රොපිලන් හවුස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ ලියාපදිංචි අංකය :
පීවී 00224990,
ලියාපදිංචි ලිපිනය :
අංක 53/3, ග්‍රෙගරිස් පාර, කොළඹ 07.

අධ්‍යක්ෂක මණ්ඩලය අණපරිදි,
ග්‍රෙගරිස් පාර්ටිනර්ස්,
සමාගම් ලේකම්, 53/3, ග්‍රෙගරිස් පාර, කොළඹ 07.

දැන්වීමයි

කුරුණෑගල මහා නගර සභාව

2020 වර්ෂයේ පරිපූරක අයවැය අංක 01

මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරය) 214 (ආ) වගන්තිය ප්‍රකාර 2020 වර්ෂයේ අංක 01 දරන පරිපූරක අයවැය ඇස්තමේන්තුව 2020 ඔක්තෝබර් 19 දින සිට දින 07 ක කාලයක් මහජනයාට දැකබලා ගැනීම සඳහා මහා නගර සභා කාර්යාලයේ තබා ඇති බව දැනුම් දෙමි.

තුෂාර සංජීව විතාරණ
නගරාධිපති,

2020-10-07
කුරුණෑගල මහා නගර සභා කාර්යාලයේ දීය.

මහජනතාව වෙත කරනු ලබන දැනුම් දීමයි

සී/ස ව්‍යාපාර සංවර්ධන සමුපකාර සමිතියේ හංවැල්ල ශාඛාවේ ජංගම මුදල් එකතු කරන්නා ලෙස සේවය කළ අඹතලේ, වැව පාර, අංක 102/1 පදිංචි ජා. හැ. අං. 910404067V දරන අම්පෙ පතිරන්නැහැලාගේ රංජිත් යන අය 2020.10.05 දින සිට අප සමුපකාර සමිතියේ සේවයෙන් ඉවත් වී ඇති බව සාමාජික ගනුදෙනුකරුවන් වෙත දැනුම් දෙමු. 2020.10.05 දිනෙන් පසුව මොහු සමග කරන ගනුදෙනු සම්බන්ධයෙන් සී/ස ව්‍යාපාර සංවර්ධන සමුපකාර සමිතිය කිසිදු වගකීමක් නොදරන බව කාරුණිකව දන්වමි.

මෙයට,
කළමනාකාරිත්වය,
සී/ස ව්‍යාපාර සංවර්ධන සමුපකාර සමිතිය.

ටෙන්ඩර් දැන්වීමයි

2021 වර්ෂය - තංගල්ල නගර සභාව

තංගල්ල නගර සභාවට අයත් පහත උපලේඛනයේ සඳහන් දේපල 2021-01-01 දින සිට 2021-12-31 දක්වා බදුදීම සඳහා පිටපත් 02 කින් යුත් මුදු, තැබූ ටෙන්ඩර්පත් 2020-11-06 දින පෙ.ව. 10.00 දක්වා තංගල්ල නගර සභාවේ ටෙන්ඩර් බහාලීම සඳහා තබා ඇති පෙට්ටියට දැමීමට හෝ එදින නියමිත වේලාවට තංගල්ල නගර සභාවට ලියාපදිංචි තැපෑලෙන් එවීමට හැකිය.

ටෙන්ඩර් පෝරම 2020-11-05 දින ප.ව. 3.00 දක්වා තම ජාතික හැඳුනුම්පත හා වෙනත් පිළිගත හැකි හැඳුනුම්පතක් ඉදිරිපත් කර පහත සඳහන් අවශ්‍යතා සම්පූර්ණ කරන අයට පමණක් පහත දැක්වෙන ගාස්තු අයකර මෙම කාර්යාලයෙන් නිකුත් කරනු ලැබේ.

ටෙන්ඩර් පෝරම ලබා ගැනීමට ප්‍රථම ටෙන්ඩර් ලබාගන්නාගේ අනන්‍යතාවය තහවුරු කළ යුතුය. ස්ථිර පදිංචිය සනාථ කිරීම සඳහා ග්‍රාම නිලධාරි සහතිකය ඉදිරිපත් කළ යුතු අතර, වාර්ෂිකව රු. 240,000/- ට වැඩි ආදායමක් ඇති බවට ප්‍රාදේශීය ලේකම් විසින් නිකුත් කළ ආදායම් සහතිකය ලංසු කරුවන් විසින් ඉදිරිපත් කළ යුතුය. වයස අවු. 25 ට වැඩි අයට පමණක් ටෙන්ඩර් පෝරම නිකුත් කරනු ලැබේ.

2020-11-06 දින පෙ.ව. 10.30 ට ටෙන්ඩර් විවෘත කරනු ලැබේ. සියලුම ටෙන්ඩර් පත් හෝ ඉන් කොටසක් පිළිගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ බලය තංගල්ල නගර සභාවේ ටෙන්ඩර් මණ්ඩලය සතුවන අතර, ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවට ටෙන්ඩර්කරුට හෝ ඔහුගේ නියෝජිතයෙකුට සහභාගි විය හැකිය. වැඩි විස්තර මෙම කාර්යාලයේදී කාර්යාල වේලාවන් තුළ දැනගත හැකිය.

දුරකථන අංකය : 047-4931945 හෝ 047-4934275

උපලේඛනය

අනු අංකය	කාරණය	ඉල්ලුම් කළ හැකි අවම ලංසු වටිනාකම රු. ශත.	ටෙන්ඩර් ඇප මුදල රු. ශත.	ටෙන්ඩර් පෝරම ගාස්තුව රු. ශත.
01.	තංගල්ල ජනතා පොළ, මාළු වෙළඳපොළ සහ නගර සභා සීමාව තුළ අමතර බදු එකතු කිරීමේ අයිතිය බදු දීම.	4,684,465.50	25,000.00	1,500.00
02	තංගල්ල පොදු වෙළඳපොළ ගව මස් කඩය බදු දීම.	1,231,875.00	15,000.00	1,500.00
03	නව පොදු වැසිකිළිය බදු දීම.	495,375.00	10,000.00	500.00

රවිඳු වෙදආරච්චි,
සභාපති, තංගල්ල නගර සභාව.

මහජන බැංකුව

කොළඹ පිටත ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය

බේරා නොගත් උකස් රන් භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මහජන බැංකුවේ පහත දැක්වෙන ශාඛාවන්හි / සේවා මධ්‍යස්ථානයන්හි 2019-03-31 දින දක්වා උකස් කරන ලදුව ඒ ඒ ශාඛාවන් ඉදිරියෙන් දැක්වෙන දිනයන්ට බේරා නොගත් රන් භාණ්ඩ මෙම නිවේදනයේ දක්වා ඇති පරිශ්‍රයන්හි දී පහත සඳහන් දිනයන්හිදී පෙ.ව. 9.00 සිට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

ශාඛාව සහ සේවා මධ්‍යස්ථානය	පහත දැක්වෙන දිනයට බේරා නොගත්	වෙන්දේසිය පැවැත්වෙන දිනය	වෙන්දේසිය පැවැත්වෙන ස්ථානය
හෝමාගම හෝමාගම නගර සේ. ම. පාදුක්ක සේ. ම/ මීගොඩ සේ.ම. ගොඩගම සේ. ම. සුධ හමුද රෙ. මු. - පනාගොඩ සේ.ම.	2020-10-30	2020-10-31 2020-11-01	හෝමාගම ශාඛාව
බත්තරමුල්ල තලවතුගොඩ සේ. ම. මාලබේ සේ.ම. / හෝකන්දර සේ.ම. විදේශ සේවා කාර්යාංශය සේ.ම.	2020-10-30	2020-10-31 2020-11-01	බත්තරමුල්ල ශාඛාව
දෙහිවල අත්තිඩිය සේ. ම. තැදිමාල සේ.ම. **ගල්කිස්ස** **රත්මලාන** රත්මලාන ආර්ථික සේ. ම.	2020-11-06	2020-11-07 2020-11-08	දෙහිවල ශාඛාව
හංවැල්ල හංවැල්ල නගර සේ. ම. කහහේන සේ.ම. **කඩුවෙල** නවගමුව සේ. ම. බණ්ඩාරවත්ත සේ.ම.	2020-11-06	2020-11-07 2020-11-08	හංවැල්ල ශාඛාව
කොලොන්නාව වැල්ලම්පිටිය සේ. ම. **කොට්කාවත්ත** ගොතටුව සේ. ම. මුල්ලේරියාව නව නගර සේ.ම.	2020-11-20	2020-11-21 2020-11-22	කොට්කාවත්ත ශාඛාව
පිළියන්දල පිළියන්දල නගර සේ. ම. **කැස්බෑව** කහතුඩුව සේ. ම.	2020-11-20	2020-11-21 2020-11-22	කැස්බෑව ශාඛාව
අවිස්සාවේල්ල කොස්ගම සේ. ම. තල්දූව සේ. ම.	2020-11-27	2020-11-28	අවිස්සාවේල්ල ශාඛාව
බොරලැස්ගමුව **දෙහිවල ගාලුපාර** කළුබෝවිල සේ.ම.	2020-11-27	2020-11-28	දෙහිවල ගාලු පාර ශාඛාව
මොරටුව රාවතාවත්ත සේ. ම. කටුකුරුන්ද සේ. ම. **මොරටුමුල්ල** පුවක්අරඹ සේ. ම. **කටුබැද්ද** සොයිසාපුර සේ. ම.	2020-12-04	2020-12-05 2020-12-06	මොරටුව ශාඛාව
නුගේගොඩ නගර කොහුවල සේ. ම. **ගංගොඩවිල** දෙල්කඳ සේ. ම/ ජයවර්ධනපුර සේ. ම. **මහරගම** පන්නිපිටිය සේ. ම. පමුණුව සේ.ම.	2020-12-04	2020-12-05 2020-12-06	ගංගොඩවිල ශාඛාව
නුගේගොඩ ඇඹුල්දෙණිය සේ. ම. / තාවල සේ.ම. වැපල් පාර සේ. ම. / වැලිකඩ සේ. ම. **පිටකෝට්ටේ ශාඛාව** ඇතුල්කෝට්ටේ සේ.ම. තලපත්පිටිය සේ. ම.	2020-12-11	2020-12-12 2020-12-13	නුගේගොඩ ශාඛාව
කොට්ටාව අතුරුගිරිය සේ.ම. මත්තේගොඩ සේ. ම.	2020-12-11	2020-12-12 2020-12-13	කොට්ටාව ශාඛාව

උක්ත උකස් වෙන්දේසි කිරීම් දැන්වීමකින් තොරව, අවලංගු කිරීම, කල්දැමීම, ස්ථානය වෙනස් කිරීම හෝ ඒකාබද්ධ කිරීමේ අයිතිය මහජන බැංකුව සතුය.

සහකාර සාමාන්‍යාධිකාරිණී,
(කොළඹ පිටත) මහජන බැංකුව,
අංක 177A, හයිලෙවල් පාර, නුගේගොඩ.
දුරකථන අංක : 2812260 / 2854189

මහජන බැංකුව PEOPLE'S BANK
www.peoplesbank.lk
AA+ (lka) Fitch Rating, AA - Brand Finance Rating

කොළඹ මහා නගර සභාව

නාගරික ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ

ලංසු සඳහා ආරාධනයයි

කොළඹ මහා නගර සභාවේ නාගරික කොමසරිස් විසින් පහත සඳහන් සේවාවන් සඳහා පිටපත් දෙකකින් යුත් මුදු, තැබූ ලංසු අයදුම්පත් භාරගනු ලැබේ.

	සේවාවේ නම	ලංසුකරුගේ යෝග්‍යතාව	ආපසු නොගෙවනු ලබන ඉල්ලුම්පත් ගාස්තුව වැට් සමග	ලංසු ඇපකරය	වැඩි විස්තර ලබාගැනීම සඳහා හමුවිය යුතු තැනැත්තා
01	කොළඹ මහා නගර සභාවේ නාගරික දිස්ත්‍රික්ක 2B හි ඝන අපද්‍රව්‍ය කළමනාකරණ සේවාවන් සැපයීම. (පරිශ්‍රයන් තුළින් කසළ එකතු කිරීම හැර)	මෙවැනි සේවාවන් සැපයීම සඳහා කොන්ත්‍රාත්කරුවන්ට ඇති විශේෂ සුදුසුකම් පළපුරුද්ද හා හැකියාව	රු. 9,720.00	රු. 2,400,000.00 (කොන්දේසි රහිත ඉල්ලුම් සහතිකයක්)	අධ්‍යක්ෂ ඉංජිනේරු (ව්‍යාපෘති අංශය) දුරකථන අංක : 011-2691191 - 252 011-2692403
02	කොළඹ මහා නගර සභාවේ නාගරික දිස්ත්‍රික්ක 03 හි ඝන අපද්‍රව්‍ය කළමනාකරණ සේවාවන් සැපයීම (පරිශ්‍රයන් තුළින් කසළ එකතු කිරීම හැර)	මෙවැනි සේවාවන් සැපයීම සඳහා කොන්ත්‍රාත්කරුවන්ට ඇති විශේෂ සුදුසුකම් පළපුරුද්ද හා හැකියාව	රු. 9,720.00	රු. 2,400,000.00 (කොන්දේසි රහිත ඉල්ලුම් සහතිකයක්)	
03	කොළඹ මහා නගර සභාවේ නාගරික දිස්ත්‍රික්ක 04 හි ඝන අපද්‍රව්‍ය කළමනාරකණ සේවාවන් සැපයීම (පරිශ්‍රයන් තුළින් කසළ එකතු කිරීම හැර)	මෙවැනි සේවාවන් සැපයීම සඳහා කොන්ත්‍රාත්කරුවන්ට ඇති විශේෂ සුදුසුකම් පළපුරුද්ද හා හැකියාව	රු. 9,720.00	රු. 2,400,000.00 (කොන්දේසි රහිත ඉල්ලුම් සහතිකයක්)	

සැලකිය යුතුයි : ලංසු ආරාධනා සඳහා විස්තර ලංසු ලේඛන සමග නිකුත් කරනු ලැබේ. ලංසු ලේඛන සමග අමුණා ඇති සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ PCA/13278 දරන චක්‍රලේඛය වෙත යොමු වන්න.

ලංසු සඳහා අවසාන දිනය : 2020.11.06 දින පෙ.ව. 10.00 දක්වා නියමිත වේලාවට නොලැබුණු අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ලංසු ලේඛන නිකුත් කිරීම : (අ) 2020.11.05 දින පෙ.ව. 10.00 දක්වා.
(ආ) කොළඹ 07, ටවුන්හෝල්, නගර සභා ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ ව්‍යාපෘති කළමනාකරණ අංශයෙන් ලබාගත හැක.

ලබාදෙන වලංගු කාලය : ලංසු බාර ගන්නා අවසන් දින සිට දින 190 ට නොඅඩුව

පෙර ලංසු රැස්වීම : ස්ථානය : කොළඹ 7, ටවුන්හෝල්, ඝන අපද්‍රව්‍ය කළමනාකරණ අංශය
වේලාව : 2020.10.26 පෙ.ව. 10.00 ට.

ලංසු ඇපකරයේ වලංගු කාලය : (අ) 2021.06.06 දක්වා විය යුතුයි.
(ආ) ලංසු ඇපකරය/ මුදල් තැන්පත්තුවේ ලදුපත ලංසු අයදුම්පත සමග ඉදිරිපත් කළ යුතුයි.

ටෙන්ඩර් පෙට්ටිය තබා ඇති ස්ථානය : කොළඹ 7, ටවුන්හේල් නගර සභා ලේකම්තැනගේ දෙපාර්තමේන්තුව, තැපෑලෙන් යවන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.

වෙනත් කොන්දේසි :

(ඒ) ටෙන්ඩර් සඳහාම වූ පෝරමවල ලංසු ඉදිරිපත් කළ යුතුයි.

(බී) ටෙන්ඩර් පෝරම සඳහා ආපසු නොගෙවනු ලබන ටෙන්ඩර් ගාස්තුව මුදලින් ගෙවීම් කළ ලදුපත සමග ව්‍යාපාර ලිපි ශීර්ෂයක් (Business Letter Head) මගින් ඉදිරිපත් කළ යුතුයි.

(සී) ලංසු ලේඛන, නගර සභා ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ, ව්‍යාපෘති කළමනාකරණ අංශයෙන් නොමිලයේ පරීක්ෂා කළ හැක.

(ඩී) ලංසු ඇපකරය සම්මත ආකාරයෙන් (සම්මත පෝරම. ලංසු ලේඛන සමගින් ලබාගත හැක) පෝරමයකින් නාගරික කොමසාරිස් , කොළඹ මහා නගර සභාව නමට ලිවිය යුතුයි.

(ඊ) ලංසු ඇපකරය මුදලින් හෝ කොළඹ මහා නගර සභාව පිළිගත් බැංකුවකින් ලබාගත් බැංකු ඇපකරයක් විය යුතුයි. පෙර හිමිකම් පැහැර හැරීම් සිදු කළ අය විසින් ඉදිරිපත් කරන ලද ඇපකර බාරගනු නොලැබේ.

(එෆ්) ඉල්ලා ඇති මුදලට ලංසු ඇපකර ඉදිරිපත් නොකරන අයැදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(ජී) ලංසු බාරගැනීම අවසන් වූ වහාම ලංසු විවෘත කරනු ලැබේ. එම දිනය ප්‍රසිද්ධ නිවාඩුවක් වේ නම් ලංසු භාරගැනීම ඊළඟ වැඩ කරන දින පෙ.. 10.00 ට අවසන් කර ඉන්පසු වහාම විවෘත කරනු ලැබේ.

(එච්) ලංසු විවෘත කරන අවස්ථාවට ලංසුකරුවන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන්ට සහභාගි විය හැක.

(අයි) හේතු නොදක්වා අවම ලංසුව හෝ වෙනත් ලංසුවක් බාරගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීමේ බලය මහ නගර සභාව සතු වේ.

නිතිඥ රෝෂණී දිසානායක
නාගරික කොමසාරිස්,
කොළඹ මහා නගර සභාව,
ටවුන්හෝල්, කොළඹ 07.

දෙහිවල ගල්කිස්ස මහා නගර සභාව

වර්ෂ 2021 වැඩසටහන් අයවැය ලේඛනය

මහ නගර සභා ආඥා පනතේ (252 වන අධිකාරියේ) 212 ඡේදය ප්‍රකාර, දෙහිවල - ගල්කිස්ස මහා නගර සභාවේ 2021 වර්ෂය සඳහා වූ වැඩසටහන් අයවැය ලේඛනය 2020 වර්ෂයේ ඔක්තෝබර් මස 20 වැනි දින සිට ඔක්තෝබර් 26 වැනි දින දක්වා කාර්යාලීය වේලාව තුළදී මහජනතාවගේ පරීක්ෂාව පිණිස තබා ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

නාවලගේ ස්ටැන්ලි ඩයස්
නගරාධිපති
දෙහිවල ගල්කිස්ස මහා නගර සභාව.

2020.10.16 දින
දෙහිවල ගල්කිස්ස මහා නගර සභාව.

මහනුවර මහා නගර සභාවේ ටෙන්ඩර් දැන්වීම

මෙහි පහත උපලේඛනයේ සඳහන් ස්ථානයේ ඇති වැසිකිළි පද්ධතියේ පවිත්‍රතා කටයුතු ඉටුකිරීම හා එය පරිහරණය කරන්නන්ගෙන් ගාස්තුවක් අයකිරීමේ අයිතිය තාවකාලිකව බදු දීම සඳහා පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ගෙන් 2020.11.03 දින පෙ.ව. 10.00 දක්වා පිටපත් දෙකකින් මුද්‍ර, තබන ලද ටෙන්ඩර් අයදුම්පත් මව්සිත් භාරගනු ලැබේ.

ටෙන්ඩර් අයදුම්පත් 2020.11.02 දින ප.ව. 3.00 දක්වා සතියේ වැඩකරන දිනයන්හිදී නිකුත් කරනු ලබන අතර, අයදුම්පත් 2020.11.03 දින පෙ.ව. 10.00 ට විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් කොන්දේසි මහනුවර මහා නගර සභාවේ ගණකාධිකාරී (ආදායම්) වෙතින් කාර්යාලීය වේලාවන් තුළදී ලබාගත හැකි අතර, වැඩි විස්තර 081-2227395 දුරකථන අංකයෙන් ලබාගත හැක.

ස්ථානය	සේවාව	ආපසු නොගෙවන ටෙන්ඩර් අයදුම්පත් ගාස්තු (බදු සහිතව) රු. ශත	ආපසු ගෙවන ටෙන්ඩර් තැන්පත් මුදල	අවම ලංසුව රු. ශත	කාල සීමාව
මහනුවර මහා නගර සභාව මධ්‍යම වෙළඳපොළ ඇතුළත වැසිකිළි පද්ධතිය	වැසිකිළි පද්ධතියේ පවිත්‍රතා කටයුතු ඉටුකිරීම හා එය පරිහරණය කරන්නන්ගෙන් ගාස්තු අයකිරීම	1,090.00	50,000.00	8,100,000.00	2021.01.01 සිට 2022.12.31

ආපසු ගෙවන ප්‍රසම්පාදන තැන්පත් මුදල :

ආපසු ගෙවන ටෙන්ඩර් තැන්පත් මුදල රු. 50,000.00 කි. ටෙන්ඩර් තැන්පත් මුදල සඳහා මහනුවර මහා නගර සභාවේ සරප් අංශයට මුදල් ගෙවන ලද ලදුපත හෝ නැවත ඉල්ලූ විට ගෙවන අවලංගු කළ නොහැකි බැංකු ඇපකරයක් මහනුවර මහා නගර සභාවේ නාගරික කොමසාරිස් නමින් ලබාගෙන එම ලියවිල්ල හෝ ටෙන්ඩර් අයදුම්පත සමග අමුණා එවිය යුතුය. එසේ නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

සුදුසුකම් :

අයදුම්කරුවන් අවම වශයෙන් වසර 3 කට වැඩි කාලයක් රජයේ / පළාත් පාලන ආයතනවල පොදු වැසිකිළි පද්ධතියක පවිත්‍රතා කටයුතු කර තිබිය යුතුය. (ලියවිලි මගින් සනාථ කළ යුතුය)

පිළිගනු ලබන ටෙන්ඩර් මුදලට අමතරව රජයට ගෙවිය යුතු බදු එකතුකර අයකරනු ලැබේ.

චන්දන තෙන්නකෝන්,
මහනුවර නාගරික කොමසාරිස්.

2020.10.09 දින,
මහනුවර නාගරික කාර්යාලයේ දී ය.

රාජාංගන ප්‍රාදේශීය සභාව

2021 වර්ෂයට මස්කඩ, පාපැදිගාල්, 5 කණුව කිරිහල, 5 කණුව ඉරිඳ හැර මුහුදු මාළු ලැල්ල හා වැව් මාළු ලැල්ල වෙළඳ කටයුතු සඳහා බදු දීමට ටෙන්ඩර් කැඳවීම.

පහත උපලේඛනයන්හි සඳහන් ව්‍යාපාරයන්හි වෙළඳ අයිතිය 2021.01.01 දින සිට 2021.12.31 දින දක්වා කාලයට බදු දීම සඳහා මුද්‍ර, තබන ලද ටෙන්ඩර්පත් 2020.11.06 වන දින ප.ව. 3.30 දක්වා මා විසින් භාරගනු ලැබේ. ටෙන්ඩර්පත් නිකුත් කරනු ලබන්නේ 2020.10.16 දින සිට 2020.11.06 වන දින ප.ව. 2.00 දක්වා පමණි.

පහත උපලේඛනයේ දැක්වෙන ටෙන්ඩරයේ ඇප හා පෝරම ගාස්තු රාජාංගන ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවා ටෙන්ඩර් පෝරමය ලබාගැනීම සඳහා තම අනන්‍යතාවය ජාතික හැඳුනුම්පත, ග්‍රාම නිලධාරී පදිංචි සහතිකය හෝ පිළිගත හැකි ලියවිල්ලක් මගින් සනාථ කළ යුතුය. අවම ලංසුවට අඩුවෙන් ඉදිරිපත් කරන ටෙන්ඩර්පත් ප්‍රතික්ෂේප කරනු ලබන අතර, ටෙන්ඩර් තැන්පත් මුදල් සහ සන්තක කරනු ලැබේ. 2020.11.06 දින ප.ව. 4.00 ට ප්‍රාදේශීය සභා කාර්යාලයේදී ටෙන්ඩර්පත් විවෘත කරනු ලැබේ. ප්‍රමාද වී ලැබෙන ටෙන්ඩර්පත් භාරගනු නොලැබේ. ටෙන්ඩර් පිටපත් 2 කින් ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් බහාලනු ලබන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන ව්‍යාපාරයේ නම සඳහන් කර ලියාපදිංචි තැපෑලෙන් හෝ කාර්යාලයේ ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීමෙන් ඉදිරිපත් කළ යුතුය.

දුරකථන අංකය : 025-2276376

උපලේඛනය

අනු අංකය	දේපළ	අවම ලංසුව	ටෙන්ඩර් ඇප	ටෙන්ඩර් පෝරම ගාස්තු
01	5 කණුව සති පොළ කුකුල් මස් කඩය	117,000.00	29,250.00	3,000.00
02	5 කණුව සති පොළ ඌරු මස් කඩය	67,800.00	16,950.00	3,000.00
03	පුත්තලම් හන්දිය සති පොළ කුකුල් මස් කඩය	93,500.00	23,375.00	3,000.00
04	පුත්තලම් හන්දිය සති පොළ ඌරු මස් කඩය	66,000.00	16,500.00	3,000.00
05	පුත්තලම් හන්දිය සති පොළ පාපැදි ගාල	80,000.00	20,000.00	3,000.00
06	5 කණුව සති පොළ පාපැදි ගාල	22,162.00	5,541.00	3,000.00
07	5 කණුව කිරිහල	17,500.00	4,375.00	1,500.00
08	5 කණුව සති පොළ ඉරිඳ හැර මුහුදු මාළු ලැල්ල	30,000.00	7,500.00	1,500.00
09	5 කණුව සති පොළ ඉරිඳ හැර වැව් මාළු ලැල්ල	30,000.00	7,500.00	1,500.00

ටෙන්ඩරය පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය ප්‍රාදේශීය සභාව සතුවේ.

2020.10.08
රාජාංගන ප්‍රාදේශීය සභා කාර්යාලයේදී.

ජී.එච්. සරත් ගාමිණී
සභාපති,
රාජාංගන ප්‍රාදේශීය සභා කාර්යාලය

කැස්බෑව නගර සභාව

2021 වර්ෂය සඳහා වරිපනම් බදු පැනවීම

255 වන අධිකාරය වන නගර සභා ආඥා පනතේ 160 වන වගන්තියෙහි (1) උප වගන්තියේ විධිවිධාන ප්‍රකාර කැස්බෑව නගර සභා බල ප්‍රදේශය සඳහා 2021 වර්ෂයට වරිපනම් බදු පහත සඳහන් ආකාරයට නියම කරනු ලැබේ.

255 වන අධිකාරය වන නගර සභා ආඥා පනතේ 160 වන වගන්තියෙහි (1) උප වගන්තියෙන් කැස්බෑව නගර සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර කැස්බෑව නගර සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටි සියලුම නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම්වල, ගෙපත්වල හා වාණිජ පරිශ්‍රයන්හි 2020 වර්ෂයට පිළිගෙන ඇති තක්සේරුව 2021 වර්ෂයේ තක්සේරුව ලෙස පිළිගැනීමටත්,

එකී තක්සේරුව මත, නගර සභා ආඥා පනතේ 160 වන වගන්තියන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර එකී දේපළ මත ඉහත කී තක්සේරුව සඳහා වාර්ෂික වටිනාකමින් සියයට හයක (6%) වාර්ෂික වරිපනම් බද්දක් නිවාස, ගොඩනැගිලි, ඉඩම් හා ගෙපත් සඳහා ද, සියයට දහයක (10%) වාර්ෂික වරිපනම් බද්දක්, වෙළඳ හෝ වාණිජ කාර්යය සඳහා පාවිච්චි කරනු ලබන ස්ථාන සඳහාද නියම වියයුතු බවටත්,

තවද, 2021 වර්ෂයෙහි පහත උපලේඛනයෙහි සඳහන් එක් එක් කාර්තුව වෙනුවෙන් ඉදිරියෙන් නිරූපිත දිනයට පෙර එසේ නියම කරන ලද වාර්ෂික වරිපනම් බද්ද කැස්බෑව නගර සභා අරමුදලට ගෙවිය යුතු බවටත්, එලෙස වාර්ෂික වරිපනම් බද්ද 2021 වර්ෂයෙහි ජනවාරි 31 වන දින හෝ ඊට ප්‍රථම ගෙවන්නේ නම් වාර්ෂික වරිපනම් බද්දේ ප්‍රමාණයෙන් සියයට දහයක (10%) වට්ටමක්ද, එකී උපලේඛනයෙහි එක් එක් කාර්තුව ඉදිරියේ තුන්වන තීරුවේ නිරූපිත දිනයට පෙර අදාළ වරිපනම් බදු මුදල කැස්බෑව නගර සභා ආරමුදලට ගෙවනු ලබන්නේ නම් එක කාර්තුවකට අදාළ මුදලින් සියයට පහක (5%) වට්ටමක් ද කැස්බෑව නගර සභාව විසින් ලබා දෙන බවත් දැනුම් දෙමි.

ඉහත කී උපලේඛනය

1 වන තීරුව	2 වන තීරුව	3 වන තීරුව
කාර්තුව	ගෙවිය යුතු දිනය	5% ක වට්ටම් සඳහා හිමිකම් ලබන අවසාන දිනය
පළමු වන කාර්තුව	මාර්තු 31 දිනට පෙර	ජනවාරි 31
දෙවන කාර්තුව	ජූනි 30 දිනට පෙර	අප්‍රේල් 30
තුන්වන කාර්තුව	සැප්තැම්බර් 30 දිනට පෙර	ජූලි 31
හතරවන කාර්තුව	දෙසැම්බර් 31 දිනට පෙර	ඔක්තෝබර් 31

ලක්ෂ්මන් පෙරේරා
සභාපති,
කැස්බෑව නගර සභාව.
2020-09-28

ලංසු සඳහා ආරාධනයයි (IFB)

ඌව පළාත් සභාව

නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) කාර්යාලය,

සාමාන්‍ය අධ්‍යාපනය නවීකරණ (GEM) ව්‍යාපෘතිය

(ණය අරමුදල් අංක : 6228 - L.K)

01. ඌව පළාත් සභාවේ අධ්‍යාපන අමාත්‍යාංශය වෙනුවෙන්, ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් පහතින් විස්තර කොට ඇති කාර්ය ඉටු කිරීම සඳහා සුදුසුකම්ලත් හා නිපුණතාපූර්ණ ලංසුකරුවන් වෙතින් මුද්‍ර, තැබූ ලංසු කැඳවනු ලැබේ.

පැකේජ අංකය	විස්තරය	ආපසු නොගෙවන ගාස්තු - රුපියල් -	ලංසු ඇපකරය මුදලින් ගෙවන්නේ නම් - රුපියල් -	ඉදිකිරීම් කාලය (දින)	ඉංජිනේරුවරයාගේ සිවිල් පිරිවැය ඇස්තමේන්තුව (වැට් රහිත) - රුපියල් මිලියන -	අවශ්‍ය අවම සීඩා ලියාපදිංචිය ගොඩනැගිලි ඉදිකිරීම්
GEM/UP/ DCSEn/2020/Rep/01	(හාලි ඇල) බ / අල් අර්ෂාඩ් මුස්ලිම් මහා විද්‍යාලය, 60' x 20' ඉංග්‍රීසි පංති කාමර ගොඩනැගිල්ල නවීකරණ කටයුතු	3,000.00	19,000.00	120	3.77	C8
GEM/UP/ DCSEn/2020/Rep/02	(ඇල්ල) බ / කරඳගොල්ල විද්‍යාලය - 60' x 20' ඉංග්‍රීසි පංති කාමර ගොඩනැගිල්ල නවීකරණ කටයුතු	3,000.00	13,500.00	120	2.62	C8
GEM/UP/ DCSEn/2020/Rep/03	(වියලුව) බ / කරඳගහමඩ විද්‍යාලය - 80' x 20' ඉංග්‍රීසි පන්ති කාමර ගොඩනැගිල්ල නවීකරණ කටයුතු	3,000.00	15,500.00	120	3.03	C8
GEM/UP/ DCSEn/2020/Rep/04	(මහියංගණය) බ / ගල්පෝරුයාය කනිෂ්ඨ විද්‍යාලය - 40' x 20' ඉංග්‍රීසි පන්ති කාමර ගොඩනැගිල්ල නවීකරණ කටයුතු	3,000.00	12,500.00	120	2.42	C8
GEM/UP/ DCSEn/2020/Rep/05	(සියඹලාණ්ඩුව) මො / මුතුකණ්ඩිය තුන්වන පියවර විද්‍යාලය - 100' x 20' ඉංග්‍රීසි පන්තිකාමර ගොඩනැගිල්ල නවීකරණ කටයුතු	3,000.00	14,500.00	120	2.88	C8
GEM/UP/ DCSEn/2020/Rep/06	(තනමල්විල) මො / තිකවැව කනිෂ්ඨ විද්‍යාලය - 80' X 20' ඉංග්‍රීසි පන්ති කාමර ගොඩනැගිල්ල නවීකරණ කටයුතු	3,000.00	14,500.00	120	2.88	C8
GEM/UP/ DCSEn/2020/Rep/07	(වැලිමඩ) බ / ශ්‍රී ගණපති දෙමළ විද්‍යාලය - 100' x 20' ගණිත පන්ති කාමර ගොඩනැගිල්ල නවීකරණ කටයුතු	3,000.00	16,000.00	120	3.13	C8
GEM/UP/ DCSEn/2020/Rep/08	(පස්සර) බ / විශ්වේශ්වර දෙමළ විද්‍යාලය - 60' x 20' ගණිත පන්ති කාමර ගොඩනැගිල්ල නවීකරණ කටයුතු	3,000.00	15,500.00	120	3.06	C8
GEM/UP/ DCSEn/2020/Rep/09	(බුත්තල) මො / පැල්වත්ත ද්විතීයක පාසල - 90' x 25' ගණිත පන්ති කාමර ගොඩනැගිල්ල නවීකරණ කටයුතු	3,000.00	15,500.00	120	3.05	C8
GEM/UP/ DCSEn/2020/Rep/10	(මැදගම) මො / කෙත්දවිත්ත මහා විද්‍යාලය - 120' x 20' ගණිත පන්ති කාමර ගොඩනැගිල්ල නවීකරණ කටයුතු	3,000.00	12,500.00	120	2.43	C8

02. ජාතික තරගකාරී ලංසුකරණ ක්‍රියාපටිපාටිය තුළින් මෙම ලංසුකරණය පවත්වනු ලැබේ.

03. කොන්ත්‍රාත් ප්‍රදානයට සුදුසුකම් ලැබීමට, සාර්ථක ලංසුකරුවා අපලේඛන ගතවූ අයකු නොවිය යුතු අතර, ඉහත වගුවේ සඳහන් කොට ඇති අවම සීඩා ලියාපදිංචිය සතුවිය යුතුය.

04. ලංසු ඇගයුම් කිරීමේදී, පහත සඳහන් සුදුසුකම් සලකා බලනු ඇත.
   i) පසුගිය වසර පහ තුළ, සමාන ස්වභාවයේ කොන්ත්‍රාත් එකක් සාර්ථකව සම්පූර්ණ කොට තිබිය යුතුය.
   ii) පසුගිය වසර පහ තුළ, සිවිල් ඉංජිනේරුවරයාගේ ඇස්තමේන්තු සිවිල් පිරිවැයට සමානව පිරිවැටුමේ සාමාන්‍යයක් පවත්වාගෙන තිබිය යුතුය.
   iii) මූල්‍ය හැකියාව හා ස්ථාවරභාවය.
   iv) දැනට කරගෙන යනු ලබන කාර්යයන්හි මූල්‍ය හා භෞතික ප්‍රගතිය.

05. උනන්දුවක් දක්වන ලංසුකරුවන්හට අවශ්‍ය වැඩිදුර විස්තර, **බදුල්ල, පිංඅරාව, පළාත් ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ (ගොඩනැගිලි)** වෙතින්, **දුරකථන / ෆැක්ස් අංක** 055-2229629 **හා ඊමේල්** : bdplanningunit@gmail.com ලබාගත හැකි අතර, **බදුල්ල, පිංඅරාව, පළාත් ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයාගේ කාර්යාලයේදී** ලංසු ලේඛන පරීක්ෂා කොට බැලිය හැකිය. **දුරකථන / ෆැක්ස්** : 055-2229629

06. ආපසු ගෙවනු නොලබන ගාස්තු ඉහත වගුවේ සඳහන් පරිදි ගෙවීමෙන් හා **බදුල්ල, පිංඅරාව, නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) කාර්යාලයේ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති** වෙත ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන්, 2020 **ඔක්තෝබර්** 16 **දින සිට** 2020 **නොවැම්බර්** 06 **වන දින දක්වා පෙරවරු** 9.00 **හා පස්වරු** 3.00 **අතර කාලය තුළ, බදුල්ල, පිංඅරාව, පළාත් ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ (ගොඩනැගිලි) කාර්යාලයෙන්** උනන්දුවක් දක්වන ලංසුකරුවන්හට, ඉංග්‍රීසි භාෂාවෙන් සකස් කොට ඇති සම්පූර්ණ ලංසු ලේඛන කට්ටලයක් මිලදී ගත හැක. ගෙවීම්, මුදලින්ම කළ යුතුවේ. ලංසු ලේඛන. නොමිලයේ පරීක්ෂා කොට බැලිය හැක.

07. ලංසු ඇපකර තැන්පතු, මුදලින් නොගෙවන්නේ නම් ඒ වෙනුවට ලංසු ඇපකරයක් ඉදිරිපත් කළ යුතුය. එම ලංසු ඇපකරය, ඉහත වගුවේ සඳහන් **වටිනාකම මෙන් දෙගුණයක් විය යුතු අතර,** ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කළ වාණිජ බැංකුවකින් ලබාගත් 2021 **මාර්තු** 09 **වන දින** දක්වා වලංගු, කොන්දේසි විරහිත හා ඒක්ෂණ බැංකු ඇපකරයක් වශයෙන් විය යුතුය.

08. යථා පරිදි සම්පූර්ණ කළ ලංසු ලේඛන, පිටපත් දෙකකින් යුක්තව, අදාළ ප්‍රසම්පාදන කමිටුව වෙත 2020 **නොවැම්බර්** 09 **වන දින පස්වරු** 2.00 ට පෙර ලැබීමට සැලැස්විය යුතුය. ලංසු පිටපත් බහාලූ කවර දෙකෙහි "**මුල්පිටපත**" හා "**අනු පිටපත**" ලෙසට සඳහන් කොට එම කවර යළි මුද්‍ර, තැබූ එක් කවරයක බහා එහි වම් ඉහළ කෙළවරේ අදාළ කාර්යය සඳහන් කළ යුතුය. මුද්‍ර, තැබූ ලංසු ලේඛන ලියාපදිංචි තැපෑලෙන්, **සභාපති, ප්‍රසම්පාදන කමිටුව, නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) කාර්යාලය, පිංඅරාව, බදුල්ල** යන ලිපිනයට එවීමෙන් හෝ කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහාලීමෙන් ලැබීමට සැලැස්විය යුතුය. අදාළ අනුපිටපත, ලංසු මුල් පිටපතේ සෑම පිටුවක්ම ඇතුළත් සහතික කළ ඡායා පිටපතක් විය යුතුය. ප්‍රමාද ලංසු ප්‍රතික්ෂේප කෙරේ.

09. ලංසු, 2021 **පෙබරවාරි** 09 වන දින දක්වා වලංගු විය යුතුය.

10. ලැබී ඇති ලංසු 2020 **නොවැම්බර්** 09 වන දින **පස්වරු** 2.00 ට **නියෝජ්‍ය ප්‍රධාන ලේකම්, (ඉංජිනේරු සේවා) කාර්යාලයේදී** පැමිණ සිටීමට කැමැත්තක් දක්වන ලංසුකරුවන්ගේ, නියෝජිතයන්ගේ ඉදිරියේ විවෘත කරනු ලැබේ.

11. මේ සම්බන්ධව පෙර - ලංසු හමුවක්, 2020 ඔක්තෝම්බර් 26 වන දින 10.00 පැයට, **බදුල්ල, පිංආරාව, පළාත් ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ (ගොඩනැගිලි)** කාර්යාලයේදී පැවැත්වීමට නියමිත අතර, ඉන් පසුව වැඩබිම් චාරිකාවක් සංවිධානය කෙරෙනු ලබන අතර, එහිදී අපේක්ෂිත ලංසුකරුවන්හට ව්‍යාපෘති අවශ්‍යතා සම්බන්ධයෙන් පැහැදිලි කර ගැනීම් ලබාගත හැකිය.

12. ලැබී ඇති ලංසු අතරින් සුදුසු ලංසුවක් තෝරා ගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ පූර්ණ අයිතිය ප්‍රසම්පාදන කමිටුව සතුවන අතර, මේ සම්බන්ධයෙන් ප්‍රසම්පාදන කමිටුවේ තීරණය අවසාන තීරණය වේ.

සභාපති,
ප්‍රසම්පාදන කමිටුව,
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) කාර්යාලය,
පිංඅරාව, බදුල්ල.
දුරකථනය - 055-2222218
ඊමේල් - dcsengupc@gmail.com
2020.10.14

උකුවෙල ප්‍රාදේශීය සභාව

2021 වර්ෂය සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම

2021 වර්ෂය සඳහා උපලේඛනයේ සඳහන් සැපයුම් හා සේවාවන් වෙනුවෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

මේ සඳහා තමා විසින් සකස් කරගත් අයදුම්පතක් නම, ලිපිනය, ව්‍යාපාරයේ ස්වභාවය සඳහන් කර ලියාපදිංචි සහතිකයක් සමග අනෙකුත් විස්තර ඇතුළත් කර ලියාපදිංචි ගාස්තුව සමග මා වෙත එවිය යුතුය. තවද චෙක්පත් හා මුදල් ඇණවුම්, **"ලේකම්, උකුවෙල ප්‍රාදේශීය සභාව"** යනුවෙන් ලියා එවිය යුතුය. ලියාපදිංචි වීම සඳහා වූ අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය **2020.12.20** දින **ප.ව. 2.30** වේ. අයදුම්පත් බහා එවන ලිපි කවරයේ ඉහළ වම් කෙළවරේ **"සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම 2021 වර්ෂය"** යනුවෙන් සඳහන් කළ යුතුය.

අනු අංකය	සැපයුම හෝ සේවාව	ලියාපදිංචි කිරීමේ ගාස්තුව රු.
	කාර්යාලයීය උපකරණ සැපයීම	
01	කාර්යාල උපකරණ (ලී හා වානේ, ප්ලාස්ටික්)	Rs. 1,500.00
02	පරිගණක යන්ත්‍ර හා පරිගණක මුද්‍රණ යන්ත්‍ර, ඡායා පිටපත් යන්ත්‍ර, ෆැක්ස් යන්ත්‍ර, ස්කෑනර් යන්ත්‍ර	Rs. 1,500.00
03	වේලාව සටහන් කිරීමේ යන්ත්‍ර (ඇඟිලි සලකුණු කිරීමේ යන්ත්‍ර)	Rs. 1,500.00
04	කැමරා, ප්‍රොජෙක්ටර් සහ වීඩියෝ උපකරණ	Rs. 1,500.00
05	කාර්යාල උපකරණ අලුත් වැඩියා කිරීම (ඡායා පිටපත් යන්ත්‍ර පරිගණක රෝනියෝ යන්ත්‍ර ෆැක්ස් යන්ත්‍ර)	Rs. 1,500.00
06	පරිගණක හා පරිගණක අමතර කොටස් සැපයීම	Rs. 1,500.00
	කාර්යාලයීය පාරිභෝගික ද්‍රව්‍ය සැපයීම	
07	ලිපි ද්‍රව්‍ය, පරිගණක මුද්‍රණ ද්‍රව්‍ය සහ පරිගණක පාරිභෝගික ද්‍රව්‍ය	Rs. 1,500.00
08	කාර්යාලීය මුද්‍රණ කටයුතු, පිත්තුර රාමු කිරීම, දැන්වීම් පුවරු ඇඳීම	Rs. 1,500.00
09	රබර් මුද්‍ර, දින මුද්‍ර, නාම පුවරු, පදක්කම් හා කුසලාන, සිහිවටන ඵලක, අතුරු නිර්මාණ සැකසීම හා සැපයීම	Rs. 1,500.00
10	විදුලි උපකරණ හා විදුලි භාණ්ඩ සැපයීම	Rs. 1,500.00
11	සියලුම විදුලි උපකරණ හා විදුලි ජනක යන්ත්‍ර අලුත්වැඩියා කිරීම හා සේවා කිරීම	Rs. 1,500.00
12	ඉලෙක්ට්‍රොනික් උපකරණ හා අමතර කොටස් සැපයීම	Rs. 1,500.00
13	නිමි ඇඳුම්, රෙදිපිළි, නිල ඇඳුම් සඳහා රෙදි, මේස රෙදි හා තිර රෙදි සැපයීම හා මැසීම	Rs. 1,500.00
14	පරිගණක යන්ත්‍ර හා ඡායා පිටපත් යන්ත්‍ර අලුත්වැඩියා කිරීම හා සේවා කිරීම	Rs. 1,500.00
15	පරිගණක මෘදුකාංග සංවර්ධනය, ස්ථාපනය කිරීම, පරිගණක ජාලගත කිරීම හා පරිගණක උපදේශාත්මක සේවා සැපයීම	Rs. 1,500.00
16	නීති සේවා සැපයීම	Rs. 1,500.00
17	සී.සී.ටී.වී. කැමරා පද්ධති සැපයීම හා සවිකිරීම	Rs. 1,500.00
18	කාර්යාල උපකරණ අලුත්වැඩියාව හා නඩත්තු සේවා (මේස, පුටු, අල්මාරි)	Rs. 1,500.00
19	පුහුණු නුපුහුණු ශ්‍රම සැපයීම (පෙදරේරු, වඩු කාර්මික, කම්කරු ආදිය)	Rs. 1,500.00
20	කාර්යාල ගබඩා සඳහා රාක්ක සැපයීම (දැව, ලෝහ)	Rs. 1,500.00
21	ක්‍රීඩා භාණ්ඩ / ක්‍රීඩා උපකරණ සැපයීම හා අලුත්වැඩියා කිරීම	Rs. 1,500.00
22	මුද්‍රණ කටයුතු	
	කෘෂිකාර්මික උපකරණ සැපයීම	
23	කෘෂිකාර්මික උපකරණ සැපයීම (වතුර පොම්ප, කෘෂි ආම්පන්න)	Rs. 1,500.00
24	කෘෂිකාර්මික රෝපණ ද්‍රව්‍ය (පැළ වර්ග, බීජ වර්ග සැපයීම)	Rs. 1,500.00
	ආහාර ද්‍රව්‍ය සැපයීම	
25	කෙටි ආහාර, බීම වර්ග, පානීය ජලය හා කේටරින් සේවා සැපයීම	Rs. 1,500.00
26	උදේ ආහාර, දිවා ආහාර සැපයීම	Rs. 1,500.00
	වාහන අලුත්වැඩියාව හා අමතර කොටස් සැපයීම	
27	සියළුම වර්ගයේ මෝටර් රථ අමතර කොටස් සැපයීම	Rs. 1,500.00
28	වාහන අලුත්වැඩියා හා අමතර කොටස් සැපයීම	Rs. 1,500.00
29	ටයර්, ටියුබ් හා බැටරි සැපයීම	Rs. 1,500.00
30	වාහන අලුත් වැඩියා කිරීම	Rs. 1,500.00
31	ට්‍රැක්ටර්, යන්ත්‍ර සූත්‍ර අළුත් වැඩියාව හා සේවා කිරීම (බැකෝ ලෝඩර්, ගල් රෝල, මෝටර් ග්‍රේඩරය)	Rs. 1,500.00
32	වාහන අමතර කොටස් සැපයීම, ටයර්, ටියුබ් හා බැටරි	Rs. 1,500.00
33	වාහන සර්විස් කිරීම	Rs. 1,500.00
	ජලනළ උපකරණ හා උපාංග සැපයීම	
34	ජලනළ උපකරණ	Rs. 1,500.00
35	ජල මනු සැපයීම සහ අලුත් වැඩියාව	Rs. 1,500.00
	කර්මාන්ත / ඉදිකිරීම් කටයුතු සඳහා යාන්ත්‍රික උපකරන සැපයීම	
36	ගොඩනැගිලි ද්‍රව්‍ය සැපයීම (වැලි, ගඩොල්, කළුගල්, සිමෙන්ති, යකඩ, ගල් කුඩු, ව්ප්ස් , කම්බි ඇතුරුම් ගල්)	Rs. 1,500.00
37	මාර්ග නඩත්තු උපකරණ සැපයීම (තාච්චි, යකඩ ඉති, රේක්ක, උදලු, විල් බැරෝ, තණකොළ කපන යන්ත්‍ර, විසි කැති)	Rs. 1,500.00
38	කර්මාන්ත / ඉදිකිරීම් කටයුතු සඳහා යාන්ත්‍රික උපකරණ සැපයීම	Rs. 1,500.00
39	නීන්ත වර්ග, නිතර්, සීලර් හා නීන්ත ආලේප කිරීමට ද්‍රව්‍ය සැපයීම	Rs. 1,500.00
40	ගොඩනැගිලි අලුත්වැඩියා කිරීම්, නඩත්තු කටයුතු හා කඩා ඉවත් කිරීම.	Rs. 1,500.00
41	කසළ අංගනයේ දුගඳ නැති කිරීමේ රසායනික ද්‍රව්‍ය සැපයීම	Rs. 1,500.00
42	තාර සැපයීම	Rs. 1,500.00
43	කොන්ක්‍රීට් කණු සැපයීම (මායිම් කණු/ හියුම් පයිප්ප)	Rs. 1,500.00
44	දර සැපයීම (තාර දැමීම සඳහා)	Rs. 1,500.00
45	සෞඛ්‍ය උපකරණ සැපයීම (ගම් බූට්ස්, ග්ලවුස්. පොලිතින් ඇතුළුව)	Rs. 1,500.00
46	වඩුවැඩ පෙදරේරු වැඩ වැල්ඩින් වැඩ සේවා සැපයීම	Rs. 1,500.00
	කසළ ප්‍රවාහන උපකරණ සැපයීම	
47	කසළ එකතු කිරීම සඳහා ප්ලාස්ටික් භාජන සැපයීම	Rs. 1,500.00
48	කසළ එකතු කිරීම සඳහා කොන්ක්‍රීට් භාජන සැපයීම	Rs. 1,500.00
	වෙනත් සේවා සැපයීම	
49	පුස්තකාල ලී භාණ්ඩ (පුස්තකාල සේවා මණ්ඩල ප්‍රමිතිය අනුව)	Rs. 1,500.00
50	ඉඩම් මැනීම හා මිතින්දේරුවන්	Rs. 1,500.00
51	සැලසුම් නිර්මාණ ශිල්පීන්	Rs. 1,500.00
52	සියලුම වර්ගයේ කොහු නිෂ්පාදන හා රබර් නිෂ්පාදන	Rs. 1,500.00
53	ශබ්දවාහිනී යන්ත්‍ර උපාංග සැපයීම	Rs. 1,500.00
54	පරණ පුවත් පත් බෝතල් හා අබලි භාණ්ඩ මිලදී ගැනීම	Rs. 1,500.00
55	අනතුරුදායක ගස් කපා ඉවත් කිරීම	Rs. 1,500.00
56	ආයුර්වේද ඖෂධ හා උපකරණ සැපයීම	Rs. 1,500.00
57	ළමා උද්‍යාන උපකරන සැපයීම	Rs. 1,500.00
58	මාර්ග සංවර්ධන උපකරණ කුලියට සැපයීම	Rs. 1,500.00
59	ග්‍රීස් සැපයීම	Rs. 1,500.00

2020.10.12 දින
උකුවෙල ප්‍රාදේශීය සභාවේ දී.

ලේකම්,
උකුවෙල ප්‍රාදේශීය සභාව.

ජල සම්පාදන අමාත්‍යාංශය
ජල සම්පත් මණ්ඩලය

2021 වසර සඳහා භාණ්ඩ සැපයීම හා සේවා ලබාදීම සඳහා ලියාපදිංචිවීම

01. 2021 වසර සඳහා ජල සම්පත් මණ්ඩලයට පහත සඳහන් භාණ්ඩ හා සේවා ප්‍රභේදයන් සැපයීම සඳහා ලියාපදිංචි වීමට බලාපොරොත්තු වන පිළිගත් සැපයුම්කරුවන්, කොන්ත්‍රාත්කරුවන්, බලයලත් දේශීය නියෝජිතයින්, රාජ්‍ය සංස්ථා, නිෂ්පාදකයින් සහ බෙදාහරින්නන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. අයදුම්පතේ සඳහන් සැපයුම් හා සේවා ප්‍රභේදයන් යටතේ ලියාපදිංචි වීම සඳහා වෙන් වෙන්ව අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය. ලියාපදිංචිවීම සඳහා අවශ්‍ය අයදුම්පත් ලියාපදිංචිය බලාපොරොත්තු වන එක් එක් ප්‍රභේදය සඳහා රුපියල් දහසක් (රු. 1,000/-) බැගින් වන ආපසු නොගෙවන ගාස්තුවක් ගෙවීමෙන් අනතුරුව, 2020 ඔක්තෝබර් 16 දින සිට 2020 නොවැම්බර් 17 දින තෙක් ලබාගත හැකිය. වැඩිමනත් විස්තර සඳහා කරුණාකර ප්‍රසම්පාදන කළමනාකරු (දුරකථනය 011-2679865) අමතන්න.

03. අයදුම්පත්, **"2021 සඳහා භාණ්ඩ හා සේවා ලියාපදිංචිය"** යනුවෙන්, බහාලන කවරයේ වම් ඉහළ කෙළවරේ සඳහන් කොට, ලියාපදිංචි තැපෑලෙන් 2020 නොවැම්බර් මස 17 දින හෝ ඊට පෙර මා වෙත ලැබෙන්නට සැලැස්විය යුතුය.

04. නියමිත ලියාපදිංචි ගාස්තුව ගෙවීමෙන් අනතුරුව ප්‍රධාන කාර්යාලයේ සැපයුම් අංශයෙන් ලබා ගන්නා අයදුම්පත් වල පමණක් ලියාපදිංචිය සඳහා අයදුම් කළ යුතුය.

05. අයදුම්පත සමග පහත සඳහන් ලිපිලේඛන ඉදිරිපත් කළ යුතුය.
    - අ) සීමිත වගකීම් සහිත සමාගම් - සාංගමික සංස්ථා පත්‍රය
    - ආ) වෙනත් ආයතන - ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකය

2021 වසර සඳහා භාණ්ඩ සැපයීම හා සේවා ලබාදීම සඳහා ලියාපදිංචිය

සැපයුම්

01. පිවිසී නළ
02. බෙටොනයිට් ක්ලේ
03. ඩ්‍රිලිංරිංග් සහ එයාර් කම්ප්‍රෙසර සඳහා අමතර කොටස්
04. ඩ්‍රිලිං රිංග් සහ බර වාහන සඳහා බෙයාරින්ග්
05. හයිඩ්‍රොලික් හෝස්, එයාර් ප්‍රෙශර් හෝස්, සක්ෂන් හෝස් සහ ෆිටින්ග්
06. ජල පොම්ප, ජල මීටර්, ජලය යට ගිල්වන ජල පොම්ප, ගැඹුරු ළිං අත් පොම්ප හා උපාංග
07. රසායනාගාර උපකරණ, ජලජ පරීක්ෂා කිරීම සඳහා රසායන
08. භූ භෞතික ජියෝෆිසිකල් උපකරණ හා උපාංග, මිණුම් උපකරණ යනාදිය
09. ඉංජිනේරුමය මෙවලම්
10. මෝටර් රථ වාහන සඳහා අමතර කොටස්
11. සෑම වර්ගයකම වාහන සඳහා ටයර් හා ටියුබ්
12. කාර්මික ආරක්ෂණ උපකරණ
13. සාමාන්‍ය ලෝහ භාණ්ඩ අයිතම
14. කාර්යාල ගෘහ භාණ්ඩ, බූරු ඇඳන්, කැම්ප් බෙඩ් - (දැව හා වානේ)
15. කාර්යාල උපකරණ (ඇඩිං මැෂින්, කැල්කියුලේටර්, ඡායා පිටපත් යන්ත්‍ර, චිත්‍ර (ඩ්‍රෝවින්) උපකරණ හා ද්‍රව්‍ය)
16. සියලුම වර්ගයේ කාර්යාල ලිපිද්‍රව්‍ය
17. ගෙඩනැගිලි ද්‍රව්‍ය (ගංගා වැලි, ගඩොල්, කළුගල්, සක්ක ගල්, හුණු, ඇස්බෙස්ටොස් තහඩු, ජී අයි සෙවිලි තහඩු, සෙවිලි උළු, දැව, නීන්ත හා නීන්ත ද්‍රව්‍ය යනාදිය ඇතුළුව)
18. විදුලි පංකා, වායු සමීකරණ යන්ත්‍ර, ශීතකරණ
19. විදුලි බුබුළු, ස්විච්, රැහැන් යනාදිය වැනි විදුලි අයිතම
20. පරිගණක හා පරිගණක අමතර කොටස්
21. ෆිල්ටර් (එයාර් / ඔයිල්)
22. ඩ්‍රිලිං මැෂින් සඳහා හැමර්, බටන් බිට්ස්, ටයර් කෝන් බිට්ස්
23. රේඩියේටර්
24. ජෙනරේටර්
25. ලිහිසිතෙල් (ලුබ්රිකන්ට්)

සේවා

01. හයිඩ්‍රොලික් හෝස් සහ එයාර් හෝස් සඳහා එන්ඩ් ෆිටින්ග් සවිකිරීම
02. සියලුම වර්ගයේ මෝටර් රථ වාහන, ලොරි සහ බර යන්ත්‍රෝපකරණ අලුත්වැඩියා කිරීම හා සර්විස් කිරීම. (තහඩු වැඩ (ටින්කරින්) හා පිංතාරු වැඩ. (බොඩි වැඩ ඇතුළුව) තමන්ගේම පරිශ්‍රයේදී හෝ ජල සම්පත් මණ්ඩල පරිශ්‍රයේදී
03. හයිඩ්‍රොලික් පද්ධති (හයිඩ්‍රොලික් පොම්ප, හයිඩ්‍රොලික් මෝටර් සහ වෙනත් උපකරණ ඇතුළුව) අලුත්වැඩියා කිරීම හා සර්විස් කිරීම
04. දුනුකොළ නැවත යෙදවීම සහ / හෝ නෙරීම සහ සයිලන්සර් නැවත යෙදීම හෝ අලුත්වැඩියා කිරීම
05. බ්‍රේක් බූස්ටර් පොම්ප, ප්‍රෙශර්ප්ලේට් ආදිය, ස්ටාටර් මෝටර්, ඕල්ටනේටර් වැනි වාහන පද්ධති ඒකක අලුත්වැඩියා කිරීම
06. පොරාදු වැඩ, කුෂන් වැඩ සහ කැන්වස් හුඩ් සෑදීම
07. ඔටෝ විදුලි අලුත්වැඩියාවන්
08. ජල පොම්ප, ජෙනරේටර්, යාන්ත්‍රික කර්මාන්තශාලා මැෂින් සහ උපකරණ අලුත්වැඩියාව
09. වාහන සඳහා වායුසමීකරණ අලුත්වැඩියා කිරීම හා සර්විස් කිරීම
10. පරිගණක නඩත්තු කිරීම හා සර්විස් කිරීම
11. රසායනාගාර හා භූ භෞතික උපකරණ අලුත්වැඩියාව
12. සිවිල් ඉංජිනේරු, ඉදිකිරීම් වැඩ සහ ඇළමිතියම් පිරිසැකසුම් වැඩ, විදුලි වැඩ ඇතුළු ගොඩනැගිලි අලුත්වැඩියා කටයුතු
13. වඩු වැඩ, මේසන් වැඩ, ජලනළ වැඩ යනාදිය
14. ඩ්‍රිලිං යන්ත්‍ර සූත්‍ර හා උපකරණ සඳහා රබර් / තියෝප්‍රින් නිෂ්පාදන (ඔයිල් සීල් පැකිං, ඩයර් යනාදිය ඇතුළු) නිෂ්පාදනය කිරීම හා සැපයීම
15. මුද්‍රණ කටයුතු
16. මෝටර් රථ වාහන අලුත්වැඩියා කිරීමේ ගරාජ

සභාපති,
ජල සම්පත් මණ්ඩලය,
2ඒ, හෙක්ටර් කොබ්බෑකඩුව මාවත,
කොළඹ - 07.
දුරකථනය : 011-2679865, 011-2697050, 011-2694835

මාවතගම ප්‍රාදේශීය සභාව

2021 වර්ෂය සඳහා සැපයුම්කරුවන් / කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම

01. මාවතගම ප්‍රාදේශීය සභාවට 2021 වර්ෂය සඳහා පහත සඳහන් ද්‍රව්‍ය හා උපකරණ සැපයීම සහ සේවාවන් ලබා ගැනීම වෙනුවෙන් ලියාපදිංචි වීමට කැමති පිළිගත් සැපයුම්කරුවන්ගෙන්, නිෂ්පාදකයින්ගෙන්, කොන්ත්‍රාත්කරුවන්ගෙන් හා අනුමත ස්වේච්ඡා සමිති හා සංවිධාන මගින් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. සැපයුම්, සේවා හා කොන්ත්‍රාත්කරුවන් වශයෙන් ලියාපදිංචි වීමට කැමති අය අදළ සියලු විස්තර ඇතුළත් කර තමා විසින්ම සකස් කරගත් අයදුම්පත් මාර්ගයෙන් ඒ ඒ අයිතමය සඳහා වෙන වෙනම ඉල්ලීම් කළ යුතුය.

03. එක් අයිතමයක් සඳහා ලියාපදිංචි ගාස්තු රු. 1,000/- ක් (2% ජාතිය ගොඩනැගීමේ බද්ද සහිතව) ගෙවිය යුතුය. අයදුම්පත් භාර ගැනීම 2020-12-31 දින, පස්වරු 3.00 ට අවසන් වේ. ඉදිරිපත් කරන සෑම අයදුම්පතක් සමගම අදළ ගාස්තු ගෙවිය යුතුය. චෙක්පත් / මුදල් ඇණවුම් මගින් ද, ගාස්තු ගෙවිය හැකි අතර, එහි **"ලේකම්, මාවතගම ප්‍රාදේශීය සභාව"** නමට ලියා එවිය යුතුය.

04. සෑම අයදුම්පතක් සමගම ව්‍යාපාරයේ ලියාපදිංචිය, බැංකු ගිණුම්, පළපුරුද්ද ආදිය සනාථ කිරීම සඳහා අවශ්‍ය ලියකියවිලිවල ඡායා පිටපත් ඉදිරිපත් කළ යුතුය. ඉදිකිරීම් සඳහා වන කොන්ත්‍රාත්කරුවන් ඉහත ලිපිවලට අමතරව තම වටිනාකම් සහතිකය ප්‍රාදේශීය ලේකම් මගින් සහතික කර ඉදිරිපත් කළ යුතු අතර, සාර්ථක කොන්ත්‍රාත්කරුවෙකු බව සනාථ කිරීම සඳහා ලිඛිත සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. (ICTAD) ලියාපදිංචිය තිබේ නම්, වටිනාකම් සහතික අවශ්‍ය නොවේ.

05. කොන්ත්‍රාත්කරුවන් වශයෙන් ලියාපදිංචි වීමට අදහස් කරන ස්වේච්ඡා සමිති හා සංවිධාන මීට පෙර කරන ලද කොන්ත්‍රාත් පිළිබඳ විස්තර ද, බැංකු ගිණුමේ සහතික කළ පිටපතක් ද අමුණා එවිය යුතුය.

06. වාස්තු විද්‍යා සේවය සැපයීම සඳහා ශ්‍රී ලංකා වාස්තු විද්‍යා ආයතනයේ ලියාපදිංචි වී තිබිය යුතුය. මෙය සනාථ කිරීමට ලියාපදිංචි සහතිකයේ ඡායාස්ථ පිටපතක් ඉදිරිපත් කළ යුතුය.

07. වරලත් ඉංජිනේරු උපදේශක සේවා සැපයීම සඳහා ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ ලියාපදිංචි වී තිබිය යුතුය. සනාථ කිරීමට ලියාපදිංචි සහතිකයේ ඡායාස්ථ පිටපතක් ඉදිරිපත් කළ යුතුය.

ද්‍රව්‍ය හා සේවා සැපයීම

01. කාර්යාල ලිපි ද්‍රව්‍ය සැපයීම
02. කාර්යාල මුද්‍රණ කටයුතු (මුද්‍රිත පොත්)
03. කාර්යාල උපකරණ සහ ලී බඩු (ලී / වානේ / ප්ලාස්ටික්)
04. විදුලි භාණ්ඩ හා උපකරණ (වීථි පහන් නඩත්තුව හා කාර්යාල ගොඩනැගිලි)
05. යතුරු ලියන, රෝනියෝ, ඡායා පිටපත්, කොම්පියුටර් යන්ත්‍ර අලුත්වැඩියාව
06. සෞඛ්‍ය උපකරණ
07. ට්‍රැක්ටර්, මෝටර් රථ අමතර කොටස්
08. ගොඩනැගිලි ද්‍රව්‍ය සැපයීම (ගඟේ වැලි, කළු ගල්, ගඩොල්, බොරළු, සිමෙන්ති, යකඩ, සිමෙන්ති ආශ්‍රිත නිෂ්පාදන)
09. දේපළ තක්සේරු කිරීම
10. රබර් සීල් සැපයීම
11. තහඩු වර්ග සැපයීම
12. සමරු ඵලක සැපයීම
13. තිර රෙදි මසා නිම කර සවි කර දීම
14. වාහන කුලී පදනම මත සැපයීමේ සේවය (ට්‍රැක්ටර් රථ, වෑන් රථ, කාර්, බස් හා ත්‍රීවීල් රථ)
15. පැස්සුම් හා වැද්දුම් වැඩ (යකඩ ආශ්‍රිත නිර්මාණ ඇතුළුව)
16. ශ්‍රමසේවා (පුහුණු / නුපුහුණු) - (මේසන් / වඩු කාර්මික / වර්ණ ආලේපනය)
17. ප්‍රචාරක කටයුතු (බැනර් / නාමපුවරු)
18. බර වැඩ සඳහා වන යන්ත්‍ර සූත්‍ර සැපයීම .(බැකෝ / ලෝඩර් / මාර්ග තලන / මෝටර් ග්‍රේඩර්, D4 D8 ඩෝසර් ආදිය)
19. ගස් කැපීම හා ඉවත් කිරීම
20. වේදිකා ඇතුළු උත්සව භාණ්ඩ සැපයීම
21. විදුලි උත්පාදන යන්ත්‍ර කුලියට සැපයීම
22. ආදහනාගාර නඩත්තු කටයුතු සේවා සැපයීම
23. නීති උපදෙස් සේවා සැපයීම
24. වරලත් වාස්තු විද්‍යා නිර්මාණ සැලසුම් හා ව්‍යුහ සේවාව
25. වරලත් ඉංජිනේරු උපදේශන සේවාව
26. ලියාපදිංචි වරලත් / මිතින්දේරු සේවාව
27. විදුලි ඉංජිනේරු සේවාව
28. ජල සම්පාදන හා අපවහන ඉංජිනේරු සැලසුම් සේවාව
29. ගිනි නිවීම හා ආරක්ෂක සේවාවන්
30. වායුසමීකරණ පද්ධති සකස් කිරීමේ සේවාව
31. උද්‍යාන අලංකරණ සේවාවන්
32. අභ්‍යන්තර ගෘහ නිර්මාණ අලංකරණ සේවාව
33. පරිගණක හා ජාල ගත කිරීම් ඉංජිනේරු සේවාව
34. ශබ්ද පරිපාලන කාර්මික සේවාවන්
35. පෞරුෂ වර්ධන, අධ්‍යාපන හා අධ්‍යාත්මික උපදේශන සේවාවන්
36. ඡායාරූපකරණය හා වීඩියෝකරණය හා කථන සංස්කරණය
37. පත්තර දැන්වීම් පළ කිරීමේ නියෝජිතයන්
38. නිල ඇඳුම් සඳහා රෙදි, පාවහන්, බූට්ස්, වැහි කබා සැපයීම
39. වාහන සේවා කිරීම හා එලයිමන්ට් කිරීම, කාර්මික සේවා හා අලුත්වැඩියා කටයුතු සේවා සැපයීම
40. උත්සව සඳහා හා සභාවට අවශ්‍ය අවස්ථාවල ආහාර පාන සැපයීම
41. වාහනවල විදුලි පද්ධතිය අලුත්වැඩියාව
42. සංවර්ධන ව්‍යාපෘති වාර්තා සැකසීම
43. විසිතුරු පැළ වර්ග හා කෘෂිකාර්මික පැළ සැපයීම
44. ක්‍රීඩා භාණ්ඩ සැපයීම
45. ප්ලාස්ටික් නිෂ්පාදන සැපයීම (පුටු / රාක්ක / කුඩ)
46. කොන්ත්‍රාත් සේවා සැපයීම (ව්‍යාපෘති සැකසීම) (ලක්ෂ 2000001 සිට ICTAD 10 සහතිකය තිබිය යුතුය.)
47. සායන සඳහා ඖෂධ, ඇස් කණ්ණාඩි අවශ්‍ය උපකරණ සැපයීම
48. සෞඛ්‍ය හා සනීපාරක්ෂක උපකරණ සැපයීම
49. ළමා උද්‍යාන උපකරණ සැපයීම
50. පොදු වැසිකිළි නඩත්තු කටයුතු
51. ළිං අලුත්වැඩියා කටයුතු
52. මුළුතැන්ගෙයි උපකරණ
53. භාෂා පරිවර්තන (ඉංග්‍රීසි / දෙමළ)

2020-10-10
මාවතගම ප්‍රාදේශීය සභාවේදී.

අනුර කමල් පෙරේරා,
සභාපති,
මාවතගම ප්‍රාදේශීය සභාව.

දිනමිණ වට පුට
ජල දරන්න - පළ කරන්න
මංගල යෝජනා
දශක ගණනාවක විශ්වසනීය සේවාව...
SUNDAY OBSERVER
Marriage Proposals
දැන් වචන 15ක් රු. 560ක් පමණයි...
චාමර - 0777 270 067 / අනුෂා - 0777 278 948

1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 7(1) වැනි වගන්තිය යටතේ දැන්වීමයි.

මගේ අංකය : KDS/UDB/4/1/1/150

ඉඩම් අමාත්‍යාංශයේ අංකය : 4-3/2/2010/FR/207

පහත උපලේඛනයේ විස්තර කොට ඇති ඉඩම/ ඉඩම් පොදු කටයුත්තක් සඳහා රජයට අත්කර ගැනීමට අදහස් කර ගෙන ඇත. වැඩි විස්තර සඳහා 2020-09-10 දින අංක 2192/58 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ III වැනි කොටස බලන්න.

සුජානි ආර්. විජේතුංග,
ප්‍රාදේශීය ලේකම්,
උඩදුම්බර.

2020-10-12 වැනි දින,
උඩදුම්බර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදීය.

උපලේඛන

මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ, උඩදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කරඹකැටිය ග්‍රාම නිලධාරී වසමේ පිහිටි ඉඩම.

ඉඩමේ නම	පිඹුරු අංකය	බිම් කට්ටිය
වින්චිෆීල්ඩ්පාර්ක් වත්ත	මූ.පි.මහ 7009	01

ප්‍රසම්පාදන දැන්වීම

පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව

සුබසාධක ආපනශාලාව පවත්වාගෙන යාම සඳහා ලංසු කැඳවීම 2020 - 2021

පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ සුබසාධක ආපන ශාලාව 2020.12.01 දින සිට 2021.11.30 දක්වා වසරක කාල සීමාවක් සඳහා පවත්වාගෙන යාමට සුදුසුකම් ඇති 600 කට වැඩි කාර්යය මණ්ඩලයක් සහ දෙපාර්තමේන්තුවට පැමිණෙන 1000 - 1500 මහජනතාවකට සේවය සැපයීමේ හැකියාවක් ඇති ලංසුකරුවන්ගෙන් මුදු, තබන ලද ලංසු කැඳවනු ලැබේ. (බස්නාහිර පළාත තුළ ආපනශාලාවක් ලෙස ලියාපදිංචියක් සහිත අයදුම්පත් සඳහා වැඩි අවධානයක් යොමු කරනු ලැබේ.)

1. මේ පිළිබඳව උනන්දුවක් දක්වන ලංසුකරුවන් හට 2020.10.16 දින සිට 2020.10.29 දින දක්වා සතියේ වැඩ කරන දිනයන්හි පෙ.ව. 09.00 සිට ප.ව. 03.00 දක්වා බත්තරමුල්ල, "**සුහුරුපාය**" ගොඩනැගිල්ලේ 13 වන මහලේ ඒ පර්යන්තයේ සිටින සංගමයේ ගරු භාණ්ඩාගාරික වෙත රු. 2.500/- ක ආපසු නොගෙවනු ලබන ගාස්තුවක් ගෙවා ලංසු අයදුම්පත ලබාගත හැකිය.
2. නිවැරදිව සම්පූර්ණ කර මුදු, තබන ලද අයදුම්පත් 2020.11.02 දින ප.ව. 2.00 ට හෝ ඊට පෙර ලැබෙන සේ **ගරු ලේකම්, සුබසාධක සංගමය, පුද්ගලයන් ලියාපදිංචිකිරීමේ දෙපාර්තමේන්තුව** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීමට හෝ "සුහුරුපාය" ගොඩනැගිල්ලේ 12 වන මහලේ, සී. පර්යන්තයේ ගිණුම් අංශයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීමට කටයුතු කළ යුතුය.
3. අයදුම්පත් බහාලන කවරයෙහි ඉහළ වම් කෙළවරෙහි "2020/2021වර්ෂය සඳහා **සුබසාධක ආපනශාලාව පවත්වාගෙන යාම සඳහා මිල ගණන් ඉදිරිපත් කිරීම**" යනුවෙන් සඳහන් කළ යුතුය. නියමිත වේලාවට පසුව ඉදිරිපත් කරන හෝ අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
4. ලංසු අයදුම්පත් භාර ගැනීම 2020.11.02 දින ප.ව. 2.00 ට අවසන් වේ. ලංසු අයදුම්පත් භාරගෙන අවසන්වූ වහාම "**සුහුරුපාය**" ගොඩනැගිල්ලේ 13 වන මහලේ, සී. පර්යන්තයෙහි ශ්‍රවනාගාරයේදී ලංසු විවෘත කිරීම සිදුකරන අතර, එම අවස්ථාවට ලංසුකරුට හෝ ඔහුගේ බලයලත් එක් නියෝජිතයෙකුට සහභාගි විය හැක.
5. අදළ ලංසු සම්පූර්ණයෙන්ම හෝ ඉන් කොටසක් හෝ පිළිගැනීමට හෝ ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය සංගමය සතු වේ.
6. වැඩි විස්තර සඳහා 0115226150 අංකයෙන් සංගමයේ ගරු ලේකම් අමතන්න.

ගරු ලේකම්
සුබසාධක සංගමය
පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව

ලංසු සඳහා ආරාධනයයි (IFB)

ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය (WUSL) කුලියාපිටිය, ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ මාකඳුර පරිශ්‍රයන්හි, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය සඳහා යෝජිත ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා ලංසු

කොන්ත්‍රාත් අංකය : (WUSL/CW/2014/02)

1. ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ (WUSL), හි උපකුලපති වෙනුවෙන් අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් ඉහත සඳහන් කාර්ය කර්මාන්තය සඳහා, යෝග්‍යතාපූර්ණ හා සුදුසුකම්ලත් ලංසුකරුවන් වෙතින් මුදු, තබන ලද ලංසු දැන් කැඳවනු ලැබේ.
2. ලංසුකරණය, ජාතික තරගකාරී ලංසුකරණ පටිපාටිය (NCB) යටතේ මෙහෙයවනු ලබන අතර, එම කාර්ය කර්මාන්තය සැලසුම් නිර්මාණය කර ගොඩනැගීම හා ඉදිකිරීම් කටයුතු මාදිලිය ප්‍රකාරව වනු ඇත.
3. යෝග්‍යතාපූර්ණ ලංසුකරුවන් පහත සඳහන් සුදුසුකම් උපමාන හා නිර්නායක පරිදි කටයුතු කළයුතු වන අතර, ගොඩනැගිලි ඉදිකිරීම් ක්ෂේත්‍රයේ (CIDA) ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය) හි C3 හෝ ඉහළ ශ්‍රේණි සඳහා වලංගු ලියාපදිංචිය සහිත විය යුතුය.
4. ලංසු ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ සරප වෙත ආපසු ගෙවනු නොලබන ශ්‍රී ලංකා රුපියල් 35,000/= (තිස් පන්දහසක්) ආපසු ගෙවනු නොලබන ගාස්තුවක් ගෙවීම සඳහා නිකුත් කරන ලද ලදුපත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව 2020/10/19 වන දින සිට 2020/11/03 දින දක්වා පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා අතරතුර මිලදී ලබාගත හැකි ලංසු, ලේඛන ආකෘතිපත්‍ර මත, ඉදිරිපත් කළ යුතුය.
5. අභිලාෂී ලංසුකරුවන් හට වැඩිදුර තොරතුරු ලබාගැනීමටත්, ලංසු ලිපිලේඛන පරීක්ෂා කර බැලීමත් ලබාගැනීමත් 2020/11/03 වන දින දක්වා, කාර්යාල වේලාවන් තුළදී ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ, ප්‍රාග්ධන වැඩ අංශයේ (Capital Works Division) හි ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී කාර්යාලයේදී (දුරකථන 037-2283620) තුළින් සිදුකරවා ගත හැකිය.
6. ලංසු ලිපිලේඛන ඉහත 4 වන ඡේදයේ සඳහන් එම ලිපිනයේදීම ගාස්තු ගෙවීමකින් තොරව නොමිලේ පරීක්ෂා කර බැලිය හැකිය.
7. ලංසු 2021/03/24 වන දින දක්වා වලංගු විය යුතුය.
8. සියලුම ලංසු සමග ඉදිකිරීම් ඇපකර අරමුදල (CGF) වෙතින් හෝ ශ්‍රී ලංකා මහ බැංකුව යටතේ ලියාපදිංචි ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මකව පවතින පිළිගත් වාණිජ බැංකුවකින් ලබාගත් **ශ්‍රී ලංකා රුපියල්** (LKR) **දහඅට ලක්ෂයක් (ශ්‍රීලංරු 1,800,000/=) වන වටිනාකමින්** යුත් ලංසු සුරක්ෂණ ඇපකරයක්ද ඉදිරිපත් කළ යුතුය. එම ලංසු සුරක්ෂණ ඇපකරය 2021/04/23 වන දින දක්වා වලංගු විය යුතු වන අතර, එය ලංසු ලිපිලේඛනවල සඳහන් ආකෘතිය ප්‍රකාරව සකස් කළ "**ඒක්ෂණ**" (ඉල්ලූවිට ගෙවනු ලබන) හා "**කොන්දේසි විරහිත**" ලංසු සුරක්ෂණ ඇපකරයක් ද විය යුතුය.
9. මුදු, තබන ලද ලංසු, **කොළඹ 07, චෝඩ් පෙදෙස, අංක 18 හි අධ්‍යාපන අමාත්‍යාංශය, අධ්‍යක්ෂක (ප්‍රසම්පාදන) කාර්යාලයේ තබා ඇති** ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතුය.
10. සමස්ත කොන්ත්‍රාත් කාල සීමාව (සැලසුම් නිර්මාණය කර, ඉදිකිරීම), ලීත් (කැලැන්ඩර්) **මාස 18 ක්** දක්වා වන අතර, මුළු, සැලසුම් කර ගොඩනැගීමේ ව්‍යාපෘති, පිරිවැය (VAT බදු හැර) රුපියල් **මිලියන 192 ක්** වනු ඇත.
11. පූර්ව ලංසු රැස්වීමක් 2020/11/05 **වන දින** පෙ.ව. 10.00 ට **ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයයේ, කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨයේ පාලන මණ්ඩල කාමරයේදී (Board Room)** හිදී පැවැත්වේ.
12. ලංසු ඉදිරිපත් කළයුතු අවසාන දිනය හා වේලාව **2020.12.22 වන දින** පෙ.ව. 11.00 දක්වා වනු ඇති අතර, ලංසු භාර ගැනීම අවසන් වූ වහාම එම ලංසු විවෘත කරනු ලැබේ.
13. ලංසු විවෘත කරනු ලබන අවස්ථාවට පැමිණ සිටින ලෙස, ලංසුකරුවන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

උපකුලපති,
ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය,
කුලියාපිටිය.
දිනය : 2020.10.19

සීමාසහිත හාරිස්පත්තුව දකුණ විවිධ සේවා සමුපකාර සමිතියේ

උකස් රන්භාණ්ඩ වෙන්දේසියක්

හැදෙණියේ දී

ඉහත සඳහන් සමිතියේ

- තිත්තපජ්ජල
- හැදෙණිය
- මැදවල
- බොක්කාවල
- හල්ලොළුව
- කළුගලතැන්න
- මාරතුගොඩ
- රණවන
- සෙනරත්ගම
- හේනේගම - හරංකහව
- ගොහාගොඩ
- ගෝනිගොඩ

යන ග්‍රාමීය බැංකු ශාඛා වෙත 2019-07-31 දින දක්වා උකස් කරන ලදුව මේ දක්වා බේරා නොගන්නා ලද උකස් රන්භාණ්ඩ

2020-11-07 සහ 08 යන දිනවල පෙ.ව. 9.00 සිට

හැදෙණියේ පිහිටි සමිති ප්‍රධාන කාර්යාලීය පරිශ්‍රයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

සාමාන්‍යාධිකාරී,
